# සීමා විනිශ්චය





රාජකීය පණ්ඩිත
කලපිටියේ විසුද්ධලෝක ස්ථවිර



සරණශ්‍රී



සුපරමාතිසුපූජනීයෝත්තම විනය-විශාරද රාජකීය පණ්ඩිත, මහාචාර්ය
බලපිටියේ විසුද්ධාලෝක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

# සීමා විනිශ්චය

සම්පාදක:


බලපිටියේ ශ්‍රී සුභද්‍රාරාම පුරාණ මහාවිහාරවාසී
රත්දෙඹේ ශික්ෂාලඞ්කාර විද්‍යාලයාධිපති
**රාජකීය පණ්ඩිත**
## බලපිටියේ විසුද්ධාලෝක
**ස්ථවිරයන්වහන්සේ**



සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

පළමුවන මුද්‍රණය: 1968 දෙසැම්බර්
දෙවැනි මුද්‍රණය: 2020 මාර්තු 20

මෙම ධර්ම දානයෙ හි පිටපත් ලබා ගැනීම සඳහා විමසීම්

බෝධිචිත්තෝපකාර විවේක සෙනසුන,
නො. 163/B, බාලිකා නිවාස පාර, රැක්මලේ, පන්නිපිටිය.

පළමුවන මුද්‍රණය:

කොළඹ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම විසින්
මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.

දෙවැනි මුද්‍රණය:

හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදය, 145 දරන ස්ථානයෙහි
පිහිටි සවින්ද ග්‍රැෆික් සිස්ටම්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරන ලදි.

# උපහාර

**මේ ග්‍රන්ථය**

අසමදෘචාර්යෝත්තම

බලපිටියේ

ශ්‍රී සුභද්‍රාරාම පුරාණ මහා විහාරාධිපතිව

වැඩවිසූ

ගෞරවාස්පද

**සිරිසද්ධම්මවංසපාල විනයාචාරිය**

## සිරි උපරතනාභිධාන

**අමරපුර සිරිසද්ධම්මවංස මහා නිකායේ**

**මහානායක ස්ථවිරපාදයන් වහන්සේගේ**

**ශ්‍රී නාමයට**

## උපහාරයක් වේවා!

# පුණ්‍යානුමෝදනා

මෙම විනය-දානමය මහා කුශල
ශක්තිය 2015 මාර්තු මස 20 වැනි දින අප
අතරින් වෙන් ව ගිය දයාබර
**ටෙහාන් ඉමල්ක උබේරත්න**
පුංචි පුතණුවන ට අනුමෝදන් වේ වා!

උත්තම නිර්වාණ-ධාතුව ම සුව සේ
සාක්ෂාත් වේ වා!

විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති.

(සපා: - 7)

# පොත ගැන

සුවිශුද්ධ බද්ධසීමාව භික්ෂුශාසනයේ ප්‍රතිෂ්ඨාස්ථානයයි. එහෙයින්:

**“න හොති භික්ඛුභාවො සො උපසම්පත්තියා විනා**
**න හොති උපසම්පත්ති සීමාසම්පත්තියා විනා”**

(සීල-4)

‘උපසම්පත්තියෙන් තොර භික්ෂුත්වයක් නැත. (පරිස සම්පත්ති – කම්මවාචා සම්පත්ති සීමාවක් තුළ ම ලැබෙන හෙයින්) සීමාසම්පත්තියෙන් තොර උපසම්පත්තියක් නැත’ යනු කීහ.

බුදු අණින් පිහිටුවන ලද සිද්ධසීමාවට රැස්වූ සමාන සංවාසක සඞ්ඝයාට සාසනය පවත්වා ගැණීමේ සුවිශේෂ බලයක් ඇත. සීමාවක් තුළ සඟමැදට වත් උපසම්පදාපෙක්ෂකයා ශික්ෂාපද කියා සීල සමාදානයක් නැතිව උපසම්පදාව පමණක් යාඥා කිරීමෙන් සඞ්ඝයාගේ ඒකමතික පිළිගැණීම අනුව කම්වදන් උදෙසා: උපසපන් භික්ෂුවක් ලෙස සම්මත කිරීමෙන් රහතුන් වහන්සේට පවා අසාධාරණ සාසනික පැවිද්දේ ශ්‍රෙෂ්ඨතම තත්වය ලබයි. එය සීමාවක් තුළ විනා අන්කිසිම තැනකදී නො ලැබෙයි.

ප්‍රථමයෙන් බුදු අණ පිහිටුවා රජගහනුවර කළ මහා බද්ධසීමාවෙන් පසු ඒ සීමාතත්වය උදකුක්ඛෙපාදි සීමාවන්ට ද තාවකාලික වශයෙන් ලැබෙන නමුත් ස්ථිර සීමාව නම්, **බද්ධසීමාව** ය. එ බැවින් **මිහිඳු** මහරහතුන් වහන්සේ ලක්දිව අනුරාධපුර මහාබද්ධසීමාව පිහිටුවාලීමෙන් පසු ‘බුදුසසුන තහවුරු ව පිහිටියේ ය’යි: වදාළහ.

**“ඉමං පන සමාන සංවාසසීමං සම්මන්නන්තෙනාපි: පබ්බජ්ජු’පසම්පදා දීනං සුඛ කරණත්ථං: පඨමං ඛණ්ඩ සීමාබන්ධිතබ්බා”** = (සපා – 777) බද්ධසීමාවෙහි ප්‍රයෝජනය

දැක්වීමේදී: මහාසීමාවක් තුළ බඬසීමාමවූ ඛණ්ඩසීමා බැඳීම: පැවිදි – උපසමපදාදීන්ගේ පහසුවෙන් කිරීම පිණිස ය" යි: දක්වන තැන: බඬසීමාව පැවිද්දට ආධාරවන බව අටුවාවෙහි විස්තරවන්නේ: භණ්ඩුකම්මාපුච්ඡන අපලෝකන කර්මය පිණිස බව පමණෙකි. අපලෝකන කර්මයට සීමාවක් උවමනා නම් ඒ අසලම පැවිදි කරණ පණ්ඩුපලාසකයා සීමාව තුළ ම පැවිදිකිරීම නොමැන විද?. බුද්ධකාලයෙහි ලැබුනු තැන් වල පැවිද්ද කෙළේය. ඉන්පසු පැවිද්ද සීමාවලදී ද කර ඇත. **විසාඛ** උපාසක පැවිදි කිරීමට අනුරාධ පුරයේදී සීමාමාලකයට ගෙණ ගියේය. **(අනුපුබ්බෙන මහාවිහාරං ගන්ත්වා පබ්බජ්ජං යාචි. සො පබ්බාජනත්ථාය සීමංනීතො)** (විසු: 231)

**මිහිඳු** මහරහතුන් වහන්සේ අනුරාධපුර මහා බද්ධ සීමාව සමමත කිරීමට පෙර ගාම සීමාවේ දී භණ්ඩුක කුමාරයා මහණ – මහලු පැවිදි කළ නමුත්: මහාසීමා සමමතයෙන් පසු ලක්වැසි බොහෝ දෙනා මහාසීමාව තුළම පැවිදි බිමට පමුණුවන්ට ඇත. සාමාන්‍යයෙන් පැවිදි කිරීම සඞ්ඝකර්මයක් නොවූවත් බද්ධසීමාවක ඇති බුදු අණ මුල්කර ගෙණ බුදු සසුනට ඇතුළත්වීම පිණිස තගන මුල් පියවරවූ පැවිද්ද පවා බඬසීමාවක් තුළ කරන්නේ නම්: එහි ගරුත්වයක් පවතින බවට බැහැරින් කරුණු දැක්වීමට උවමනා නැත.

බුදුරජාණන් වහන්සේගේ සාසන භාරය දරන්නේ සඞ්ඝයා වහන්සේය. ඒ සඞ්ඝයා වහන්සේ: බුද්ධ නියමය පරිදි සමමත කළ සීමාවකට හැර: පොළොව මතුපිට අවකාශ ඇති කොතැනකට නමුත් සඞ්ඝයා වහන්සේ සියදහස් ගණනින් රැස්ව ද විනය කර්මයක් කළ නොහැක. අනුපසම්පන්නයකු උපසපන් කිරීමෙන් විනය කර්මාර්හ සඞ්ඝසභාවට ඇතුළත් කරගැණීමට හෝ, උපසපන්ව සිටි භික්ෂුවක් උත්ක්ෂෙපණීය කර්මයෙන් ඒ සඞ්ඝසභාවෙන් නෙරපා ලීමට හෝ බලය ඇත්තේ සීමාවකට රැස්වූ සඞ්ඝයාට ය.

ඒ සීමාව බද්ධ-අබද්ධ වශයෙන් දෙපරිදිය. එයින් අබද්ධ සීමාව: තාවකාලික ය. බද්ධසීමාව: ඉතා වෙහෙස මහන්සියෙන් ඇති කරගන්නා සම්බුද්ධසාසනයේ බලකොටුවය. අනුරාධපුර මහාසීමාව උගුළුවා ලන්නට තැත්කළ අභයගිරිකයන්ගෙන් මහාවිහාරික භික්ෂූහු එය රැකගත්තේ දිවි පිදීමෙන් රජයක් පිළිබඳ බල කොටුවක් රැකගන්නා ලෙසිනි.

සම්බුද්ධසාසනයේ ජීවය පවතින ඒ උතුම් ස්ථානය උසස් ලෙස ගෞරවාකාරයෙන් පවත්වා, ගැණීම භික්ෂූන් වහන්සේ සතුය. ඒ ස්ථානයේ ශ්‍රේෂ්ඨත්වය සලකන ඇතැම් බෞද්ධ රටවල බෞද්ධයෝ මැණික් ඔබ්බවා රන් ආලේපකරවා උත්කර්ෂවත් ලෙස සීමා මන්දිර තනා ඇති බව කියත්. ලක්දිව ද සමහර විහාරස්ථානයක ඇති බද්ධ සීමා මන්දිරය විහාරස්ථානයේ සියලු ගොඩනැගිලිවලට වඩා ඉතා උසස් ලෙස තනා පිරිසුදුව සැලකිල්ලෙන් තබා ගන්නා අතර, ඇතැම් තැනෙක සීමාමන්දිරය විහාරස්ථානයෙන් ම අබල – දුබල තැනය. ඒහැර මැදුරක් නොතැනූ ඇතැම් සීමාමාලකයක් ගස්වලින් පිරුණු කැලෑ මණ්ඩියකි. නැතිනම්: තණ බැඳුණු පිට්ටනියකි.

සීමාවක් සම්මත කළ පසු එහි බලය සඟසතුය. එක පුද්ගලයෙක් නොව හැම සඞ්ඝයා වහන්සේලාම සීමාව පාලනය පිළිබඳව වගකිව යුත්තෝය. ඒ නිසා කවර භික්ෂූන් වහන්සේ නමකට හෝ අපිරිසිදු සීමාවක් පිරිසුදු කර තැබීම සුදුසුය. පූර්වකෘත්‍යයවලද හැමදීම් ආදියෙන් සීමාව පිරිසුදු කිරීම සඳහන් වන්නේ පොදු බැවිනි. ඒ සීමාමාලකයතුළ මැදුරක් ඉදිකරන්නේ නම් හෝ, ඇති මැදුරක් පිළිසකර කරන්නේ නම් හෝ සඞ්ඝයා විචාරාම: කරන්නේ නම් සඟසතු කාරිය මනාව ඉටු කළාම් වෙයි.

එවැනි පිළිවිසීමක් සිදුනොවන බැවින් ඇතැම් විහාර ස්ථානවල සම්මත කර ඇති බද්ධසීමාවේ නිමිත්තපාසාණ සම්පූර්ණයෙන් සීමාමන්දිරයට ඇතුළත් කොට ද, ඇතුළෙන්

තනන ගොඩනැගිල්ල නිමිත්ත පාසාණවලට සම්බන්ධ කොට ද, ඇතැම් විට කීපයක් සම්බන්ධ කොට ද, කල්‍යාමේදී පෙළ වෙනස්වී ඇති නිමිත්ත පාසාණවලින් කීපයක් මන්දිරයේ ආලින්දයට ඇතුළත් කොට ද, උසට තැනූ මැදුරට නැගීම පිණිස නිමිත්තපාසාණවලට පිටතින් තැනූ පඩිපෙළක් සීමාමන්දිරය සම්බන්ධකර තැබීමෙන් ද, සීමාමන්දිරයේ වේදිකාව: නිමිත්ත පාසාණ සම්පූර්ණයෙන් හා, අඟල් දෙකක් තුනක් පමණ මතුව සිටිනසේ යටකරමින් සීමන් තරිකාය පවා වැනසීයනසේ තැනී මෙත්ද යනාදි නොයෙක් ආකාරවලින් සීමාමන්දිරය ගැණම සැලකීම ඇතිකරගෙණ තැනුනු ගොඩනැගිලිවලින් බද්ධසීමාවට යම් කිසි ක්‍රමය කින් සංකර දෝෂයක් ඇතිවුව හොත් එහි විනය කර්ම කිරීමෙන් සිදුවන විපත පිරිමසාලිය නොහෙයි.

විනය කර්මයක් පිණිස බද්ධා'බද්ධ කවර සීමාවකට හෝ රැස්වන භික්ෂූන්ට ඒ සීමාව පිරිසුදුව – අසංකාරව පිහිටා ඇතැයි: හැඟීම ඇති වියයුතු. සමහරවිට මේ සීමාව: 'සංකරවී ඇද්ද? නැද්ද'යි: සැකය ඇතිකර ගෙණ සිටි එකද භික්ෂුවක් සමග හෝ විනයකර්ම කිරීම: **සීමා නානා සංවාස කත්වයට** හේතු විය හැක. එබඳු මතභේදවලට තුඩුදෙන යම් සුළුවූ හෝ, සැකඋපදින තැන් සීමා මන්දිරවල වේත් නම්: ලාබවූ හෝ, අලාබවූ හෝ, පක්ෂවූ හෝ, විපක්ෂවූ හෝ, ඒ හැම කාරුණක් ගැණම: නෛර්‍යාණික සම්මා සම්බුද්ධ ශාසනය දෙස බලා ඒකමතික තීරණයකට පැමිණම ඒ ස්ථානවල විනය කර්ම කරන්නාහු නම්: එය සම්බුද්ධ සාසනයේ චිරස්ථායී භාවය පිණිස ඒකාන්තයෙන් හේතු වනු ඇත.

විසේසයෙන් **උපොසථ – පාරුපනාදි** සාසනිකවාද විවාදවලින් තීරණයකට පැමිණියත් නො පැමිණියත් බුදු සසුනට එයින් එතරම් හානියක් නැත නමුත් සීමාව පිළිබඳ මතභේදය සමථයකට පත්කර නොගෙණ එහි විනයකර්ම කිරීමෙන් ඇතිවන විපත එයට වඩා ඉතා බලවත් ය.

බද්ධසීමාව මකුළු හුයක් සමගවත් අන් සීමාවක් හා සම්බන්ධ වී ඇති අතර: එහි කරණ විනය කර්මය විනාසවෙයි. උපසම්පදාවක් කළ හොත් ඒ උපසම්පදාපෙක්ෂකයාගේ උපසම්පදාවත් නො පිහිටා ගිහිකමත් – පැවිදිකමත් නැති පුද්ගලයෙක් වෙයි. ඔහු සමග කරණ අතික් විනය කර්මය කුත් එසේ ම වෙයි. අන්තිමේදී නොදැනම බුදු සසුන වඳවී යයි.

**පොළොන්නරුවේ** පැරණි නගරයේ ඇති **බද්ධසීමාව**: ආදර්ශවත්ය: එය තනිමලුවක පිහිටා තිබේ. එහි නිමිත්ත පාසාණ: අඩි 3½ ක් පමණ බිමින් උඩට මතුවී ඇති අඩි 2½ ක පමණ වට මහත ඇති සටාකාර මුදුන් සහිත ගල් කණුය. ඒවායින් වැඩි කොටසක් කැඩී බිඳී ගොස්ය. ඒ නිමිත්තපාසාණවලින් අඩි 10 ක් පමණ මාලකයේ මැදට ගෙණ මන්දිරය තනා ඇත. නිමිත්තපාසාණවලින් මඩුවක ප්‍රමාණ තරම් දුරකින් සීමන්තරික පාසාණ පිහිටුවා එයට අඩි 10 කට පමණ දුරින් ප්‍රාකාරය බැඳ ඇති බව පෙනේ. ඒ නිමිත්තපාසාණ හෝ, අන්තරිකපාසාණ අතර ගල් – ගඩොල් ආදි කිසිවකින් ඇහිරීමක් නැති පියවිබිම පිරිසිදුව පවතියි.

සමහර පළාත්වල භික්ෂූන් වහන්සේලා සීමාවක් ඇති කර ගැණීම ගැණවත්, ඇති සීමාව රැකගැණීම ගැණවත් සැලකිල්ලක් නොදක්වීම සාසනික කටයුතුවලට බාධාවකි. සීමාවක් ඇතිකර ගැණීමේ අපහසුව නිසා හෝ, නො විමසීමෙන් විනය සම්ප්‍රදායයන් ලෙස පවත්වා ගෙණ එන සමහර සාසනික කටයුතු අතර: පොහෝ – පවුරුණු: විහාර ප්‍රතිමා මන්දිරවල ම කරණ බවත්, කඨින වස්ත්‍ර කොතනකදී හෝ ලදහොත් 'ගාම සීමාව' ය යි: කියා එහිදී ම භික්ෂුවකට පවරණ බවත්, වැව් – අමුණු ආදි තැන්වල උදකුක්ඛෙපය කොට ගරුකර්ම පවා කරණ බවත් දැනගන්ට ලැබුනේය. මේ කරුණුවල සත්‍ය භාවය කෙසේ වෙතත් විහාරප්‍රතිමා මන්දිරවල පොහෝ–පවුරුණු කිරීමේ හේතුව: **'සචෙ වන මජ්ඣෙ විහාර කරොන්ති: වනං න ඡින්දි තබ්බං'**

(සපා: 774;) යනාදීන් අටුවා–ටීකාවල **‘විහාර’** සදින් ‘බද්ධසීමා’ ව ද දක්වා ඇති හෙයිනැ’ යි: සිතිය හැක. මෙසේ සම්ප්‍රදායම ගරුකොට හෝ, නොවිමසා විනයකර්ම කිරීමෙන් නොදූනීම භික්ෂු ශාසනය අතුරුදන්වීම සිදුවනු ඒකාන්තය.

කරුණු මෙසේ වෙතත්: මේ ග්‍රන්ථය සැපයීමට අප මෙහෙයවීම කාලේ අබෞද්ධ භවතෙකි. දිනෙක: බෞද්ධ සාහිත්‍යයේ සීමාවන් පිළිබඳ කරුණු දූන ගැණීමට අප වෙත පැමිණි ග්‍රන්ථයක් නිපද වීමෙහි තත්පරවූ උපාධි අපෙක්ෂක භවතෙකු අවසථාවේ හැටියට සීමා පිළිබඳ කරුණු සාකච්ඡා කොට අගේ ඇති මේ සීමාවිත්ති සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පළකෙරුණොත් අයහපත්ද? යි: කීය. ඒ කීමද කල්පනාවට ගෙණ, සිංහල භාෂාවෙන් ලියැවුනු මෙවැනි ග්‍රන්ථයක් දකින්නට නොලැබුනු නිසා ද මේ කාර්යයෙහි අපි ව්‍යාපෘතවීමු.

බුදු සමයේ පරසමය වාදීන් සමග ඇති වාදවලට වඩා ස්වසමය වාදින් ම ඔවු නොවුන් වාදබිමට බැසගැණීමට ‘සීමානය’ තරම් ඉදිරිපත් කරගත් අන්කිසි කරුණක් නැති තරම්ය. නිකාය භේද, පක්ෂ භේදවලට හා ඇතැම් තැනෙක: පුද්ගල භේදයට ද සීමාවාද හේතු වී ඇතිබව ඒ ගැණ ලියා ඇති ග්‍රන්ථවලින් පෙනෙයි.

පෞරාණිකවූ ද, මධ්‍යතනවූ ද, සමීපාතීතවූ ද, ස්වජාතීය වූ ද, විජාතීයවූ ද ලක්දිව **සාරිපුත්ත,** චෝළිය **කස්සප,** සිංහල **වාගීශ්වර,** ම්‍රම්මවංශික **සාගරබුද්ධි** ආදි ත්‍රිපිටකධාරී ටීකා – ප්‍රකරණ ග්‍රන්ථකාරක මහා විනයධර පඬිවරයන්ගේ මතවලින් ගහණ සීමානය ගැණ තීරණාත්මක ග්‍රන්ථයක් ලිවීම තබා සිතීම ද අසීරු කරුණකි.

සීමානය ගැණ: කරුණු සෙවීමේ දී බහුල වශයෙන් ලැබෙන්නේ ස්වමතයන් තහවුරු කරණු පිණිසම ග්‍රන්ථනය කරණලද ග්‍රන්ථයෝය. ඇතැම් තැනෙක එකම අටුවාපදයක් දෙපසක් විසින් දෙපරිද්දෙකින් විනිශ්චය කරණු ලබයි.

**සංඝට්ටනවිටප**[1] (සපා: 788) යන අටුවා පදය: චෝලිය **කස්සප** මහ තෙරණුවෝ **එක** අයුරකින්ද, සාරත්ථදීපනී ටීකාකාර **සැරියුත්** මහ තෙරණුවෝ අන් අයුරකින් ද **වාගීශ්වර** තෙරණුවෝ සහ **බුද්ධනාග** තෙරණුවෝ සැරියුත් මතය අනුමත කිරීමෙන් ද විවරණය කරත්. මෙසේ නොයෙක් මත කැටි වී - ගැටලු වී ඇති සීමානය විජටනු යෙහිලා බුදුවරයෙක්ම සමත් වෙයි.

එබඳු බැරෑරුම් මාතෘකාවක් ගෙණ අප ලියා ඇත්තේ: සීමා පිළිබඳ **මහාවග්ගපාළි උපොසථක්ඛන්ධක**යට ඇතුළත් කොටස හා එය විවරණය කරණ අටුවා- ටීකා- ප්‍රකරණ කතුවරුන්ගේ අදහස් මාත්‍රයක් පමණෙකි.

යම් යම් කරුණු ගැණ පක්ෂවද-විපක්ෂව ද ලියන අදහස් සඞ්ග්‍රහ කරණ විට කථාවස්තුවක් මෙන් අදහස් එකට ගැලපීමක් කළ නොහැක. ඒ ඒ ග්‍රන්ථවලින් සඳහන් කරගත හැකිවූ පරිදි අදහස් මාත්‍රයක් පමණක් සකස්කර ග්‍රන්ථය පිළියෙලකොට ඇත. පාලි භාෂාමය ග්‍රන්ථවලට අයත් පාඨවල යම් යම් කරුණු ගැණ සිංහල අනුවාද පාලියට අනුරූපවම ලියා ඇත්තේ නවීන අදහස් නොවන බව හැඟවීමටය. එසේ ලියන විට: එකම කරුණ මද මද වෙනස්කම් ද ඇතිව කීපවිටක් ද ලියන්ට සිදුවිය. සමහර තැන් සිංහලයට නුහුරුව ගොස් කරුණ නොවැටහේ ය යි: හැඟුනු තැන්වල වරහන් අතර අවබෝධයට රුකුලක් ලීමට පමණක් නැවතත් ඒ කරුණ ලිහිල්ව සඳහන් කර ඇත. ඒ හැර අපගේ රුචියෙන් ගත් නිගමන කොතැනකදීවත් සඳහන්කිරීමට අදහස් නො කොළෙමු. ඒ අතර අකුරු පෙළක් දෙපෙළක් පමණෙකින් කිහිප තැනෙක අදහස් මාත්‍රයක් පමණක් වරහන්තුළ දක්වා ඇත්තේ: ඒ හැඟීම එතැනින් ම මතුවූ දතයුතු කරුණක් බැවිනි. එහෙයින් මෙහිදී මතුවන කිසියම් පිළිවිසුම් ගැණ වගකීමකට බැඳීමක් අපවෙත නැත

---

1. සංඝට්ඨ විටපා-විම: 7,

අපගේ මුල් අදහස වූයේ: මෙකල පලවිදුනා බද්ධා'බද්ධ සීමා කීපයක් ගැණ පමණක් සුළු විවරණයක් සැපයීමටය. ඒබව දත් අප සොහොයුරු බලපිටියේ ශ්‍රී සුභද්‍රාරාම පුරාණ මහාවිහාරාධිපති සද්ධම්මවංස විනයාලංකාර බලපිටියේ ඤාණාලෝක අධිකරණනායක ස්ථවිර පාදයන් වහන්සේගේ අදහස් පරිදි ඊට වඩා මේ ග්‍රන්ථය පුළුල්ලෙස සැපයීමට කල්පනා කෙළෙමු.

ග්‍රන්ථයෙහි සඳහන්වන කරුණු නොයෙක් ලෙසින් තැන් තැන්වල වර්ණිත බැවින් පිළිවෙළින් පිඬුකොට වට හා ගැණීමේ පහසුව සඳහා 'සැකෙවින්' යන ශීර්ෂය යටතේ සාරාංශයක් සපයා ඇත. බද්ධසීමා සම්මතය ද විසේසයෙන් වෙනම දතයුතුම බැවින් එයද පැහැදිලිව දැනගැණීම පිණිස 'බඩසීමං සම්මති' යන ශීර්ෂය යටතේ සඳහන් කෙළෙමු. කරුණු උද්ධරණය කරගත් ග්‍රන්ථ දැක්වීමේදී: ඒ ග්‍රන්ථවල නාමය අකුරු දෙකකින් ද, පිටුව අංකයෙන් ද සඳහන්කර, සමහර තන්හි දිග වාක්‍ය කොටසක් පාසාම ඒ අංක ලකුණු යොදා ඇත්තේ අත් අදහස් එහි නොවැකි බව හැඟවීමටය. සමහර ස්ථානවල යොදා ඇති පිටුඅඞ්ක හා ග්‍රන්ථසඞ්කෙත ද ප්‍රමාදයෙන් වෙනස් වී ඇති බැව් මුද්‍රණයෙන් පසුව දකින්ට ලැබුනේය. ඒ හැර තවත් ප්‍රමාදස්ථාන ද ඇතිවිය හැක. එබඳු තැන් ගැණ විනයධර සුධීහු සමාධිය භජනය කරණු ඇතැයි: විශ්වාස කරමු.

මෙහි දී ශ්‍රී ලඞ්කා අමරපුර සඞ්ඝසභාවේ සභාපති තැන්පත් විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ බුද්ධධර්මාංශයේ විනෙතෘව සිටි: අග්ගමහාපණ්ඩිත සාහිත්‍ය චක්‍රවර්ති බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක මාහිමි තුමන් වහන්සේ වෙත තුබූ විනයමුඛීනයසඞ්ඛාසිනී ග්‍රන්ථයේ පිටපත් කොටසක් බලා ගන්ට ලැබීම හා, මේ ග්‍රන්ථයේ ඇතුළත් යම් යම් කරුණු ගැණ උන්වහන්සේ සමග සාකච්ඡාකරන්ට ලැබීම ද අපට සතුටකි.

තවද රත්දෙඹේ ශික්ෂාලඞ්කාර විද්‍යාලයේ උප ප්‍රධානාචාර්ය රාජකීය පණ්ඩිත කොස්ගොඩ **සිරිවිසුද්ධි** නාහිමිපාණන් වහන්සේ ද, රත්දෙඹේ සඞ්ඝරාජ මහාවිහාරාධිපති ශික්ෂාලඞ්කාර විද්‍යාලයේ අධිකාරි තැන්පත් කොස්ගොඩ **පඤ්ඤාසීහ ස්ථවිරයන්** වහන්සේ සහ, තද්විහාරවාසී ශික්ෂාලඞ්කාර විද්‍යාලයේ ආචාර්ය ශාස්ත්‍රවේදී කොස්ගොඩ **ජිනාලඞ්කාර** ස්ථවිරයන් වහන්සේ ද මේ ගත සැපයීමේ දී අපට ආධාර කළ බව සතුටින් සඳහන් කරමු.

ශාස්ත්‍රවේදී වලලඹගල **පඤ්ඤාසාර** ස්ථවිරයන් වහන්සේ පොළොන්නරුවේ පුරාණ බද්ධසීමාවෙහි ඡායා රූපය පුරාවිද්‍යා අධිකාරියේද අනුමැතිය ඇතිව ඉතා අවිවේක අවස්ථාවකදී උනන්දුවෙන් සපයාදුන් බව ද, චිත්‍රකලා ශාස්ත්‍ර විසාරද හීනැටියේ **සරණශ්‍රී** ආයුෂ්මතුන් වහන්සේ අභිවත් ලෙස පිටකවරයේ චිත්‍රය ඇඳ දීමෙන් ද ආධාර කළ බව සඳහන් කරන්නේ සන්තෝෂයෙනි.

ලක්දිව අධ්‍යයනාභිලාෂීන්ට නා නා විෂයයන් පිළිබඳ ග්‍රන්ථ සුලභ කරවා ලීමෙන් ජාතික සාහිත්‍ය සේවයක් කළ කොළඹ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගමේ අධිකාරීව සිටි **ඇම්. ඩී. සිරිසේන** මහතුන්ගේ අභාවය වැඩී ගෙණ ආ සාහිත්‍ය ගත්වැල ලියලෑමට බාධාවක් බව සංවේගයෙන් සඳහන් කරමු.

**බලපිටියේ විසුද්ධාලෝක ස්ථවිර.**

බලපිටියේ
ශ්‍රී සුභද්‍රාරාම පුරාණ මහා විහාරය.
ශ්‍රී බු: ව: 2512
1968-10-8

# දේවැනි මුද්‍රණය පිළිබඳ වදනක්......

**නමෝ මහා කාරුණිකස්ස තස්ස!**

මහා කාරුණික වූ ත්, සර්වඥ වූ ත් සම්මා සම්බුද්ධෝත්තමයන් වහන්සේ විසින් පණවා වදාළා වූ විනය ප්‍රතිපත්තීන් ම සම්බුද්ධ ශාසනයා ගේ ආයුෂය වන්නේ ය. ඉතා කුඩා ශික්ෂා පදයක් වත් බිඳලන්නේ නොමැතිව එම විනය ප්‍රතිපදාවන් මනා ව සුරැකීම ම සම්බුදු සසුනෙ හි චිර පැවැත්ම තීරණය කරන්නේ ය. ශාසනය නිර්මලව පවත්නේ පිරිසිදු සිල් ඇති උපසම්පදා ස්වාමීන් වහන්සේලා මුල් කරගෙන ය. උපසම්පන්න භික්ෂූන් වහන්සේලා බිහිවන්නා වූ 'තිඹිරි-ගෙය' නම්, ඉතා පරෙස්සමින්, විනයානුකූල ව සම්මත කරගන්නා ලද 'සීමා මාලකය' යි. මේ අනුව සම්බුද්ධ ශාසනයෙ හි සුරක්ෂාව සහ සුවිශුද්ධ වූ අනාගත පැවැත්ම පිණිස අසමෝත්තම වූ කර්තව්‍යයක් ඉටු කෙරෙන්නා වූ පරම-පූජනීයස්ථානය නම් 'සීමා-භූමිය' ම වන්නේ ය. විවිධ වූ, විශේෂී වූ න්‍යායයන්, පැණැවීම්, අනු-පැණැවීම් සහිත වූ ත්, මහා සාගරය සේ ගාම්භීර වූ ත්, විස්තාර සහිත වූ ත් විනයයෙ හි අතිශය සූක්ෂමතම පරිච්ඡේදය නම් 'සීමා මාලක' පිළිබඳ බව යි අප ගේ වැටැහීම. ථේරවාදී විනය අධ්‍යයනයෙ හි යෙදෙන්නා වූ විනයකාමීන් ට ද, විනයකර්මයන් හි යෙදෙන්නා වූ අති-පූජනීය තෙරුන් වහන්සේලා ට ද පරිහරණය පිණිස, මෙම විෂයය පිළිබඳ කරුණු සංයුක්ත වූ ග්‍රන්ථයන් දුර්ලභතර ය. කරුණු මෙසේ හෙයින්, මෙයින් දෙ-

පණස් වසරකට පමණ පෙර පරමාතිසුපූජනීය විනයෙ හි සුවිශාරද, රාජකීය පණ්ඩිත, මහාචාර්ය **බලපිටියේ විසුද්ධාලෝක** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් අතිමහත් පරිශ්‍රමයෙන්, සූක්ෂම ඥානයෙන් සහ ඉතාමත් ම පරෙස්සමින් සම්පාදිත මෙම 'සීමා විනිශ්චය' නම් විනය ග්‍රන්ථය, සුවිශිෂ්ඨ වූ ත්, පරමෝත්තරීතර වූ ත්, උත්කෘෂ්ට වූ ත්, 'සීමා-නය' හා බැඳි විනය-ඥානය නැමැති හිඩැස පූරණය කරන්නා වූ ත්, එක් නිධානයක් සොයන්නකු ට නිධාන රාශියක් හමු වූවාක් මෙන් විනයකාමීන ගේ සිත් අතිශය ප්‍රමෝදයට පත් කරලන්නා වූ ත්, අඩපණ ව සිටින්නා වූ විනයඥයන ගේ විනය-පිපාසාව දුරු කොට සසුන්-ජීවය උපදන අමෘතයක් වන්නා වූ ත්, සාකල්‍යයෙන් ම සසුන් සුරක්ෂාකර වූ ත් උත්සාහයක් බව පැවැසීම දොස් සහිත නො-වන්නේ ය. විනයෝන්නතිකාමී උතුමන ට හස්තසාර ග්‍රන්ථයක් විය යුතු වූ ත්, මෙකල මුද්‍රණයෙ හි නොමැති වූ ත් මෙම විනයගත නැවත සංඝ-සමාජගත කිරීම ම අති- මහාතම් ශාසනානුග්‍රහයක් බව යි අප ගේ කල්‍යාණ-මිත්‍ර පූජනීය ස්වාමීන් වහන්සේලා ගේ සිහිපත් කිරීම වූයේ.

මෙබඳු අත්‍යුතුම් විනය-සංග්‍රහයක් සකසාලමින් මහනීය විනයාලෝකයක් විහිදුවාලූ ත්, ඇත් දළෙක සුසඟවාගත් ගජ-මුතු සේ ඉතා නිහඬ ව අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතාදී සාමඤ්ඤ ගුණයෙන් පිරිපුන් ව සසුන් කිසෙ හි යෙදුනා වූ ත්, තම වල්ගය රක්නා සෙමර

මුවරදුන් මෙන් සාතිශය ශික්ෂාකාමී ප්‍රතිපදාවන් සාරාණීය වශයෙන් ම පූරණය කළා වූ ත්, සුපරමාතිසුපූජනීයෝත්තම විනයයෙ හි සාතිවිශාරද, රාජකීය පණ්ඩිත, මහාචාර්ය **බලපිටියේ විසුද්ධාලෝක** නායක සව් ාමීනද්‍ර යන 'වහනශ් ස 'ට පා්‍රර්ථනයී බොධී -චිතත් යෙන් උතුම් නිර්වාණාවබෝධය පිණිස ම මේ 'විනය-දානමය' මහා කුශලය ඒකාන්තයෙන් පාරමිතාවක් ම වේ වා!

වසර 106ක් පමණ ඉතා ම සුපරමාදර්ශතර වූ, සුපේශල ශික්ෂාකාමී දිවියක් ගත කොට අපවත් වී වදාළ සුපරමාතසුපූජනීයෝත්තම **අම්පිටියේ ශ්‍රී රාහුළ** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ට ද ප්‍රාර්ථනීය බෝධි-චිත්තයෙන් සුවිශුද්ධ වූ නිර්වාණ-ධාතුව ම සාක්ෂාත් වේ වා!

අප සුවිශේෂී පරම-කළ්‍යාණෝත්තම ගුරුදේවයන් වහන්සේ වූ පරමාතිපූජනීයෝත්තම බෝධිසත්ත්වගුණෝපේත මහා-කම්මට්ඨානාචාර්ය ත්‍රිපිටකධාරී **නාඋයනේ ශ්‍රී අරියධම්ම** අනුනායක සංඝ-පරිණායකයන් වහන්සේ ට ලොව්තුරා අභි-සම්බෝධිය ම ඒකාන්තයෙන් මුදුන්පත් වේ වා!

'සසරින් ආ මිතුරා' ලෙසින් දෙව්ලොව සිට ඉතා කෙටි කලෙක ට වුව ත් මෙහි පැමිණ, ඉතාමත් ම පුණ්‍යාත්මීය වූ ත්, පරිත්‍යාගශීලී වූ ත් දිවියක් ගත කොට, මෙයින් වසර 5ක ට පෙර අප අතුරින් වෙන් ව ස්වර්ගපරායණ වූ ත්, අද ට ත් අප හට ගම්භීර දහම් මග ට මග පාදන්නා වූ ත් **ටෙහාන් ඉමල්ක**

උබේරත්න පුංචි පුතණුවන ට මේ මහනීය වූ ත්, අසම-සම වූ ත්, අග්‍රෝත්තම වූ ත් පුණ්‍ය ශක්තිය අනුමෝදන් වේ වා! සසරේ කිසිදු කලෙක දුක්-පීඩා-රෝ-බිය නො-වේ වා! නිදුක් බව, නීරෝගී බව, දීර්ඝායුෂය ම වේ වා! කායික වූ ත්, මානසික වූ ත්, ලෞකික වූ ත්, ආධ්‍යාත්මක වූ ත්, දිට්ඨධම්මික වූ ත්, සම්පරායික වූ ත් සියලු ශාන්තිය ම උදාපත් වේ වා! ජරා-මරණාදී සියලු දුකින් වෙන් වූ අමෘත නිර්වාණාවබෝධය සඳහා ම වහ වහා පාරමී ගුණ ම සිත් සේ ම සුව සේ ම පූරණය වේ වා!

1968 වසරේ දී කොළඹ, සීමාසහිත 'ඇම්.ඩී. ගුණසේන සහ සමාගම' විසින් පළ කරල ලද මෙහි පළමු මුද්‍රණයට කිසිදු හානියක් නො-වන්නා වූ ලෙසින්, දින කිහිපයක් වැනි ඉතා කෙටි කලෙකින් අත්‍යාලංකාර ව මෙම ග්‍රන්ථය මුද්‍රණය කර දුන් 'සාවින්ද්‍ර ග්‍රැෆික් සිස්ටම්ස් පුද් සමාගම' ට ද හදපත්ලෙන් ම පුණ්‍යානුමෝදනා කරන්නෙමු.

ග්‍රන්ථය ට අවැසි ඡායාරූපයන් සපයා දීම උදෙසා අපමණ කැප වූ කළ්‍යාණ මිත්‍රයින් සියලු දෙනා ට ද උතුම් සත්‍යාවබෝධය ම වේ වා!.

අප සැම දෙනා ම පිහිට සලසා ගන්නා මේ උතුම් බුද්ධ-ශාසනය මිථ්‍යා-දෘෂ්ටියකින්, ධර්ම-විනය විකෘතියකින්, මාර බලවේගයකින් පිරිහීම ට පත් වී චිරාත් කාලයක් අති-නිර්මලව ම පවතී වා! පර්යාප්තියෙන්, ප්‍රතිපත්තියෙන්, ප්‍රතිවේධයෙන් දිනෙන් දින ම බැබැළීමෙන් බැබැළීම ට ම පත් වේ වා!

උත්තම නිර්වාණාවබෝධය දක්වා ම
සෙවණැල්ලක් මෙන් තමා සමගින් ම පවතින්නා
වූ මේ උතුම් කුසල ශක්තිය අප සෑම දෙනා ට ත්,
පින්කම ට නන් අයුරින් සම්බන්ධ වූ සෑම දෙනා
ට ත්, සියලු සත්ත්වයන ට ත්, එක සේ
අනුමෝදන් වේ වා!

සෑම දෙනා ගේ ම කාය-චිත්ත පීඩාවන් දුරු
වේ වා!

කායික වූ ත්, මානසික වූ ත් සුවපත් භාවය
උදා වේ වා!

නීරෝගී සම්පත්, දීර්ඝායු සම්පත් උදා වේ වා!

සියලු කටයුතු සර්වාකාරයෙන්
සඵලත්වය ට පත් වේ වා!

මෙලොව ජීවිතය සුවපත් වේ වා!

පරලොව ජීවිත සුගතිගාමී වේ වා!

නිවන් දක්නා තෙක් කිසිදු කලෙක පාප-මිත්‍රයන
ගේ ඇසුරක් නො-ලැබේ වා!

කල්‍යාණ-මිත්‍රයන ගේ ඇසුර ම වේ වා!

තම සිතෙ හි සියුම් වශයෙන් වත් කෙලෙස්
සිතිවිල්ලක් නූපදී වා!

කුසල් අරමුණක් ම සෑම විට සිතෙ හි පිහිටා වා!

සියලු දුර්-ගුණයෙන් ඉවත් වේ වා!

සියලු යහ-ගුණයෙන් පරිපූර්ණ වේ වා!

උතුම් සද්ධර්මය වටහාගැනීම ට ත්, භාවනා මාර්ගය
දියුණු කරගැනීම ට ත්, ජීවිතාවබෝධය
සලසා ගැනීම ට ත්,
ඉතා තියුණ-ප්‍රඥාව,
ගම්භීර-ප්‍රඥාව, පුළුල්-ප්‍රඥාව ම උදා වේ වා!

සසර වශයෙන් හෝ කල්‍යාණ ගුණ සහිත ගුරු

උතුමන් ඇසුරෙ හි පැවිදි ව සීල-සමාධි-ප්‍රඥා ගුණ පුරන්න ට වාසනාව ලැබේ වා!

උතුම් සිතුම්-පැතුම් ඒ ආකාරයෙන් ම මුදුන්පත් වේ වා!

ප්‍රාර්ථනීය බෝධි-චිත්තයෙන් උතුම්

නිර්වාණ-ධාතුව සාක්ෂාත් කරගැනීම පිණිස ම මේ සියලු කුසල් පාරමිතාවන් බව ට ම පත් වේ වා!!!

තෙ රුවන් සරණ යි!

මෙය ට, සම්මා සම්බුද්ධ ශාසනෝන්නතිකාමී, සැදැහැති,

**චින්තක උබේරත්න,**
**සඳුනි උබේරත්න,**
**හිමන්සි(ටෂී) උබේරත්න.**

2020 මාර්තු මස 20 වැනි දා.

# සීමා විනිශ්චය

# සැකෙවින්.

ශ්‍රී සම්බුද්ධශාසනය ලෝකයෙහි ඇතිවීමට පෙරදී පටන් මිසදිටු අන්තොටුවෝ දඹදිව විසූහ. ඔවුහු සතිපතා රැස්වී මිනිසුන්ට කරුණු කියා දුන්හ. සීමා අනුදැනීම එයින් ඔවුන්ගේ දියුණුව ඇතිවිය. ඒ බව දුටු බිම්සර රජතෙම: රජගහනුවර ගිජුකුළුපව් විහාරයෙහි වැඩවිසූ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ 'භික්ෂූන්ට ද රැස්වීම අනුදැන වදාළ හොත් යෙහෙකැ' යි: දැන්වී ය. එවිට උන්වහන්සේ භික්ෂූන්ට රැස්වන්නට අනුදැන වදාළහ. භික්ෂූහු රැස්ව නිශ්ශබ්දව හුන්හ. දහම් ඇසීමට පැමිණි මිනිස්සු භික්ෂූන්ගේ නිහඬ බව ගැණ දෙස් පැවරූහ. එය දැනගත් බුදුරජාණන් වහන්සේ විසින් සමගිවූ භික්ෂූන්ට පාමොක් උදෙසීම අනුදන්නාලදී. මෙහි සමගිය නම්: සාසනික පිළිවෙත් ඒකමතිකාව සපුරණ භික්ෂූන්ගේ ඒකාවාසයයි- එකතැනක රැස්ව විසීමයි. එසේ රැස්වන තැන පිරිසිඳ ගැණීම පිණිස බුදුරජාණන් වහන්සේ සීමාසම්මතය අනුදැන වදාළහ.

සීමාවක් සම්මත කරගැණීමේදී 'අටවැදෑරුම් නිමිති අතුරෙන් ලැබෙනපරිදි පළමුකොට නිමිති කීර්තනය කොට නැවත සීමාව සම්මත කරගතයුතු ආදිම සීමාව: ය' යි: කළ අනුදැනීමට අනතුරුව භික්ෂූහු හතර – පස් –හය තරම් යොදුන් දිග පලළ ඇති මහාසීමා සම්මත කරගන්ට පටන්ගත්හ. ඊට පසු බුදුරජාණන් වහන්සේගේ අනුදැනීම පරිදි දම්සෙනෙවි සැරියුත් මහරහතුන් වහන්සේ විසින් රජගහනුවර අටලොස් මහාවිහාර යන් ඇතුළත්කොට තුන්යොදුන් මහාසීමාව සම්මත කරණලදී. එයට පෙර සතර- පස්- යොදුන් දිග- පලළ ඇති මහාසීමාවෝ ද භික්ෂූන් විසින් සම්මත කළ නමුත් අවසාන පරිච්ඡේදය තුන්යොදුන ම ය යි: කළ ප්‍රඥපතියෙන් පසු ඒ සීමා අසීමා වූහ.

ඛඩසීමාවේ ඉතා වැඩිම වූ ප්‍රමාණය **තුන්යොදුනය**. මීට වඩා කොස්අගක් පමණවත් සීමාව විසාල වුවහොත් එය අසීමාව වෙයි. එමෙන් භික්ෂූන් විසිඑක

**මහාසීමා**: නමකට වටා හිඳීමට නො පොහොනා තරම් ඉතා කුඩා සීමාව ද අසීමාවය.

පළමුකොට ම තිමිති කීර්තනයෙන් **සමානසංවාස** මහා සීමාව සම්මත **කර**ගත්හ. නැවත: **මහකාසුප්** මහ රහතුන් වහන්සේ **සප්පිනියා** ගඟින් එතරවන අතර සිවුරු තෙමී **ගිය** බැවින් උන්වහන්සේගේ තේචීවරික භාවය රැකදීම පිණිස: **තිචීවරාවිප්පවාස** සීමාවත් ඒ සමාන සංවාස මහා සීමාව තුළම බුදුරජාණන් වහන්සේගේ අනුදැනීම පරිදි සම්මත **කර**ණලද්දීය. එකල ඒසීමාව තුළ පැවති ගාම- ගාමූපචාරවල තුබූ සිවුරු විනාසවී ගිය හෙයින් නැවත ගාම- ගාමූපචාර හැර තිචීවරාවිප්පවාස සීමාව සම්මත කරණලෙස අනුදැන වදාළහ.

**ඒ දෙ** සීමාවෙන් යුත් **මහාසීමාවක්** භික්ෂු ජනපදයක් ලෙස සැලකියහැක. දහස් ගණන් භික්ෂූන්ගේ ආවාස- විහාර- ආරාම- පිරිවෙන්- ගිලන්හල්- ප්‍රතිමාගෘහ- බෝධි- චෛත්‍ය- බොජුන්හල්- අසුන්හල්- දහම්හල් ආදියෙන් ගැවසී ඇති අතර **ඛණ්ඩසීමා** හා **උපෝසථාගාර** ද වූහ. ලක්දිව: අනුරාධපුර මහාසීමාවතුළ ද නොයෙක් වෙහෙර- විහාර හා නගරය ද පිහිටියේය.

ඒ මහාසීමාව තුළ භික්ෂූහු සංකේතයක් නොමැතිව තමහට රිසිවූපරිදි තැන් තැන්වල උපෝසථය කරන්ට පටන් ගත්හ. උපෝසථය කිරීමට පැමිණෙන භික්ෂූන්ට එය බලවත් කරදරයක් විය.

එකල්හි බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ගේ පහසුව පිණිස (පොහොයකිරීමට ගෙයක්) උපෝසථාගාරයක් සම්මත කරගැණීමට නියමකළ සේක.

**උපෝසථාගාර**: එය මහාසීමාව තුළ ඇති: ආවාසයක්- භික්ෂූන් වසන විහාරයක්- පිරිවෙන්

ගෙයක්- තට්ටුගෙයක්- හෝ සාලාවක් ආදිවසයෙන් පැවති භික්ෂූන්ගේ රැස්වීමට සුදුසු ගෙයකි. ඒ ගෙය උපෝසථාගාර කම්වදන් උදෙසා සම්මතකරගත් පසු **'උපෝසථාගා' ර** ය වෙයි.

**ඒ** උපෝසථාගාරය: සම්මතකළ සීමාවට අයත්ය. ඛණ්ඩසීමාව මෙන් වෙනස් නො වේ. එහෙයින් උපෝසථාගාරයක විනය කර්මයක් කරණකල සියලු මහාසීමාව ම සෝධනය කොට කළයුතුය. එක උපෝසථාගාරයක විනය කර්මයක් කරණ කල එයට ඇතුළත් සීමාවේ අන් තැනක හෝ උපෝසථාගාරයක විනය කර්මකිරීම සුදුසු නො වේ.

භික්ෂූන් වාසයකරණ විහාර- ආවාස- පිරිවෙන් බොහෝ ගණනක් ඇති මහාසීමා ප්‍රමාණ වූ හෝ, ඊට කුඩා වූ හෝ සීමාවක හැර සීමාසම්මුතියක් නො ලද අන් තැනෙක උපෝසථාගාරයක් සම්මත නො කරයි. කුඩා සීමාවකට උපෝසථාගාරයක් උවමනා නැත.

සමහරවිට රැස්වෙන තරම් සඞ්ඝයාට උපෝසථාගාරය නො පොහොනේ නම්: **උපෝසථාගාරපමුඛයක්** (ඉදිරියෙන් වැඩිකොටසක්) නිමිති කීර්තනය කොට ඇතුළත් කරගත හැක. ඒ තැන්වල නිමිතිවලට ගල්- ගඩොල්- ලී ආදි කවර දෙයක් හෝ යොදාගත හැක. මහාසඞ්ඝ සන්නිපාතයක් වූ දිනෙක ඒ පමුඛය සහිත උපෝසථාගාරයත් නො සෑහේ නම්: උපෝසථාගාරයෙන් බැහැර සඞ්ඝයාගේ අත්පසේ සීමාභූමියෙහි හිඳ පාමොක් ඇසීමෙන් ද උපෝසථය කළාවෙයි.

තුන්යොදුන් පමණවූ හෝ ගව්-දෙගව් පමණ වූ හෝ ඊටත් කුඩාවූ හෝ මහාසීමාවක් සෝධනය කර ගැණීම අපහසුබැවින් ඒ සීමා තුළ **ඛණ්ඩසීමා**

**ඛණ්ඩසීමා:** සම්මත කළහ. මහාසීමාවට වඩා කුඩා බැවින් හෝ, මහාසීමා භූමියේ මහාසීමාවට සම්බන්ධනොවූ කොටස් වසයෙන් වෙන්කරගත් බැවින්

හෝ ඛණ්ඩසීමා ය යි: කියයි: ඛණ්ඩසීමාව: මහාසීමාවක් තුළ ද: ඉන්බැහැර ද බන්ධනය කළහැක. මහාසීමාවෙන් බැහැර බන්ධනය කළකල්හි ඛණ්ඩසීමාව නම් ‘කුඩාසීමාව’ යයි: සැලකෙයි. මහාසීමාවක් බන්ධනය කරණකල: ප්‍රථමයෙන් ඛණ්ඩසීමාවල නිමිති කීර්තනය කොට, එහිම සීමන්තරිකා නිමිති කීර්තනය කොට, නැවත මහාසීමාවේ නිමිති කීර්තනය කොට ඛණ්ඩසීමාවේ පටන් සීමා බන්ධනයකරයි. ඛණ්ඩසීමා සම්මතයෙන් පසු මහාසීමාව සම්මතකරයි.

එවිට මහාසීමාව ඛණ්ඩසීමාව හා සම්බන්ධ නො වෙයි. ඛණ්ඩසීමාව මහාසීමාව හා සම්බන්ධ නො වේ. ඒ දෙක සීමන්තරිකයෙන් වෙන් වෙයි. මහාසීමාවෙන් ඛණ්ඩසීමාවට හෝ ඛණ්ඩසීමාවෙන් මහාසීමාවට හෝ සම්බන්ධවන ගස්– අතු ආදියක් ඇත්නම් ඒවා සෝධනය කොටම සඟකම් කළයුතු.

ඛණ්ඩසීමාව: හැමලෙසින්ම ඉතාපහසු කුඩා සීමාවකි. සමානසංවාස මහාසීමාවේ ගාම – ගාමූපචාරයන්හි තිචීවරාවිප්පවාසය නො ලැබෙයි. නමුත් ඛණ්ඩසීමාවතුළ සමාන සංවාස– තිචීවරාවිප්පවාස දෙකම ලැබෙයි. මේ කුඩා සීමාව කඳුමුදුනක හෝ– ගලක් මත හෝ– විශාලගෙයක් තුළ හෝ– ගෙයක් මත සඳළුවක් වැනි අවකාශ ඇති තැනක හෝ භූමිය පිරිසුදු නම් සම්මත කළ හැක. මේ ගැණ අටුවා ටීකාවන්හි බොහෝ විස්තර ඇත. අන් සීමාවකට යටත් නොවීමෙන් පිරිසුදු භූමියක සීමා උගුළුවීමක් උවමනා නැත. නිමිති සකස්කරගත් විට සඞ්ඝයා රැස්වී සිටීනම් සුළු කාලයක් තුළදී ඛණ්ඩසීමාවක් සම්මත කරගත හැක.

මහාසීමාවට කුඩා: යොදුන – ගව්වතරම් විසාල විහාරසීමාවෝ ද වෙති. මහාසීමාව: විසාල භික්ෂුජනපදයක් වනඅතර විහාරසීමාව: ඊටවඩා කුඩා භික්ෂු

**විහාරසීමා:** ජනපදයක විලාසය ගණියි. සමහරවිට ගාම–

**සීමවිහාර:** ගාමූපචාර එයට ඇතුළත් නොවන්නටත් හැකිය. සාමාන්‍යයෙන් විහාරසීමාවක: භික්ෂූන්

වාසයකරණ විහාර– පිරිවෙන්– ආවාස– චෛත්‍යය– බෝධිය– ප්‍රතිමාගෘහ ආදිය ද පැවති බව පෙනේ. ඒ අතර උපෝසථාගාර හා බණ්ඩසීමා ද වූහ.

මහාසීමා– විහාරසීමා– සීමවිහාර– ඛණ්ඩසීමා: බද්ධසීමාවෝ ය. ඒ සීමා බන්ධනය කිරීමේදී පළමුකොට නිමිති කීර්තනය කළයුතුය. ඒ නිමිති වසයෙන් පබ්බත–

**නිමිති:** පාසාණාදි අටවැදෑරුම් නිමිති හැර අන්දෙයක් ගැණීම ප්‍රඥප්ති විරෝධය. නිමිති එකක් හෝ දෙකක් පමණක් කීර්තනය කොට සීමාබන්ධනයක් නො කළහැක. අඩුගණනේ නිමිති තුණේ පටන් අටතෙක් අට දිගට නිමිති ගතහැක. මෙසේ එකදිසාවකින් නිමිති කීපයක් වුවත් කීර්තනය කරගන්ට අවකාස ඇත. වටා නිමිති කීර්තනය කරණකල කවර දිසාවකින් හෝ කීර්තනය කිරීමට පටන්ගෙණ ඒ පටන්ගත් නිමිත්ත නැවතත් කීර්තනය කොට නිමිත්තෙන් නිමිත්ත ගලපා තැබියයුතු. නො එසේ කළහොත් 'ඛණ්ඩනිමිත්තා' නම්: ද්‍වේසය වී අසීමාව වෙයි.

මහාසීමාවලට: රුක්ඛ– වන– පබ්බත– නදී ආදි මහා නිමිති ම ගන්නා අතර: ඛණ්ඩසීමාවලට: සීමානිමිත්ත මෙන් සීමන්තරික නිමිත්ත ද මහාසීමාතුළ කීර්තනය කළයුතු බැවින් වන– පබ්බත– රුක්ඛාදි නිමිති එසේ එකතැන ලබාගැණීමේ දුෂ්කරතාවය නිසා පාසාණම නිමිතිවසයෙන් ගෙණ ඇති බව පෙනේ. එහෙයින් අටුවාවෙහි: **සීමන්තරිකා පාසාණා ඨපෙතබ්බා** යනුවෙන් සඳහන් කරයි. නිමිත්තට ගන්නා පාසාණවල පොළොවෙන් මතුකොට තැබිය යුතු ඉතා කුඩාවූ ම ප්‍රමාණය බරින් නොව උස – මහතින් පලම් 32 ක උක්හකුරු ගුළියක් පමණ වියයුතු. එවිට සාමාන්‍යයෙන් අඟල් 10 – 12 ක් පමණ පොළොවෙන් මතුවී සිටිය හැක. ඊට කුඩා පාසාණ නිමිත්තුපග නො වෙයි. සමහරවිට පස්වලින් නිමිති යට වී ඇතහොත් නියම ප්‍රමාණය මතුකර තැබීම සුදුසුය. නිමිතිගල එපමණද? යනු සැක ඇතිවිය හැකි බැවිනි.

මහාසීමාවක නිමිති කීර්තනය කිරීමේදී ඉතාදුර ගමන්කිරීමට අපහසුබැවින් සීමාව මැදසිට ඒ ඒ දිසාවලට අභිමුඛව නිමිති දක දන්නා කෙනෙකුගෙන් දැන විනයධර භික්ෂුවට නිමිති කීර්තනය කළහැකිය. කුඩා සීමාවක වුවත් එසේ කළහැකිබව දක්වයි.

සීමාසංකර – සම්භේදාදිය නැතිකිරීම පිණිස භාග්‍යවතුන්වහන්සේ විසින් සීමන්තරිකයක් අනුදැන වදාරණලදී. මහාසීමාවල ඛණ්ඩසීමා සම්මතකිරීමේදී

**සීමන්තරිකා**: සීමන්තරික පාසාණ ද කීර්තනය කරත්.

ඛණ්ඩසීමාවේ නිමිතිගල් හා සීමන්තරික පාසාණ අතර රියනක් හෝ ඊට අඩු – වැඩි ප්‍රමාණයක අතරක් වෙයි. ඒ අන්තරය යමකින් ඇහිරීමක් නැතිව පිරිසුදුව පවතී. යම් දෙයකින් එය අහුරා දැමීමෙන් අන්තරිකය නැතිවීයයි. මහාසීමාවේ ඒ අන්තරික පාසාණ–වලින් පිටත ඇත්තේ මහාසීමාවය. ඒ මහාසීමාවත් ඛණ්ඩසීමාවත් නොගැටීම පිණිස ඒ අන්තරිකය නොතැබුව හොත් සීමාසංකරය වෙයි.

යම් තැනෙක කුඩා බඩසීමාවකට උවමනාතරම් බිම් පෙදෙසක් සීමා උගුළුවීමකින් සෝධනය කරගත් පසු එහි හාත්පස පැරණි බඩසීමාවට අන්තරිකයක් වසයෙන් සීමන්තරික පාසාණ ද පිහිටුවත්. නමුත් ඒ පාසාණ කීර්තනය කරණබවක් නොපෙනේ. මේ සීමන්තරික ප්‍රඥප්තියේ සමර්ථභාවය නිසා මකුළුහුයකින්වත් අන්සීමාවක් හා සම්බන්ධය විනයැදුරෝ පිළිකෙව් කරත්. එහෙයින් සීමන්තරිකයෙන් තොර බඩසීමාව සංකරදෝසයෙන් නොමිදුනේයයි දක්වයි.

බඩසීමාවට සීමන්තරිකය තැබියයුතු ය යි: සූත්‍රයෙහිම දක්වනලද බැවින් අටුවාවෙහි: අබඩසීමාවවූ: උදකුක්ඛෙප සීමාවට අන්‍ය උදකුක්ඛෙපයක් ද, සත්තබ්භන්තර සීමාවට අන්‍ය සත්තබ්භන්තරයක් ද සීමන්තරික වසයෙන් තැබිය යුතුය යි: දක්වයි. නමුත් අබඩසීමාවක්වූ ගාමසීමාවට අන්තරිකයක් දක්වා ඇතිබවක් නොපෙනේ.

මහාසීමාවක්: සෝධනය කරගැණීම් ආදි අපහසුකම් නිසා කුඩා කරගැණීමට හෝ, කුඩාසීමාවක්: ඉඩ-පහසුකම් නොමැති නිසා විසාල කරගැණීමට හෝ

**සීමාසමූහනන:** ප්‍රථමයෙන් පැවති සීමාව උගුළුවා දමයි. සීමාවක් උගුළුවා-ඉවත්කර දැමීමේදී: පළමු කොට තිචීවරාවිප්පවාසසීමාව ද, නැවත සමානසංවාස සීමාව ද උගුළුවා දමයි. සීමාවක් සම්මතකිරීමේදී: පළමු කොට සමානසංවාස සීමාව ද නැවත තිචීවරාවිප්පවාස සීමාව ද සම්මත කරයි. සීමාවක් උගුළුවන කල්හි: එයට විරුඬ කිසියම් උපසපන් භික්ෂූන් පස්නමක් හෝ ඊට වැඩිගණනක් සීමාව තුළ සිටියහොත් සීමා උගුළුවා දැමීම සිදු නොවේ. අනුරාධපුර මහාසීමාව උගුළුවන්ට **අභයගිරිකයෝ** පැමිණීවිට එහි ගුහාවක උපසපන් භික්ෂූන් සිටි බැවින් එය නොහැකි විය.

සීමාවක නිමිති හරිහැටි නොදන සීමාවක් උගුළුවාලීමට නොහැකියයි: දක්වා ඇතත්: සීමාබිම මඤ්චකප්‍රමාණ මණ්ඩල බෙදා ඒ එකමණ්ඩලයක භික්ෂූන් පස්නමක් හෝ සනමක් අත්පසගෙණ සිට සීමා උගුළුවාලීම කළහොත් ඒ මණ්ඩලවල සීමාව ඉගිලී යනබැවින් තමහට කැමති තරම් බිම් පෙදෙසක එසේ පැරණි සීමාව උගුළුවා දමා සීමාවක් සම්මත කරගතහැක. එවිට ඒ සම්මත කරගන්න සීමාවට හාත්පස ඇත්තේ පුරාණ සීමාවකි. එබැවින් විසේසයෙන් සීමන්තරිකයක් තැබියයුතු වෙයි.

අබඬ සීමාවන්ගේ උගුළුවාලීමක් නැත. ඒ ගාම – උදකුක්ඛෙප – සත්තබ්භන්තර සීමා අධිෂ්ඨාන කාලයෙන් පසු නැතිවී යති.

නදී – සමුද්‍ද – ජාතස්සර ආදියෙහි මධ්‍යමපුරුෂයාගේ උදකුක්ඛෙපයෙන් පිරිසුන් ප්‍රමාණය ‘උදකුක්ඛෙප සීමාව’යයි: සූත්‍රයෙහි දැක්වෙයි. උදකුක්ඛෙපය

**උදකුක්ඛෙපසීමා:** කරණවිට දිය වැලි එකට මිශ්‍රකොට උදකුක්ඛෙපය කරණනමුත් සූත්‍රයෙහි දැක්වෙන්නේ දිය පමණකි. දිය එතරම් දුරට වීසිකළ

නොහැකි. එබැවින් උදකුක්ඛෙපය සිවුරියන් පමණ වේයයි: කියයි. මේගැණ මතභේද පවතී. ඇතැම් ඇදුරුකෙනෙක් සූත්‍රයෙහි මධ්‍යමපුරුෂයා ය යි: කියනු විනා විස්තරයක් දක්වා නැත. අටුවාවෙහි ථාමමජ්ඣිම පුරිසය යි: දක්වයි. එවැනි අයෙක් උදකුක්ඛෙපය කරණවිට ලබාගැණීම දුෂ්කර ය යි කියත්. තව ඇදුරු කෙනෙක්: මධ්‍යම පුරුෂයා සතර රියන් පුරුෂයා ය යි කියත්. එවැනි කෙනෙක් සොයාගැණීම ද අපහසුය. සිවුරියන ගැණීමේදී ඒ රියන වඩුරියන ද, තමරියන ද, අත්වහර රියනක්දැ? යි: ද, යනු නොපවසත්. ඇතැම් කෙනෙක්: තුන්යොදුන් සීමාව: කෙස්ගහක් පමණ වත් අධික වූවහොත් අසීමාව වන්නාසේ: උදකුක්ඛෙපයේ ද පමණ නොදැනීම සුදුසුදැ? යි: විචාරත්. එය බුඩනියමය අනුව කළයුතු බැවිනි. එසේ හෙයින්: උදකුක්ඛෙපය නම්: මැනීමේ එක් ප්‍රමාණයකි. විනයකර්මයක් කරණු පිණිස කැපවූ තැනක දියටබට භික්ෂුව වටා උදකුක්ඛෙප සීමාවක් අදිටන් බෙලෙන් ඇතිවේ ය යි: ද විනයකර්මයෙන් පසු එය නැතිවී ය යි: ද කියත්. අන් ඇදුරුමතයක: ප්‍රමාණය ගැණීම කෙසේ හෝ වේවා: උදකුක්ඛෙපය කළ යුතු ම යයි: ද එසේ කිරීමෙන් ද සඞ්ඝයාගේ සීමාධිෂ්ඨානයෙන් ද උදකුක්ඛෙප සීමාව ඇති වන්නීයයි: දක්වත්.

අගාමකාරඤ්ඤයෙහි (ගමනොවූ විඣ්‍යාටවී වැනි මහවෙනෙහි) දෙපසින් සත් අබතුරක් මැදසිටි භික්ෂුවගේ හාත්පස තුදුස් අබතුරක් දිග - පලල ඇති පෙදෙස සත්තබ්භන්තර සීමා නම්. මෙහි: තිචීවරාවිප්පවාස බලය ද

**සත්තබ්භන්තරසීමා**:

ඇත. මෙහිදු උදකුක්ඛෙපයට කී ලෙසම: සූත්‍රයෙහි සත්තබ්භන්තර ය යි: දක්වීම විනා විස්තරයක් නොදැක්වූ හෙයින් ඒ අබතුර ගැණීම: සුගත් පමණින් ද, මැදුම් මිනිස් පමණින් ද, වහර විසින්දැ? යි: විමති සහිතය. ප්‍රඥප්තිය කෙස්ගහක් පමණවත් ඉක්මවූව හොත් එය විපත්තිකාරය. සියලු විනයකර්ම විපත්තියට පැමිණෙත්. එබැවින් බුදුරජාණන් වහන්සේගේ අදහස නොදැන සත්අබතුර

මැනැගැණීම නොකළහැකිය. අරඤ්ඤයට ගිය විනයකර්මයක් කරගණු කැමති භික්ෂූන්ගේ අධිෂ්ඨානය පරිදි සත්තබ්භන්තර සීමාව ඇතිවන්නී ය සි: ද, විනය කර්මාවසානයෙහි එය නැතිවන්නී ය සි: ද එක පක්ෂයක් කියයි.

කෙසේ නමුත් සත් අබතුර මැන අධිෂ්ඨාන කිරීමෙන් ම සීමාව ඇතිවන්නී ය යි: තවත් ඇදුරුපක්ෂයක් කියයි.

සියලු නදී- සමුද්‍ද- ජාතස්සරයෝ බද්ධසීමාවනට කොත් නොවෙත්. නදියේ ආරම්භයේ පටන් අවසානය තෙක් යම් කුඩා නදියෙක සඞ්ඝයා පිරී සිටී **නදීසීමා:** නම්: ඒ කුඩා නදියේ උදකුක්ඛෙපයක් කිරීමට ඉඩකුත් නො මැති නම්: එය නදී සීමාවය. සඞ්ඝයාට ඒ නදියෙහි හැඳ පෙරවූ සිවුරු සමග බැසසිටීමට අපහසුනම් ජල සාටිකාව හැඳගෙණ හෝ එහි බැස සඟකම් කළහැක. උදකුක්ඛෙප සීමාවක ද එසේ නදියෙහි බැසසිට සඟකම් කිරීම වරද නැත. නො පොහොනා තරම් දියෙහි අටල්ලක් බැඳ හෝ ඔරු- පාරු- අහුල්- නැව් ආදියක හිඳ හෝ සඟකම් කිරීම වටියි. කුඩා සමුද්‍ද- ජාතස්සරයන් හි ද එසේයි. කැණූ වැව්- පොකුණු ආදියෙහි සඟකම් කිරීම සුදුසු නැත.

එහෙත් දියෙහි උදකුක්ඛෙප සීමාවක ම හැර, නදී හෝ එවැනි දියසීමාවක සඟකම් කිරීම ගැණ ඇතැම් ඇදුරහු කැමැති නො වෙත්.

මහවෙනහි සත්තබ්භන්තර සීමා ලැබෙන අතර 'නිමිත්තූපග අරණ්‍යය' වැනි: කුඩා අරණ්‍යයක සඞ්ඝයා පිරී සිටීනම් එහි සත්තබ්භන්තර **අගාමකාරඤ්ඤ සීමා:** සීමාවක් උවමනා නැත. එය 'අරඤ්ඤසීමා' යයි: ගෙණ එහි සඟකම් කළ හැකිය යි: ඒක ඇදුරු මතයක් ඇතත්, අරණ්‍යයෙහි සත්තබ්භන්තර සීමාව හැර අරඤ්ඤසීමාවක් නැතැයි: ඇතැම් ඇදුරහු ඒමතයට පටහැණි වෙත්.

**අට්ඨකථාවෙහි:** මුහුදේ මසුන් ඇල්ලීමට නොයන තරම් දුර කුඩා දූපත් වැනි බිම් පෙදෙස් ද පොළොව යට ගුහා ද අහසෙහි දෙව්ලෝ ආදි තැන් ද අරඤ්ඤසීමා සඞ්ඛ්‍යාවට යෙත් ය යි: දක්වයි. එහෙත් ආගමක- අරඤ්ඤ යන දෙ සදින් අග සදවූ 'අරඤ්ඤ' සදින් අරඤ්ඤසීමාව ගත්කල අහසෙහි ඇති දෙව්ලෝ ආදියෙහි: අරණ්‍ය ගතියක් නැති හෙයින් 'අගාමක සීමා' නමින් ගැණීම යෙහෙකැයි ද කියත්. එවිට ගාම – ගාමූපචාර හැර ලැබෙන තිචීවරාවිප්පවාස බලයද සත්තබ්භන්තර සීමාවට මෙන් ලැබිය යුතුය.

උදකුක්ඛෙපාදි අධිෂ්ඨාන මාත්‍රයකින් ඇතිකර ගන්නා සීමා අතර 'ගාමසීමාව' ද: වෙයි. රට්ඨ- නගර- ජනපද සීමා ද ගාමසීමාවට ඇතුළත්ය. අන්‍ය සීමාව
**ගාමසීමා:** කින් සම්බන්ධ නො වූ පිරිසිදු ගමක් – රටක් හෝ නගරයක් සීමාවක් මෙන් අධිෂ්ඨාන කර ගෙණ විනය කර්මකරයි. එය 'ගාමසීමාව' ය. සඞ්ඝයාගේ අධිෂ්ඨානය අවසන්වූ පසු සීමාව ද අවසන්වන්නීය. මිහිඳු මහරහතුන් වහන්සේ විසින් භණ්ඩුක කුමාරයා පැවිදි කරවා උපසම්පදා කරණලද්දේ අනුරාධපුර ගාමසීමාවේය. ගාමසීමාවක විනයකර්මයක් කරණකාල ඒ ගමේ ඇති සියලු උපසපන් භික්ෂූන් අත්පසට ගෙන්වාගත යුතුය. ගම හෝ රට විසාලවූ පමණට එසේ භික්ෂූන් එක්තැන් කරගැණීම අපහසුය. එවැනි ගාම සීමාවක: විනයකර්මයක් කිරීමේදී කොතැනක හෝ, උපසපන් භික්ෂුවක් සිටිය හොත් කර්මය කෝප්‍යය වෙයි එහෙයින් ගාමසෝධනය කොට විනයකර්ම කළයුතුය.

සීමාවක් අන් සීමාවක් හා සම්භින්දන- අජ්ඣොත්ථරණ- සංකරවීමෙන් කර්ම කෝප්‍යය වෙයි. එහෙයින් අනුදූන වදාළ සීමන්තරිකාය සඞ්කරාදි දෝෂ පරි
**සීමාසංකර:** හාරය පිණිස වන්නා සේ ම: අන්තරිකා රහිත සීමාව දෙස් සහිතය. එහි විනය

කර්ම කිරීම සුදුසු නො වේ. භික්ෂුසඞ්ඝයාගේ සීමාවකින් භික්ෂුණීන්ගේ සීමාව ද, භික්ෂුණීන්ගේ සීමාවකින් භික්ෂු සඞ්ඝයාගේ සීමාව ද සංකර නො වේ.

අධිෂ්ඨාන මාත්‍රයකින් තාවකාලිකව වෙන්කරගත් එකට සම්බන්ධව පැවති ගාමසීමා දෙකක එකවිටම විනය කර්මයක් කළහොත් ඒ දෙකම අන්තරිකයක් නො මැතිව එකට සම්බන්ධවී තිබීම නිසා සංකර දෝසයෙන් නො මි දෙයි. උදකුක්ඛෙපාදි සීමාවන්ගේ අන්තරය පිණිස අන් උදකුක්ඛෙපයක් තබන්නා සේ එවැනි ගාමසීමාවකට අන් ගමක් අන්තරයක් ලෙස තැබීම සුදුසුය. තාවකාලික ගාමසීමාව ඒ හා සම්බන්ධවූ පිරිසුදු ගම සමග සම්බන්ධවීම නො වැලැක්විය හැක. එමෙන් තුන්යොදුන් මහාබඩසීමාව හාත්පස ඇති ගම් හා සම්බන්ධය වැලැක්වීම උගහටයයි කියයි. ඒ ගැණ මතභේදයක් පවතියි.

විජාතීය වූ නදී- සමුද්ද- ජාතස්සර සීමා: ගාමසීමාව සමග ද, ගාමසීමා:- නදී- සමුද්ද- ජාතස්සර සීමා සමග ද සංකර දෝසයට නො පැමිණෙත්. අරඤ්ඤසීමාව: 'නදී' ආදි සීමාවන් සමග ද, ගාමසීමාව සමග ද සම්බන්ධ දෝස යෙන් ඉවතය. මේ කියනලද නදී ආදී සීමා උදකුක්ඛෙප යක් නොලද නදිය පුරා සඞ්ඝයා පැතිර සිටි කුඩා නදී- අරඤ්ඤ ආදිසීමාවෝය. නදීජලය පැතිර සිටියේ ද, අරණ්‍යය පවත්නේ ද ගමපිළිබඳ භූමියේ ය. නමුත් ගම හා නදිය ද, ගම හා අරණ්‍යය ද දෙකකි. එහෙයින් ඒකී භාවයක් නැත.

බද්ධසීමාවක්: අන්‍යබද්ධසීමා-- ගාමසීමාවන් සමග ද, නදී- උදකුක්ඛෙපාදි සීමාවන් සමග ද ගස්- මූල්- වැල්- රැහැන් ආදි බාහිර දෙයකින් ඔවුනොවුන් සම්බන්ධවීම: සංකරාදි දෝසවලට හේතුවෙයි. පොළොව යටින් ඇතිවන මූල් පඨවිගතික වන අතර කාණුපයිප්ප- විදුලිකම්බි- ජල නළ ආදිය පඨවිගතික නොවන බව සැලකිය යුතුය. ගල්- පස්- වැලි පඨවිගතිකය.

**උදකුක්ඛෙපසීමාවක්:** බද්ධ- ගාම- නදී- අරඤ්ඤ- සත්තබ්භන්තර සීමාවන් සමග ද, අන්‍ය උදකුක්ඛෙප සීමාවක් සමග ද ගස්- වැල්- ඒදඬු- පාලම් කිසිවකින් සම්බන්ධ වුවහොත් සංකර දෝෂය ඇති වෙයි. ඔරු- පාරු- අටලු ආදියක් අටවා නදියෙහි උදකුක්ඛෙප සීමාවක් ඇතිකර ගත්විට ඒ ඔරු- පාරු- අටලු ගඟ දියෙන් ගසාගෙණ යාම වලක්වා ගැණීමට කඹ රැහැන් ආදියකින් ඒවා බැඳ ගං ඉවුරෙහි හෝ ගංඉවුරෙන් බැහැර හෝ ගසක - කණුවක බැඳතැබීම විපත්තිකරය. ගඟතුළ ඇති ගස් ආදියක බැඳ තැබීම වටියි.

විනයකර්මයක් කිරීමට ආරම්භකිරීමේදී සඞ්ඝයා රැස්ව ඇති සීමාව: ගස්- වැල් ආදි බාහිර දේවලින් සම්බන්ධවී ඇතිදැයි: සොයා බලා ඒ තැන් සෝධනය

**සීමාසොධන:** කළයුතු. ඡන්දය ලබාගැණීමට සුදුසු භික්ෂූන්ගෙන් ඡන්දය ගැණීම ද සීමාවතුළ පැතිර සිටින සියලු භික්ෂූන් අත්පසට ගෙන්වා ගැණීම ද සෝධනයයි.

# බද්ධසීමාසම්මති

බුද්ධනියමය අනුව ගාම - නගර - ජනපද ආදියට අයත් සුදුසු භූමිභාගයක බද්ධසීමාවක් සම්මත කරයි. බුද්ධකාලයේදී රජගහනුවර සම්මතකළ මහාබද්ධසීමාවට: විහාර අටළොසක් හා ගාම- ගාමූපචාර ද ඇතුළත් වූහ.

මහාසීමා: එසේ සඞ්ඝයාට අයත් වූ ද නො වූ ද භූමි භාග ඇතුළත්කොට යොදුන් ගණන් දිග-පළල ඇතිව සම්මතකරණලද නමුත් සඟකම් කිරීමේදී සීමා සෝධන ආදි කටයුතුවල පහසුව පිණිස: මහාසීමාව තුළ ද එයින් බැහැර ද ඛණ්ඩසීමා නම් කුඩාසීමා සම්මත කරගත්හ. එහිදී සඞ්ඝ පරිභොගයට සුදුසු කැප- සරුප් භූමි ප්‍රදෙශ වල ම සීමා සම්මත කොට ඇතිබව පෙනේ.

මෙකල දහ-පහළොස් රියන් පමණ වූ ද ඊට අඩු- වැඩි වූ ද බද්ධසීමා සම්මත කරත්. එසේ බද්ධසීමාවක් සම්මත කරගැණීමේ දී ආරාමයේ අසුන්හල්- බොජුන්හල්- පිළිමගේ ආදි සඞ්ඝයා රැස්වන ස්ථානවලින් බැහැර, අසුන් හල් ආදිය නැති නම්: ඒවා තනාගැණීමට ඉඩ තබා විවේක සුදුසු බිම නියමකොට ගෙණ පිටත හා සම්බන්ධවී ඇති ගස්- වැල්- මූල් ආදිය සිඳදමා, රැහැන්- ලී- බැම් තාප්ප ආදි දෙයකින් සම්බන්ධවී ඇති නම්: ඒවාද ඉවත් කොට, කඳුගැට- කැලෑගස් ඇත්නම් ඒ සියල්ල ඉවත්කර බිමසමතලා කොට: ඒ භූමිභාගය පැරණි සීමාවලට සම්බන්ධවී ඇත හොත් එය ඉවත්කරණු පිණිස සීමා සමූහනනය (සීමා උගුළුවීම) කරයි.

ඒකසීම විහාරයක සීමාසමූහනනය කරණකල "ලෙඩ්ඩුපාතයක ප්‍රමාණයේ පටන් සීමා සමූහනනය කල යුතු ය යි: සඳහන්ව ඇතත් මෙකල සීමාව සම්මත කරගන්නා බිමට වඩා අඩි කීපයක අතරක් ගෙණ සීමා සමූහනනය කරයි. ඒ සීමා සමූහනනය කිරීමේදී

ගාමසෝධනය කරණ නමුත් සමූහනනය කරන්නේ සීමාවක් බැවින් එයට ගාමසෝධනයත් උවමනා බව නො දක්වෙයි. එබැවින් සීමා සම්මතකිරීමට මාස හෝ දින කීපයකට කලින් වුවත් සඞ්ඝයා රැස්කරගැණීමට පහසු දිනක සීමා සමූහනන ය කොට බිම පිරිසිදු කොට තබාගත් පසු ජනසඤ්චාරය නැති පහසුවේලාවක සඞ්ඝයා රැස්කර ගෙණ ගාම සෝධනය කොට පැය බාගයකින් පමණ සීමා සම්මතය කළහැක.

ඒ සීමාසම්මත විනයකර්‍මයට රැස්වන සඞ්ඝයාට අව්‍ව-සුළං- වැසි- පිනි ආදියෙන් ඇතිවන පීඩා වලක්වා ගැණීම පිණිස ආවරණයක් කරගැණීමට උවමනා නම් සීමාව සම්මතකරණ බිමෙහි කණු- ලී ආදි කිසිවක් නොසිටුවා ඒ බිම මැදිකොට පිටතින් ලී සිටුවා මඩුවක් සාදගැණීම හෝ වියනක් දමාගැණීම කළහැක. ඒ හැර පිටතට සම්බන්‍ධ නොවන ලෙස සීමාසම්මත කරණ භූමිය තුළ පමණක් ලී සිටුවා ආවරණයක් ද කරගැණීමට ඉඩ ඇත. එහි ලී-රැහැන් ආදි කිසිවක් පිටත හා සම්බන්‍ධ නොවිය යුතුය.

මෙකල ලක්දිව පමණක් නොව: සමහර අබෞද්‍ධ රටවල පවා වනගත පෙදෙස් එළිකිරීමේදී ද, පොළොව කැණීමේදී ද හමුවන බෞද්‍ධ පුරාවස්තු ගැණ සලකන විට බුඞසාසනය පැතිර පැවැතීමේ සීමාවක් ගැණීම දුෂ්කර ය. එබැවින්: ඒ ඒ කාලයන්හි බන්‍ධනය කරණලද යොදුන් ගණන් දිග - පලලවූ ද ඊට කුඩාවූ ද බඩසීමාවලට සීමාවක් සම්මතකරගැණීමට බලාපොරොත්තුවන භූමිභාගය යටවී ඇතිදැ? යි: නිශ්චය නො කළහැකි බැවින් කොතනක හෝ කවර රටක හෝ සීමා බන්‍ධනයක් කරණවිට පෙර පැවතුනැ යි: සලකන සීමා උගුළුවා දැමීම පිණිස සීමා සමූහනනය කොටම සීමාබන්‍ධනය කරණු වටියි.

සීමා බන්‍ධනය කරණ අවස්ථාවෙහිදී සංකරාදි දෝෂයන් ඇතිවුව හොත් ඒ සීමාව සම්පූර්ණයෙන් අසීමාව වෙයි. එබැවින් ඉතා පිරිසිදුව ම සීමාබන්‍ධනය කළයුතුය. එය කළ පසු බාහිර යම් ගස් ආදියක් සම්බන්‍ධවීමකින් වන සංකරාදි දෝෂයක් ඇතිවුවහොත් එය ඉවත්කළ පසු සීමාව පිරිසුදු වෙයි.

මෙකල බොහෝ ස්ථානවල සීමා සමූහනනය හා, සීමා සම්මතය ද එකදිනකදීම සිදුකරයි. පළමුකොට සීමාබන්ධනය ගැණ පළපුරුදු විනයධර තෙරුන් සමග සාකච්ඡාකොට දින වේලාවල් නියමකරගෙණ සමීප විහාරස්ථ සමානසංවාසක සියලු භික්ෂූන්ට ඒ සීමාබන්ධන විනයකර්මයට පැමිණෙන ලෙස ආරාධනාකරයි.

සීමා සම්මතය කරණ අවස්ථාවේදී බැහැරින් උපසපන් භික්ෂූන්ගේ ගම්වැදීම වලක්වාගණු පිණිස සියලු සංඝයා වෙත පුවත්පත්- ලියුම්- කියුම්වලින් සීමාබන්ධනය කරණ දින වේලාවත් දන්වයි.

සීමා සම්මතය කරණ වේලාවේදී: ග්‍රාමභෝජක- ගම්මුදලි- ආරච්චි- ග්‍රාමසේවක යන මූලාදෑනි වසම්වලින් සම්මතකිරීමට බලාපොරොත්තුවන සීමාවට අයිති ගම සුඞකරගන්නේ යම්මූලාදෑනි වසමකින් නම්: ඒගමට අයිති සියලු විහාරස්ථානවල උපසපන් භික්ෂූහු ඒස්ථානයට හෙවත් සීමාසම්මත විනයකර්මය කරණ සඞ්ඝයාගේ අත්පසට පමුණුවා ගණී. එසේපැමිණිය නොහැකිතරම් රෝගපීඩාදි අපහසුකමක් ඇති භික්ෂුවක් වෙයි නම් ඒ භික්ෂුවගෙන් ඡන්දය ලබාගැණීම කරයි. ඡන්දයත් නොලැබේනම්: ඒ ඒ විහාරස්ථානවල ඇති බඞසීමා තුළට වී සීමාසම්මතය කරණ තෙක් ඒ භික්ෂූන්ට බැහැර නොගොස් සිටින සේ දන්වයි.

එසේත් සිටිය නොහැකිනම් හෝ, බඞසීමාවක් නැත්නම් හෝ ගමෙන් ඉවත්වී සිටිනලෙස නියමකරයි. ගඟක් හෝ මුහුදක් ඇත්නම් ඔරු - පාරුවකටවී හෝ සිටිය හැක.

ඉන්පසු: වාහනවලින් හා පයින් ගමන්කරණ භික්ෂූන් වහා සීමා බන්ධනස්ථානයට ගෙන්වා ගැණීම පිණිස ද, එසේ නො පැමිණෙන භික්ෂූන්ගේ ගම් වැදීම වලක්වනු පිණිස ද පාලම්- මං හන්දි- ගංතොට ආදි ගමට ඇතුල්වන තැන්වල අනුපසම්පන්නයන් හෝ සැදැහැ ඇති උපාසකයන් සඞ්ඝාඥාපත්‍රයක් ද දී රැකවල් පිණිස නවත්වයි. ඔවුන්ට: පිටතින් ගමතුළට එන උපසපන් සඟනමක් හමුවුවහොත්: ඒ භික්ෂුවට සඞ්ඝාඥාපත්‍රය පෙන්වා සීමා සම්මත විනය

කාම්යට ඉක්මණින් පැමිණ සම්බන්ධවන ලෙස ද, එසේ නොහැකිනම් එය අවසන්වනතුරු ගමට ඇතුල් නො වන ලෙස ද ඉතා කරුණාවෙන් දන්වනලෙස කියයි.

මෙසේ රැකවල්තබා: සීමා සම්මතය කරණ භූමියේ මධ්‍යචකප්‍රමාණ මණ්ඩල: ලණු ආදි රැහැණින් හෝ, හුණුදිය ආදි පාටක් ඇති දියරක් වත්කිරීමෙන් හෝ විසමව සිටිනසේ මණ්ඩල බෙදා, ලකුණු කොට ඒ එකමණ්ඩලයක් තුළ අඩුවසයෙන් භික්ෂූන් පස්නමක් හෝ, වැඩිගණනක් හෝ අත්පස ගෙණ සිටුවා පළමුකොට තිචීවරාවිප්පවාස සීමා සමූහනන කම්වදන් ද නැවත සමාන සංවාස සීමා සමූහනන කම්වදන් ද අස්වා සීමා සමූහනනය කරයි.

ඇතැම් ඇදුරුකෙනෙක්: මධ්‍යචකප්‍රමාණ මණ්ඩල නොබෙදා, විනයකාමීයට රැස්ව ඇති සඞ්ඝයා: සීමා සම්මතයට සකස්කළ භූමියේ මූළු පෙදෙසක එකපෙළට පස්නම බැගින් හෝ එයට වැඩිව හෝ සිටුවා, එසේ සිටි සඞ්ඝයාගෙන් පිරී ඇති ප්‍රමාණ මණ්ඩල බෙදා ලකුණු කරගෙණ ද කම්වදන් අස්වති. සීමා සම්මතය කරණ භූමිය පුරා සිටීමට තරම් සඞ්ඝයා ඇත්නම්: මණ්ඩල උවමනා නැත. එකවරට ම සීමා සමූහනනය කළහැක.

ඇතැම් තැනෙක: නිමිත්තපාසාණ කලින් සිටුවාගෙණ ඒ අතර පැකිලෙමින් මණ්ඩලවලට මාරු වෙමින් ද, තවත් තැනෙක: දියපිරවීමට හා නිමිත්තපාසාණ සිටුවීමට වල් සාරාගෙණ මණ්ඩලවලට මාරුවන අතර, ඒවා තුළ පතිත වෙමින් ද කම්වදන් අස්වත්. සමූහනනයට පෙර නිමිත්ත පාසාණ සිටුවීමක් ගැණ සීමාබන්ධනය කියා ඇති තැන්වල සඳහන්ව නැත. කෙසේවුවත්: පරිච්ඡේදය ගතයුත්තේ සමූහනනයෙන් පසුව බැවින් ද, සීමාසම්මතය කරණ මූළු භූමියම සඞ්ඝයාගේ පාදසපශීය ලැබීම සුදුසු හෙයින් ද සමූහනනයෙන් පසු **'නිමිත්තපාසාණා ඨපෙතබ්බා'** යනු දක්වා ඇති හෙයින් ද සීමාසමූහනනයකොට නිමිත්ත සම්පාදනය යහපත්වනු ඇත.

කියනලද ආකාරයෙන් සීමා සමූහනනය කොට නිමිතිවලට ගණුලබන්නේ පාසාණ නම්: අඩිදෙකක් දෙකාහමාරක් පමණ දිග, අඟල් 6ක් හෝ ඊටමඳක් අඩු වැඩිව හෝ මහතඇති කලින් සපයා තුබූ නිමිත්තූපග

පාසාණ: සඞ්ඝයාට කැමති සේ සීමාභූමියේ දිග - පළල ගෙණ ඉතා අඩුවෙන් අඩියක් හෝ ඊට වැඩියෙන් හෝ බිමින් මතුකොට අට දිසාවෙහි සිටුවා, ඒ පාසාණවලට කෙළින් මඩුවක ප්‍රමාණයක් හෝ ඊට අඩුව හෝ දුරින් සීමන්තරිකා පාසාණ ද සීමාඋගුළුවාලූ භූමිය තුළම සිටුවා: පළමුකොට විනයධර භික්ෂුව විසින් **'පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං'** යනුවෙන්: පළමුවෙන් පෙරදිග නිමිත්ත කීර්තනය කොට: ක්‍රමයෙන් දක්ෂිණාවතීව ගමන් කරමින් අනික් සත්දිග නිමිති ද කීර්තනය කොට නැවතත් පෙරදිග නිමිත්ත වෙතට පැමිණ **'පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං'** යි: පළමු කීර්තනය කළ පෙරදිග නිමිත්ත ම නැවතත් කීර්තනය කොට නිමිත්තෙන් නිමිත්ත ගළපා තැබිය යුතු. මෙසේ තෙවරක් නිමිති කීර්තනය කොට අවසන් වූ පසු: ඒ කීර්තිත නිමිති මැද සඞ්ඝයා රැස්ව හිඳ ප්‍රථමයෙන් සමානසංවාස සීමාව ද, දෙවනුව තිචීවරාවිප්පවාස සීමාව ද සම්මත කරයි. සීමා සම්මතය අවසන් වූ කෙණෙහි නිමිත්ත පාසාණයන්ගේ ඇතුල් පැත්ත කෙළින් මැද පිහිටි භූමිභාගයේ ජලපොළොව තෙක් බුද්ධාඥවෙන් බද්ධසීමාව පිහිටයි. නිමිත්ත පාසාණ: සීමාවෙන් බැහැර වෙයි. සීමා සම්මතය අවසන්වූ පසු: සක්- බෙර- ඝණ්ඨා ආදියෙන් ශබ්ද පවත්වා රැකවලට ගියවුන්ට විනයකර්මීය නිමාවට ගිය බව දන්වයි.

නිමිති ගැණීමේදී සමහර ස්ථානයක වල් සාරා එහි බඳුන්වලින් ජලය ගෙණැවිත් පුරවා උදක නිමිත්තෙන් සීමා සම්මත කොට නැවත ඒ වල්තුළ පාසාණ පිහිටුවයි. ඒ ජලය සීමා සම්මත කම්වදන් උදෙසා නිමවන තුරු පැවතිය යුතුය. වැලිපොළොව වැනි ඉක්මණින් දිය සිඳෙන තැන්වල සීමා සම්මත කම්වදන් උදෙසීමට ඇරඹූ පසු වරින්වර ඒ වල්තුළ දිය වත්කිරීම සුදුසු නොවේ. වළෙහි කොළ ආදියක් අතුරා දියසිඳීම වැළැක් වීම ද, බඳුන්වල දිය තබා නිමිති ගැණීම ද නො කළ යුතු ය. නිමිති කීර්තනයෙන් පසු ඒ වල්තුළ නිමිති දූනගැණීමට තිරලෙස පාසාණ පිහිටුවයි. සමහරවිට නිමිත්තේ ඇතුල්පැත්ත කෙළින් පොළොවෙහි සීමාව පිහිටන බැවින් ජලය පිහිටා ඇති භූමියට අඟල් කීපයක් හෝ පිටතට ගෙණ පාසාණය පිහිටුවීම කළහොත් සම්මත නොවූ බිමින් කොටසක් සීමාබිමට එකතුවිය හැක. එබැවින් ඉතා පරීක්ෂාවෙන් එය කළ යුතු ය.

**නිමිති පිළිබඳව:** වන නිමිත්තෙහි **'හෙට්ඨිම පරිච්ඡෙදෙන චතු පඤ්ච රුක්ඛමත්ත'මපි';** රුක්ඛ නිමිත්තෙහි: **'අන්තමසො උබ්බෙධතො අට්ඨඞ්ගුලො සූචිදණ්ඩප්පමාණො'පි';** පාසාණ නිමිත්තෙහි: **'අයගුළො'පි: පාසාණසඞ්ඛ'මෙව ගච්ඡති;** වම්මික නිමිත්තෙහි: **'තං දිවස ජාතො අට්ඨඞ්ගුළුබ්බෙධො';** උදක නිමිත්තෙහි: **අන්තමසො සූකරඛතාය'පි - තං ඛණඤ්ඤෙ'ව පඨවියං ආවාටං ඛත්වා කූටෙහි ආහරිත්වා පූරිතඋදක'මපි'** (සපා – 776); යතුවෙන් **'අන්තමසො** = යටත්පිරිසෙයින්' ගතයුතු නිමිති දක්වන අතර වල් සාරා දිය පුරවා ගන්නා ලද උදක නිමිත්ත ද දක්වා ඇත. නිමිත්ත උවමනාකරන්නේ යටට නොව මතුපිට පිරිසිදීම දැනගණු පිණිස ය.

පාසාණ නිමිත්තෙහි: **'අයගුළො'පි පාසාණ සඞ්ඛ'මෙව ගච්ඡති. තස්මා යො කොචි පාසාණො වට්ටති'** (සපා – 774); **'සීමන්තරිකපාසාණා කිත්තෙතබ්බා'; 'නිමිත්තුපග පාසාණෙ ඨපෙත්වා නිමිත්තානි කිත්තෙතබ්බානි'** (සපා – 778); **'තං බද්ධනෙනහි සීමාමාලකස්ස සමන්තා නිමිත්තුපග පාසාණා ඨපෙතබ්බා'; 'සමන්තා එසො පාසාණො නිමිත්ත'න්ති එවං නිමිත්තානි කිත්තෙත්වා කම්මවාචාය සීමං සම්මන්නිතබ්බා'; බහි සීමන්තරික පාසාණා ඨපෙතබ්බා'** (විම - 22); යනාදීන් බොහෝ තැන්වල **'පාසාණ නිමිත්ත'** ගරු වසයෙන් දක්වා ඇත. පොළොන්නරු පුරාණ බද්ධසීමා වෙහි ද පාසාණ නිමිති පිහිටුවා ඇති බවපෙනෙයි.

එහෙයින් සුදුසු නිමිත්තක් සම්පාදනය කරගෙණ බද්ධසීමා සම්මතකරණුවටියි.

නිතර භික්ෂූන්ගේ ගැවසීම පවතින නගරවල ගාම–සෝධනය කරගැණීම අපහසුබැවින් රජයලවා වෙනම ගමක් ලෙස බිම් පෙදෙසක් වෙන් කරවාගෙණ එහි දූ බද්ධසීමා සම්මත කරගණීයි. එය **විසුංගාම සීමාව** ය.

මෙසේ එකොළොස් විපත්ති සීමාවන්ගෙන් තොරව. නිමිත්ත – පරිස – කම්මවාචා යන ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්තව සම්මතකළ බද්ධසීමාව සම්බුද්ධ ශාසනයේ ප්‍රතිෂ්ඨා ස්ථාන ය යි.

———

# ලකුණු හැඳින්වීම.

**අදී** – අභිධානප්පදීපිකා (වස්කඩුවේ ශ්‍රී සුභූති නායක මහා ස්ථවිරපාදයන් වහන්සේගේ සෝධනය)

**අචි** – අභිධානප්පදීපිකා සූචි (ව-ශ්‍රී-සු-නා-සෝ)

**අටී** – අභිධානප්පදීපිකාටීකා (ව-ශ්‍රී-සු-නා-සෝ)

**උබ** – උපග්‍රන්ථය බලනු.

**කපි** – කඞ්ඛාවිතරණී පිටපොත (කාලුකොඳයාවේ පඤ්ඤාසේඛර මහානායක ස්ථවිර පාදයන් වහන්සේගේ සෝධනය 1936 මුද්‍රිත)

**කම** – කම්මවාචා (ඉඹුලමූරේ ධම්මමූර්ති ස්ථවිරයන් වහන්සේ 1955 – මු)

**ඛවි** – ඛන්ධක විනය (පණ්ඩිත හේන්පිටගෙදර ඤාණසීහ ස්ථවිරයන් වහන්සේ – ආචාර්ය හේන්පිටගෙදර ඤාණාවාස ස්ථවිරයන් වහන්සේ 1966 – මු)

**කවි** – කඞ්ඛාවිතරණී – මාතිකට්ඨකථා (හේවාවිතාරණ)

**පාග** – පාතිමොක්ඛගණ්ඨිදීපනී (ගුණරතන ස්ථවිරයන් වහන්සේ 1890 – මු)

**පාටී** – පාලිමුත්තක විනයවිනිච්ඡය සඞ්ගහටීකා (කහඳමෝදර සිරිපඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ 1908 – මු)

**පාමු** – පාලිමුත්තක විනයවිනිච්ඡය සඞ්ගහ (දෙ: පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ – ප: විමලධම්ම නායක ස්ථවිරයන් වහන්සේ – වේ: අමරමොලි නායක ස්ථවිරයන්වහන්සේ 1930 – මු)

**පාරා** – පාරාජිකා පාලි (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා)

**මඋ** – මහාවග්ගපාළි උපොසථක්ඛන්ධක (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා)

**මස** – මහාවග්ග (සද්ධාතිස්ස ස්ථවිරයන්වහන්සේ 1933-මු)

**මහා** – සිංහලමහවග (පණ්ඩිත අහුන්ගල්ලේ විමලකිත්ති තිස්ස මහානායක ස්ථවිරයන් වහන්සේ 1965 – මු)

**වබු** – වජිරබුද්ධිටීකා (බුරුම අකුරු පොත)

**විකෝ**– විනය කෝෂය (පණ්ඩිත මොරටුවේ සාසනරතන ස්ථවිරයන් වහන්සේ 1955 - මු)

**විගැ** – විනය ගැටපදය (වේරගොඩ අමරමෝලි ස්ථවිරයන් වහන්සේ 1944 – මු)

**විටී** – විනයාලංකාර ටීකා

**විනි** – විනය විනිශ්චයව්‍යාඛ්‍යානය (පණ්ඩිත තලල්ලේ ධම්මානන්ද නායක ස්ථවිරයන් වහන්සේ 1956 – මු)

**විම** – විනයත්ථ මඤ්ජූසා = කඞ්ඛාවිතරණීටීකා (යූ. පී. ඒකනායක පඬිවර 1912 - මු)

**විමු** – විනයමුට්ඨිනයප්පකාසිනී

**විල** – විනයාලඞ්කාර (පාණදුරේ ඤාණවිමලතිස්සනායක ස්ථවිරයන් වහන්සේ බු: ව: 2444 – මු)

**විවි** – විමති විනෝදනී = විනයට්ඨකථාටීකා (බෙරතුඩුවේ ධම්මාධාරතිස්ස මහාස්ථවිරයන් වහන්සේ 1935–මු)

**විසු** – විසුද්ධිමග්ග (හේවාවිතාරණ)

**සපා** – සමන්තපාසාදිකා = විනයට්ඨකථා (හේවාවිතාරණ)

**සස** – සමන්තපාසාදිකා සන්නය (පුස්කොළපොත)

**සාදී** – සාරත්ථදීපනී = විනයට්ඨකථා ටීකා (පුස්කොළ පොත)

**සීද** – සීමානයදප්පන (රන්දොඹේ ධම්මාලඞ්කාර මහානායක ස්ථවිරපාදයන්වහන්සේ බු: ව: 2428 – මු)

**සීදී** – සීමාලක්ඛණදීපනී (ආචරිය විමලසාර මහානායක ස්ථවිරපාදයන් වහන්සේ බු: ව: 2424 – මු)

**සීවි** – සීමාවිසොධනී (පුස්කොළ පොත)

**සීල** – සීමාලඞ්කාර සඞ්ගහ (ආචරිය බුද්ධසිරිතිස්ස මහා ස්ථවිර පාදයන්වහන්සේ 1904 – මු)

**ශසෝ** – ශබ්දසෝම මහානිධි

**ශ්‍රීසු** – ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය

# පටුන


| | පිටුව |
|---|---|
| උපෝසථ නිදාන | 1 |
| සමානසංවාස සීමා සම්මති | 5 |
| මහාසීමා සම්මති | 6 |
| නදීපාර සීමා සම්මති | 7 |
| උපෝසථාගාර සම්මති | 8 |
| උපෝසථාගාර පමුඛ සම්මති | 10 |
| තිචීවරාවිප්පවාස සම්මති | 11 |
| තිචීවරාවිප්පවාස සීමා සමූහනන | 13 |
| සමානසංවාස සීමා සමූහනන | 14 |
| සමානසංවාස ඒකූපෝසථ සීමා | 15 |
| සත්තබ්භන්තර සීමා | 16 |
| උදකුක්ඛෙප සීමා | ,, |
| සීමා සම්භින්දන | ,, |
| සීමා අජ්ඣොත්ථරණ | 17 |
| සීමන්තරික | ,, |
| එකොලොස් විපත්තිසීමා | 18 |
| සීමා භේද | 19 |
| බද්ධසීමා | ,, |
| අබද්ධසීමා | 20 |

| | පිටුව |
|---|---|
| ත්‍රිවිධ සමපත්ති | 21 |
| අටවැදෑරුම් නිමිති | 22 |
| පබ්බත නිමිත්ත | ,, |
| පාසාණ ,, | 23 |
| වන ,, | 24 |
| රුක්ඛ ,, | 25 |
| මග්ග ,, | ,, |
| වම්මික ,, | 26 |
| නදී ,, | 27 |
| උදක ,, | 28 |
| නිමිත්ත කීර්තන | ,, |
| සීමා භූමිසටහන් | 31 |
| සීමා බන්ධන | 32 |
| ඛණ්ඩසීමා | 33 |
| සමානසංවාස මහාසීමා | 39 |
| තිචීවරාවිප්පවාස මහාසීමා | 41 |
| ඒකසීම මහාවිහාර | 43 |
| සීමවිහාර | 44 |
| විහාරසීමා | ,, |
| නදීපාරසීමා | 45 |
| සීමන්තරික විධාන | 48 |

| | පිටුව |
|---|---|
| සීමා සමූහනන | 50 |
| ගාමසීමා | 52 |
| විසුංගාම සීමා | 54 |
| අගාමකාරඤ්ඤ සත්තබ්භන්තර සීමා | 58 |
| නදී-සමුද්ද-ජාතස්සර උදකුක්ඛෙප සීමා | 62 |
| උදකුක්ඛෙප සීමා | 71 |
| සීමා සංකර | 75 |
| සීමා සෝධන | 89 |
| කම්ම කොපෘයවීම | 91 |
| විසේස සීමා | 94 |
| උපග්‍රන්ථය | 99 |
| සීමාභූමි සටහන් | 113 |
| අනුක්‍රමණිකා | 121 |

# සීමා විනිශ්චය

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

---

## උපොසථ නිදාන

"තෙන ඛො පන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති: ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා, ධම්මං භාසන්ති. තෙ මනුස්සා උපසඞ්කමන්ති: ධම්මස්සවණාය. තෙ ලභන්ති: අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු පෙමං. ලභන්ති: පසාදං. ලභන්ති: අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පක්ඛං...............;[1]= එසමයෙහි* වනාහි භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ රජගහනුවර සමීපයෙහි වූ ගිජුකුළු පව්වෙහි වැඩවසන සේක. එසමයෙහි වනාහි අන්තොටු පිරිවැජියෝ පක්‍ෂය පිළිබඳ තුදුස්වක් – පසළොස්වක් – දින යන්හි හා අටවක් දිනයන්හි ද රැස්ව ('අසවල් අසවල් දිනවල, අසවල් අසවල් මුහුර්තවලදී මෙනම් මෙනම් දෙය

---

1. මඋ: 249, * උබ:

කළ යුතුය, නො කළ යුතුය' යි:1) ඔවුන්ගේ ධර්මය කියා දෙත්. මිනිස්සු. ඒ දහම් ඇසීමට ඔවුන් වෙත එළඹෙත්. (එයින්) ඔවුහු අන්තොටු පිරිවැජියන් කෙරෙහි ප්‍රේමය ලබත්. ප්‍රශාදය ලබත්. අන්තොටු පිරිවැජියෝ (තමනට) පක්ෂවීම ලබත්..........;"

එකල මගධ දේශාධිපති බිම්සර රජහට මෙවැනි අදහසක් උපන: අන්තොටු පිරිවැජියෝ තුදුස්වක් - පස ළොස්වක් - අටවක් දිනයන්හි රැස්ව ඔවුන්ගේ ධර්මය කියා දෙත්. මිනිස්සු: ඔවුන්ගේ දහම් ඇසීමට එළඹෙත්. එයින් මිනිස්සු අන්තොටු පිරිවැජියන් කෙරෙහි පහදිත්. අන් තොටු පිරිවැජියෝ මිනිසුන්ගේ පක්ෂවීම ලබත්. එබැවින් අපගේ ආයෂ්‍යයන් වහන්සේලා ද: තුදුස්වක් - පසළොස්වක්- අටවක් දිනයන්හි රැස්වුව හොත් යෙහෙක: කියායි.

එකල: බිම්සර රජ: භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ: ඒ අදහස උන්වහන්සේට මතක් කළේය. ඉක්බිති භාග්‍ය වතුන් වහන්සේ මෙම නිදානයෙහි ලා භික්ෂූන් අමතා:

**"අනුජානාමි: භික්ඛවෙ! චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිතු' න්ති**[2] = මහණෙනි! පක්ෂය පිළිබඳ තුදුස්වක් - පසළොස්වක් - අටවක් දිනයන්හි රැස්වන්ට අනුදනිමි'යි:" වදාළහ.

එකල භික්ෂූහු: මේ ප්‍රඥප්තියෙන් පසු තුදුස්වක්-පසළොස් වක්-අටවක් දිනයන්හි රැස්ව නිශ්ශබ්දව හිඳිත්. මිනිස්සු: දහම් ඇසීමට භික්ෂූන් වෙත එළඹෙත්. එසේ එළැඹියාහු: නිශ්ශබ්දව හිඳින භික්ෂූන් දැක: 'ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ මහ ඌරන්[3] මෙන් නිශ්ශබ්දව හිඳිති' යි: දෙස්කීහ. භික්ෂූහු ඒ දෝසාරෝපන කථාව: භාග්‍යවතුන්වහන්සේට දැන්වූහ.

---

1. විශු: 218, 2 මළ: 249,
3. මළ: ගොළු ඌරන් 251, මකා: මිගසූකරා 117,
 විම: ගොළුවන් ඌරන් 167,
 සස: මහළුඌරන්
 සපා: මූග සූකරාති - ථූලසරීරසූකරා 772*

**"අනුජානාමි: භික්ඛවෙ! චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා ධම්මං භාසිතු'න්ති[1]**= මහණෙනි! පක්ෂය පිළිබඳ තුදුස්වක්-පසළොස්වක්--අටවක් දිනයන්හි රැස්ව දහම් දෙසන්ට අනුදනිමි'' යි: වදාළහ.

නැවත භාග්‍යවතුන් වහන්සේට: 'මාවිසින් භික්ෂූන්ට යම් සිකපද කොනෙක් පනවන ලද්දාහු නම්: ඒ සිකපද භික්ෂූන්ට පාමොක් උදෙසිම් කොට අනුදන්නෙම් නම්: යෙහෙකැ'' යි සිත්වී:

**"අනුජානාමි: භික්ඛවෙ! පාතිමොක්ඛං උද්දිසිතු'න්ති[1]**= මහණෙනි! පාමොක්* උදෙසන්ට අනුදනිමි'' යි: මහණෙනි! මෙසේ පාමොක් උදෙසිය යුතුය: ව්‍යක්ත – ප්‍රතිබල* භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දැන්වියයුතු.

**"සුණාතු: මෙ භන්තෙ* සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො: උපොසථං කරෙය්‍ය. පාතිමොක්ඛං උද්දිසෙය්‍ය. කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං –පෙ– ආවිකතාහිස්ස ඵාසු හොති[1]**= වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට ප්‍රාප්තකාලය* (පැමිණිකල්* ඇත්තේ) වේ නම්: සඞ්ඝ තෙම* උපොසථය* කරන්නේය. පාමොක්* උදෙසන්නේය. සඞ්ඝයාගේ (උපෝසථයෙහිදී කළයුතු) පෙරකිස* කිම? කරණ ලද්දේද? --පෙ-- ඇති ඇවත ප්‍රකාශ කළයුතුය. එසේ ප්‍රකාශ කිරීමෙන් ඒ භික්ෂුවට (ධ්‍යානාදීන්ගේ අධිගමය පිණිස) පහසු වෙයි.'' යනාදි වශයෙනි.

එසමයෙහි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් 'පාමොක් උදෙසීම: අනුදන්නා ලදැ'යි: දිනපතා පාමොක්* උදෙසත්. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ. මහණෙනි! දිනපතා පාමොක් නො උදෙසිය යුතුය. යම්භික්ෂුවක් දිනපතා පාමොක් උදෙසන්නේ නම්: – ඔහුට දුකුළා ඇවතවේ. **"අනුජානාමි භික්ඛවෙ! උපොසථෙ පාතිමොක්ඛං උද්දිසිතු'න්ති[1]**= මහණෙනි! පොහෝදිනෙහි පාමොක් උදෙසන්ට අනුදනිමි'' යි: වදාළහ.

---

1. මඋ: 250, * උබ:

එසමයෙහි භික්ෂූහු: භාග්‍යවතුන් වහන්සේ විසින් 'පාමොක් උදෙසීම අනුදන්නා ලද්'යි: පක්ෂය පිළිබඳ: තුදුස්වක් – පසළොස්වක් – අටවක් යන තෙදිනෙහි තෙවරක් පාමොක් උදෙසත්. භික්ෂූහු: භාග්‍යවතුන් වහන්සේට ඒකාරණය දැන්වූහ. මහණෙනි! පක්ෂයකට තෙවරක් පාමොක් නො උදෙසියයුතු. යම්භික්ෂුවක් උදෙසන්නේ නම් (ඔහුට) දුකුළා ඇවතවේ. **"අනුජානාමි භික්ඛවෙ! සකිං පක්ඛස්ස චාතුද්දසෙ වා, පණ්ණරසෙ වා පාතිමොක්ඛං උද්දිසිතු'**න්ති[1] = මහණෙනි! පක්ෂයකට වරක් තුදුස්වක් දින හෝ පසළොස්වක් දින හෝ පාමොක් උදෙසීමට අනුදනිමි'' යි: වදාළහ.

එසමයෙහි: සවගමහණහු: පිරිස් අනුව තමතමන්ගේ පිරිස්වලදී පාමොක් උදෙසත්. භික්ෂූහු: භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ. මහණෙනි! පිරිස් අනුව තමතමන්ගේ පිරිස්වලදී පාමොක් නො උදෙසිය යුතුය. යම්භික්ෂුවක් උදෙසන්නේ නම්: (ඔහුට) දුකුළා ඇවතවේ. **"අනුජානාමි: භික්ඛවෙ! සමග්ගානං උපොසථ කම්ම'**න්ති[1]= මහණෙනි! සමගිවූවන්ට පොහොය කිරීම අනුදනිමි''යි: වදාළහ.

ඉක්බිති භික්ෂූන්ට මෙබඳු සිතක් විය: භාග්‍යවතුන් වහන්සේ විසින් සමගිවූවන්ට පොහොය කිරීම පනවන ලද්දේය. **"කිත්තාවතානු ඛො? සාමග්ගී හොති: යාවතා එකාවාසො උදාහු සබ්බා පුථුවී' ති***[1]= කොපමණෙකින් සමගියවේද? ඒ කාවාසය තෙක්ද? නැතහොත් මුළු පොළොව දූ?'' යි: කියා යි. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ඒකාරණය දැන්වූහ. **"අනුජානාමි භික්ඛවෙ! එත්තාවතා සාමග්ගී යාවතා එකාවාසො"** ති[1] = මහණෙනි! (සීමාවටරැස්වූ භික්ෂූන්ගේ) ඒකාවාසය යම්තාක් වේද: සමගිය එපමණෙකින් වේ'ය යි: අනුදනිමි'' යි: වදාළහ.

1. මැ: 250, * උබ:

එසමයෙහි **මහාකස්සප** තෙරහු රජගහනුවර **මද්දකුච්ඡි** උයනෙහි* වැඩ වෙසෙති. ඒ තෙරුන්ට: "මම පොහොය කිරීමට යන්නෙම්ද? සඞ්ඝකර්මයට යන්නෙම්ද? නොයන්නෙම්ද? මම පරම විසුඬියෙන් (රහත් බැවින්) පිරිසුදුවූයෙම් නොවෙම්ද?" යි: යන සිතක් උපන්නේය. **මහාකස්සප** තෙරුන්ගේ මේ අදහස දත් භාග්‍යවතුන්වහන්සේ ඒ තෙරුන් වෙත ඍඞියෙන් වැඩමවා මෙසේ විචාළ සේක: ඔබට "මම පොහොය කිරීමට යන්නෙම්ද? නොයන්නෙම්ද? මම පරම විසුඬියෙන් පිරිසුදුවූයෙම් නොවෙම්ද?" යි: යන සිතක් ඇතිවූවා නොවේද?" එසේය, "ස්වාමිනි! "ඔබ වැන්නෝ පොහොය කිරීම. (උපෝසථය) ගරුනොකරන්නාහු නම්: කවරෙක් එය ගරු කරන්නාහු වෙත්ද? පොහොය කිරීමට යව. සඞ්ඝකර්මයට යව" යි: වදාරා, ගිජ්ඣකූළුපව්වට වැඩිසේක[1].

ඉක්බිති භික්ෂූන්ට මෙබඳු සිතක් විය: භාග්‍යවතුන් වහන්සේ විසින් "ඒ කාවාසය යම් පමණද සමගියත් එපමණය"යි: පනවනලදී. ඒ ඒකාවාසය කොපමණෙකින් වේද? කියායි. භික්ෂූහු ඒ කාරණය භාග්‍යවතුන්වහන්සේට දැන්වූහ[1].

---

## සමානසංවාස සීමං සම්මති[2]

**"අනුජානාමි: භික්ඛවෙ! සීමංසම්මන්නිතු"** තති[1] = මහණෙනි! සීමාවක් සම්මත කරන්ට අනුදනිමි"යි: වදාළහ. කෙසේද? පළමු කොට ඒ සීමාවෙහි: **පබ්බත** නිමිත්ත ය - **පාසාණ** නිමිත්ත ය-**වන** නිමිත්ත ය-**රුක්ඛ** නිමිත්ත ය-**මග්ග** නිමිත්ත ය - **වම්මික** නිමිත්ත ය - **නදී** නිමිත්ත ය - **උදක** නිමිත්ත ය යන මේ නිමිති කීර්තනය කොට: ව්‍යක්ත - ප්‍රතිබල භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දැන්විය යුත්තේය.[1]

**"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො:* යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො එතෙහි නිමිත්තෙහි සීමං සම්මන්නෙය්‍ය: සමාන සංවාසං එකූපොසථං. එසා ඤත්ති.**

1. මජ: 2. සම්මුති - වබු: මක - 121 * උබ:

**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො* යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා: සඞ්ඝො එතෙහි නිමිත්තෙහි සීමං සම්මන්නති: සමාන සංවාසං එකූපොසථං. යස්සායස්මතො ඛමති එතෙහි නිමිත්තෙහි සීමා සම්මති. සමාන සංවාසාය එකූපොසථාය. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. සම්මතා සා සීමා සඞ්ඝෙන එතෙහි නිමිත්තෙහි සමානසංවාසා එකූපොසථා[1]. ඛමති: සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී”**ති.

“වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්: යම් පමණ තැනෙක නිමිති කීර්තනය කරණ ලද්දේද: සඞ්ඝතෙම ඒ නිමිති වලින් ඇතුලත සමානසංවාස එකුපෝසථ සීමාව සම්මත කරන්නේය.” මේ දැන්වීමයි.

වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. යම් පමණ (තැනෙක) හාත්පස නිමිති කීර්තනය කරණ ලද්දේද: සඞ්ඝතෙම ඒ නිමිතිවලින් (ඇතුළත) සමාන සංවාස* ඒකුපෝසථ සීමාව සම්මතකරයි. යම් ආයුෂ්මත් කෙනෙකුට ඒ නිමිතිවලින් (ඇතුලත) සමාන සංවාස ඒකුපෝසථ සීමාව සම්මතකිරීම: රුචිවේනම්: හෙතෙම: (කථානොකොට) නිශ්ශබ්ද වන්නේය. යමෙකුට රුචි නොවේනම්: හෙතෙම (ඒ රුචිනොවීම) කියන්නේය. සඞ්ඝයාවිසින් මේ නිමිතිවලින් (ඇතුලත) සමාන සංවාස ඒකුපෝසථසීමාව සම්මතකරණ ලද්දීය. සඞ්ඝයාට එය රුචිවෙ යි. එබැවින් (කථා නොකොට) නිශ්ශබ්දවෙ යි. මෙසේ මෙයදරමි.[1] (පිළිගණිමි)” කියායි.

---

## මහා සීමා සම්මති[2]

එසමයෙහි වනාහි: සවග මහණහු* භාග්‍යවතුන්වහන්සේ විසින් ‘සීමාසම්මත කිරීම අනුදන්නාලද්දූ’ යි: සිවුයොදුන්-පස්යොදුන්-සයයොදුන්* පමණ ඉතා විශාලවූ සීමාසම්මත

1. මඋ: 258, 2. සම්මුති. මකා: 121, * උබ:

කරත්. පොහොය කිරීමට පැමිණෙන භික්ෂූහු: පාමොක් උදෙසනු ලබන කල්හි ද, පාමොක් උදෙසූ ඇසිල්ලෙහි ද, පැමිණෙත්. අතරමග ද රුඳෙත්. භාග්‍යවතුන්වහන්සේට ඒ කරුණ දැන්වූහ. මහණෙනි! සිවුයොදුන්-පස්යොදුන්-සය යොදුන් පමණ ඉතා විශාල සීමා සම්මත නොකළ යුතුය. යම් භික්ෂුවක් (එබඳු සීමාව) සම්මත කරන්නේනම්: (ඔහුට) දුකුළා ඇවතවේ. **"අනුජානාමි භික්ඛවෙ! තියොජන පරමං සීමං සම්මන්නිතු"**න්ති[1] = මහණෙනි! තුන්යොදුන් පරම කොට ඇති සීමාව සම්මත කිරීමට අනුදනිමි" යි: වදාළහ.

---

## නදීපාර සීමාසම්මති

එසමයෙහි සවග මහණහු (නදිය හරස්කොට) **නදීපාර සීමාව** සම්මතකරත්. පොහොය කිරීමට එන භික්ෂූහු ද: පාසිවුරු ද ගඟදියෙන් ගසාගෙණයත්. භාග්‍යවතුන්වහන් සේට ඒ කරුණ සැළකළහ. මහණෙනි! **නදීපාරසීමාව** සම්මතනොකළ යුතුය. යම් භික්ෂුවක් සම්මතකරන්නේ නම් (ඔහුට) දුකුළා ඇවතවේ. **"අනුජානාමි භික්ඛවෙ! යත්ථස්ස ධුවනාවා වා ධුවසෙතු වා එවරූපං නදීපාරං සීමං සම්මන්නිතු'න්ති**[1]= මහණෙනි! යම් තැනෙක නිතර පවතින නැවක් හෝ, හෙයක් වේනම්: එබඳු තැනෙක **නදීපාර** සීමාව සම්මත කරන්ට අනුදනිමි" යි: වදාළහ.

එසමයෙහි භික්ෂූහු (ඒකසීම මහාවිහාරයක* අසවල් තැන පොහොය කරන්නේයයි) සලකුණක් නොකොට පිරිවෙණක්* පාසා පාමොක් උදෙසත්. ආගන්තුක භික්ෂූහු* අද පොහොය කරණු ලබන්නේ කොහිදැ? යි: නොදනිත්. භාග්‍යවතුන් වහන්සේට ඒ කරුණ දැන්වූහ. මහණෙනි! අසඞ්කෙතයෙන් පිරිවෙණක්* පාසා පාමොක් නොඋදෙසිය යුතුය. යම් භික්ෂුවක් උදෙසන්නේ නම් (ඔහුට) දුකුළා ඇවතවේ.

---

1 මඑ: 258,   * උබ:

## උපෝසථාගාර සම්මති

**“අනුජානාමි භික්ඛවෙ! උපොසථාගාරං සම්මන්නිත්වා උපොසථං කාතුං, යං සඞ්ඝො ආකඞ්ඛති: විහාරං වා- අඩ්ඪයොගං වා-පාසාදං වා-හම්මියං වා-ගුහං වා. එවඤ්ච පන භික්ඛවෙ! සම්මන්නිතබ්බං: බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො[1]=** මහණෙනි! සඞ්ඝතෙම යම් විහාරයක්* හෝ, අඩ්ඪයෝග නම්* ගරුඬපක්ෂාකාර සෙවෙනි ඇතිගෙයක් හෝ, පහයක්* හෝ, හම්මිය නම්* සඳලු සහිත ගෙයක් හෝ, ගුහාවක්* හෝ, කැමැතිනම් උපෝසථාගාරයක් (පොහෝගෙයක්) ලෙස සම්මත කොට පොහොය කරන්නට අනුදනිමි. මහණෙනි! (එය) මෙසේ සම්මත කළයුතුය. ව්‍යක්ත - ප්‍රතිබල* භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දැන්විය යුතුය”

**“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යදි සඞ්ඝස්ස පත්ත කල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං උපොසථාගාරං සම්මන්නෙය්‍ය එසා ඤත්ති”.**

**“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: ඉත්ථන්නාමං විහාරං උපොසථාගාරං සම්මන්නති, යස්සායස්මතො ඛමති: ඉත්ථන්නාමස්ස විහාරස්ස උපොසථාගාරස්ස සම්මති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො විහාරො: උපොසථාගාරං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි[1]”**

“වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්: මෙ නම් විහාරය. උපොසථා ගාරයක් (පොහෝ ගෙයක්) කොට සම්මත කරන්නේය. මේ දැන්වීමයි”.

“වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. සඞ්ඝතෙම මෙනම් විහාරය: උපෝසථාගාරයක් කොට සම්මත කරයි. යම් ආයුෂ්මතෙකුට මෙනම් විහාරයාගෙ උපොසථාගාර සම්මතිය රුචි කෙරේ නම්: හෙතෙම (කථා නොකොට)

---

1 මඋ: 260, * උබ:

නිශ්ශබ්ද වන්නේය. යමෙකුට රුචි නොකෙරේ නම්: හෙතෙම කියන්නේය. සඞ්ඝයා විසින් මෙනම් විහාරය උපෝසථාගාරයක්* කොට සම්මතකරණ ලද්දේය. සඞ්ඝයාට (එය) රුචි වෙයි. එහෙයින් නිශ්ශබ්ද වෙයි. මෙය මෙසේ දරමි. (පිළිගනිමි)"

එසමයෙහි එක්තරා ආවාසයක (එකම සීමාවකට අයත් මහාවිහාරයෙක) උපෝසථාගාර දෙකක් සම්මත කරණ ලදි. භික්ෂූහු පොහොය කිරීමට දෙතැන්හිම රැස්වෙත්. භාග්‍ය වතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ. "මහණෙනි! එක ආවාසයක උපෝසථාගාර දෙකක් සම්මත නොකළ යුතුය. යම් භික්ෂුවක් සම්මත කරන්නේ නම් (ඔහුට) දුකුළා ඇවත වේ. මහණෙනි! එක් උපොසථාගාරයක් උදුරා (උපොසථා ගාරය යන සම්මතිය නැති කොට) එක් තැනෙක පොහොය කරන්ට අනුදනිමි.

එසමයෙහි එක්තරා ආවාසයක (එකම සීමාවකට අයත් මහා විහාරයක) ඉතා කුඩා උපෝසථාගාරයක් සම්මත කරණ ලද්දේය. ඒ පොහෝ කරණ දිනයෙහි මහා භික්ෂු සඞ්ඝතෙම රැස්විය. භික්ෂූහු (උපෝසථාගාර සම්මතියෙන්) සම්මත නොකළ බිම* හුන්නාහු පාමොක් උදෙසීම ඇසූහ. ඉක්බිති භික්ෂූන්ට 'අප විසින් පොහොය කරණ ලද්දේද? නොකරණ ලද්දේදූ'යි: සිත් විය. භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ[1].

**"සම්මතාය වා භික්ඛවෙ! භූමියා නිසින්නා: අසම්මතාය වා, යතො පාතිමොක්ඛං සුණාති: තතො'වස්ස උපොසථො**[2]= මහණෙනි! (උපෝථාගාර) සම්මතිය ලද බිම හෝ, ඒ සම්මතිය නොලද (සීමාසම්මතිය පමණක් ලද) බිම හෝ හුන්නේ පාමොක් උදෙසීම අසාද ඒ භික්ෂූන් විසින් පොහොය කරණ ලද්දේම වේ".

---

1. මඋ: 262; 2. 'සම්මතාය වා අසම්මතාය වා' ති: උපොසථා-ගාර සම්මුතියා ච සීමාසම්මුතියා- වබු * උබ:

## උපෝසථාගාර පමුඛසම්මති

මහණෙනි! එසේ නම්: යම් පමණ මහත්වූ [1] උපෝසථාගාර පමුඛයක්* කැමති වේනම්: එපමණ මහත්වූ උපෝසථාගාර පමුඛයක් සම්මත කෙරේවා. මහණෙනි! මෙසේ සම්මත කළයුතු. පළමුකොට: නිමිති කීර්තනය කළ යුතු. නිමිති කිර්තනය කොට ව්‍යක්ත – ප්‍රතිබල භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දැන්වියයුතු.

**"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො –පෙ– සම්මතං සඞ්ඝෙන. එතෙහි නිමිත්තෙහි උපොසථ පමුඛං. ඛමති: සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එව මෙතං ධාරයාමී' ති**[1]= වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. –පෙ– සඞ්ඝයා විසින් මේ නිමිතිවලින් (ඇතුළත) උපෝසථාගාර පමුඛයක් සම්මත කරණ ලද්දේය. සඞ්ඝයාට (එය) රුචි වෙයි. එහෙයින් නිශ්ශබ්ද වෙයි. මෙය මෙසේ දරමි."

එසමයෙහි එක්තරා ආවාසයක: ඒ පොහොය කරණ දිනයෙහි නවක* භික්ෂූහු පළමුකොට රැස්වී ස්ථවිර* භික්ෂූන් පැමිණෙන්ට පෙර නික්ම ගියහ. පොහොයකිරීම අවුල් විය. භාග්‍යවතුන්වහන්සේට ඒ කරුණ දැන්වූහ. (එවිට උන්–වහන්සේ) මහණෙනි! ඒ පොහොය කරණ දිනයෙහි: "පළමු කොට ස්ථවිර භික්ෂූන්ට රැස්වීමට අනුදනිමි" යි: වදාළහ.

එසමයෙහි රජගහනුවර සමාන සීමා ඇති බොහෝ ආවාසයෝ වෙත්. ඒ ආවාස වැසි භික්ෂූහු "අපගේ ආවාසයෙහි පොහොය කරණු ලැබේවා. අපගේ ආවාසයෙහි පොහොය කරුණු ලැබේවා' 'යි: විවාද කරත්. භාග්‍යවතුන්වහන්සේට ඒ කරුණ දැන්වූහ. මහණෙනි! ඒ විවාදකරණ භික්ෂූන් එකට රැස්වී පොහොය කළයුතු. යම්තැනෙක ස්ථවිර භික්ෂුතෙම වෙසේ නම්: එතැනට රැස්වී පොහොය කළයුතු. වර්ගවූ (කොටස්වූ) සඞ්ඝයා විසින් පොහොය නොකළ යුතු. යම් භික්ෂුවක් කරන්නේ නම්: (ඔහුට) දුකුළා ඇවත වේ.

---

1. මඋ: * උබ:

## තිචීවරාවිප්පවාස සීමාසම්මති

එසමයෙහි මහකසුප් තෙර: **අන්ධකවින්ද*** විහාරයෙහි සිට **රජගහ*** නුවරට පොහොය **කිරීමට** එන අතර මගදී: නදිය එතර කරන්නේ, දියෙන් මදක් ගසා ගෙණ ගොස් සිවුරු තෙමුනේය. භික්ෂූහු ඒ කාරණය භාග්‍යවතුන් වහන්සේට **දැන්වූහ**. මහණෙනි! සඞ්ඝයා විසින් සමාන සංවාස ඒකූපෝසථ* යම් සීමාවක් සම්මතකරණ ලද ද: ඒ සීමාව තිචීවරාවිප්පවාස* සීමාවක් කොට ද: සම්මත කෙරේවා. එය මෙසේ සම්මත කළයුතු: ව්‍යක්ත – ප්‍රතිබල* භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දැන්විය යුතු.

**“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමාන සංවාසා ඒකූපොසථා: යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො: තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති”.**

**“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: –පෙ– සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසා. ඛමති: සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී”ති**[1].=

වහන්ස! සඞ්ඝ තෙම: මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් සමාන සංවාස ඒකූපෝසථ යම් ඒ සීමාවක් සම්මත කරණ ලද්දී ද: ඉදින් සඞ්ඝයාට පැමිණි කාල් ඇත්තේ නම්: සඞ්ඝතෙම ඒ සීමාව: තිචීවරාවිප්පවාසය ඇත්තක් කොට සම්මත කරන්නේය. මේ දැන්වීමයි.

වහන්ස! සඞ්ඝ තෙම: මාගේ වචනය අසාවා –පෙ– සඞ්ඝයා විසින් තිචීවරා විප්පවාසය ඇති සීමාව සම්මතකරණ ලද්දීය. සඞ්ඝයාට එය රුචිවෙයි. එහෙයින් නිශ්ශබ්දය. මෙය මෙසේ දරමි.

එසමයෙහි වනාහි: භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් ‘තිචීවරාවිප්පවාස සම්මතිය අනුදන්නා ලද්දී’යි: ගමතුළ සිවුරු තැන්පත් කර තබත්. ඒ සිවුරු විනාස වෙත්. ගින්නෙන්

1. මළ: 264, * උබ:

දැවීයත්. මීයන් විසින් ද කනු ලබත්. භික්ෂූහු දිරාගිය දුබල සිවුරු ඇත්තාහු වෙත්......... භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ.

මහණෙනි! සඞ්ඝයා විසින් සමාන සංවාස ඒකූපොසථ යම් සීමාවක් සම්මත කරණ ලද ද: සඞ්ඝ තෙම ඒ සීමාව: ගම ද- ගාමූපචාරය ද හැර, තිචීවරා විප්පවාසය ඇත්තක් කොට සම්මත කෙරේවා. මෙසේ සම්මත කළයුතු. ව්‍යක්ත -ප්‍රතිබල භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දැන්විය යුතු

**“සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො; යා සා සඞ්ඝෙන සීමා සම්මතා: සමාන සංවාසා ඒකූපොසථා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං,* සඞ්ඝො: තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නෙය්‍ය, ඨපෙත්වා: ගාමඤ්ච ගාමූපචාරඤ්ච. එසා ඤත්ති;**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා: සමාන සංවාසා ඒකූපොසථා. සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නති: ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. යස්සා යස්මතො ඛමති: එතිස්සා සීමාය තිචීවරෙන අවිප්පවාසාය සම්මති. ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච.**

**සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.**

**සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරා විප්පවාසා: ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. ඛමති: සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී”ති.**

“ස්වාමිනි! සඞ්ඝ තෙම මාගේ වචනය අසා වා. සඞ්ඝයා විසින් සමාන සංවාස ඒකූපෝසථ යම් ඒ සීමාවක් සම්මත කරණලද්දී ද: ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම්: සඞ්ඝ තෙම ඒ සීමාව: තිචීවරාවිප්පවාසය ඇත්තක් කොට, ගමත් - ගාමූපචාරයත් හැර සම්මත කරන්නේය. මේ දැන්වීමයි.

---

1. සම්මුති - මළ: 266, සම්මති - සාව: * මළ:

“ස්වාමීනි! සඞ්ඝ තෙම: මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් සමාන සංවාස ඒ කුපෝසථ යම් ඒ සීමාවක් සම්මත කරන ලද්දී ද: සඞ්ඝ තෙම ඒ සීමාව: තිචීවරා විප්පවාසය ඇත්තක් කොට, ගමත් - ගාමූපචාරයත් හැර සම්මතකරයි. යම් ආයුෂ්මතෙකුහට ගමත් ගාමූපචාරයත් හැර, තිචීවරා විප්පවාසය ඇති ඒ සීමාවගේ සම්මතිය රුචිවේ නම්: නිශ්ශබ්ද වන්නේය. යමෙකුට රුචිනොවේ නම්: හෙතෙම කියන්නේය.

සඞ්ඝයා විසින් ගමත් - ගාමූපචාරයත් හැර තිචීවරාවිප්පවාසය ඇති ඒ සීමාව සම්මතකරණ ලද්දීය. සඞ්ඝයාට (එය) රුචිවෙයි. එහෙයින් නිශ්ශබ්ද වෙයි. මෙසේ මෙය දරමි.”

---

මහණෙනි! සීමාවක් සම්මත කරන්නහු විසින් පළමු කොට **සමාන සංවාස*** සීමාව සම්මත කළ යුතුය. මහණෙනි! සීමාවක් උදුරන්නහු විසින් පළමු කොට තිචීවරා විප්පවාස* සීමාව ඉදිරිය යුතුය.[1]

---

## තිචීවරාවිප්පවාස සීමා සමූහනන

මහණෙනි! මෙසේ තිචීවරා විප්පවාස සීමාව ඉදිරියයුතු. ව්‍යක්ත - ප්‍රතිබල භික්ෂුවක් විසින් සඞ්ඝතෙම දූත් වියයුතු.

**“සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො: යො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො සම්මතො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං තිචීවරෙන අවිප්පවාසං සමූහනෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො: යො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො සම්මතො: සඞ්ඝො තං තිචීවරෙන අවිප්පවාසං සමූහනති. යස්සායස්මතො ඛමති: එතස්ස තිචීවරෙන අවිප්පවාසස්ස සමුග්ඝාතො. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.**

---

1. මඋ: 266, * උබ:

**සමූහතා: සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි”[1]ති.**

“වහන්ස! සඞ්ඝතෙම. මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් යම් ඒ තිචීවරාවිප්පවාසයෙක්* සම්මතකරණ ලද ද: ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම්: සඞ්ඝතෙම ඒ තිචීවරාවිප්පවාසය සමූහනනය* කරන්නේය. මේ දැන්වීමයි.

වහන්ස සඞ්ඝතෙම: මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් යම් ඒ තිචීවරාවිප්පවාසයෙක් සම්මතකරණ ලද ද: සඞ්ඝතෙම ඒ තිචීවරා විප්පවාසය සමූහනනය කරයි. යම් ආයුෂ්මතෙකුට මේ තිචීවරාවිප්පවාසයාගේ සමූහනනය රුචිවේ නම්: හෙතෙම නිශ්ශබ්දවන්නේ ය. යමෙකුට රුචිනොවේ නම්: හෙතෙම කියන්නේ ය.

සඞ්ඝයා විසින් ඒ තිචීවරාවිප්පවාසය සමූහනනය* කරණ ලද්දේය. සඞ්ඝයාට (එය) රුචිවෙයි. එහෙයින් නිශ්ශබ්දවෙයි. මෙය මෙසේ දරමි.

---

## සමාන සංවාස සීමං සමූහනන

මහණෙනි! මෙසේ සමාන සංවාස සීමාව සමූහනනය කළ යුතුය. ව්‍යක්ත – ප්‍රතිබල* භික්‍ෂුවක් විසින් සඞ්ඝ තෙම මෙසේ දැන්විය යුතු.

**“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා: සමාන සංවාසා එකූපොසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං සීමං සමූහනෙය්‍ය: සමාන සංවාසං එකූපොසථං. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා: සමාන සංවාසා එකූපොසථා. සඞ්ඝො තං සීමං සමූහනති: සමානසංවාසං එකූපොසථං. යස්සා යස්මතො**

---

1. මඋ: 266,  * උබ:

**ඛමති: එතිස්සා සීමාය සමාන සංවාසාය එකූපොසථාය සමුග්ඝාතො. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.**

**සමූහතා: සා සීමා සඞ්ඝෙන සමාන සංවාසා එකූපොසථා. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී”ති[1].**

“වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් යම් ඒ සමාන සංවාස* ඒකූපෝසථ* සීමාවක් සම්මතකරණ ලද ද: ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම්: සඞ්ඝතෙම ඒ සමාන සංවාස ඒකූපෝසථ සීමාව සමූහනනය කරන්නේය. මේ දූන්වීමය.

වහන්ස! සඞ්ඝතෙම මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් යම් ඒ සමාන සංවාස ඒකූපෝසථ සීමාවක් සම්මත කරණ ලද ද: සඞ්ඝතෙම ඒ සමාන සංවාස ඒකූපෝසථ සීමාව සමූහනනයකරයි. යම් ආයුෂ්මතෙකුට මේ සමාන සංවාස ඒකූපෝසථ සීමාවගේ සමූහනනය රුචිවේද: හෙතෙම නිශ්ශබ්දවන්නේය. යමෙකුට රුචි නොවේනම්. හෙතෙම කියන්නේය.

සඞ්ඝයා විසින් ඒ සමාන සංවාස ඒකූපොසථ සීමාව සමූහනනයකරණ ලද්දීය. සඞ්ඝයාට (එය) රුචිවෙයි. එහෙයින් නිශ්ශබ්දවෙයි. මෙය මෙසේ දරමි (පිළිගණිමි).

---

## සමාන සංවාස ඒකූපෝසථ සීමා

**“අසම්මතාය භික්ඛවෙ! සීමාය: අට්ඨපිතාය: යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. යා තස්ස ගාමස්ස වා ගාමසීමා, නිගමස්ස වා නිගමසීමා. අයං තත්ථ සමාන සංවාසා එකූපොසථා[1]** = මහණෙනි! සීමාවක් සම්මත නො කළ කල්හි: නො පිරිසිඳිකල්හි: (භික්ඛුසඞ්ඝ තෙම යම් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට

1. මඋ: 268, * උබ:

වාසය කෙරේද: ඒ ගම පිළිබඳ යම් ගාම සීමාවක් හෝ, නියම්ගම පිළිබඳ යම් නිගම සීමාවක් හෝ වේ ද. මේ එහි සමාන සංවාස ඒකූපෝසථ සීමාවය”.

---

## සත්තබ්භන්තර සීමා

**“අගාමකෙ චෙ භික්ඛවෙ! අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරා: අයං තත්ථ සමානසංවාසා එකූපොසථා**[1] = මහණෙනි! ගමනොවූ වනයෙහි* මැද සිටි භික්ෂුවගේ හාත්පස අබ්භන්තර* සතක් වේ ද: මේ එහි සමාන සංවාස ඒකූපෝසථ සීමාවය”

---

## උදකුක්ඛෙප සීමා

**“සබ්බා භික්ඛවෙ! නදී අසීමා, සබ්බො සමුද්දො අසීමො, සබ්බො ජාතස්සරො අසීමො, නදියා වා භික්ඛවෙ! සමුද්දෙ වා, ජාතස්සරෙ වා, යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපා: අයං තත්ථ සමානසංවාසා එකූපොසථා**[1] = මහණෙනි! සියලු නදිය අසීමාවය, සියලු මුහුද අසීමාවය, සියලු ජාතස්සරය* අසීමාවය, (මෙසේ නදී- සර- සමුද්‍රයෙහි බදසිම්බව ප්‍රතික්ෂෙප කොට[2]) නදියක හෝ, මුහුදක හෝ, ජාතස්සරයක හෝ යම් පෙදෙසක් සථාමමධ්‍යම පුරුෂයාගේ* හාත්පස උදකුක්ඛෙපයෙන්* පිරිසිඳේද: මේ උදකුක්ඛෙපය එහි සමාන සංවාස* ඒකූපෝසථ සීමාවය”.

---

## සීමා සම්භින්දන

එසමයෙහි වනාහි: සවග මහණහු* සීමාසම්භින්දනය* කරත්. භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ. මහණෙනි! යම් කෙනෙකුන් විසින් පළමුකොට සීමාවක් සම්මත කරණ ලද ද: ඔවුන්ගේ ඒ (සීමාසම්මත) කර්මය: ධාර්මිකය, අකොප්‍යය* (ඉවත් නොකළයුතුය.) කාරණයට

---

1. මළ: 268, 2. විම: 16, කපි: 5,

සුදුසුය. මහණෙනි! යම් කෙනෙකුන් විසින් (ඒ සීමාව සම්භින්දනය කරමින්) පසුව සීමාවක් සම්මතකරණලද ද: ඔවුන්ගේ ඒ (සීමාසම්මත) කර්මය: අධාර්මිකය. කොප්‍යය. කාරණයට නුසුදුසුය.

**"න භික්ඛවෙ! සීමාය සීමා සම්භින්දිතබ්බා. යො සම්භින්දෙය්‍ය: ආපත්ති දුක්කටස්ස**[1] = මහණෙනි! සීමාවෙන් සීමාව සම්භින්දනය නොකළ යුතුය. යම් භික්‍ෂුවක් සම්භින්දනය* කරන්නේ නම් (ඔහුට) දුකුළා ඇවතවේ".

---

## සීමා අජ්ඣොත්ථරණ

එසමයෙහි වනාහි: සවග මහණහු* සීමාවෙන් සීමාව අජ්ඣොත්ථරණය* කරත්. භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය දැන්වූහ. මහණෙනි! යම් කෙනෙකුන් විසින් පළමුකොට සීමාවක් සම්මතකරණ ලද ද: ඔවුන්ගේ ඒ (සීමා සම්මත) කර්මය: ධාර්මිකය. අකොප්‍යය.* (ඉවත් නො කළ යුතුය.) කාරණයට සුදුසුය. මහණෙනි! යම් කෙනෙකුන් විසින් (ඒ සීමාව අජ්ඣොත්ථරණය කරමින්) පසුව සීමාවක් සම්මතකරණ ලද ද: .ඔවුන්ගේ ඒ කර්මය අධාර්මිකය. කොප්‍යය.* කාරණයට නුසුදුසුය.

**"න භික්ඛවෙ! සීමාය සීමා අජ්ඣොත්ථරිතබ්බා: යො අජ්ඣොත්ථරෙය්‍ය: ආපත්ති දුක්කටස්ස**[1] = මහණෙනි! සීමාවෙන් සීමාව අජ්ඣොත්ථරණය නොකළයුතුය. යම් භික්‍ෂුවක් අජ්ඣොත්ථරණය කරන්නේ නම්. (ඔහුට) දුකුළා ඇවතවේ".

---

## සීමන්තරික

**"අනුජානාමි භික්ඛවෙ! සීමං සම්මන්නන්තෙන: සීමන්තරිකං ඨපෙත්වා සීමං සම්මන්නිතුං**[1] = මහණෙනි! සීමාවක් සම්මත කරන්නහු විසින් සීමන්තරිකයක්* තබා සීමාව සම්මතකරන්ට අනුදනිමි".

---

1. මළ: 268, * උබ:

## එකොළොස් විපත්ති සීමා

**"අතිඛුද්දකා1- අතිමහතී2- ඛණ්ඩනිමිත්තා3- ඡායානිමිත්තා4- අනිමිත්තා5- බහිසීමෙඨිතසම්මතා6- නදියා සම්මතා7- සමුද්දෙසම්මතා8- ජාතස්සරෙසම්මතා9- සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා10- සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා[1]11"**

(කර්මාර්හයා සමග විසිඑක්නමක් භික්ෂූන්ට පරිමණ්ඩලාකාරයෙන් වටා හිඳීමට නොහැකිතරම්[2]) කුඩාසීමාව:- **අතිඛුද්දකා**[1] නම්. තුන්යොදුනට වඩා කොසඟක් පමණෙවත් විසාලවූ සීමාව:- **අතිමහතී**[2] නම්. **"පුරත්ථිමායදිසාය කිං නිමිත්තං** = පෙරදිග නිමිත්ත කුමක්ද?" යි: නිමිති කීර්තනය අරඹා, දකුණුදිග - පසුදිග - උතුරුදිග යන සිවුදිග හා අනුදිගද නිමිතිකීර්තනය කරමින් **"උත්තරාය අනුදිසාය කිං නිමිත්තං** = උතුරු අනුදිග නිමිත්ත කුමක්ද?" යි: උතුරු අනුදිග නිමිත්තද කීර්තනය කොට නො නවත්වා: නැවතත් පෙරදිග නිමිත්ත කීර්තනය කළතැනට පැමිණ: **"පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං**= පෙරදිග නිමිත්ත කුමක්ද?" යි: පෙරදිග නිමිත්ත නැවතත් කීර්තනය කොට මෙසේ නිමිත්තෙන් නිමිත්ත ගලපා නොතැබූ සීමාව:- **ඛණ්ඩනිමිත්තා**[3] නම්.

තවද නිමිත්තක් ලෙස ගැණීමට නො සුදුසු හරනැති ගසක් - කණුවක් - පස්ගොඩක් - වැලිගොඩක් ආදි දෙයක් නිමිත්තක් වසයෙන් කීර්තනය කළ සීමාවද:- **ඛණ්ඩ නිමිත්තා** නම් වෙයි. පර්වතච්ඡායාදි යම්කිසි ඡායාවක් නිමිත්තක් ලෙස කීර්තනය කොට සම්මත කළ සීමාව:- **ඡායානිමිත්තා**[4] නම්. සර්වප්‍රකාරයෙන් නිමිති කීර්තනය නොකොට සම්මතකළ සීමාව:- **අනිමිත්තා**[5] නම්. නිමිති කීර්තනය කොට, ඒ නිමිතිවලින් පිට සිටගෙණ සම්මත කළ සීමාව:- **බහිසීමෙඨිත සම්මතා**[6] නම්. **සියලු නදියම**[7]- **සියලු සමුද්‍රයම**[8] - **සියලු ජාතස්සරයම**[9]: ඒ හාත්පස ඇති නිමිති කීර්තනය කොට බඬසීමා කරත්නෙමුයි: සම්මත

1. කම්: 4, 2. විම; 16,

කළහොත් අසීමා වෙති. සීමාවෙන් සීමාව **සම්භින්දනය** කරමින් සම්මත කරණ ලද සීමාවද[10] – සීමාවෙන් සීමාව **අජ්ඣොත්ථරණය** කරමින් සම්මත කරණ ලද සීමාවද[11] අසීමා වෙති.[1]

---

## සීමා භේද

**"සීමානාමෙ'සා බද්ධසීමා-අබද්ධසීමා'ති දුවිධා**[2]= සීමාව නම්: බද්ධසීමාවය, අබද්ධසීමාව යයි: දෙපරිදිය" නැවත: බද්ධ සීමාව: ඛණ්ඩසීමා – සමාන සංවාසසීමා – අවිප්පවාසසීමාය යි: තෙපරිදිය. අබද්ධසීමාව: ගාමසීමා – උදකුක්ඛෙපසීමා – සත්තබ්භන්තර සීමාය යි: තෙපරිදිය. මෙසේ සයආකාර වන්නීය.[3] ඇතැම් ඇදුරු කෙනෙක්: නදී – ජාතස්සර – සමුද්ද – අරඤ්ඤයන්ගේ ද සීමාභාවය කියති.[4]"

තවද: ඛණ්ඩසීමා – උපචාරසීමා – සමානසංවාසසීමා – අවිප්පවාසසීමා – ලාභසීමා – ගාමසීමා – නිගමසීමා – නගර සීමා – අබ්භන්තරසීමා – උදකුක්ඛෙපසීමා – ජනපදසීමා – රට්ඨසීමා – රජ්ජසීමා – දීපසීමා – චක්කවාළසීමායි: පසළොස් භේදයක්ද දක්වයි.[5]

මෙසේ නොයෙක් ප්‍රභේද ඇති සීමාවන් අතර: **"සීයතෙ සමග්ගෙන සඞ්ඝෙන කම්මවාචාය බජ්ඣතෙ'ති සීමා= සීයතෙ** ය යි: සේයි. සමගි සඞ්ඝයා විසින් කර්මවාක්‍යයෙන් බඳිනු ලැබේනුයි: **සීමා** නම් වෙයි.[6] යනාදි ක්‍රමයෙන් දැක්වෙන **සීමා** පිළිබඳ විනිශ්චයක් ප්‍රධානවශයෙන් මෙහි දැක්වෙයි.

---

## බද්ධ සීමා

මෙහි: **ඒ ඒ** දිසාවල පිහිටි නිමිති පිළිවෙළින් කීර්තනය කරගෙණ අවුත්: මුලින් කීර්තනය කළ නිමිත්ත නැවතත්

---

1. කවි: 4, 2. කවි: 4, පාචි: 169, 3. විස: 564, පාමු: 183,
4. සීල: 5, 5. සීවි: බු, කවි: 59, 6. සීද: 47.

කීර්තනය කොට, එකට එක ගලපා, බන්ධනයක් මෙන් තබා, කර්මවාක්‍යයෙන් සම්මත කරණ හෙයින් **බද්ධසීමා** නම්වෙයි. එසේ මුලින් කීර්තනය කළ නිමිත්ත අවසාන යේදී නැවතත් කීර්තනය නොකළ හොත්: එය '**ඛණ්ඩ නිමිත්ත**' වී අසීමා වෙයි.

**ඛණ්ඩසීමා**: යම් සීමාවක් හාත්පස්හි සීමන්තරිකයෙන් පිරිසුන්වී ද, ඕතොමෝ: යම්හෙයකින් හාත්පස්හි පරිච්ඡින්න වීද එහෙයින් 'ඛණ්ඩසීමා' යි: කියනලදු[1]. "**ඛණ්ඩසීමා**'ති **ඛුද්දකසීමා**= ඛණ්ඩසීමා නම් කුඩා සීමාවය"[2]; මහාසීමාව අපෙක්ෂා කොට කුඩා සීමාවයයි: කියත්.[3]

**සමානසංවාස සීමා**: දිට්ඨි – සීල – සාමඤ්ඤයන්ගෙන් එකතුබවට ගිය භික්ෂුසමූහයා විසින් උපෝසථාදී සඟකම් එකට කිරීමෙන් සමානව විසීමට සම්මතකරගත් සීමාව.[3]

**අවිප්පවාසසීමා**: තුන්සිවුරෙන් අත්පසින් වෙන්ව විසීමට සම්මතකරණ ලද සීමාව. මේ සීමාදෙක තුන්යොදුන් තරම් වනබැවින් 'මහාසීමා' ය යි:[4] කියයි..

---

## අබද්ධ සීමා

මෙහි නිමිති කීර්තනයක් හෝ, කම්වදන්[5] උදෙසීමක් හෝ නැත. ගාම – නගර – ජනපද යම් පමණ විසාල වෙත්නම්: අබද්ධගාම සීමාව ද එතරම් ම විසාල වෙයි. ගාම– උදකුක්ඛෙප – සත්තබ්භන්තර සීමාවලට: මර්‍යාදාත්වයෙන් සීමාත්වය ලැබෙයි.[6] මෙහි සඟකම් කිරීමට රැස්වූ සඞ්ඝයාගේ සීමාධිෂ්ඨානය පවතිනතාක් සීමාව පිහිටා, සඞ්ඝයා ඉවත්වූ පසු සීමාව නැතිවීයයි.

**ගාමසීමා**: සීමාවක් සම්මත නොකළ කල්හි –පෙ– ඒ ගමේ යම් සීමාවක් වී නම්: මේ එහි **සමාන සංවාස ඒකූපෝසථ සීමාව** ය[7]. '**ගාමො යෙව: ගාමසීමා**[8]= ගම ම

---

1. සීල: 5, 2 සීල: 6, 3. සීවි: ඛා, 4. සීවි: ඛා,
5. කපි: 4, 6. සීදී: 3, 7. මඋ: 268, 8. සිවි: බො,

ගාමසීමාව' ය. මේ ගම: මහාසීමාව වැනි බද්ධසීමාවකට සම්පූර්ණයෙන් හෝ, සමභිනන්දන–අපේක්ඛාත්ථරණයන්ට සුදුසු තරම් පෙදෙසක් හෝ යටපත් නොවූ, එසේ කුඩාවූ හෝ බද්ධ සීමාවකින් අන් ගමක් හා සම්බන්ධ නොවූ පිරිසුදු ගමය.

එක ගම් කොතක් යම් පමණ වේද: මේ **ගාමසීමා** නමි. ගම ගැණීමෙන් නගරය ද ගන්නා ලද්දේ වෙයි එහි යම් පමණ ගම් පෙදෙසක ග්‍රාමසේවකයෝ අය – බදු ලබත් ද: සුළු වූ හෝ, මහත්වූ ඒ පෙදෙස: **ගාමසීමාව** ය: යන සඞ්ඛ්‍යාවට යෙයි. එක ම ගම්කොතක යම් පෙදෙසක් (කොටසක්) ය. මෙය වෙනම ගමක් වේවා යි: වෙන් කොට රජ තෙම කිසිවෙකුට දෙයි ද: ඒ ගම **විසුංග්‍රාම සීමාව** වෙයි. එබැවින් ඒ විසුංග්‍රාමය ද, අතික් ප්‍රකෘති ගාම-නගර සීමා ද: **බද්ධසීමා** සමාන වූවාහු වෙත්. හුදෙක් ඒ සීමාවෝ වනාහි: **තිචීවරවිප්පවාසය** නොලබත්.[1]

**උදකුක්ඛෙප සීමා**: නදී-සමුද්‍ර-ජාතස්සරයන්හි මැදුම් බලය ඇති පුරුෂයකුගේ* හාත්පස උදකුක්ඛෙපයෙන්* පිරිසුන් ප්‍රමාණය 'උදකුක්ඛෙපසීමා' නමි.[2]

**සත්තබ්භන්තරසීමා**: ගම නො වූ වෙනෙහි මැද සිටි භික්ෂුවගේ දෙපසින් අබ්භන්තර සත බැගින් තුදුස් අබතුරක්* සත්තබ්භන්තර සීමා' නමි.[2]

---

## ත්‍රිවිධ සම්පත්ති

බද්ධසීමාවක් සම්මතකරණ කල්හි: **නිමිත්ත - පරිස - කම්මවාචා** යන ත්‍රිවිධ සම්පත්තිය සම්පූර්ණ වියයුතු.

**නිමිත්තසම්පත්ති** නම්: අට වැදෑරුම් නිමිති අතුරෙන් ඒ ඒ දිසාවලින් ලැබෙන පරිදි සුදුසු නිමිති '**පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං**' යනාදි ක්‍රමයෙන් කීර්තනය කොට, නැවතත් මුලින් කීර්තනය කළ නිමිත්ත කීර්තනය කොට නිමිති ගලපා තැබීම ය[2].

1. පාමු: 183, 2. කවි: 5, 6. * උබ:

**පරිසසම්පත්ති** නම්: සීමාබන්ධනයට ඉතා අඩු වශයෙන් සතර නමක්වත් රැස්ව: ඒ ගමේ බද්ධසීමා - නදී - සමුද්ද-ජාතස්සරයන්හි සිටි භික්ෂූන්හැර අන්සියලු භික්ෂූන් අත් පසට කැඳවාගෙණ පැමිණිය නොහැකි භික්ෂූන්ගේ ඡන්දය ද ගෙණ සම්මත කිරීම ය.[1]

**කම්මවාචාසම්පත්ති** නම්: **'සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා-'** යනාදි නයින් **සඞ්ඝො** කියන ලද පිරිසුදු (බ්‍යඤ්ජන සම්පත්තියෙන්* යුතුව උදෙසන ලද) ඤත්තිදුතිය කර්මවාක්‍යයෙන් සම්මත කිරීමය.[1]

---

## අට වැදෑරුම් නිමිති

**පබ්බත - පාසාණ - වන - රුක්ඛ - මග්ග - වම්මික - නදී - උදක.**

සුද්ධපංසු (පස්කන්ද), සුද්ධපාසාණ (ගල්කන්ද), උභය මිස්සක (ගල් - පස් මිශ්‍රවූ කන්ද) යයි: තෙවැදෑරුම් වෙයි.

**පබ්බතනිමිත්ත**[2]: තනි වැලිගොඩ සුදුසු නැත. ඒ තුන් වැදෑරුම් පර්වත: ඇතෙකුට වඩා විශාල විය යුතුය. ඊට කුඩාවීම සුදුසු නැත. ඇතෙක් හත්-අටරියනක් පමණ උස ඇත[3]. ඇතෙකුට වඩා කොතරම් විශාලවූවත් වරද නැත. සතර දිසාවෙහි නිමිති සතරක් හෝ, තුන්දිසාවක නිමිති තුණක් හෝ පබ්බත නිමිත්තාදී වසයෙන් ගෙණ නිමිති කීර්තනය කොට බද්ධ සීමාවක් සම්මත කළ හැක.

නිමිති දෙකක් හෝ, එකක් කීර්තනය කිරීමෙන් සීමාවක් සම්මත කළ නොහැක. පර්වතය: නිමිත්තක් කොට සම්මතකරන්නහු විසින්: මේ පර්වතය: සීමාව හා එකට සම්බන්ධ වී ඇද් ද? නැද්ද? යි: විමසා බලා, එකට සම්බන්ධවී තිබේ නම්: නිමිත්තක් ලෙස කීර්තනය නො කළයුතු. පාසාණාදි නිමිත්තයන් පිළිබඳව ද එසේයි.

---

1. කඞ්: 5-6. 2. සපා: 773, කඞ්: 5, 3. විම: 18,

නොයෙක් දිසාවලට විහිදී ඇති එකම පර්වතය: එක දිසාවකින් පමණක් නිමිත්තක් ලෙස කීර්තනය කොට, නැවත අන් දිසාවකින් ද: එය ම නිමිත්තක් ලෙස කීර්තනය නොකළ යුතු. සීමවිහාරය* වටකොට සිටි පර්වතය: එක දිසාවකින් නිමිත්තක් ලෙස කීර්තනයකර අන් දිසාවලින් එය බැහැරලා එහි පිහිටි: රුක්–හුඹස් ආදි අන් නිමිත්තක් කීර්තනය කරගත යුතු.

ඉදින් පර්වතයෙන් කොටස් කීපයක් හෝ, බාගයක් හෝ සීමාවට ඇතුළත් කර ගැණීමට උවමනා නම්: පර්වතය නිමිත්තක් ලෙස කීර්තනය නොකොට, එහි ඇති තෙමේ හටගත්[1] රුක්–හුඹස් ආදි එක්තරා නිමිත්තක් කීර්තනය කරගතයුතු. ඉදින්: යොදුන් දෙක–තුණක් පමණවූ සියලු පර්වතය ම: සීමාවට ඇතුළත් කරගණු කැමති නම්: පර්වත යෙන් බැහැර, බිමෙහි හටගත් රුක් – හුඹස් ආදි නිමිති කීර්තනය කරගතයුතු. එසේ නිමිති කීර්තනය කරණවිට: අට වැදූරුම් නිමිතිවලින් මිශ්‍රව හෝ, අමිශ්‍රව සියගණන් වුවත් නිමිති කීර්තනය කළහැක.[2]

---

**පාසාණනිමිත්ත[3]:** යගුළි හෝ යබොර ද[4] පාසාණ සඞ්ඛ්‍යාවට යෙයි. එබැවින් යම්කිසි පාසාණය (ගල)ක් නිමිත්තක් වසයෙන් කීර්තනය කිරීම වටී. ප්‍රමාණයෙන් එය ඇතෙකු පමණ වුවහොත්: පර්වත සඞ්ඛ්‍යාවට යන බැවින් මහගොණෙක්–මහමීහරකෙක් පමණ පාසාණය: උඩත් පිරිසයින් ද, යටත් පිරිසයින්: (බරින් නොව විශාලත්‍වයෙන්) දෙතිස් පලමක්* තරම් වූ උක්සකුරු ගුළියක් පමණ ඇති පාසාණය ද වටී. එයට කුඩාවූයේ නො වටී.

මහත්වූ හෝ මැටියෙන් කළ ගඩොල් නොවටී. අනිමිත්තූපග ගල්කැට – වැලි – පස්ගොඩවල් ද: නොවටී. සාමතක් මෙන් බිමට සමවූගල් තලාව ද, බිමෙන් කණුවක්

---

1. විවි: 369, විම: 18, 2. විම: 17, 3. සපා: 774, 4. සාවි: 5. *උබ:

සේ නැගී සිටි ප්‍රමාණවත් ගල ද සුදුසු ය. ඉතා මහත් ගල් තලාව ද පාසාණ සඞ්ඛ්‍යාවට ම යෙයි. මහ ගල්තලාවක එක් පෙදෙසක්: සීමාවට ඇතුල් කරගණු කැමැත්තේ නම්: එය නිමිත්තක් ලෙස කීර්තනය නො කොට, ඒ ගල්තලාව මතු පිට ඇති: අනික් ගලක් නිමිත්ත ලෙස කීර්තනය කළයුතු.

ගල්තලාවක් මත (බඞසීම) විහාරයක් කරත්නේ නම්: ඒ ගල්තලාව (බඞසීම) විහාරය මැදින් විනිවිද ගොස් සිටිය හොත්: එවැනි ගල්තලාවක්: නිමිත්තක් ලෙස ගතයුතු නැත. ඉදින් එය කීර්තනය කළහොත්: (බඞසීම) විහාරය: නිමිත්ත මතුපිට පිහිටියේ වෙයි. හැම නිමිත්තක්ම සීමාවෙන් බැහැරව සිටිය යුතු බැවින් (බඞසීම) විහාරය ද සීමාවෙන් පිටත පිහිටියා වෙයි. (බඞසීම) විහාරය වටකොට පිහිටි ගල්තලාව එක දෙසකින් පමණක් කීර්තනය කළයුතු[1].

---

**වනනිමිත්ත**[1]:

තණ කොළ වනය හෝ, තචසාර නම්වූ මැදහරයක් නැති: තල් – පොල් – කිතුල් – උණ ආදි ගස් ඇති වනය ද: නිමිත්තක් ලෙස කීර්තනය කිරීමට සුදුසු නැත. අඹ – ජම්බු – කොස්[2] ආදි ගස් හා, හරය ඇති හල් ආදි ගස් ඇති වනය ද, යටත්පිරිසෙයින්: හතරෙන් තුණක් හෝ, පහෙන් තුණක් හෝ හරය ඇති ගස්වලින් යුත් වනය ද කීර්තනය කරත්ට වටී. යොදුන් සියගණත්වූ හෝ එවැනි වනය නිමිත්තක් ලෙස කීර්තනය කළ හැක.

වනයක්මැද (බඞසීම) විහාරයක් කරත්නේ නම්: ඒ වනය කීර්තනය නොකළ යුතු. වනයෙන් කොටසක් ඇතුළත් කොට සීමාවකරත්ට කැමැත්තවුන් විසින් වනය නිමිත්තක් ලෙස කීර්තනය නොකොට, එහි ඇති: රුක්ඛ – පාසාණාදිය නිමිති ලෙස කීර්තනය කළයුතු. බඞසීම විහාරය වටකොට ඇති වනය එක් දෙසකින් පමණක් කීර්තනය කළ හැක[1].

---

1. සපා: 774,    2. වීම: 19

කඳ මැද අරටුවක් නැති. තල් - පොල් ආදි ගස් නිමිත්තුපග නොවෙති. කඳ මැද අරටුව ඇති නොමළ:

**රුක්ඛනිමිත්ත[1]:** යටත්පිරිසයින් අටගුල් පමණවත් උස්වූ හෙළදිව පත්හිඳසා කඳක් තරම් මහත්වූ[2] හෝ, හුලැගිලි පමණවූ හෝ,[3] බට දඬු පමණවූ හෝ[4] ගස කීර්තනය කරන්ට වටී. එකට බැඳී හොඳ හැටි බිම පිහිටා, සිටි නුගවැනි ගස එක දෙසකින් කීර්තනය කොට, අන් දෙසකින් ද: කීර්තනය කරන්ට නොවටී. යොදුන් ගණන් පැතිරී වැඞී ඇති නුගරුක ද වටී. උණ - බට පුරුක් ආදි භාජනවල රෝපනය කළ ප්‍රමාණවත්වූ ද ගස: කීර්තනය කිරීමට සුදුසු නැත. එයින් ඉවත් කොට එකොණෙහි බිම සිටුවා, කොටුකර දිය ඉස ගත් ගසද කීර්තනය කිරීමට සුදුසුය. එහි අලුත් මුල් - අතු ආදිය ඇතිවීම ප්‍රමාණ නැත. කඳකපා සිටුවූ ගසෙහි මුල් අතු ලියලා පැවතීම උවමනා කරයි.

රුක: කීර්තනය කරණවිට 'රුක්ඛ' කියා හෝ, 'සාල-සාක-රුක්ඛ' ය යි: විසේස කොට කීම හෝ වරද නැත. එකට බැඳී වැඩුනු නුග වැනි ගස්වලින් එකක් පමණක් එක දෙසකින් කීර්තනය කොට නැවත අන්දෙසකින් ඒ ගස හා බැඳී ඇති අනික් ගසක් කීර්තනය කරන්ට නොවටී[1].

---

වන - කෙත් - ගංගා - වැව් - පොකුණු ආදියට පමණක් ගමන් කරණ මාර්ග: නිමිති ලෙස නොගත යුතු. යම් මගක්

**මග්ගනිමිත්ත[5]:** කෙලින් ගම් දෙකක්-තුණක් ඉක්මවා යයි ද: යම් පා මගක්: රියමග ඉක්මවා ගොස් නැවත රිය මගකට ම වැටේ ද: එවැනි පාමගක් හෝ, රියමගක් නිමිත්තක් ලෙස කීර්තනයට ගන්ට වටී.

---

1. සපා: 774, 2. විම: 19, 3. සාදි: ෂො,
4. විම: 19 5. සපා: 775, පාමු: 172,

කලින් ගමන් කොට අතහැර දැමූ පා මග හා, රිය මග ද නිමිත්තක් ලෙස කීර්තනයට නොවටී. පයින් හා රියවලින් වෙළඳාමට යන්නවුන්ගේ මාර්ගය ම ගන්ට වටී.

ඉඳින් පා මග දෙකක් එකතුවී, ගැල් මගක් මෙන් සැදෙයි ද: එය දෙකට වෙන්වූ තැන හෝ, එකට එක්වූ තැන හෝ වරක් කීර්තනය කොට, නැවත කීර්තනය නොකළයුතු. එය ඒකාබද්ධ නිමිත්තවන බැවිනි.

ඉඳින් සමහරවිට: සීමවිහාරය වටකොට, මාර්ග සතරක් සිවුදිගට යෙත් ද: ඒ මාර්ගයන්ගේ මැදින් එකක් කීර්තනය කොට එයට සම්බන්ධවූ අනික් මාර්ගයක් කීර්තනය කරන්ට නොවටී. ඒකාබද්ධව සිටි බැවිනි. සීමාවේ: සතර කොණින් මාර්ග දෙක සම්බන්ධවූ තැනින්[1] විනිවිද (යටකොට) ගිය මාර්ගය පරභාගයෙන් කීර්තනය කිරීම වටී. සීමවිහාරය මැදින් විනිවිද ගිය මාර්ගය කීර්තනය කරන්ට නොවටී. එය කීර්තනය කළහොත්: නිමිත්ත මත්තෙහි සීමවිහාරය වෙයි.

මාර්ගය කීර්තනය කරන්නහු විසින්: **මග්ග – පථ – පජ්ජ** යන කවර නාමයකින් හෝ කීර්තනය කරන්ට වටී. සීමවිහාරය වටකොට ගිය මාර්ගය එක තැනකින් කීර්තනය කොට අන් තැනකින්ද: කීර්තනය කරන්ට නොවටී.

———

යටත් පිරිසයින් එදිනම හටගත් අටඟුල් උසැති හරක් අඟක් පමණවූ ද: තුඹස: නිමිත්තක් ලෙස කීර්තනය කරන්ට වටී. ඉන්කුඩාවූයේ නොවටී.
**වම්මිකනිමිත්ත**[2]: වට කොට සිටි තුඹස එක දෙසකින් කීර්තනය කොට, අන් දෙසකින් ද කීර්තනය කරන්ට නොවටී.

———

දැහැමි රජුන්ගේ කාලයෙහි යම් දිනයක: පක්ෂයට වරක් හෝ, දස දිනකට – පස් දිනකට වරක් හෝ,

1. විවි: 398, 2. සපා: 775,

**නදීනිමිත්ත**[1]: වැසි වසිනවිට දියපහර පැවතී සිට, වැසි නැවතුනු පසු ජලය නැතිවී යයි ද: මෙය නදී සඞ්ඛ්‍යාවට නො යයි. යම් නදියක: මෙවැනි වැසි කාලවලද, වැසි සාරමසෙහි ද දිය පහර නොසිඳී පවතී ද, යටත්පිරිසෙයින් තෙමඩුළු* වසා සිවුරු හැඳ පොරවා ගඟ මැදින් ගමන් කරණ භික්‍ෂුණියකගේ අඳනය තෙමෙන තරම් පමණවත් (අඩියක් පමණ) ජලය ඇති ගංගාව නදී සඞ්ඛ්‍යාවට යෙයි. සීමාබන්ධනයට නිමිත්ත ද වෙයි. භික්ෂුණියකගේ නදීපාරගමනෙහි ද, උපෝසථාදි සඟකම් කිරීමෙහි ද නදීපාර සීමාසම්මතයෙහි ද මේ ප්‍රමාණවූ ජලය ඇති නදිය ගණියි.

යම් නදියක්: මාගීයක් මෙන් ගැල් සටහණින් හෝ, හතර - පස්රියන් පලලින් හෝ, පරිඛා සටහනින් හෝ, දෙතුන් රියනක් පලල ඇතිව: සීමවිහාරය වටකොට ගියේ නම්: එය: එක දෙසකින් කීර්තනය කොට, නැවත: අන් දෙසකින් කීර්තනය නො කළයුතු.

සීමවිහාරයෙහි: සිවුදිගින් ඔවුනොවුන් විනි විද ගිය සිවුරැස් නදියෙහි ද: මේ ක්‍රමය මැයි. එකට එක මුසු නො වූ නදිය: සිවු දිගින්ම කීර්තනය කරන්ට වටී. ඉදින් ගඟ සරසට: වැටමෙන් ගස් හෝ, ලී සිටුවා, වැල්-කොළ ආදිය තබා, ගඟ දියපහර වලක්වා-අහුරා තැබූ ගංගාව ද නිමිත් තක් කරන්ට වටී. එසේ අහුරා තැබූ විටදී: ජලය නොපවතී නම්: හෙයක් කොට තැබූ නදියෙහිත්: එසේම ජලය නො පවතී නම්: ඒ නදිය නිමිත්තක් කරන්ට නො වටී.

දුබික් කාල හෝ, ගිමන් කාල: ජලය නැතිවී ගිය ද: එවැනි නදිය: නිමිත්තක් වසයෙන් ගතහැක. මහා නදියෙන් පිටතට ගන්නා දියමාතිකාවල: නිතර ජලය පැවතුනත් නදී නිමිත්තක් කරන්ට නොවටී. මහා නදියෙන් ගලාගිය ජල මාතිකාවත් කල්ගත වීමෙන් ඔරු - පාරු යාහැකි මෝර - කිඹුල් ආදි දිය සතුන් ගැවසුනු නදියක් වේනම්: එය නදී නිමිත්ත වසයෙන් කීර්තනය කළහැක.

---

1. සපා: 775. * උබ:

දිය නැති තැනෙක නැවක-ඔරුවක හෝ, කළ-හැළි ආදි බඳුන්වල හෝ දිය පුරවා තබා ගෙණ: **උදක නිමිත්තක්** ලෙස කීර්තනය කරන්ට නො වටී. බිම **උදක නිමිත්ත**[1]: පිහිටි ජලයම කීර්තනය කළයුතු. වල්-වැව්-පොකුණු-විල්-ජිතස්සර-ලුණු ලේවා ආදියෙහි ඇති ගලා නොයන ජලය කීර්තනය කරන්ට වටී. දිය පහර - නදී - දියමාතිකා ආදියෙහි ගලා බස්නා ජලය කීර්තනය කරන්ට නොවටී.

**අඛාතටස්ථා**වෙහි: ගැඹුරු ආවාට (ළිං) ආදියෙහි දිග-රැහැන්වලින් ඇද ගන්නා තරම්: ගැඹුරෙහි ඇති ජලය කීර්තනය නොකළ යුතුය යි: කියයි. එය වරදවා කීමකි. එය තමන්ගේ මතිමාත්‍රයකි. යටත්පිරිසෙයින්: **ඌරන්** කැණූ වළක හෝ, ගම්දරුවන් කෙළනා පිණිස කැණූ විලක හෝ ජලය ද, එකෙණෙහි බිම වල් සාරා කළ භාජනාදියෙන් ගෙණැවිත් පිරවූ ජලය ද: සීමාසම්මත කම් වාක්‍යය සඞ්ඝයා විසින් උදෙසා නිමවනතුරු (මුලින් වත්කළ ජලය) නොසිඳී පවතී නම්: නිමිත්තක් ලෙස කීර්තනය කරන්ට වටී.

ඒ දිය පිරවූ වල් තුබූ තැන්වල: නිමිත්තෙහි ඇතුල් පැත්ත කෙළින් සම්මත බිම්සීමාව නොවරදවා දැනගැණීම පිණිස: ගල්කාණු හෝ, දූවකාණු-ගල්-පස්-වැලි ගොඩ හෝ ඇති කරන්ට ද, ඇතිකරවන්ට ද වටී. (මේවා කීර්තනය නොකළ ලකුණුය)

---

## නිමිත්ත කීර්තන

තුන්යොදුන් සීමාව හැමදිසාවෙන්ම තුන්යොදුන විය යුතුය. නොයෙක් දිසාවලින් නිමිති ගන්නාවිට භූමිප්‍රමාණයේ නානාවිධ සටහන් ඇතිවෙයි. එකකොණක් දිගවී අන් කොණක් කොට - පටු - පලළ - දිග හෝ වියහැක. එසේ ඇතිවන කවර කොණක සිට හෝ ඒ කෙළින් ඇති

---

1. සපා: 776

අනික් කොණට කවර අන්දමකින්වත් තුන්යොදුනට වැඩි නොවියයුතු. කෙසඟක්වත් වැඩිවූවහොත් සීමාව අසීමාව වෙයි. භික්ෂුව ද ඇවැත් අවදියි.[1]

තුන්යොදුන් සීමාවෙහි: තුන්වරක් වටා ගමන්කරමින් නිමිති කීර්තනය එක දිනකින් ම අපහසු බැවින් හාත්පස යොදුන් එකහමාර බැගින් අවකාස තබා, සීමා භූමිය මැද සිටි විනයධර භික්ෂුව විසින් තමා නොදන්නා ලද්දාවූ ද, ප්‍රථමයෙන් භික්ෂූන් දැක සුදුසුයයි: සම්මත කරණලද්දාවූ ද නිමිති[2] **"පඨමං නිමිත්තං කිත්තෙතබ්බං** = පළමුකොට නිමිති කීර්තනය කළ යුතුය" යි: දැක්වූ හෙයින් සීමා සම්මතයට ප්‍රථමයෙන් කීර්තනය කළයුතු[3].

කුඩා සීමාවක වුවත්: සීමාභූමිය මැදසිට: ඒ ඒ දිසාවන්ට හැරී නිමිති වෙතද: නො ගොස් නිමිති කීර්තනය කළ හැක[4]. සමහරවිට පෙරදිග නිමිත්තක් නොමැතිනම්: නිමිත්තක් ඇති දිසාවක සිට කීර්තනය ඇරඹීම නිවැරැදිය. එසේ කීර්තනය කිරීමේදී: අටදිග පටන් තුන්දිග තෙක් කීර්තනය කළහැක. නිමිති කීර්තනය කරණ භික්ෂුව. පෙරදිග පටන් දකුණට හැරී ගමන්කළයුතු. ආරම්භයේදී විනයධර භික්ෂුව: පෙරදිග නිමිත්තට අභිමුඛව නිමිතිවලින් බැහැර නොගොස් හාත්පස නිමිතිතුළ සිට: **"පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං** = පෙරදිග නිමිත්ත කුමක් ද?" යි: උපසපන්වූ, හෝ නොවූ නිමිත්තෙන් බැහැර සිටි කෙනෙකුගෙන් විචාළයුතු. එවිට නිමිත්ත පර්වතය නම්: **"පබ්බතො භන්තෙ** = වහන්ස! පර්වතය" යි: කියයුතු. නැවත! විනයධර භික්ෂුව විසින් **"එසො පබ්බතො නිමිත්තං** = මේ පර්වතය නිමිත්තය" යි: කීර්තනය කළයුතු. (ශබ්ද නගා කියයුතු) 'එතං පබ්බතං නිමිත්තං කරොමි-...... කරිස්සාම- .. කතො-..... හොතු- .. භවිස්සති-...... හොති' යනාදි වසයෙන් කීර්තනය නොකළයුතු[3].

අනතුරුව **"පුරත්ථිමාය අනුදිසාය, දක්ඛිණාය දිසාය, දක්ඛිණාය අනුදිසාය, පච්ඡිමාය දිසාය, පච්ඡිමාය**

1. සපාඃ 780-781, 2. විවි 396, 3. සපාඃ 773, 4. විවි: 396, විලඃ 202,

**අනුදිසාය, උත්තරාය දිසාය, උත්තරාය අනුදිසාය කිං නිමිත්තං”** යනුවෙන් දකුණට ගමන් කරමින් නිමිති කීර්තනය කරගෙණ අවුත්: එතැනින් නොනැවතී, නැවතත් මුලින් කීර්තනය කළ පෙරදිග නිමිත්ත ඉදිරියට පැමිණ **‘‘පුරත්ථිමායදිසාය කිං නිමිත්තං”** යනුවෙන්: ප්‍රථමයෙන් කීර්තනයකළ පෙරදිග නිමිත්ත: නැවතත් කීර්තනයකොට, නිමිත්තෙන් නිමිත්ත ගලපා තැබියයුතු. එසේ නොකළ හොත් **‘ඛණ්ඩ නිමිත්ත’** වෙයි[1]. දිසා කීපයක දෙතුන් දෙනෙක් සිට කීර්තනය කිරීම නොවටියි.[2]

අටවැදෑරුම් නිමිති අතුරෙන් මිශ්‍රවූ ද, අමිශ්‍රවූ ද නිමිති කීර්තනය කළහැක. උදක – පාසාණ ආදි එකම නිමිත්තක් අටදිසාවෙහි ම හෝ, එක දිසාවකින් උදක නිමිත්ත ද, අන් දිසාවකින් පාසාණ නිමිත්ත ද ගෙණ මිශ්‍රව ද කීර්තනය කරන්ට වටියි. නිමිති එකක් හෝ දෙකක් පමණක් කීර්තනය කොට සීමා සම්මත නොකළ යුතු. මිශ්‍රව හෝ අමිශ්‍රව නිමිති තුණේ පටන් සියගණනක් වුවත් දිසා – අනුදිසාවලින් ගෙණ කීර්තනය කිරීම වරද නැත. එක දිසාවකින්ම නිමිති වැඩිගණනක් වුවත් කීර්තනය කළ හැක. **“පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං, පබ්බතො භන්තෙ; පුන පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං, පාසාණො භන්තෙ; පුන පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං, උදකං භන්තෙ;”** යනුවෙන් නිමිති කැමති ගණනක් වුවත් කීර්තනය කළහැක.[3]

මහාසීමා බන්ධනයෙහිදී පළමුකොට, ඛණ්ඩසීමාවල නිමිති කීර්තනය කොට, ඊට අනතුරුව සීමන්තරිකවල නිමිති කීර්තනය කොට, අවසානයෙහි මහාසීමාවෙහි නිමිති කීර්තනය කොට: යම් සීමාවක් ප්‍රථමයෙන් බඳිනු කැමති නම්: ඒ සීමාවෙහි පටන් සීමාබන්ධනය කළහැක. නමුත්: ඛණ්ඩසීමාවෙහි පටන් සීමාබන්ධනය කිරීම සුදුසුය. නිමිති කීර්තනය කරණවිට ඛණ්ඩසීමාවෙහි නිමිති මහාසීමාවෙහි සිට ද, මහාසීමාවෙහි නිමිති ඛණ්ඩසීමාවෙහි සිට ද කීර්තනය

---

1. සපා: 773, 2. විවි: 397, 3. විවි: 398, සපා: 776,

නොකළ යුතු. **සීමන්තරික** පාසාණ ද: සිමන්තරිකයෙහි සිටම කීර්තනය **කළයුතු**[1]. සීමා නිමිති: සීමා මණ්ඩලය සම්මත කරන්නාවූ භික්ෂූන් විසින් තුන්වරක් කීර්තනය කළයුතුය යි: **අන්ධකට්ඨකථාවෙහි** දක්වයි[2].

මෙසේ නිමිති කීර්තනයෙන් පසු: සමාන සංවාස-තිචීවරාවිප්පවාස කම්වදන් උදෙසා, සීමාසම්මතය කළකල්හි බුඩාඥවෙන් ජලපොළව තෙක් කීර්තනය කළ නිමිති ඇතුළත සීමාව පිහිටයි. නිමිති බැහැරවෙයි[3].

---

## සීමාභූමි සටහන්[4]

නිමිති සම්මතකිරීමේදී: නිමිති තුණට අඩුගණනකින් සීමාවක් සම්මත නො කළහැක. නිමිති තුණකින් සීමාව සම්මත කළහොත් ඒ බිම් සටහන ත්‍රිකෝණාකාර වෙයි. සතර වුවහොත්: සිවුරැස් වෙයි. මෙසේ: වට-අඩසඳ-පණව-මුදිඞ්ග-විතාන-නැගුඳුනු-සකට ආදි ආකාරවූ ද*, සයපට්ටන් -අටපට්ටන් ආදි ආකාර ඇත්තාවූ ද නිමිතිවලට ගැලපෙනසේ භූමිසටහන ඇතිවන නමුත් ඉඩපහසු ඇතිවන අයුරැ ඒ බිම්පෙදෙසෙහි සීමාමණ්ඩිරය තනාගත හැක.

---

## සීමාබන්ධන

**"තං බන්ධිතුකාමෙහි: සාමන්ත විහාරෙසු භික්ඛූ තස්ස තස්ස විහාරස්ස සීමාපරිච්ඡෙදං පුච්ඡිත්වා: බද්ධසීම විහාරානං සීමාය සීමන්තරිකං, අබද්ධසීමවිහාරානං සීමාය උපචාරං ඨපෙත්වා, දිසාචාරික භික්ඛූනං නිස්සඤ්චාර සමයෙ, සචෙ එකස්මිං ගාමක්ඛෙත්තෙ සීමං බන්ධිතුකාමා: යෙ තත්ථ බද්ධසීමවිහාරා: තෙසු භික්ඛූනං මයං අජ්ජසීමං බන්ධිස්සාම, තුම්හෙහි සකසීම පරිච්ඡෙදතො වා බහි නික්ඛමිත්ථාති: පෙසෙතබ්බං, යෙ අබද්ධසීම විහාරා: තෙසු භික්ඛූ එකජ්ඣං සන්නිපාතෙතබ්බා.........**"[5]

---

1. සපා: 778, 2 සපා: 773, 3. සපා: 777 4 සපා:776, විස: 565, විවි: 398, සාදී: ෂො, 5. සපා: 777, පාමු: 176, විම: 21, *උබ:

ඒ සීමාබන්ධනය **කරණු** කැමති භික්ෂූන් විසින් (සීමා බන්ධනය **කරණ** ගමේ) හාත්පස විහාරයන්හි භික්ෂූන්ගෙන් ඒ ඒ (සීම) විහාරයාගේ සීමා පරිච්ඡේදය (මයිම්ාදූව) අසා, බද්ධසීම විහාරයන්ගේ* සීමාවට සීමන්තරිකායක්* ද, අබද්ධ සීමවිහාරයන්ගේ* සීමාවට උපචාරය ද* තබා, දිසා චාරික භික්ෂූන් ඔබ මොබ ගමන් නොකරණ වේලාවක (සීමාබන්ධනයකළයුතු) ඉදින් එක් ගම්කෙතක (ගමක) සීමාවක් බඳිනු කැමැත්තහු නම්: එහි යම් බද්ධසීමවිහාරයෝ වෙත් නම්: ඒ විහාරවල භික්ෂූන්ට "අපි අද සීමාවක් බන්ධනය කරන්නෙමු: ඔබ ස්වකීය සීමා පරිච්ඡේදයෙන් බැහැර නොයව්" ය යි: දන්වා යැවියයුතු. යම් අබද්ධසීම විහාරයෝ* වෙත් නම්: ඒ විහාරවල භික්ෂූහු එකට රැස් කරවියයුතු. ඡන්දය ගෙන්වා ගැණිමට සුදුසු භික්ෂූන්ගෙන් ඡන්දය ගෙන්වා ගතයුතු. ඉදින් අනික් ගම්කෙත්ද: ඇතුළත් කරගණු කැමැත්තහු නම්: ඒ ගම්වල යම්පමණ භික්ෂූහු වෙසෙත් ද: ඒ භික්ෂූන් ද පැමිණිය යුතුය. "නො පැමි-ණෙන්නවුන්ගේ ඡන්දය ගෙණ ආ යුතු" ය යි: **මහාසුමම** තෙර කියයි.[1]

**මහාපදුම** තෙර වනාහි: 'නොයෙක් ගම් කෙත්: වෙන වෙන ම බද්ධසීමා සමාන වෙත්: එහෙයින් ඡන්දපාරිසුද්ධිය නො පැමිණෙයි. එබැවින් නිමිතිතුළ වසන භික්ෂූන් පමණක් පැමිණිය යුතුය"යි: කියා, නැවත "සමාන සංවාස සීමාව සම්මතකරණ කාලයෙහි: පැමිණියත් නො පැමිණියත් වරදක්නැත.[2] අවිප්පවාස සීමාව සම්මතකරණ කාලයෙහි නිමිතිතුළ වසනා භික්ෂූන් පැමිණිය යුතුය. නොපැමි ණෙන්නාවුන්ගේ ඡන්දය ගෙණ ආයුතු"යයි: කියයි.[1]

මෙසේ භික්ෂූන් රැස්වූකල: ඡන්දය* ගැණිමට සුදුසු භික්ෂූන්ගෙන් ඡන්දය ගෙණ ආ කල්හි: ඒ ඒ මාර්ගවල ද ගං තොට – ගංදෙර ආදිතන්හි ද: යන එන ආගන්තුක භික්ෂූන් වහ වහා අත්පසට කැඳවා ගැණිම පිණිස ද, එසේ

1. සපා: 777, 2. සාදී: ෂො, * උබ:

නො පැමිණෙන භික්ෂූන් ගාමසීමාවෙන් බැහැර කිරීම පිණිස ද, ආරාමිකයන් හා සමණුද්දෙසයන් ද සිටුවා (සීමා සම්මතකිරීමට ආසන්න බව) බෙරහඬ - සක් හඬ ආදි ශබ්දයකින් දන්වා නිමිති කීර්තනයට අනතුරුව: **"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො .... ;"** යනාදි වසයෙන් කියන ලද: සමාන සංවාස - තිචීවරාවිප්පවාස කම්වදන් උදෙසා සීමා බන්ධනය කළයුතු[1].

කම්වදන් අවසානයෙහි නිමිති බැහැර කොට ඇතුල් බිම්කොටසෙහි යට පොළොව දරාසිටින ජලයතෙක් (බුඩාළුවෙන්) සීමාව පිහිටියා වෙයි. මේ සමාන සංවාස සීමාව සම්මත කරණ භික්ෂූන් විසින්: පබ්බජ්ජු'පසම්පදාදී* සඞ්ඝකම්මයන්ගේ පහසුව පිණිස පළමුකොට **ඛණ්ඩසීමාව** බැඳියයුතු[1].

---

## ඛණ්ඩසීමා:

ඛණ්ඩසීමාව* බඳින භික්ෂූන් විසින්: වත දැනගතයුතු[1]. බෝධිය - චෛත්‍යය - බොජුන්හල ආදි සියලු විහාරවස්තූන් පිහිටුවා කළ විහාරයෙහි ඛණ්ඩ සීමාවක් බඳින්නේ නම්: බොහෝ ජනයන් හැසිරෙන විහාරය මැද නොබැඳ, විහාරපසුභාගයෙහි අවකාශ ඇති පෙදෙසක බැඳියයුතු. (භික්ෂූන් වසන) විහාරයක් නො කළ තැනෙක බඳින්නවුන් විසින්: බෝධිය-චෛත්‍යය ආදි විහාර වස්තූන්ට ඉඩතබා අවකාශ ඇති සුදුසු තැනෙක බැඳියයුතු. ඒ සීමාව යටත්පිරිසයින් (ඉතා අඩුගණනින්) විසිඑකනමක් භික්ෂූන්ට වටේ හිඳීමට හැකිවියයුතු. මේ ඉතා කුඩා සීමාව ය. මීට වඩා කුඩා සීමාවක් සම්මත නොකළ හැක. මීට වඩා සියදහස්ගණන් භික්ෂූන්ට හිඳීමට තරම් විසාල වූ සීමා සම්මත කළ හැක[1].

---

1. සපා: 777, *උබ:

මෙසේ **ඛණ්ඩසීමාව** සම්මත කරණ භික්ෂූන් විසින්. සීමාමාලකය* හාත්පස වටා නිමිත්තූපග පාසාණ* තැබිය යුතු. **ඛණ්ඩසීමා** වෙහි සිටි භික්ෂූන් විසින්: මහා සීමාව නො බැඳිය යුතු. (සම්මත නොකළ යුතු) මහාසීමාවෙහි සිටි භික්ෂූන් විසින් ද **ඛණ්ඩසීමාව** නො බැඳිය යුතු. ඛණ්ඩසීමාවෙහිම සිට ඛණ්ඩසීමාව ද, මහාසීමාවෙහි සිට මහාසීමාව ද බැඳිය යුතු. මේ දක්වන්නේ එය බඳනා විධියයි.[1]

**ඛණ්ඩසීමාව** හාත්පස වටා **'එසො පාසාණො නිමිත්තං'** යනුවෙන් මෙසේ නිමිති කීර්තනය කොට සමානසංවාස සීමා සම්මත කර්මවාක්‍යයෙන් ඒ සීමාව සම්මත කළ පසු: එය ම දැඩිකිරීම පිණිස තිචීවරාවිප්පවාස කර්මවාක්‍යයෙන් අවිප්පවාස සීමාව ද සම්මත කළයුතු. එසේ සීමාව සම්මත කොට පිටතින් සීමන්තරිකා පාසාණ* තැබිය යුතු[2]. ඒ සීමන්තරිකා පාසාණ* නොඅඩුවසයෙන් නිමිතිගලේ සිට රියනක් හෝ වියතක් පමණ අතර තිබීම ප්‍රමාණ ය යි: **කුරුන්දිය** අටුවාවෙහි ද, සතරඟුලක් පමණද වටින්නේ ය යි: **මහාපච්චරිය** අටුවාවෙහි ද කියයි[2].

ඉඳින් විහාරය විසාල වේ නම්: ඛණ්ඩසීමා දෙකක් – තුණක් හෝ, ඊට වැඩිගණනක් හෝ බැඳිය හැක. මෙසේ පළමුකොට ඛණ්ඩසීමා සම්මතකොට, මහාසීමාව සම්මත කරණ කාලයෙහි: ඛණ්ඩසීමා වලින් නික්මී මහා සීමාවෙහි සිට ගාත්පස වටා හමත් කරමින් මහාසීමාවෙහි නිමිති කීර්තනය කොට: අත්පස* නො හැර සිටින භික්ෂූන් විසින්: කර්මවාක්‍යයෙන් සමානසංවාස සීමාව සම්මතකොට: එය තහවුරු කරණු පිණිස: තිචීවරාවිප්පවාසසීමාව ද සම්මත කළ යුතු. එවිට සමානසංවාස සීමාවසමූහනනය කරන්නෙමුයි: පැමිණෙන්නවුන්ට අවිප්පවාසසීමාව නොසලකා: එය නො දැන[3] එකවිට සීමාසමූහනනය කරන්ට නොහැකි වෙයි.

ඉඳින් ඛණ්ඩසීමාවෙහි නිමිති කීර්තනය කොට ඉක්බිති සීමන්තරිකයෙහි* නිමිති කීර්තනයකොට මහාසීමාවෙහි ද නිමිති කීර්තනය කොට: මෙසේ තුන් තැනකම නිමිති

1. සපා: 777, 2 සපා: 779, විවි: 399, 3. වබු, පාමු: 177 * උබ:

කීර්තනය කොට තබා: මෙයින් යම් සීමාවක් පළමුවෙන් බඳිනු කැමති නම්: ඒ සීමාව පළමු කොට බැඳිය හැකි වෙයි. එසේ වුවත් කියන ලද ක්‍රමයෙන් ඛණ්ඩසීමාවෙහි පටන් ම සීමාබන්ධනය කළයුතු.

මෙසේ බඳනාලද සීමා ඇතිකල්හි: ඛණ්ඩසීමාවෙහි සිටි භික්ෂූහු: මහාසීමාවෙහි විනයකර්ම කරන්නවුන්ගේ ඒ කර්මය කොප්‍යය නොකරත්. එසේම මහාසීමාවෙහි සිටි භික්ෂූහු: ඛණ්ඩසීමාවෙහි විනයකර්ම කරන්නවුන්ගේ ඒ විනය කර්ම කොප්‍යය නොකරත්. සීමන්තරිකායෙහි සිටි භික්ෂූහු ඛණ්ඩ සීමා-මහාසීමා දෙකෙහිම කර්මකොප්‍යය නොකරත්. ගම් කෙතෙහි සිට විනයකර්ම කරණ භික්ෂූන්ගේ ඒ කර්මය සීමන්තරිකායෙහි සිටි භික්ෂූහු: කොප්‍යය කරත්. සීමන්තරිකාය ගම්කෙත භජනය කරණ හෙයිනි.[1]

බඩසීමාවක්: පොළෝතලයෙහි පමණක් නොව: ගල් තලාවක - තණකිළියක - ලෙණක - පහයක-පර්වත මුදුනක වුවත් බැඳිය හැක.[1]

පිටුපහණෙක-ගල්තලාවෙක: සීමාවක් බඳින භික්ෂූන් විසින්: ඒ ගලමත්තෙහි සීමාව පමණ ඉරක් හෝ: ගල්වළ වල් හෝ කොටා ඒවා නිමිති මෙන් කීර්තනය නො කළ යුතු[2]. නිමිත්තූපගපාසාණම* තබා නිමිති කීර්තනය කළයුතු සීමාබන්ධන කර්මවාක්‍යාවසානයෙහි බුද්ධාඥාව පරිදි පොළොව අනන්තයතෙක් බැස සීමාව පවතියි.[1]

නිමිතිගල් තුබූතැන නො පවතීනම්: වටේ ඉරක් හෝ කොටා සතර කොන්වල ගලවිද හෝ, සීමාවෙහි පිරිසිඳීම මෙපමණය යි: අකුරු හෝ කොටා තැබිය යුතු. කුටිගෙයෙහි බිත්ති කීර්තනය නොකොට භික්ෂූන් විසිඑක නමකට පහසු වෙන් වටා හිඳීමට අවකාස ඇතිතරම් පෙදෙසක් ඇතුල් කොට පාසාණ නිමිති තබා සීමාව සම්මත කළයුතු.[2]

ඉඳින් බිත්ති ඇතුළත: විසිඑක් නමකට හිඳීමට තරම් අවකාස නැති නම්: ඊට යාබද කුටිපමුඛයෙහි* හෝ, වහල්

1. සපා: 778, පාමු: 179 2. විවි: 399, * උබ.

පලයෙන් ජලය වැටෙන තැන හෝ නිමිති තබා කීර්තනය කොට සම්මත කළ හැක.[1] එවිට සම්පූර්ණ කුටිගෙයම සීමාව වෙයි. බිත්ති සතරක් ඇති ලෙණ තුළ ද: බිත්ති කීර්තනය නො කොට: සීමාව සම්මත කළයුතු. එවිට කුටිගෙයෙහි මෙන් සීමාව පිහිටයි.[1]

පහය මතුයෙහි ද: බිත්ති කීර්තනය නොකොට ඇතු ළෙහි පාසාණ තබා නිමිති කීර්තනය කොට: සීමාව සම්මත කළහැක.[2] ඉදින් නො පොහොනේ නම්: පාසාද පමුඛ යෙහි ද* පාසාණතබා නිමිති කීර්තනය කොට සීමාව සම්මත කළහැක.

මෙසේ: සම්මත කළ සීමාව: පහය මතුයෙහි (උඩ තට්ටුවෙහි) ම වෙයි. යටට නොබසී යි.[2] ඉදින් භූමියෙහි බොහෝ කණු සිටුවා ඒමත තළාඳ (බල්ක) දමා, ඒ තළාඳ මත කළ පහයේ යට තට්ටුවෙහි ඇති බිත්තිය: උඩතට්ටුවේ කීර්තනය කළ නිමිති ඇතුළත පවතී නම් හෝ: යට භාගයෙහි පිහිටි බිත්තිය ඒ තළාඳ (කඳන්) හා එකට සම්බන්ධ වී සිටීනම් හෝ සීමාව ද යටතට්ටුවට බසී. පරස්පර වී සිටීනම්: පහත එකබිත්තියකින් හෝ, උඩ සීමා ප්‍රමාණ යෙන් වෙනස්ව තිබේ නම්: සීමාව නොබසී යයි: ඇතැම් කෙනෙක් කියත්. සමහරු: 'කොටසක ඇතැ'යි: කියත්. එහෙයින් විනයකර්ම නිසැකව කළයුතු.[3]

එක කණුවක් මත කළ ප්‍රාසාදයාගේ ඉහළ තට්ටුවෙහි බඳිනලද සීමාවක් වේ නම්: ඒ කණුවමත කියනලද පරිදි භික්ෂූන් විසිඑක නමකට හිඳීමට අවකාස ඇත්තේ නම්: සීමාව යටට බසී. ඉදින් ප්‍රාසාද බිත්තියෙන් නික්මුනු නුගඅරළු-මැලියම් ආදියෙහි පාසාණ තබා සීමාව බඳීනම්: පහයෙහි බිත්ති අතර පමණක් සීමාව වෙයි. පහළට බැසීම හෝ, යට කියනලද ආකාරයෙන් දතයුතු.[2]

යට පහයෙහි නිමිති කීර්තනය කරණ භික්ෂූන් විසින්. ලී කණු හා බිත්ති නිමිති ලෙස කීර්තනය නො කළයුතු

1. සපා: 778, පාමු: 179, 2. සපා: 779: 3. විව: 401,

බිත්තියට සම්බන්ධ වී ඇති ගල්කණු කීර්තනය කරන්ට වටියි. මෙසේ කීර්තනය කළ සීමාව: යටපහයේ නිමිතිගත ගල්කණු ඇතුළතම වෙයි.[1] ඉදින් යට පහයේ බිත්තිය උඩතට්ටුව හා සම්බන්ධවේ නම්: පහය මත්තට (උඩතට්ටුවට) ද සීමාව නගී. ඉදින් පහයෙන් පිට වහල් පියැස් සෙත් වැසිදිය වැටෙන තැන නිමිති තබා කීර්තනය කොට සීමාව සම්මත කරන්නේ නම්: සියලු ප්‍රාසාදයම සීමාවට අයත්වෙයි.[1]

පර්වතයක් මත ගල්තලාවක කුඩාසීමාවක්* බන්ධනය කළහොත්: ගල්පර්වතය යටට ද ඒ ගලමතුපිට සීමාප්‍රමාණ යෙන් සීමාව බසී යි. තල්මුලක් වැනි යට කොටස මහත් වූ උඩකොටස සිහින් වූ පර්වතයෙහි ද[2] සීමාව බැඳි කල යට කී ලෙස සීමාව පහතට බසී යි. යම් ගල් පර්වතයක් විතාන හෙවත් නයිහතු සටහන් ඇත්තේ නම්: එහි උඩ කොටස පළල්ව ද: යට කොටස පටුවී සිටී ද: එබඳු ගලක උඩකොට සෙහි බඳනාලද සීමාව යටට නොබසී යි. මෙසේම: මිහිඟු බෙර සටහන් ඇති පර්වතය: මුදුනට වඩා මැද පටු බැවින් ද, පණාබෙර සටහන් පර්වතය: යට කොටස මුදුනට වඩා පටු බැවින් ද මත්තෙහි බඳින ලද සීමාව: යටට නොබසියි[2].

යම් තැනෙක ආසන්නව පිහිටි ගල්පර්වත දෙකකින් එකක හෝ, මත්තෙහි කුඩා සීමාවක් කිරීමට තරම් දිග පළල නැත්තේ නම්: ඒ පර්වතදෙක අතර බැම් බැඳ හෝ, පස් ආදිය පුරවා හෝ එකට සම්බන්ධ කොට ඒ මත සීමාව සම්මත කළ හැක.

එකපැත්තකින් නයිපෙණයක් මෙන් නැමී විහිදී ගිය පර්වතයක් මත්තෙහි· සීමාවක් බැඳීමට තරම් විහිදී ගිය කොටස දිග – පළල ඇත්තේ නම්: එහි සීමාවක් බැඳිය හැක. එහි යට පැත්ත සීමාසම්මත කළ ප්‍රමාණයට වඩා කුහරයක් මෙන් සැදී, ආකාස පබ්භාරයක්* මෙන් සිටීනම් සීමාව පහළට නො බසී යි[2].

1. විවි: 400, 2. සපා: 779, * උබ:

කුඩා සීමාවක්* තරම් විසාල සිදුරක් (කුහරයක්) මැද ඇති ගල් පර්වතයක මුදුනේ සීමාවක් බැන්ද කල: සීමාව පහළට බසියි. ගල් පර්වතය සීමාවතුළ පිහිට යි. එහෙත්: ගල්පර්වතයෙහි ඇති යටලෙණෙහි (කුහරයෙහි) බඳින ලද බිත්තියෙහි උඩ කෙළවර ගලමතුපිට බැඳ ඇති සීමාවට අයිති කොටසේ පර්වතයෙහි යටි පැත්තට සම්බන්ධ වී සිටී නම්: සීමාව පහළට බසියි. පර්වතය මතුපිට ද යට ද සීමාව වෙයි. ඉදින් යට ලෙණ (පර්වතකුහරය) පර්වතය මත්තෙහි සීමාව පිහිටි මර්‍යාදායෙන් කෙළින් ඇතුළත නොපිහිටා ඉදිරි – පසුවී බැහැරව පිහිටියේ නම්: ලෙණ සීමාවෙන් බැහැරවෙයි. ලෙණතුළට සීමාව නො බසි යි[1].

තවද: පර්වතය මතුපිට පිහිටි සීමා මර්‍යාදාව කුඩා වේ නම්: සීමා පරිච්ඡේදය ඉක්ම වා සිටියේ නම්: සීමාව මත්තෙහි ම පිහිටයි. පහතට නො බසි යි[1].

ඉදින් පර්වතය පහළ ඇති ලෙණ කුඩාසීමාවක්* පමණ වී, පර්වතය මත්තෙහි ඇති සීමාව මහත් වේ නම්: එසේම මතු ඇති සීමාවට යටවී පිහිටියේ නම්: සීමාව පහළට බසියි. ඉදින් ලෙණ ඉතාකුඩා සීමා ප්‍රමාණයත් ඉක්මවා සිටී නම්: පර්වතය මත්තෙහි සීමාව එතනම වෙ යි. පහතට නො බසි යි. ඉදින් පර්වතය මත්තෙහි ඇති සීමාවෙන් කොටසක් බිඳවැටී ඉතිරි කොටස කුඩා සීමාවක් පමණ වේ නම්: එය සීමාවය. කඩා වැටුනු කොටස අසීමාවය[2].

ඛණ්ඩසීමාව: පිහිටි බිම පහත්වේ නම්: පස් ආදියෙන් පුරවා උස් කළත් සීමාව මැයි. සීමා බිමෙහි ගෙයක් කළ හොත්: ඒ ගෙය ද සීමාවට ඇතුළත් වෙයි. සීමාබිමෙහි පොකුණක් කැණුව හොත්: ඒ පොකුණද සීමාව වෙයි. යම්ලෙසකින් සීමා බිම වතුරගලා යට වී සිටී නම්: ඒ සීමා මාලකයෙහි* අටල්ලක් බැඳ විනයකර්ම කරන්ට වටි යි[2].

සීමාබන්ධනයට ප්‍රථමයෙන් බද්ධසීමාවට කෙළින් සිටි පොළොවයටින් ගලායන උමංගංගාවක ඉදිමත් උපසපත්

1. සපා: 779, පාමු: 179, 2. සපා: 780, පාමු: 179, *

භික්ෂුවක් සිටිය හොත්: ඒ සීමාවෙහි කරණ විනය කර්‍මය කොප්‍යය නො වේ. ඉදින් එහි සීමාබන්‍ධනයට පසුව උමං ගඟ ඇතිවී නම්: යට කී ලෙස භික්ෂුවක් සිටිය හොත්: විනය කර්‍මය කොප්‍යය වේ. තවද: සීමා භූමියට ඇතුළත් පොළොව තුළ හෝ, යම් හෙයකින් ඉදිමත් භික්ෂුවක් සිටිය හොත් එය විනය කර්‍මය කරණවෙලාවක් නම් කර්‍මය කොප්‍ය වෙයි[1].

සීමාබන්‍ධනය කරණකාලයෙහි ආසන්නව බද්ධසීමාවක් ඇත්නම්: එයට අන්තරිකයක් ද, ආසන්නයෙහි සීමාවක් නොපිහිටියේ නම්: එයට උපචාරයක් ද තැබියයුතු. 'සීමාවක් බඳින්නහු විසින්: සීමන්තරිකයක් තබා සීමාව බැඳියයුතුය'යි: කරණලද බුද්ධප්‍රඥප්තිය ඉක්මවී මෙන්: එසේ අන්තරිකයක් හෝ, උපචාරයක් නොතබා බඳින සීමාවෝ අසීමාවෙත්. ඒ සීමන්තරිකානුජානනයට අනුලෝම් වන බැවින් ඒ ඒ සීමාවන් හා රුක් ආදීන්ගේ සම්බන්‍ධය ද වලක්ව යි. එසේ අන්සීමාවක් හා අතු ආදියකින් ඇති සම්බන්‍ධය ද: ඉවත් කොට දමා සීමාබන්‍ධනය කළයුතු. ඒ සීමාබන්‍ධනයකරණ අවස්ථාවෙහි: ඒ සීමාබන්‍ධන භූමියෙහි පිහිටි රුක් ආදියක් හෝ, ඒ බිම හා සම්බන්‍ධවූ රැහැන් – දඬු ආදියක් හෝ ඇති වූවහොත් කර්‍මකොප්‍යයවන හෙයින් හැකිතරම් පරීක්‍ෂාකාරීව පිරිසුදුව සීමාබන්‍ධනයකිරිම වටියි[2].

---

## සමානසංවාස මහාසීමා

"අනුජානාමි භික්ඛවේ! තියොජන පරමං සීමං සම්මන්නිතු'න්ති[3]= මහණෙනි! තුන් යොදුන් පමණ ඇති සීමාව සම්මත කරන්ට අනුදනිමි"යි: භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් යොදුන් සමාන සංවාස මහාසීමාව* අනුදැන වදාළ පසු: සවග මහණුන් විසින් හතර – පස් යොදුන් දිග පලල ඇතිව විසාල කොට සම්මත කරණ ලද සීමා අසීමා වූහ. එහෙයින් තුන් යොදුනට වඩා දිගින් පලලින් කොස ගක්වත් සීමාව විසාල වූවහොත්: එය අසීමා වෙයි.

---

1. සපා: 780, පාමු: 179, 2 සීද: 93. 3. මඑ: 258, * උබ:

බුද්ධ කාලයෙහි: **දම් සෙනෙවි සැරියුත් මහ රහතුන්** වහන්සේ ප්‍රධාන මහා සඞ්ඝයා වහන්සේ විසින්: **රජගහ නුවර: අන්ධකවින්ද - වේළුවනාදි** අටළොස් මහා විහාර ඇතුළත් කොට ප්‍රථම තුන් යොදුන් සමාන සංවාස මහා සිමාව සම්මත කරණ ලදි[1]. ඒ කාලයෙහි **මහකසුප් මහ රහතුන්** වහන්සේ: **සප්පිනියා** ගඟින් එතරවන කල උන් වහන්සේගේ සිවුරු තෙමී ම හේතු කොට ගෙණ: භාග්‍ය වතුන් වහන්සේ විසින්: ඒ සමාන සංවාස මහා සීමාවෙහිම තිචීවරාවිප්පවාස සීමාව ද සම්මත කිරීමට අනුදත් බැවින් මහාසඞ්ඝයාවහන්සේ ඒ සීමාවද සම්මත කළහ.

**මිහිඳු මහරහතුන්** වහන්සේ විසින් ද, **දෙවනපෑතිස්** රජුගේ අනුග්‍රහයෙන් ලක්දිව **අනුරාධපුර** මහාමෙඝ වනොද්‍යානය ද ඇතුළත් කොට තුන්යොදුන් මහා සීමාවක් සම්මත කරණ ලද බව ඉතිහාසයෙහි සඳහන් වෙයි[2].

**“එතා ච සීමායො තියොජනපරමතාය’පි සම්භ වතො: මහාසීමා’ති නාමං ලභන්ති”**[3]= මේ සමාන සංවාස තිචීවරාවිප්පවාස සීමා: තුන්යොදුන් පමණ විසාලව ද සම්මත කළහැකි බැවින් **මහාසීමා** යන නම ලබත්” මූල් අවස්ථා වෙහි මේ සීමාවන්ට ගාම-ගාමූපචාරහා,නගර-නගරූපචාරද ඇතුළත් වූහ. එකල භික්ෂූහු තම තමන්ගේ සිවුරු ගමේ තැන් තැන්වල තැබූහ. ඒ සිවුරු ඒ තැන්වල ම මීයන්-වේයන් විසින් විනාස කළහ. ඒ බවදත් භාග්‍යවතුන් වහන්සේ ‘ගාම-ගාමූප චාරයන්හි එසේ සිවුරු නොතැබිය යුතුය’යි: ගාම-ගාමූපචාර හැර තිචීවරාවිප්පවාස සීමාව අනුදූන වදාළහ.

**“සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරාවිප්පවාසා ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්චා’ති: ඉමිස්සා කම්ම වාචාය උප්පන්න කාලතො පට්ඨාය භික්ඛූනං පුරිම කම්මවාචා න වට්ටති. අයමෙවථාවරා හොති**=[4] ගමත් -ගාමූපචාරයත් හැර තිචීවරාවිප්පවාස සීමාව සම්මතකිරීමට

---

1 සපා: 783,
2. මහා 14: පරි,
3. සීචි-ඛාඃ,
4. සපා: 783,

අනුදූන වදාළ පසු: කලින් තුන් යොදුන් මහා සීමාවෙහිම පැතිර පැවති තිචීවරාවිප්පවාස සීමාව වෙනස් විය. (ගාම-ගාමූපචාරයන්හි තිචීවරාවිප්පවාස බලය නැති විය.) එබැවින් ලක්දිව මහාසීමාවෙහි ද තිචීවරාවිප්පවාස සීමාව සම්පූර්ණ මහාසීමාව තුළ ම නො පැවතින. එබැවින් රජගහ නුවර මහාසීමාව තුළ සහ ලක්දිව මහාසීමාව තුළ ද ඛණ්ඩසීමා ඇතිවූහ. අනුරාධපුර මහාසීමාවෙහි ඛණ්ඩසීමා දෙතිසක් එ දවස ම සම්මත කළහ[1]. මහාසීමාවට **ගාම - ගාමූපචාර** ඇතුළත්වන ස්ථානයන්හි භික්ෂූන්ට තිචීවරාවිප්පවාසය නො ලැබෙයි. **ඛණ්ඩසීමා** තුළ තිචීවරාවිප්පවාසය ද ලැබෙයි. එ බැවින් ඒ සීමා වැඩි වසයෙන් ඇති වන්නට වූහ. එයින් ඔවුන්ගේ සම්භේද ද – අජ්ඣොත්ථරණ නිවාරණය පිණිස **සීමන්තරිකාය** අනු දන්නා ලදි. එහෙයින් මහා සීමාවේ වැඩුනු ගසක අත්තක් හෝ අත්දෙයක් ඛණ්ඩ සීමාව හා ගැටී-ඇතිරී තිබී මෙන් ද, ඛණ්ඩ සීමාවෙහි දෙයකින් මහා සීමාව සම්බන්ධ වීමෙන්ද සංකර වන බව කීය[2]. මහාසීමාව විසාල බැවින් එයට ඇතුළත් විහාරවල භික්ෂූන්ට රැස්වීමේ පහසුව පිණිස උපෝසථාගාර සම්මතය ඇති විය. අනුරාධපුර මහා සීමාවෙහි **ලෝවාමහාපායද** උපෝසථාගාරයකි[3].

---

## තිචීවරාවිප්පවාස මහාසීමා

සඞ්ඝයා විසින් පළමුකොට සම්මත කරණලද සමාන සංවාස සීමාව තුළම: නැවත 'තිචීවරාවිප්පවාස සීමා'ව[4] සම්මත කරයි. එය ප්‍රථමයෙන් **ගාම-ගාමූපචාර** ඇතුළත් කොට සම්මතකළ නමුත් පසුව එය ඉවත් කළහ. එහෙත් භික්ෂුණීන්ට එය සාධාරණ නැත. සමාන සංවාස සීමාවෙහිම: තිචීවරාවිප්පවාස සීමාව සම්මත කිරීමෙන් සමාන සංවාස සීමාව තහවුරු වෙයි. එහෙයින් සමාන සංවාස සීමාව: උද්ධරණය කිරීමට අරඹන්නන්ට එකවිට එය කිරීමට නොහැකි වෙයි[5]. සමාන සංවාස

---

1. මහා: 15 පරි: 62, 2 සපා: 780 විවි: 403
3 මහා: 27 පරි: 101, 4. මළ: 264, 5. වබු:

සීමාවක් සම්මත නොකල තැනෙක: තිචීවරාවිප්පවාස සීමාවක් සම්මත නොකල හැක. ඊට වෙනම නිමිති කීර්තනයක් ද නැත[1]. තිචීවරාවිප්පවාස සීමාව පමණක් කිසි තැනෙක සම්මත නොකරයි. සමාන සංවාස සීමාව: තිචීවරාවිප්පවාස සීමාවගේ පසු බිමය.

බුඩකාලයෙහි භික්ෂූහු බොහෝ සෙයින් තුන් සිවුරෙන් වෙන්ව නොවිසූහ. එවැනි විනයතේචීවරික භික්ෂූන්ගේ තුන් සිවුරෙන් වෙන්ව අරුණක් ගත කළ හොත් සිවුරු නිසඟිවන බැවින් සමහර අවස්ථාවක දිනාවසානයෙක් තුන් සිවුරෙන් වෙන්ව නොවිසී ම අපහසුවක් විය. නමුත්: තිචීවරාවිප්පවාස සීමාව තුළදී: තුන් සිවුරෙන් හෝ, එකකින්-දෙක කින් හෝ වෙන්ව අරුණ නගමින් විසීමේ දී සිවුරු නිසඟි නොවෙත්. සත්තබ්භන්තර - අරඤ්ඤ සීමා වල හැර: උදකුක්ඛෙපාදි සීමාවල තිචීවරාවිප්පවාසය නො ලැබෙයි. ගාම-ගාමූපචාර දෙකින් බැහැර තිචීවරාවිප්පවාසය ලැබෙන්නේ භික්ෂූන්ට පමණෙකි[2].

**භික්ෂුණීන්ට** වනාහි: ගාම-ගාමූපචාර දෙකත් සම්බන්ධ කර දෙසනලද තිචීවරාවිප්පවාස සීමාසම්මතිය වටියි[2]. එයම තහවුරු වෙයි. කවර හෙයින්ද? භික්ෂුණී සඞ්ඝතෙම ගමතුළම වසන හෙයිනි. සමහර විට ගාම-ගාමූපචාර දෙක ඉවත් කිරීම භික්ෂුණී සඞ්ඝයාටත් සාධාරණ වන්නේ නම්: භික්ෂුණී සඞ්ඝයාට තිචීවරාවිප්පවාසයක් නොලැබෙන්නේය[2]. නමුත් භික්ෂුණීන්ට ද තිචීවරාවිප්පවාසය ලැබිය යුතුය. එහෙයින් ඔවුන්ට ප්‍රථම ප්‍රඥප්තියම වටනේය. භික්ෂුණී සඞ්ඝයාට 'සමාන සංවාස - අවිප්පවාස' සීමා දෙකම ප්‍රථම සම්මතය පරිදි ලැබෙයි. භික්ෂූන්ගේ සීමාවක් යටපත් කොට හෝ, සීමාවක් ඇතුළත හෝ භික්ෂුණීන්ගේ සීමා සම්මත කළහැක. භික්ෂූන්ට ද භික්ෂුණීන්ගේ සීමා යටපත් කොට සීමා සම්මත කළහැක[2]. භික්ෂු-භික්ෂුණීහු: ඔවුනොවුන් විනය කර්මවලදී ගණපූරකයෝ නොවෙත්[2].

---

1. සපා: 784, 2. සපා: 783,

'**ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච**[1]' යන මෙහි 'ගාම' ශබ්දයෙන් නිගම-නගරද ඇතුළත් කරත්. සමාන සංවාස සීමා සම්මතකළ මහාසීමාවක හෝ, ඒකසීම මහාවිහාරයක* තිචීවරාවිප්පවාස සීමාව සම්මත කළ කල්හි ඒ සීමාවත්ට ඇතුළත් පෙදෙසෙහි ගාම-ගාමූපචාර ඇති වුවහොත් ඒ තත්හි (භික්ෂූන්ට) අවිප්පවාසසීමාව නොලැබෙයි[2].

ඉදින් අවිප්පවාස සීමාව සම්මතකළ කාලයෙන් පසු ගම පිහිටියේ නම්: ඒ ගමෙහි ද අවිප්පවාස සීමා බලය පවතියි. එසේම කලින් පිහිටා තුබූ ගම දියුණුවී ගොස් ගම නොවී තුබූ පෙදෙස් වලද ගම ඇති වීනම්: කලින් ගම නොවූ බැවින් සීමා සම්මත කාලයෙහි ඒ පෙදෙස්වල ද සීමාව පිහිටයි. අවිප්පවාස සීමා සම්මත කරණ කාලයෙහි. ගෙවල්සාදා තිබූ නමුත්: ඒ ගෘහවල මිනිසුන්ගේ පදිංචියක් නොවූවත්: සීමාසම්මතයෙන් පසු මිනිස්සු පදිංචියට පැමිණ සිටියත් අවිප්පවාස සීමාව පිහිටා සිටියි. ඉදින් සාදා ඇති එක ගෙයකවත්: මිනිස්සු පදිංචිවී සිටියාහු නම්: ඒ පෙදෙස් ගාම සඞ්ඛ්‍යාවට යති. තිචීවරාවිප්පවාස සීමාව නොපිහිටයි[3].

---

## ඒකසීම මහාවිහාර

බඬසීමා අතර විසාලවූ ම සීමාව: තුන් යොදුන් මහාසීමාවය. එහි සමාන සංවාස-තිචීවරාවිප්පවාසසීමාසම්මත කරත්. එහි ඛණ්ඩසීමා හා උපෝසථාගාර ද වෙති. භික්ෂූන් වාසය කරණ විහාර (පන්සල්) ආවාස කීපයක් ඇති යොදුන්-ගව්පමණවූ හෝ, විසාල විහාරභූමිය වටකොට නිමිති කීර්තනය කොට, සම්මතකරණ එකාම බඬසීමාවකට අයත් මහාවිහාරය: ඒකසීමමහාවිහාරය යි. මෙහි දු මහා සීමාවෙහි මෙන් ඛණ්ඩසීමා-උපොසථාගාර-පිරිවෙන්-අවාස වෙති. එහෙයින් "**අනුපරිවෙණියනති, එකසීමමහාවිහාරෙ තස්මිං තස්මිං පරිවෙණෙ**[4]= අනුපරිවෙණියං යනු ඒකසීම මහාවිහාරයෙහි ඒ ඒ පිරිවෙණෙහි ය"යි: කියයි.

---

1. මඑ: 266, 2 සපා: 783, 3. සපා: 785 4. සපා: 782, * උබ,

මේ මහාවිහාරය: එකම සීමාව බැවින් තැන්-තැන්වල ඇතිවිහාර-පිරිවෙන්*-ආවාසවල වසන භික්ෂූහු එක තැනකට රැස්ව උපෝසථය කළයුතු. සීමා භූමිය තුළ සම්මතකර ගත් උපෝසථාගාරයෙහි සියලු භික්ෂූන්ට රැස්වහිඳීමට අවකාස නොමැතිනම්: උපෝසථපමුඛයක්* සම්මතකාරගත හැක. උපෝසථාගාරය නොපොහොනේ නම් රැස්වසිටි භික්ෂූන්ගේ අත්පසට ඇතුළත්ව: සීමා සම්මතකළ භූමියෙහි හිඳ පාමොක් ඇසුවත් උපෝසථය කළා වෙයි.[1] සමහරවිට පාමොක් නො ඇසුනත් අත්පසෙහි සිටියේ නම්: උපෝසථය කළාම වෙයි[1]. උපෝසථයකිරීමට පළමුවෙන්ම මහතෙරුන් පැමිණිය යුතු. ඉදින් මහතෙරුන් වාසය කරණ ලද විහාරය උපෝසථාගාරයක් ලෙස සම්මතකර ඇත්තේ නම්: එය පහසු නම් සියලු භික්ෂූහු එතැනට රැස්ව උපෝසථය කළ යුතු. තෙරුන්වහන්සේගේ විහාරය: ප්‍රත්‍යන්ත විශම ප්‍රදේශයක පිහිටියේ නම්: වහන්ස! නුඹවහන්සේගේ විහාරය අපහසුය. සියලු භික්ෂූන්ට රැස්වීමට අවකාස නැත. එබැවින් 'අසවල් උපෝසථාගාරයෙහි උපෝසථය කරමු' ය යි: කියයුතු. එතැනට තෙරුන්වහන්සේ නොපැමිණේ නම් උන්වහන්සේගේ ඡන්දපාරිසුද්ධිය ගෙණ සියල්ලන්ට පොහෝනා පහසුතැනෙක උපෝසථය කළයුතු[2].

**ඒකසීම විහාර – සීම විහාර – විහාරසීමා** නමින් පැවති ස්ථානයෝද වූහ. බුද්ධකාලයෙහි හෝ, ඊට පසුව හෝ සීමාසම්මතවලට යටපත් නොවූ පිරිසුදු පෙදෙසක (අක්කර කීපයක හෝ ඊටත් කුඩාවූ හෝ) බිම්පෙදෙසක සීමාසමූහනනයක් නොකොට, සුදුසු නිමිති ඒ ඒ දිසාවලින් කීර්තනය කොට සංඝයා රැස්ව, සුළුකාලයකින් සීමාවක් සම්මතකාරගත හැක. එවිට සම්පූර්ණ විහාරය හෝ ආරාමය: එකම සීමාවය. එහි නමාට උවමනා තැනක හිඳ විනය කර්මයක් කළ හැක. එවැනි විහාර ඒකසීමවිහාර – සීම විහාර-විහාරසීමා නමින් පැවති බව පෙනෙයි.

---

1. සපා: 782, 2. සපා: 783 * උබ:

## නදීපාරසීමා

**"නදියා පාරං නදී පාරං[1]: තං නදීපාරං, නදිං අජ්ඣොත්ථරමානන්ති" අත්ථො[2]**= ගඟ යටත් කිරීම 'නදී පාර' නමි. ඒ නදීපාරයයි. ගඟ යටපත් කරමින්ය: යන අර්ථයි." නදී ලක්ෂණය: නදී නිමිත්තෙහි කී නයයි. නදීපාර සීමාවක් බඳින තැන තොටුපොළෙහි ඉතා අඩු වසයෙන් පදින්නාත් සමග තුන්දෙනෙකුට හෝ යාහැකි තරම් ඔරු-පාරු ආදියක් ඇතිවිය යුතු. ඒ තොටුපොළෙහි තුබූ ඔරුව: යම්කිසි කාරියක් පිණිස: ගඟ ඉහළට හෝ, පහළට ගෙණ ගියේ නම් හෝ, සොරු ගෙණ ගියේ නම් හෝ, බැඳතුබූ තැනින් කැඩී සුළඟින් ගසාගෙණ ගඟ මැදට ගියේ නම් හෝ සීමා බන්ධනය කරණ අවස්ථාවෙහි අවශ්‍යයෙන්ම ගෙන්වා ගතයුතුය.[2]

එය: තොටු පොළෙහි මහජනයාගේ ගමනාගමනයට තබනලද ඔරුවක් ම විය යුතුය. නිතර ජනයන් එගොඩ මෙගොඩ කළ: ගඟේ දිය අඩු කල ගොඩ ඇද තුබූ ඔරුවක් හෝ, සුණු-කසට ආදිය පුරවා තුබූ ප්‍රයෝජනයට ගතහැකි ඔරුවක් හෝ සුදුසුය. නමුත් කැඩුනු-බිඳුනු ලෑලි ගැලවී ගිය ඔරු ආදිය සුදුසු නැත.

**මහාපදුමතෙර** වනාහි "තාවකාලික ඔරුවක් හෝ ගෙණවුත් සීමාබන්ධනය කරණ තැන තබා නිමිති කීර්තනය කෙරේනම් එයද: තොටෙහි නිතර ඇති නැවක් (ඔරුවක්) ලෙස ගත හැකිය"යි: කියයි[2]. මෙහිදී: **මහාසුම්මතෙර** නිමිත්ත හා සීමාව කර්මවාක්‍යයට ඇතුළත් වෙයි. නැව (ඔරුව) ඇතුළත් නොවෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින්: ගමන් කළ හැකි නිතර තොටුපොළෙහි ඇති නැවක් (ඔරුවක්) අනුදන්නා ලදි. එබැවින් නිතර එහි ගමන් කළහැකි (නැවක්) ඔරුවක් තිබිය යුතුමය"යි: කියයි[2].

---

1. 'සීමාසද්දං අපෙක්ඛිත්වා ඉත්ථි ලිඞ්ගං' සාදි: 2. සපා: 781

තවද ගස් කපා එකට බැඳ තැනූ හෝ, ලෑලි බැඳ කළාවූ හෝ, පයින් හා රියවලින් ගමන් කළ හැකි ඒදණ්ඩක් හෝ ඇත්-අස් ආදීන්ට වුවත් යාහැකිවූ ද මහා ඒදඬු-පාලම් ගඟහරහා දමා ඇතිනම්: ඉතා යොග්‍යය. එසේත් නැත්නම්: එකෙණෙහි (ඒ සීමාබන්ධනය කරණ වේලාවෙහි) ගස්කපා ගඟ සරසට දමා මිනිසුන්ට යාහැකි ලෙස කළ ඒකපදික ඒදණ්ඩ හෝ ධ්‍රුවසේතු සඞ්ඛ්‍යාවට යෙයි. මෙවැනි තැනෙක නදීපාර සීමාවක් සම්මතකරන්ට වටී. උඩින් බඳින ලද වේවැල් ආදි අත්වැලක් නැති: ඒදඬු ගැණීම සුදුසු නැත. යටත් පිරිසයින් ලඟ තොටුපොළෙහි හෝ ඒදඬු පාලම් ආදියක් ඇත්නම් එබඳු තැනක උවත් නදීපාරසීමාවක් සම්මත කළහැක.

**කරවීක තිස්සතෙර**: ගවුවක් පමණ ඇතින් වුවත් එසේ නිතර එගොඩ-මෙගොඩ ගමන් කළ හැකි තොටුපළක නැවක් (ඔරුවක්) හෝ, ඒදඬුපාලම් ආදිය තනා ඇත්නම් එත් වරදක් නැතැයි කියයි.[1]

මේ **නදීපාර සීමාව**: සම්මත කරන්නහු විසින්: එක ඉවුරක සිට; ඉහළ ගං ඉවුරෙහි නිමිත්ත කීර්තනය කොට, එතැන් පටන් තමා හාත්පස සිටි, යම්පමණ පෙදෙසක සීමාව සම්මත කරන්ට කැමතිවේ නම්: ඒ පෙදෙස කෙළවර: යටගංඉවුරෙහි නිමිත්ත කීර්තනය කොට, ගංගාවේ පර තීරයෙහි ද තමාට හමුවන තැනෙක නිමිත්ත කීර්තනය කළ යුතු. එතැන්පටන් යම් ප්‍රමාණයක් සීමා සම්මතයට කැමතිවේ නම්: ඒ ප්‍රමාණයෙන් ඉහළ ගංඉවුරෙහි ප්‍රථමයෙන් කීර්තනය කළ නිමිත්තට ඉදිරිනිමිත්ත තෙක්: නිමිති කීර්තනය කොට, පසුහැරී මූලින් කීර්තනය කළ නිමිත්ත හා ගළපා තැබියයුතු[1].

ඉක්බිති සියලු එගොඩ - මෙගොඩ නිමිති ඇතුළත සිටි භික්ෂූහු අත්පසෙහි කොට, කර්මවාක්‍යයෙන් සීමාව සම්මත කළයුතු. (මෙය බද්ධසීමාව බැවින්) ගඟදියෙහි

1. සපා: 781,

සිටි භික්ෂුවද අත්පසට නොපැමිණියත් කර්ම කොප්‍යය නොවෙයි. සීමා සම්මතිය අවසානයෙහි ගඟදියහැර එගොඩ- මෙගොඩ නිමිති ඇතුළත භූමිය එකම සීමාවය. නදිය ඛණ්ඩසීමා සංඛ්‍යාවට නොයයි. එය වෙනම සීමාවකි. (ගඟ දියෙහි උදකුක්ඛෙප සීමාවල කරණ විනය කර්මයන්ගෙන් නදීපාරසීමාවට බාධාවක් නැත)

ඉදින්: නදියතුළ ද්වීපතක් වේනම්: එයද නදීපාර සීමාවට ඇතුළත් කරණු කැමැත්තහු විසින්: මුලින් කී පරිදි ද්වීපත තුළ පිහිටි ඉවුරෙහි ඉහළ - පහළ නිමිති කීර්තනය කොට: දෙකෙළවරෙහි ද නිමිති කීර්තනය කොට: මුලින් කීර්තනය කළ නිමිත්ත හා ගළපා තැබියයුතු. ඉක්බිති: නදියෙහි ඉවුරු දෙකෙහි ද: ද්වීපතෙහි ද ඇතිසියලු භික්ෂූහු අත්පසට පමුණුවා ගෙණ කර්මවාක්‍යයෙන් සීමාව සම්මත කළයුතු. නදිය මැද දියමතුපිට සිටි භික්ෂූහු ද අත්පසට නොපැමිණියත් කර්මය කොප්‍යය නොවෙයි. සීමාසම්මතය අවසානයෙහි: නදිය හැර නිමිති ඇතුළත ඉවුරු දෙක ද, ද්වීපත ද එකම සීමාව වෙයි. නදිය සීමාව නොවෙයි.[1]

ඉදින්: ද්වීපතෙහි: විහාර සීමාවක් වේ නම්: ඒ විහාරසීමා පරිච්ඡේදයෙන් ඉහළ කොටස හෝ, පහළ කොටස විසාල වේද: (දිග - පලල ඇත්තේද) එකල විහාරසීමා පරිච්ඡේද නිමිත්තට කෙළින් ඉදිරියේ ඇති ද්වීපතේ පහළ ඉවුර කොණේ නිමිත්ත කීර්තනය කොට, එතැන් පටන් ද්වීපතේ මුදුන (මැදකොටස) වටකරමින් අවුත්: පහළ ඉවුරුකොණේ නිමිත්ත ඉදිරියෙහි: ඉහළ කොණේ නිමිත්ත කීර්තනය කළයුතු. එතැන්සිට: මුලින් කී පරිදි පරතීරයෙහි ඉදිරි නිමිත්ත ආදිකොට පරතීර නිමිති ද, ද්වීපතෙහි ඉහළ - පහළ ඉවුරුකොන්වල නිමිති ද, කීර්තනය කොට මුලින් කීර්තනය කළ නිමිත්ත සමග ගලපා තැබියයුතු. මෙසේ කීර්තනය කළ සීමාව පණීත සටහනක් ගණී[2]. (පහළ කොටස පුළුල්ව ද ඉහළ කොටස පටුව ද සිටින බැවින් කන්දක හැඩයක් ගණීයයි) කීය.

---

1. සපා: 781, 2. සපා: 782,

ඉදින්: (දූපත) ඉහළින් ද-පහළින් ද: විහාරසීමා පරිච්ඡේද යෙන් වැඩියක්ම යටවී සිටියේ නම්: පළමු කී ආකාරයෙන්ම දූපතේ: උඩ - යට උභය සිඛරයන් (මුදුන්) වටකොට නිමිති කීර්තනය කරන්නහු විසින්: නිමිති ගැලපීම කළයුතු. එසේ කීර්තනය කොට සම්මත කළ සීමාව මුදිඞ්ග (දිග හැඩේ බෙරයක) සටහණ ගණියි. (මෙහි විහාරසීමාවට දූපතේ වැඩිකොටස: යටවී ඇතිබැවින්: විහාරසීමා පරිච්ඡේද යෙන් පිටවීඇති පටුබිම්තීර දිගබෙරයක හැඩය ගණී ය යි: කියයි. තවද දූපත විහාරසීමා පරිච්ඡේදයාගේ ඇතුළතින් කුඩා වේනම් සියල්ලට පළමුවෙන් කී පරිදි දූපතේ නිමිති කීර්තනය කළයුතු. එසේ කීර්තනය කොට සම්මතකළ සීමාව පණාබෙර සටහනක් (මැද සිහින්ව දෙපස පලල්ව) ඇත්තී වෙයි.[1]

---

## සීමන්තරිකා විධාන

**"සීමාවක් සම්මත කරණ කල සීමන්තරිකායක් තැබිය යුතුය[2]"** යි. සූත්‍රයෙහි වදාළ බැවින්: සීමන්තරිකාය ද සීමාවෙහි අඞ්ගයකි. එහෙයින් ගාමසීමා - බඞසීමා අතර ද, බඞසීමා දෙකක් අතරද, උදකුක්ඛෙප - සත්තබ්භන්තර සීමාවන් අතරද, උදකුක්ඛෙප-ගාමසීමාවන් අතරද: සීමන්තරිකයක් තැබිය යුතු. **"එකනිස්සය එකසභාගානමෙව හි සීමන්තරිකාය විනා සංකරො'ති වුත්තත්තා'ච[3]**=එකනිශ්‍රය - එකසවභාව ඇති සීමාවන්ගේ සීමන්තරිකයෙන් තොරව සීමා සම්මතකිරීම (හා ඇති සීමන්තරිකාය නැතිකිරීම ද) සංකරයට හේතු වේ ය යි: කියන ලද්දේමය.

සීමන්තරිකාය: ඉතා අඩු වශයෙන් රියනක් පමණ ඇතැ යි: ද, වියතක් පමණ වුවත් ප්‍රමාණය යි: **කුරුන්දිය** අටුවාවෙහි ද, සතරඟුල් පමණ වුවත් ප්‍රමාණය යි: **මහාපච්චරිය** අටුවාවෙහි ද කියයි[4]. අඟලක් දෙකක් තැබුවත්

---

1. සපා: 782, 2. මළ: 268,
3. විවි: 416, 4. සපා: 778,

ප්‍රමාණයයි: **ඇතැම් ඇදුරහු** කියතත්. එය දුර්බෝධ හෙයින් ඉතා අඩුවසයෙන් සතරඟුලක් පමණගණිත්[1]. **සීමන්තරිකාය ඨිතා උභින්නම්පි න කොපෙන්ති**[2] = සීමන්තරිකයෙහි සිටි භික්‍ෂූහු. දෙපසෙහි පිහිටි දෙසීමාවෙහිම කරණ විනය **කර්ම** කොප්‍යය නොකරත්.” ය යි: දක්වා ඇති හෙයින්: සීමන්තරිකය භික්‍ෂූන් හතර – පස්නමකට සිටීමට තරම් ඉඩ ඇතිව තැබිය යුතු බව පෙනෙයි. ඇතැම් ඇදුරු කෙනෙක් සීමන්තරිකය: මණ්ඩුකප්‍රමාණ **වියයුතු** ය යි ද කියත්[3].

(අභිනව සීමාවක් බන්ධනයකරණු පිණිස: පැරණි සීමාව සමූහනනයෙන් **උගුළුවාලූ** කල්හි: හාත්පස ඇත්තේ පැරණිසීමාවය. එබැවින් ඊට සෑහෙන අතරක් තබාම අභිනව සීමාව බන්ධනය කරණු වටී. එවිට වටා සීමන්තරිකය පිහිටයි. එබැවින් සීමාබන්ධනවලදී: **උගුළුවාලූ** සීමාවට එක පෙළක් ද බන්ධනයකරණ සීමාවට නිමිතිවසයෙන් එක පෙළක් දූ යි: පාසාණ දෙපෙළක් පිහිටුවයි )

සත්තබ්භන්තර සීමාවෙහි සඞ්ඝයාගෙන් බැහැර පිටතින් සිටින භික්‍ෂුව: සීමාවට අයිති සත්තබ්භන්තරය සහ සීමන්තරිකා වසයෙන් ඇති සත්තබ්භන්තරයක් ද ඉක්මවා සිටියයුතු: එසේ නොසිටියහොත්: **කර්මකොප්‍යය** හා සංකරය ඇතිවිය හැකි බැවිනි. **උදකුක්ඛෙපයෙහි ද** එසේයි. එහෙයින් **“ඌනකං පන නවට්ටති’**යි: (සීමන්තරිකය) අඩුවෙන් තැබීම නොවටී” ය යි: අටුවාවෙහි කීය, මේ සත්තබ්භන්තර – උදකුක්ඛෙප සීමාවල: සීමන්තරික විධානය: බද්ධසීමා දෙකක් අතර සීමාන්තරිකයක් තැබිය යුතු ය යි: අනුදන්නා ලද සූත්‍රයට අනුලෝම් වීමෙන් සිද්ධ ය යි: දතයුතු[4].

භාග්‍යවතුන් වහන්සේ විසින් එකම ගාම සීමාවක් ඇසුරු කළ ඒකසභාග බද්ධසීමා දෙදෙනෙකුන්ගෙ ඔවුනොවුන් සම්භේද – අජ්ඣොත්ථරණ දෝෂපරිහාරය පිණිස: සීමන්තරිකය අනුදන්නා ලදී. මේ උදකුක්ඛෙපාදි සීමාවල ද ඊට

1. සීද: 88, 2: සපා 778, 3. විමු, 4. විවි: 414.

අනුලෝම් **වීම්** වසයෙන්: අරඤ්ඤ - නදී ආදි සීමාවන් ඇසුරුකළ සත්තබ්භන්තර - උදකුක්ඛෙප සීමාවන් අතරද: ඔවුනොවුන්ගේ සම්භේද - අජ්ඣොත්ථරණය: සීමන්තරිකා යක් තැබීමෙන් හැර වෙන් නොවී සිටීම: භාග්‍යවතුන් වහන්සේට ද අභිමතවූ හ යි: **දත් අටුවා ඇදුරෝ:** සත්තබ්භන්තර - උදකුක්ඛෙප සීමාවල ද සීමන්තරිකය නියම කළහ. විසභාග සීමාවන්ගේ ද: එක සීමාවක් ඇසුරු කිරීමය. ඒකසභාග බවය යන දෙ අඟින් යුත් කල්හි: එක්සීමාවක් සීමන්තරිකා රහිතව පැවතීම. සීම සම්භේදයට (සංකරයට) හේතුවෙයි. සීමන්තරිකයක් තැබූකල: එසේ සම්භේද නොවේ යයි: දතයුතු. සීමන්තරිකය තැබීමට නියමකිරීමෙන්ම බද්ධසීමාවන්ගේ මෙන් උදකුක්ඛෙප සීමාවන්ගේ ද ඔවුනොවුන් ගස් ආදිය හා සම්බන්ධවීම නුසුදුසුය යන මෙය ද නය වසයෙන් දක්වන ලද්දේ ය යි දතයුතු[1].

---

## සීමාසමූහනන

**"සීමන්නාම: ද්වීහිකාරණෙහි සමූහනන්ති: පකතියා ඛුද්දකං පුන ආවාස වඩ්ඪනාය මහතිං වා කාතුං, පකතියා වා මහතිං පුන අඤ්ඤෙසං විහාරොකාස දානත්ථාය ඛුද්දකං වා කාතුං[2]** = සීමාවක්: කරුණු දෙකක් නිසා සමූහනනය කරයි: කුඩාසීමාවක් මහත් කිරීමට හෝ, මහාසීමාවක් කුඩා කිරීමට හෝ යන කරුණු දෙකය" සමූහනනය නම්: උගුළුවා දැමීම - ඉවත් කිරීම - විනාසකර දැමීමය"[3]

කලින් සීමාවක් සම්මත කොටතුබූ තැනෙක හෝ, යොදුන් දෙක-තුණ දිගපලළ ඇති මහාසීමා සම්මත කරණ විට: එයට ඇතුළත්ව තුබූ හෝ, සීමාව ඉවත් නොකොට අතික් සීමාවක් එහි සම්මත නොං කළහැක. එසේ සම්මත කළ හොත්: සීමසම්භේද - අජ්ඣොත්ථරණවීමට ඉඩ ඇත.

මහාසීමාවක් තුළ හෝ, විහාරසීමාවක් තුළ: ඛණ්ඩසීමා සම්මත කරණවිට: ප්‍රථමයෙන් ඛණ්ඩසීමාවල නිමිත්ත

1. විවි: 414, 2. සපා: 714,. 3. විවි; 448,

පාසාණ ද, අනතුරුව සීමන්තරික පාසාණද, නැවත මහාසීමාවෙහි නිමිති ද කීර්තනයකොට ඛණ්ඩසීමාවෙහි පටන් සීමාබන්ධනය කරයි. එබැවින් සීමාසමූහනනය කරණවිට ද ඒ සීමා නිමිති දැනගෙණම සමූහනනය කළ යුතුය.[1]

**"තත්‍ථ සචෙ ඛණ්ඩසීමඤ්ච අවිප්පවාස සීමඤ්ච ජානන්ති: සමූහනිතුං'චෙව'ව, බන්ධිතුඤ්ච සක්ඛිස්සන්ති**[2] ඉදින් ඛණ්ඩසීමාව ද, මහාසීමාව ද සීමපරිච්ඡේද සහිතව නියම වසයෙන් දනිත්නම්: සමූහනනය කරන්ට ද, සීමා බන්ධනයකරන්ට ද හැකිවෙත්.

ඛණ්ඩසීමා පරිච්ඡේද දන්නාභික්ෂූන්ට මහාසීමාපරිච්ඡේද නො දැනවුවත් (ඒ ඛණ්ඩසීමා) සමූහනනය කරන්ට ද, සීමා බන්ධනය කරන්ට ද හැකිවෙත්, ඛණ්ඩසීමා පරිච්ඡේද නොදන්නාවූ, මහාසීමා පරිච්ඡේද පමණක් දන්නාවූ භික්ෂූන්ට: චෛත්‍යඞ්ගණ - බෝධියඞ්ගණ - උපෝසථාගාරාදි සැකනැති තැනෙකසිට: කැමතිනම් සමූහනනය කරන්ට පමණක් හැකිවෙයි. බන්ධනය කරන්ට නොහැකි වෙයි[2]. ඉදින් සීමාබන්ධනය කරන්නාහු නම්: සීම සම්භේදයකොට සීමවිහාරය: අසීම විහාරයක් හෙවත් විනයකර්‍ම කිරීමට නොසුදුසු තැනක් කරන්නාහුය. එබැවින් සමූහනනය නොකළයුතු. යම්කෙනෙක්: ඛණ්ඩසීමා - මහාසීමා යන දෙකම නොදනිත් නම්: ඒ භික්ෂූන්ට සමූහනනය කරන්ටද, බන්ධනය කරන්ටද නොහැක. යම්කෙනෙක්: දෙකම දනිත් නම්: ඒ භික්ෂූන්ට සමූහනනය කරන්ටද - බන්ධනය කරන්ටද හැක. බඩසීමාව: සීමා සමූහනන කම්වදනින් හෝ, සාසනන්තර ධානයෙන් හෝ අසීමාව වෙයි. එබැවින් ඛණ්ඩසීමා - මහාසීමා දෙක මනාව දැනගෙණම: සීමාසමූහනනය හා බන්ධනය ද කළයුතු[2].

මහාසීමාවක් තුළ ඛණ්ඩසීමාවක් සම්මත කරණවිට හෝ ඛණ්ඩසීමා ප්‍රථමයෙන් සම්මත කොට මහා සීමාව සම්මත

---

1. අවිප්පවාසසීමාති: මහාසීමං සන්ධාය වදති. විවි; 408, 2. විවි: 408,

කරණවිට හෝ ඛණ්ඩසීමාව තුළ සිට මහාසීමාව ද, මහා සීමාව තුළ සිට ඛණ්ඩසීමාව ද සම්මත නොකළ යුතුය යි: කලින් කියනලද බැවින් සමූහනනය කරණ කල්හි ද: මහාසීමාව තුළ සිට මහා සීමාවද, ඛණ්ඩසීමාව තුළ සිට ඛණ්ඩසීමාව ද සමූහනනය කළයුතු.[1] මහාසීමාව. සමූහනනය කරණකල: ඛණ්ඩසීමාව ද, ඛණ්ඩසීමාව: සමූහනනය කරණ කල මහාසීමාවද සමූහනනය නොවේ[1].

**ඇතැම් ඇදුරුකෙනෙක්:** "සයනමක් හෝ පස්නමක් පමණ භික්ෂූන් ගෙණ විහාර දෙකෙළවර පටන් සීමවිහාරය වටා ඇතුළ ද, විහාරයට පිටින් ලෙඩ්ඩුපාතයක්* පමණ තැන ද මඤ්චක ප්‍රමාණ* මණ්ඩලබෙදා: ඒ මණ්ඩලතුළ සියලු තැන ඒ භික්ෂූන් අත්පස ලැබෙනසේ සිටුවා, පළමුකොට අවිප්පවාස සීමාව ද, අනතුරුව සමානසංවාස සීමාව ද සමූහනනය කළයුතුය"යි: කියත්. එ කල්හි ඒ මණ්ඩල: ඛණ්ඩසීමාවකට හෝ මහාසීමාවකට අයත්ව පැවතුනාහු නම්: ඒ මණ්ඩලතුළ පැවැති අවිප්පවාස - සමානසංවාස සීමා ඉගිළීයෙත්. ඉක්බිති: ගාමසීමාව පමණක් සේසවෙයි. එය සුඛ ගාමසීමාවය. මෙසේ සමූහනනය කිරීමට සීමා පරිච්ඡේද දැනගැණීම උවමනානැත[2].

**අට්ඨකථාවෙහි:** ඛණ්ඩසීමා පරිච්ඡේද දත්නාහු නම්: මහාසීමා පරිච්ඡේද නොදන්නාහු නමුදු: සමූහනනය හා බන්ධනය ද කළ හැකියි" කියයි[2].

අබද්ධසීමාවල සමූහනනයක් නැත. ඒ උදකුක්ඛෙපාදි සීමාවල විනයකර්මයකොට සඞ්ඝයා ඉවත්වූ පසු සීමාව ද නැතිවී ය යි.

---

## ගාම සීමා

සීමාසම්මතයක් නොකළ යම් ගමක්* හෝ නියම්ගමක්* හෝ ඇසුරුකොට වසන උපසපන් භික්ෂූන්ට ඒ ගම

1. සපා: 408, 2. විවි: 409, * උබ:

හෝ නියම්ගම සමාන සංවාසඒකූපෝසථ සීමාවය[1]. එය බඩසීමාවක් වැනිය. එහි විනයතේචීවරිකා භික්ෂුවට තිචීවරා විප්පවාස පරිහාරය නොලැබෙයි[2]. මේ ගම් කිසිදිනෙක සීමාවක් සම්මත නොකළ බණ්ඩසීමාවකට හෝ, මහාසීමාවකට සම්බන්ධනොවූ පියවිගම් වියයුතු. මෙහි ගාම* ශබ්දයෙන් නියම් ගම්* හා නගර ද ගැණෙයි[2]. කුඩාවූ හෝ, විසාලවූ හෝ යම්කිසි ගමක ග්‍රාමභෝජකයෝ අයබදු ගණිත් නම් එය ගමකි[2]. මිහිඳු මහරහතුන් වහන්සේ ලක්දිවට වැඩියද, රාත්‍රිකාලයෙහි උන්වහන්සේලා සමග ගිහිවෙසින් පැමිණි භණ්ඩුකකුමරු මිහින්තලේ ගාමසිමාවේදී ප්‍රව්‍රජ්‍යාපසමපද, කළහ[3].

ගාමසීමාවම: බඩසිමාවන්ට කෙත (පසුබිම්) වෙයි. අරණ්‍ය – නදී ආදීහු: සත්තබ්භන්තර– උදකුක්ඛෙප සීමාවන්ට කෙත (පසුබිම) වන්නාක් මෙනි[4]. ගම්මායිමෙන් ඇතුළත ඇති කෙත්වතු – වන – පර්වත කඳු ආදී සියල්ලම ගමට ඇතුළත් වෙයි. ගමේ ඇති ගෙවල් කඩවීදිවලට පමණක් නොව. ලෝකවාසීන් විසින් ගෙවල් – කඩවීදි – කෙත් වතු ආදී නොයෙක් භූමිභාගයෙන් යුත් පෙදෙසකට 'ගම' ය යි: ව්‍යවහාරකරණු ලබයි ද මෙහිදු එය 'ගාමසීමා' යයි ගණුලැබේ[4].

'ගාමසීමා' යන තන්හි: 'සීමා' ශබ්දය 'බඩසීමා' යනාදි තැන්වල මෙන් විසේස අරුත නොගණියි[1]. "ගාමො එව ගාමසීමා[4] ගම ම ගාම සීමාය'යි කියයි. එහෙයින් රජයෙන් අයබදු ගැණීමට යම්කිසි නමකින් හෝ, අන් ක්‍රමයකින් හෝ ව්‍යවහාරකරණ ගම: මෙහි ගාමසීමා වෙයි.

මේ ක්‍රමයෙන් මෙයින් මතු පළවන අරණ්‍ය-නදී-සමුද්‍ර ජාතස්සර යන පෙදෙස් ගැණ ද ලෝක ව්‍යවහාරය ම ප්‍රමාණ වෙයි. තවද: 'ගාමසීමා' යයි: ගත්කළ ගමේ මායිම – සීමාව ම 'ගාමසීමා' යයි: කියයුතුය. ගමට අයිති කෙත් –

---

1 මඋ: 268, 2. සපා: 785, 3. මහා: 14 පරි: 51, 4. විවි: 409,
* උබ,

වතුනොගතයුතුය. නමුත්: සාසන ව්‍යවහාරයෙන් ගම ගත්නාවිට: ඒ පිරිසිඳීම් ප්‍රමාණයෙන් නොනැවතී ගමෙන්ම ඇතිවන සීමා–මායිම් ප්‍රමාණය සලකා 'ගාමසීමා' ය යි: කියයි. අරඤ්ඤසීමා – නදීසීමා – සමුද්දසීමා ද එසේය. අරඤ්ඤය ම අරඤ්ඤසීමා ය, නදිය ම නදී සීමාය, සමුද්‍රය ම: සමුද්දසීමාය. මෙසේ සීමා ව්‍යවහාරය දතයුතු ය.[1]

ග්‍රාම භෝජකයෝ අයබදු ගන්නා ප්‍රදේශය ම ගමය යි: ගත්කල: යම්කිසි ගමක් 'කිරිය හෝ, අමුණු මෙපමණෙකැ යි: රජයේ ලේඛනාරූඪ කර තැබූ බිම් පෙදෙස්වල: වැව්–පොකුණු – අමුණු – සොහොන් – පර්වත ආදීන් ගෙන් බදු නොගණිත් නම්: ඒ සියල්ල ද එකතුව: රජයෙන් පිරිසුන් ප්‍රමාණය එක ගමක් මෙන් සලකයි[2].

එසේම: නදී–ජාතස්සර–ලුණු ලේවා හැර, රජයෙන් පිරිසුන් සියලු භූමිභාග: ගාම සීමායයි: දතයුතු.[2] නදිය: ගමේ ඇතිවුවත් ගම නදියට සම්බන්ධවුවත් නදියත්-ගමත් දෙකක් බැවින්: ගාමසීමාවේ විනය කම් කිරීමෙන් නදියෙහි ඇතිකර ගන්නා උදකුක්ඛෙප සීමාවට හෝ, උදකුක්ඛෙප සීමාවෙන් ගාම සීමාවට හෝ වරදෙක් නොවෙයි. පියවි ගාමසීමාව මෙන්: පියවි නිගම–නගර සීමාවෝ ද බද්ධ සීමා සමාන වෙත්[2]. එහි සියලු සඟකම් කළහැක[2].

---

## විසුං ගාම සීමා

රජු හෝ, රජය ගමෙන් කොටසක් වෙන් කොට වෙනම ග්‍රාම භෝජකයෙක් පත්කොට කිසිවෙකුට දෙන ගම් කොටස[3] **විසුං ගාම සීමා** නම්[2] වෙයි. මේ විසුං ගාමයද බද්ධසීමා–ඛණ්ඩසීමාදි කිසි සීමාවකට සම්බන්ධ නොවූ පියවි ගමේ කොටසකි. ගාමසීමා වෙහි මෙන් සියලු සඟකම් කළහැක.[4]

---

* උඹ: 1. විවි: 409, 2. විවි: 410, 3. සපා: 785, 4. සීදී: 51,

රජ තෙම: යම්කිසි පෙදෙසක් ගාමාන්තරයකින් වෙන් කරයි ද: එයද ගාමසීමාවම වෙයි[1]. (මෙහි ග්‍රාම භෝජකයෙක් පත් නොකර කලින් සම්බන්ධවී තුබූ ගමෙන්ම පාලනය වේ නම් මුලින් සම්බන්ධවී තුබූ ගමටම ඒ පෙදෙස අයත් විය යුතු ) සමහර විට ගමක තුබූ නදී-ජාතස්සර නැතිකොට ඒවා වැව් – පොකුණු බවට පෙරළා තැබීමෙන් හෝ, ඒ නදී ආදිය පස්වලින් පුරවා ගොඩකොට කෙත්වතු බවට පෙරළා තැබීමෙන් හෝ ඒ ගමේ බිම්කොටස් වෙනස් කළත් ඒවා එසේම මුල් ගාමසීමාවටම සම්බන්ධවෙත්. වෙන ම ගමක් (විසුංගමක්) නොවෙයි[1].

යම් ගම් නියම්ගම් රජුන්ගේ යුදබිය ආදියකින් හෝ, සොර – රෝග ආදිබියකින් හෝ, මිනිසුන්ගේ පදිංචිය අතහැරදමා ගොස් බොහෝ කලක් යක් – පිසස් ආදි භූතයන්ට නිවෙස් වී පාලුවී පැවතුන හොත්: ඒහාත්පස මිනිසුන් පදිංචිවූ ගම් ඇතත්: ඒ පාලුගම් වෙනම ගාම සීමාවෝ වෙත්. ඒ පාලුවී ගිය ගම්වල: රජවරු ආසන්න ගම් වැසියන් ලවා ගොවිතැන් කරවා ඒ ගොවිතැන් කළ පෙදෙස් ලේඛනාරූඪ කරවා ඒ පෙදෙස්වලින් බදු අය කරත් ද, ඒ පෙදෙස් අනික් ගමක් හා සම්බන්ධ කරත් ද, ඒ පෙදෙස් ද ගාමසඞ්ඛ්‍යාවටයෙත්, යම්ගමක් රජුන් විසින් අතහැර දමන ලද්දේ ද, ඇතැම් ගමක් වනය හා එක්වී ද ඒ ගම් අගාමකාරඤ්ඤබවට පැමිණෙත්. මුලින් තුබූගාම සීමා වෙනස් වෙත්[1]. (වෙනම ගමක් නොවෙයි.)

රජවරු: ඇතැම් මහවන පෙදෙස්වල විසාලගම් ඇති කොට නොයෙක් දහස් ගණන් ජනයන් පදිංචිකරවා ඒ ගම් වැසියන්ට 'භෝගගම්' ය යි: හාත්පස නොයෙක් ගාම සීමා ඇති කොට දෙත්නම්: පැරණිගම් මායිම් අභාවයට යෙත්නම්: ඒ ගම් වෙන්-වෙන් ගාමසීමා ඇත්තාහුවෙති. පැරණි පැවති ගම්මායිම් වෙනස් වෙත්[1]. (වෙන් - වෙන් ගාමසීමා ඇති වෙත්. විසුංගාමසීමා නොවෙත්).

---

1. විවි: 410,

**පසේනදි කොසොල්රජ: පොක්ඛරසාති බමුණු** ආදීන්ට දක්ෂිණෝදකය හෙළා දුන්නාක් මෙන් බ්‍රහ්මදෙය්‍ය වසයෙන් දෙන ගම්වැනි පෙදෙස් **විසුං ගාම** වෙත් යයි: ඇතැම් ඇදුරු කෙනෙක් කියත්[1]. තවද: රජුවිසින් යම්කිසි ගමකින් එක් කොටසක් වෙන්කොට මෙය වෙනම ගමක් වේවායි. ග්‍රාමභෝජකයෙකුට* දෙනු ලැබේ නම් එය **විසුං ගාම** යයි: කියයි[2].

විසුංගාම සීමාවට ගම වෙන් කිරීමේදී: පළමු ගම් මායිම වෙන් කොට පරිච්ඡේදයක් නියම කිරීම පමණක් නොව, අයබදු ගෙවීම් මෙන් ද ඒ කොටස වෙන්කළ යුතුයයි: කියයි[3]. එබැවින් මේ විසුං ගාමය: ග්‍රාම ලක්ෂණයන් ගෙන් තොරවූවක් හෝ බදු ගැණීමෙන් තොරවූවක් හෝ නොවිය යුතු.

එබැවින් ගමේ ඇති තම-තමන්ගේ විහාරාරාමවලට පමණක් ගැලපෙන ග්‍රාමලක්ෂණවිරහිත යම්කිසි පෙදෙසක් රාජාදීන් ලවා වෙන් කරවා ගෙණ එය: 'විසුංගාමසීමා' ය යි: නොගෙණ පෙළට අනුලෝම් වූ, අටුවාවට සමවූ, භික්ෂූන්ගේ ඇසුරට සුදුසු, බදු ගැණීමෙන් පිරිසුන්, අටුවා ඇදුරන් විසින් හා පැරණිවූ ද – අභිනවවූ ද සාසනගරුක විනයධරයන්ට අභිමතවූ විපත්ති සඞ්කා රහිත පිරිසිදු මතයක්ම ගතයුතු. එබැවින්: **කල්‍යාණීප්‍රකරණයෙහි**: යම් තෙරවරු ග්‍රාම ලක්ෂණ රහිත යම්කිසි කැමති තැනක්: රජුන් ලවා වෙන් කරවාගෙණ විසුංගාමයක් වේය යන හැඟීමෙන් තමාට කැමති තැන්වලම සිටි භික්ෂූන් අත්පසට ගෙණ සීමා සම්මත කරත්. ඔවුන්ගේ ඒ සීමාසම්මති කර්මය පරිසවිපත්තියෙන් කොප්‍යයවෙයි. එබැවින් එබඳු සීමාවල කරණ උපසම්පදාදී කර්මද සීමාවිපත්තියෙන් කොප්‍යයවෙත්යයි: ලියන ලදි[1].

**ඇතැම් ඇදුරු** කෙනෙක්: අපි සීමාබන්ධනයක් කරණු කැමැත්තෙමු. එබැවින් මෙතරම් බිම්පෙදෙසක් විසුංගම් කෙතක් කරණු මැනවැයි: රජුට දන්වා, එසේ ගමෙන් කොටසක් වෙන්කළ පසු මේ ස්ථානය විසුංග්‍රාම ක්ෂෙත්‍රයක්

1. සීවි: බො, 2 සිදී: 49, 3. සීදී: 51,

වේයයි. සලකා ඒ ගම් කොටස තුළ පමණක් සිටි භික්ෂූහු අත්පසට ගෙණ සීමාසමූහනන සීමාබන්ධනාදිය කරත්. මේ කාරණය: **"අයම්පි විසුංගාමො හොතූ"ති: පරිච්ඡින්දිත්වා රාජිකාසස්වදෙති"** යන අටුවා වචනය හා ද, **"සා ච රාජිච්ඡා ච සෙන පරිවත්තිත්වා සමුප්පන්නා අභිනවා ච"** යන **විමති විනොදනී ටීකා** වචනය හා ද සමවත්නාක් මෙන් නොපෙනේ[1]. යනු ද කියත්.

එසේම: රජු විසින් භික්ෂූන්ගේ ඉල්ලීමක් පරිදි ගමෙන් කොටසක් වෙන් කිරීමෙන් ම විසුංගාමය නොවේයයි: ද, ඒ ගමෙන් මෙපමණ අය-බදු ගතයුතුය යි: අය බද්දෙන් සීමා කිරීම හා, ඒ අය-බදු ගැණීමට ග්‍රාමභෝජකයෙකු පත්කිරීම ද යන ග්‍රාමාඞ්ගයන්ගෙන් ඒ විසුංගාමය සම්පූර්ණ නොවුව හොත්: පියවිගම හා සඞ්කරවී පවතින බැවින් එබඳු විසුංගාමයක සීමා බන්ධන ආදි සඟකම් කිරීම ඇතැම් ඇදුරු කෙනෙක් සැමැති නොවෙත්[1].

**ඇතැම් ඇඳුරුකෙනෙක්**: අටුවා ආදියෙහි යම් පමණ විසුංගාම ලක්ෂණ දක්වා ඇත්තාහු නම්: ඒ සියලු විසුංග්‍රාම ලක්ෂණ විස්තර රජවරු රට දියුණු කිරීම පිණිස ලෝක ව්‍යවහාර වසයෙන් ගම් වෙන් කොට ග්‍රාමාඞ්ගයෙන් සම්පූර්ණ කර ග්‍රාමභෝජකයන්ට අය-බදු අයකිරීමට දෙනලද ගම්ය. භික්ෂූන්ට සීමාබන්ධනයට දෙනලද ගම් නොවෙත්. මෙය සුත්ත-සුත්තානු ලෝමිකයයි කියත්[2].

යම්කිසි බිම් පෙදෙසක් සඞ්ඝාරාමයක් පිහිටුවනු පිණිස ආණ්ඩුවට දන්වා, ආණ්ඩුව විසින් බිම් ලේඛණයෙහි ලියා පදිංචි කොට බෙදා වෙන් කරණ ලද්දේ නම්: ඒ ආරාම භූමියද: එක් විසුංග්‍රාම සීමාවකි. **මණ්ඩලේ නුවර** පිහිටි සඞ්ඝාරාමභූමිය මෙනි. තවද: ඒ ඒ ආරාමයක් තුළ හෝ පිට තැනෙක හෝ විසුංගාම නාමයෙන් ඉල්ලා ආණ්ඩුවෙන් වෙන්කර දෙන ලද භූමිභාගයක් වේ නම් හෙ ද: එක් විසුංගාම සීමාවකි.[3]

---

1. සීදී: 52-53, 2. සිදී 60, 3. විසු: ප්‍ර: 33,

ධම්මවිනයධර සහශ්‍රාධික සුධර්මසහිත සප්විර භික්ෂූන් පිරිවර කොට ඇති ත්‍රිපිටකධර ඤෙය්‍යධම්ම සඞ්ඝරාජ මාහිමියාණන් වහන්සේ විනය විරෝධ විපත්ති සීමාවන්හි කිසිසේත් සඞ්ඝකර්ම නොකරණ හෙයින් මේ විසු ග්‍රාම සීමාවෝ විනය අටුවාවෙහිම නියම ආකාරයෙන්ම යොදන ලද්දක් බැවින් ආගම ශුද්ධිවශයෙන් ද නිරාසඞ්ක වන්නෝමය[1].

---

## අගාමකාරඤ්ඤ-සත්තබ්භන්තරසීමා

“අගාමකෙ අරඤ්ඤෙ......;[2]= ගම නොවූ වනයෙහි” යනාදීන් විස්තර වන සත්තබ්භන්තරසීමාව: ගම නොවූ දඹදිව හිමාලය පර්වතප්‍රාන්තයෙහි ඇති විඣ්‍යාටවී ආදී මහ වනාන්තරවල ලැබෙනබව දක්වයි[3]. මේ සත්තබ්භන්තර සීමාවෙහි තිචීවරා විප්පවාසයද ලැබෙයි. විනය තේචීවරික භික්ෂුව අරුණ නගින වේලෙහි මේ සීමාවෙන් ඉවත්ව සිටිය හොත් ඒ භික්ෂුවගේ සිවුරු නිසගි වෙයි[4].

යම් පෙදෙසක වී වැපිරීම් ආදි ගොවිකම් කෙරේ නම් ඒ පෙදෙස ගමය. එවැනි ගොවිකම් නොකරණ පෙදෙස් අරඤ්ඤසඞ්ඛ්‍යාවට යෙත්[5]. එහෙත් “අගාමකෙ = ගම නොවූ තන්හි”ය සි: වෙනම අර්ථයක් ගෙණ මහාසමුද්‍රයෙහි මසුන් ඇල්ලීමට ගියවුන්ට එදිනම පෙරළා පැමිණිය නොහැකි තරම්[5] දුර දූපත්වල අරඤ්ඤයක් ඇති වුවත් නොවූවත් මිනිසුන් නැති, නොමිනිසුන් හෝ ඇති[4] බිම පෙදෙස්වලද දිග පළල ඇති ගල් පර්වත වලද සත්තබ්භන්තර සීමාව ලැබෙන බව දක්වයි[6].

එවිට ගම නොවූ පෙදෙස්වල හා අරඤ්ඤයෙහි ද: අත් පස නොහැර එකතැන රැස්ව සිටි සඞ්ඝයාගේ හාත් පස අන්තයෙහි සිට එක දිසාවකට සත් අබතුර බැගින් ගෙණ සත්තබ්භන්තර සීමාව ඇතිකර ගතහැක. එවිට දෙපසින්

---

1. විසු: ප්‍ර: 35, 2. මළු: 268, 3. සපා: 785,
4. සපා: 472, 5. විජි: 410, 6. විම: 23,

තුදුස් අබතුරක් වෙයි. සඞ්ඝයාගේ අඩු-වැඩි වීමෙන් සීමාවද ලොකු-කුඩාවෙයි. තවද ගම නොවූ පෙදෙස් ගැණෙනවිට අහසෙහි හෝ, දෙව්ලෝ බඹලෝ ආදී තැනෙක හෝ, දෙව් විමනෙක හෝ පොළෝ තලයෙන් වෙන්වූ දියපොළොව ආදි තැනක හෝ සත්තබ්භන්තර සීමාවට ස්ථාන බව දක්වයි[1].

**ඇතැම් ඇදුරුකෙනෙක්**:[2] 'රැස්ව සිටි සඞ්ඝයාගේ බාහිරාන්තයෙහි පටන් සත් අබතුරක් මැන පිරිසිඳී මෙන්ම සත්තබ්භන්තර සීමාව ඇතිවේ'ය යි: කියත්. එය නොගතයුතු. ඉඳින් සත් අබතුර පිරිසිඳින ආකාරයෙන්ම සීමාව ඇති වේනම්: අබද්ධ ගාම සීමාවක් ද ඇති නොවෙයි[3].

තවද: වඩුරියන හා පියවිරියන ලෝකව්‍යවහාරයෙහි නා නා ප්‍රකාරය. විනයෙහිදු: 'රියන' මෙපමණ ය යි: දක්වා නැත. යම් ප්‍රමාණයකින් මැනීම කළත් භාග්‍යවතුන් වහන්සේ විසින් අනුන්දන්නාලද රියනෙන් මනිනලද්දේ ද? නැද්ද? යි: සැක ඉපදීමට අවකාශ ඇත. ඒ සැකය සීමා විපත්තියට හේතු වෙයි. එවිට කර්ම විපත්තියද සිදු වන්නේය[4].

ඇතැම්විට සත් අබතුර මනිනකල ඉතා සවල්ප මාත්‍ර යක්වත් අඩු-වැඩි නොකොට මැන ගැණීමට නොහැකි වුවහොත්: සීමං විපත්තියක් ම වන්නේය. සඟපිරිස සිටිය අත්දමින් මනිනකල: ප්‍රමාණය අඩු-වැඩිවීමට අවකාස ඇත. භික්ෂූන්ගේ (ආපත්‍යාරෝචනය-අත්පසගැණීම් ආදි) යම් කිසිසකස්වීමකින් යුතුව විනයකර්මය කිරීමට අදහස් කරත් තේනම්: සීමාපේක්ෂාවක් ඇති ඒ භික්ෂූන්ට අපේක්ෂාව පරිදි ප්‍රදීපාලෝකයක් මෙන් සීමාව ඇතිවෙයි. භික්ෂූන්ගේ සීමාපේක්ෂාව හා විනයකර්ම ප්‍රයෝග නැතිකල්හි සීමාව නැතිවී යයි.[4] එබැවින් සීමාපේක්ෂාව ඇතිකල්හිම සීමාව ඇතිවෙයි. සීමාපේක්ෂාව නැතිකල්හි සීමාව නැතිවෙයි.[5]

1. සීවි: බ:, 2. විවි: 411, 3. විවි: 418. 4. විවි; 411,
5 විවි: 412,

කියනලද ලකුණු ඇති මහාරඤ්ඤයෙහි: සත්තබ්භන්තර සීමාවක් නැතිව ද: **අරඤ්ඤසීමාවෙහි** සඟකම් කළහැක[1]. ඒ අරඤ්ඤසීමාව: ස්වභාවයෙන්ම බද්ධසීමාවක් සමානය[1]. අගාමකාරඤ්ඤය බැවින් තිචීවරාවිප්පවාස පරිහාරය ද ලබයි. නමුත් සත්තබ්භන්තර සීමාව අනුදැනීමෙන්: ගාමසීමාවෙහි වර්ගකර්මයන්ගේ දුරුකිරීම පිණිස බද්ධසීමාව අනුදැනවදාළාක් මෙන් අරඤ්ඤයෙහි ද: වර්ගකර්ම පරිහාරය පිණිය සත්තබ්භන්තර සීමාව: අනුදන්නාලදි[1]. එබැවින් සත්තබ්භන්තර සීමා දෙකක් අතර සඞ්කර නිරාකරණය පිණිස සීමන්තරිකා වසයෙන් අතික් සත්තබ්භන්තරයක් තැබියයුතු[2].

යම් කුඩා අරඤ්ඤයක් මහාභික්ෂුසමූහය කින් පිරිගිය හොත්: ඒ භික්ෂූන්ට එහිදී විනයකර්මයක් කිරීමට උවමනාවක් ඇතිවූ කල: වර්ගකර්මවීමේ සැකයක් ද නොවේ නම්: සත්තබ්භන්තර සීමා පෙක්ෂාවක් ද අවිද්‍යමාන නම්: හුදෙක් මුළු අරඤ්ඤයම සීමාව කොට ගෙණ සඟකම් කළ හැක. නදී – අරඤ්ඤ දෙකෙහිම මෙසේය[1].

එක් සක්වළෙක: ගාම – නදී – සමුද්‍ද – ජාතස්සර හැර ඉතුරු නොමිනිසුන් වැසි: දෙව්ලෝ – බඹලෝ ආදීසියල්ල (සීමාවසයෙන්) අරඤ්ඤසඞ්ඛ්‍යාවට යෙයි. (පෙළෙහි:) **'ගාමා වා අරඤ්ඤා වා'**යි: කී බැවින්: නදී – සමුද්‍ද - ජාතස්සර ආදිය ද: අරඤ්ඤම වෙයි. එහෙත්: 'නදී' ආදිය: වෙනම සීමා කොටසක් ලෙස ගත් බැවින් ඒවා හැර, අවසේස සියලු තැන අරඤ්ඤයලෙස ගතයුතුය. එහි යම් පමණ පෙදෙසක් එකම 'අරඤ්ඤ' ය යි: ගණුලබන්නේ නම්: ඒ එක අරඤ්ඤ සීමාවකි. ශක්‍ර පුරය සියල්ලම: එක අරඤ්ඤ සීමාවකි. අසුර-යක්ෂපුර ආදිය ද එසේයි. අහසෙහි පිහිටි අහසින් පිරිසුන් දේව – බ්‍රහම විමානයෝ ද: මුහුද මැද දූපත් මෙන් වෙන්-වෙන් වූ ස්ථාන ද අරඤ්ඤසීමාවෝය[3].

එහෙයින් පොළොව මතුපිට අරඤ්ඤසීමා තලය සමග යට පොළොවත් 'අරඤ්ඤ' යයි: ව්‍යවහාර නොවන

---

1. විවි: 410; 2. සපා: 755; 3. විවි: 417,

බැවින් යටපොළොව වෙනම අරඤ්ඤ සීමාවක් ලෙස ගතයුතු. එහෙයින්: ගාම-නදී ආදි සීමා පිළිබඳ අටුවා කථාවෙහි: යටපොළෝතලෙහි සිටි ඍද්ධි ඇති භික්ෂුව: 'විනයකර්ම කොප්‍යය කෙරේය'යි: බඩසීමාවට දක්වූ ක්‍රමය නොගත යුතුයයි: කියත්. ඒ ගාමසීමාදීන්ගේ යට පොළෝ පමණ දක්වීම සූත්‍රාදීන්ට විරෝධයක් නොවන බැවින් යුක්තියක් මෙන් පෙණෙයි. විමසාගතයුතු[1].

භාග්‍යවතුන් වහන්සේ විසින්: **'සබ්බා භික්ඛවෙ! නදී අසීමා[2]'** යනාදිවසයෙන් නදී - සමුද්‍ර - ජාතස්සරයෝ: බඩසීමාවට ස්ථාන නොවන බව දෙසන ලදි. එහෙත් 'අරඤ්ඤ'ය: බඩසීමාවට ස්ථාන නොවේයයි: නොදෙසන ලදි. එබැවින් අරඤ්ඤය ද බඩසීමාවට ස්ථාන ය යි: ගත හැක. එසේ නම් අරඤ්ඤයෙහි කවර හෙයින් බඩසීමා නොබඳිත් ද?. ප්‍රයොජනයක් නැති බැවිනි. සීමාපේක්ෂාවට අනතුරුව. සත්තබ්භන්තර සීමාව අරඤ්ඤයෙහි ලැබෙයි. ඒ සම්බවෙන සත්තබ්භන්තර සීමාවට උඩින් බඩසීමාවක් සම්මත කළ හොත්: ඒය සංකරවීමට හා යටපත් වීමට ගොස් විපත්ති සීමාවක් වන්නීය. ගම් කොතෙහි සිට ගමනොවූ අරඤ්ඤයෙහි කොටසක් ඇතුල් කොට සම්මත කරණලද බඩසීමාව ද: මනාව සම්මත කරණ ලද්දක් විය හැක. එහෙත්: ආගමකාරඤ්ඤයෙහි භාග්‍යවතුන්වහන්සේ විසින්: අනුදත්නාලද සත්තබ්භන්තර සීමාව ද නො පවත්නා හෙයින්: එහි විනයකර්මකිරීමට පිවිසියවුන්ට ද, එයින් පිට හුදකලා අරඤ්ඤ සීමාවෙහි විනයකර්ම්ම කරන්නවුන්ට ද අතර සත් අබතුරු තුණක් සීමන්තරික වසයෙන් තැබිය යුතුය. එසේ නොතබා විනයකර්ම කළහොත් ඒ සීමා විපත්ති සීමාවෙත්. එහෙයින් අගාමකාරඤ්ඤයෙහි බඩසීමාකිරීම සර්වප්‍රකාරයෙන්ම නිරර්ථකයයි: දතයුතු[3].

———

1. විවි: 418, 2. මඋ: 3. විවි: 418,

## නදී - සමුද්ද - ජාතස්සර - උදකුක්ඛෙපසීමා

**"සබ්බා භික්ඛවෙ! නදී අසීමා**...... ;[1]= මහණෙනි සියලු නදියම අසීමාවය!"

**"සබ්බා භික්ඛවෙ! නදී අසීමා'ති: - යං කාචි ලක්ඛණුපපන්නා නදී නිමිත්තානි කිත්තෙත්වා එවං බද්ධසීමං කරොමා'ති: කතා'පි අසීමා. බද්ධසීමා නහොතී'ති: අත්ථො. අත්තනො සභාවෙ නෙ'ව පන සා බද්ධසීමා සදිසා. සබ්බත්ථ සඞ්ඝකම්මං කාතුං වට්ටති. සමුද්දජාතස්සරෙසු'පි එසෙ'ව නයො**[2]= 'සියලු නදියම අසීමාවය' යන මෙහි: පිහිටීම් ආදීන්ගේ වසයෙන් ලක්ෂණයෙන් යුත් නදියක් නිමිති කීර්තනය කොට බද්ධසීමාවක් කළහොත්: අසීමාව වෙයි. බද්ධසීමාවක් නොවෙයි: යන අර්ථයි. නමුත් ස්වභාවයෙන්ම 'නදිය' බද්ධසීමාවක් වැනිය. හැමතැන සඟකම් කරන්ට වටී. සමුද්ද-ජාතස්සරාදියෙහි ද එසේයි.

මෙයින්: වැව් - පොකුණු - අගල් ආදි වසයෙන් සාරා කාණින ලද ජලය පිහිටි ස්ථානයන්හි උදකුක්ඛෙප කොට හෝ සඟකම් කිරීම නොවටී. ගාමසීමාවට ඇතුලත් බැවිනි[3]. නදී ආදියෙහි මැදුම් බලය ඇති පුරුෂයකුගේ හාත්පස උදකුක්ඛෙපයෙන් පිරිසිඳිනා ලද තන්හි: උදකුක්ඛෙපසීමාවය. එහි සියලු සඟකම් කළහැක. රැස්වන සඞ්ඝයාගේ ප්‍රමාණයෙන් උදකුක්ඛෙපසීමාව ලොකු-කුඩා වෙයි.

**නදිය:** වැඩි දිගනොවේ නම්: පටන් ගත් තැන සිට මුවදෙර තෙක් ම සඞ්ඝයා අත්පස නොහැර හිඳිනම්: උදකුක්ඛෙපයක් උවමනා නොකරයි. මුළු නදියම එකම සීමාවය. **මහාසුම්මතෙර**: 'යොදුනක් පමණදුර ගලාබස්නා නදියක ඉහළ අඩ යොදුනක් හැර පහළින් ඇති අඩ යොදුනෙහි සඟකම් කිරීමවටී'යයි: කියත්. **මහාපදුමතෙර** එය පිළිකෙව් කරයි[4].

---

1. මළ: 268, 2. විම: 16, 3. සපා: 788,
4. සපා: 785,

සික්ඛාකරණියෙහි දක්වූ පරිදි: තෙමඬුලු වසා සිවුරු හැඳ පෙරවූ භික්ෂුණියක් නදියකින් එතරවනවිට ඒ භික්ෂුණියගේ අඳනය තෙමෙන තරම් ජලය ඇති නදියක උදකුක්ඛෙප සීමාවක් ඇති කළ හැක[1]. මේ විනයෙහි නදීලක්ෂණයයි. එහෙයින් යොදුන හෝ අඩක් ගැණීම උවමනා නැත. ඒ යටකී ලක්ෂණය ඇති නදියක ඒ නදිය හටගත් තැන් පටන් සඟකම් කරන්ට වටී.

තවද: නදියක බොහෝ භික්ෂූහු වෙන වෙනම සඟකම් කෙරෙත් නම්: තම තමන්ගේ උදකුක්ඛෙප සීමාවලට අනන්තරය පිණිස අතික් උදකුක්ඛෙපයක් සීමන්තරිකාය පිණිස තැබියයුතු. එයට වැඩිවීම වරද නැත. අඩුවීම සුදුසු නැත. ජාතස්සර-සමුද්‍ර ආදියෙහි ද එසේමැයි[1].

භික්ෂූන් නදියෙහි විනය කර්මයක් කිරීමට ගිය කල්හි: නදිය ජලයෙන් පිරී පැවතුනීනම්: ජලසාටිකාව හැඳගෙණ හෝ නදිය තුළ උදකුක්ඛෙපය කොට විනයකර්මය කළයුතු.[1] එසේ නොකළ හැකි නම්: ඔරු-පාරු ආදියක හෝ හිඳ උදකුක්ඛෙපය කොට විනය කර්මය කළ හැක. ගමන් කරණ ඔරු-පාරු ආදියක විනය කර්ම කරන්ට නොවටයි[1]. සීමාව උදකුක්ඛෙපයකල ප්‍රමාණයයි. ගමන් කරණවිට එය වහා ඉක්ම ගොස්: එක තැනකදී ඤත්තිය ද, අන් තැනකදී අනුසාවණය ද වෙයි. එබැවින් ඒ ඔරු-පාරු-පහුරු ආදිය හබලෙන් හෝ ගලක් දියේ බස්වා හෝ නදිය තුළ හටගත් ගසක බැඳ හෝ (නදිය තුළම ලීයක් සිටුවා බැඳ හෝ) ඔරු-පාරු-පහුරු නවත්වා ගෙණ සඟකම් කළයුතු[1].

නදියතුළ අටල්ලක් මැස්සක් බැඳ ඒ මත හෝ නදිය තුළ පිහිටි ඉඩ පහසු ඇති ගසක හෝ හිඳ සඟකම් කරන්ට වටියි[1]. ඉදින් ඒ උදකුක්ඛෙපය තුළ පිහිටි විනය කර්මය කරණ ගසේ අත්තක් හෝ, ඒ ගසින් නික්මුනු අරළුවක් (මූලක්) හෝ ගං ඉවුරෙන් බැහැර විහාර සීමාවක හෝ ගාම සීමාවෙහි හෝ පිහිටියේ නම්: එහි සිටි භික්ෂූන් අත්පසට

1. සපා: 786, කවි: 7,

ගෙන්වා ගෙණ හෝ, එයින් ඉවත් කොට හෝ[1] ඒ අතු-මුල් කපාදමා සීමාව සුද්ධ කරගෙණ සඟකම් කළයුතු. එසේම ගාමසීමාව හා උදකුක්ඛෙප සීමාව බාහිර ගස් අතු-සේතු ආදි දෙයකින් සම්බන්ධවීම ද ඉවත් කළ යුතු.[1] ගං ඉවුරෙන් (ගඟෙහි දිය පැතිරී පවතින ප්‍රමාණයෙන්) බැහැර (පිට) පිහිටි ගසක අත්තක් ගඟට ඇතුල්වී සිටිකල ඒ අත්තෙහි හෝ එසේ පිටගසකින් ගඟට ඇතුල්වී සිටි මූලක හෝ ඒ සඟකම් කරණ ඔරු - පාරු බැඳ තබා ගෙණ විනය කර්ම කරන්ට නොවටියි. (සුදුසු නැත) එසේ බැඳ තබන්නවුන් විසින් අතු-මුල්-බැමි ආදිය කපා හෝ පිටත පිහිටි බව ඉවත් කොට හෝ සීමාව සුද්ධකොට සඟකම් කළයුතු. එසේම ගං ඉවුරෙහි කණු සිටුවා ඒ කණුවල විනය කර්ම කරණ ඔරු-පාරු බැඳ තබා ගෙණ විනය කර්ම කිරීම ද නොවටියි[1].

තවද: නදියෙහි දමා ඇති ඒ දඬු පාලමෙහි පාද (කණු) ගඟතුළම පිහිටියේ නම්: ඒදඬු පාලම මත සිට විනය කර්ම කරන්ට වටී. ඉදින් ඒදණ්ඩ පිහිටා-තබා ඇති පාද (කණු) හෝ, ඒදණ්ඩෙ (පාලමේ) කොණක් හෝ බැහැර ගං ඉවුරෙහි වැදී සිටී නම් එහි විනය කර්මය කරන්ට නොවටියි. (ඒ වැදී සිටි තැන් ඉවත්කර) සීමාව සුද්ධකොට විනයකර්ම කළයුතු. ඉදින් ඒදණ්ඩ (පාලම) පිහිටුවා ඇති කණු නදිය තුළ පිහිටියාහු දෙකොණ ඉවුරේ බිම නොවැදී උස්ව-මතුවී සිටියේ නම් ඒමත විනය කර්මය කළහැක[1].

නදිය තුළ ඇති ගලක (ගල්තලාවක) හෝ දූපතක යම් පමණ පෙදෙසක් (හෝ සම්පූර්ණයෙන්ම හෝ) මුලින් කියන ලද පරිදි පියවි වැසිකාලයෙහි ද වර්ෂාඍතුවේ සිවුමසෙහි ද ජලයෙන් යටවී සිටී නම් එය ද නදීසඞ්ඛ්‍යාවටම යෙයි.[1] අධික වර්ෂාව පවතින කාලයෙහි පමණක් යටවී සිටීම නො ගතයුතු යම් කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ එසේ පවතී නම් ගාමසීමා සඞ්ඛ්‍යාවට යෙයි[1].

1. විවි: 416,

නදිය විනාසකොට හෝ, වෙනස් කොට එය විලක් බවට පමුණුවානම්: එහි ද, නදිය පහළින් බඳින ලද ඇලවලින් ජලය ගලා ඇවිත් විලක් පිරී සිටී නම් එහි ද සඟකම් කරණු නොවටී යි. ඉහළ පහළ නදිය උතුරා සිටී නම්: උතුරා යන නදියෙහි සඟකම් කළහැක. එහෙත් තළාක - නදී අතර පවතින ජලයෙහි සඟකම් කිරීම නොවටී ය යි: දක්වයි[1].

හේමන්ත-ගිම්හාන කාලවලදී වැසි නොවසිනවිට ජලය සිඳී වියලී යන නදියක* උවත් විනය කම් කළ හැක[2]. එහෙත්: නදීවලින් ගන්නා දිය මාතිකා (ඇලවල්) වල විනය කම් කිරීම සුදුසු නැත. ඉඳින් ඒ දිය ඇලවල් කැඩී-බිඳී ගොස් කල්ගත වීමෙන් නදියක් වී නම් එබඳු තැනෙක සඟකම් කිරීම වරද නැත. ඇතැම් නදියක් බොහෝ කලකින් උතුරා ගොස් ගම්-නියම්ගම් යටපත්කර ගෙණ සිටී නම්: එය නදියම වෙයි. විනය කම් කිරීමට ද සුදුසුය. ඉඳින් ගඟ ගලා ගොස් විහාර සීමා* යට වී සිටී නම්: එය විහාර සීමාව ම වෙයි[2].

මුහුදෙහි: සඟකම් කරණ කල: යම් පෙදෙසක් මුහුදු වඩදියෙන් හෝ, පියවියෙන් පවතින රළ: වේගයෙන් අවුත් හෝ යටපත් වේනම්: එබඳු තැන්වල සඟකම් කිරීම සුදුසු නැත. යම් පෙදෙසක් පියවි රළ (වේගයෙන් නොව) සවභාව යෙන් යටපත් කොට පැතිර සිටීනම්: ඒ පෙදෙස ජලාන්ත යෙහි පටන් මුහුදට ඇතුළත් වෙයි. මුහුදෙහි සියලු තැන සෝධනය නොකළ හැකි බැවින් උදකුක්ඛෙප සීමාවෙහි සිටම විනයකම් කළයුතුය[3]. මුදු දියෙහි සිටිය නොහැකි නම්: ඔරු-පාරු ආදියක හෝ අටල්ලක සිට කළයුතු. ඒ තැන් පිළිබඳ විනිශ්චය නදියෙහි කී ක්‍රමයෙන් දතයුතු. මුහුදෙහි පිහිටා ඇති ගල් තලාවක් ඇතැම් වාරයක රළ වේගයෙන් යට පත්වී සිට නැවත වාරයෙක දියෙන් මතුවී සිටීනම් එහිසිට

1. විජි; 419, 2. සපා; 787, 3. විවි; 414, * උබ්,

සඟකම් කරන්ට නොවටියි. එය ගාම සීමා සඞ්ඛ්‍යාවට යෙයි. ඉඳින් රළ එන කල හෝ, නො එන කල ද නිතර පියවි ජලයෙන් යටවී තිබේ නම්: එවැනි ගල් තලාවක සිට විනය කම් කළ හැක[1].

මහමුහුදෙහි මසුන් ඇල්ලීමට මිනිසුන් නොයන තරම් දුර දූපතක් හෝ, ගල්තලාවක් තිබෙනම්: එය (අගාමක) අරඤ්ඤසීමා සඞ්ඛ්‍යාවට යෙයි. මිනිසුන්ට යාහැකි තරම් දුරින් ඇති දූපත් ගාම්සීමා සඞ්ඛ්‍යාවට යෙත්. එහි ගාමසීමාව සෝධනය නොකොට විනයකම්කරන්ට නොවටියි[1]. මහ මුහුද: ගම හෝ නියම් ගම යටපත් කොට සිටී නම් (මුහුද ගලා මුහුදට යටවීගියේ නම්) එය මුහුද ම වෙයි. එහිවිනය කම් කරන්ට ද වටියි. ඉඳින් විහාර සීමාව මුහුදුජලයෙන් යටවී තිබේ නම්: එය විහාර සීමාව ම වෙයි[1].

**ජාතස්සරයෙහි**:* සඟකම් කරණ කල: යටකී ආකාර යෙන් වැසිකල ඉක්මගිය කල්හි පානය කරන්ට හෝ, යටත්පිරිසෙයින් අත්-පා සෝදන්ට හෝ ජලය නැතිවී වියලී යයි ද: මෙය ජාතස්සරයක් නොවෙයි. ගම්කෙතම වෙයි. එහි විනයකම් කිරීමට සුදුසු නැත. යම් ජාතස්සරයක වැසිකල ජලය සිටී නම්: එයම ජාතස්සරයයි. එහි යම්පමණ පෙදෙසක වෂ්ෂාෘතුවේ සාරමසෙහි උදකුක්ඛෙපයකට සුදුසු තරම ජලයපවතී ද: එහි උදකුක්ඛෙපය කොට සඟ කම්කළ හැක. කුඩා ජීතස්සරයෙහි උදකුක්ඛෙපයක් උවමනා නැත[2]. ගැඹුරු දියෙහි නම්: අටල්ලක් බැඳගෙණ හෝ, ජලයපවතින තැනෙක හටගත් ගසක හෝ, ගල්තලා- දූපත්වල හෝ නදියෙහි කී ආකාරයෙන් ඔරු-පාරු ආදියක හිඳ හෝ සඟකම් කළහැක[1].

ජලය ලබාගැණීම පිණිස සාරණ ලද වලවල්-වැව්-පොකුණු: ජාතස්සර නොවෙත්. ඒවා ගාමසඞ්ඛ්‍යාවට ම ඇතුලත් වෙත්[3]. ඒ වැව්-පොකුණු ආදියෙහි පස්පුරවා

---

1. සපා: 787, 2 විමි: 414, 3. සපා: 788,

ගොඩ කළත් ඒවා ගාමසීමාවෝයි. එකපැත්තකින් වේල්ලක් බැඳ මහවැවක් කළත් ජාතස්සරයක් නොවෙයි. ගාමසීමා සඞ්ඛ්‍යාවට ම යෙයි.

**ලුණුලේවාය** ද: ජාතස්සර සඞ්ඛ්‍යාවට ම යෙයි. එහෙයින් වැසිසාරමසෙහි සුදුසුලෙස ජලය නැවතී ඇති තැන්වල සඟකම්කරන්ට වටියි[1].

කුඩා නදී – ජාතස්සර ආදියෙහි සම්පූර්ණයෙන් සඞ්ඝයා පිරීසිටියේ නම් ඒ නදී ආදිය: සීමාව ලෙස සලකාගෙණ සඟකම්කළහැක, උදකුක්ඛෙපයක් උවමනා නැත[2].

සඞ්ඝයා විසයෙහි යම්සීමාවක් ඇතිකල්හි: යම්බඳු විනය කර්මයක් කරන්ට හැකිවෙයි ද, (එය) ඒ භික්‍ෂූන්ගේ ප්‍රයෝග යෙන් (ක්‍රියාවෙන්) උපන් සීමාවකි. (එය) ඒ භික්‍ෂූන්ගේ ප්‍රයෝගයෙන් ඇතිවීම ද, නැතිවීම ද වෙයි[3]. සාසනන්තර ධානය තෙක් පවත්නා බඬසීමාව මෙනි. (සත්තබ්භන්තර සීමාව) සකල අරණ්‍යයෙහිම සීමවිහාරයක සීමාව මෙන් පැතිරපවතී නම්: අතික් (සත්තබ්භන්තර) සීමාවක් ඇතිවූ විට සීමසම්භෙද සඞ්කාව නොවන්නේ ද? එබැවින් (සත්තබ්භන්තරසීමාව) සීමාපෙක්‍ෂාව ඇතිකල්හි ම ඇතිවෙයි. නැතිකල්හි නැති වේ ය යි: ගතයුතු[4].

අරඤ්ඤයෙහි: සත්තබ්භන්තර සීමාව මෙන්: නදී ආදියෙහි උදකුක්ඛෙප සීමාව ද සීමාපෙක්‍ෂාවෙන් ඇතිවෙයි. ඒ උදකුක්ඛෙප සීමාවෙහි ද: මධ්‍යම පුරුෂයා කොබඳු වූවෙක් දැ?යි: (සූත්‍රයෙන්) නොහැඟෙයි. එසේම: සියලු ශක්තියෙන් ජලය දැමීම ද නොපැහැදිලිය. (එසේ ම) යම් දිසාවකින් සත්තබ්භන්තර – උදකුක්ඛෙප සීමාවන් ඇතිකරගැණීමට අවකාස මදවේ නම්: එහිදී සත් අබ්භන්තරමැනීම* හෝ, උදකුක්ඛෙපය කිරීම හෝ කෙසේ වන්නේ ද? සමහරවිට ගම්කෙත් ඇතුල්වීමෙන් නො කෙතෙහි සීමාව පිහිටා කාවරනම් සීමාවිපත්තියක් නොවන්නේ ද?[4].

1. සපා: 788, 2. සපා: 785, 3. විවි: 411, 4 විවි 412, * උබ:

සීමාපෙක්‍ෂාවෙන් සීමාව ඇතිවන කල්හි: පොහෝනා පමණකින් සත්තබ්භන්තර-උදකුක්ඛෙප සීමා තෙමේ (ඉබේ) ම පරිපූර්‍ණව උපදිත්. යම් තැනෙක නොපොහොනේ නම්: එහි තමාට (සීමාවට) ඉඩ ඇතිපමණින් උපදිත්. එයින් බැහැර නූපදිත්[1].

යම් ආකාරයකින් සීමාලක්‍ෂණ දැක්වීමෙහිදී: අබ්භන්තර මනින ප්‍රමාණය ද, වැලි ආදිය දැමීම දැක්වීම ද යන මෙය: තෙමේ හටගත් සීමා පිහිටිතැන් පිරිසිඳීම පිණිස කරණ ලද්දකි. ගාමූපචාර-ඝරූපචාර දැනගණු පිණිස: ගල්කැටයක් -කුල්ලක් විසිකිරීමෙන් ප්‍රමාණය සලකා ගැණීමේ නියමය දැක්වූවාක්මෙනි. ඒහෙයින්ම (කඞ්ඛාවිතරණී) මාතිකාට්ඨකථා වෙහි: **"සීමං වා බන්ධති, උදකුක්ඛෙපං වා පරිච්ඡින්දති"** ය යි: කියනලදි. මෙසේ අබ්භන්තර මැනීමෙන් හෝ, උදකුක්ඛෙපය කිරීමෙන් හෝ ඒසීමා පිරිසිඳීම (මායිම) හරිහැටි දැනගත නොහෙන බැවින්, පුළුල් වසයෙන් දැන, සීමාතුළ සිටින්න වුන් නිසැක තැනක සිටියයුතු. සීමාවෙන් බැහැර කරන්න වුන් නිසැක තැනකට යැවියයුතු[1].

**ඇතැම් ඇදුරු කෙනෙක්**: මෙසේ කියත්: සීමා පෙක්‍ෂාවෙන් වැඩෙක් නැත. මග යනගමන් හෝ, දියනෑම් ආදි කටයුත්තක් නිසා හෝ යම්භික්‍ෂුවක් අරණ්‍යයට හෝ නදී ආදි තැනකට හෝ පිවිසි කෙණෙහි: ඒ භික්‍ෂුව වටකොට අරණ්‍යයෙහි සත්තබ්භන්තරසීමාව ද, නදියෙහි: උදකුක්ඛෙප සීමාව ද ප්‍රදීපාලෝකයක් මෙන් තෙමේ ම ඇතිවෙයි. ඒ භික්‍ෂුව: ගම් කෙත් ආදියට පැමිණිකල්හි නැතිවී ය යි. එහෙයින් සඟදෙකොටසක් වෙන් වෙන්ව අරණ්‍යයක හෝ, නදියක සඟකම් කරණකල: සත්තබ්භන්තර සීමා දෙකක් අතර අතික් සත්තබ්භන්තරයක් ද, උදකුක්ඛෙපසීමා දෙකක් අතර: අතික් උදකුක්ඛෙපයක් ද සීමන්තරිකා වසයෙන් තැබීමට නියමකරණ ලදි. සීමාපරියන්තයෙන් කිසියම් කටයුත්තක් සඳහා බැහැර යවන ලද භික්‍ෂුවගේ හාත්පස හටගත් සීමාව: අනුන්ගේ සීමාවක් හා ගැටී සීමසම්භේදය කරන්නේය. එය ද එසේ නොවේවා යි:

1. විවි: 412.

තවත් රියනක් හෝ සතරඟුලක් පමණවත් සීමන්තරිකය වශයෙන් තැබිය යුතුය. සීමන්තරිකයෙහි සිටි භික්ෂුව අත්පස ගෙණ දෙපසේ ඇති සීමාවල කර්මකෝප්‍යයකිරීම කියන ලද බැවින් ද මේ කාරණය සිද්ධය. ඒ සීමන්තරික යෙහි සිටි භික්ෂුව: වටකොට තෙමේ ම හටගත් සීමාවෙන් දෙපසෙහි ඇති සීමා දෙකෙහිම හෝ, එකක හෝ සපශී වී කර්මකෝප්‍යය වන බැවිනි[1].

එහෙත්: **ඒ ඇඳුරුහුගේ** කර්ම කෝප්‍යයවේය යි: කීම නොයෙදෙයි. කවර හෙයින් ද? **මාතිකාට්ඨකථා** වෙහි: **"පරිච්ඡෙදබ්භන්තරෙ හත්ථපාසං විජහිත්වා ඨිතොපි, පරිච්ඡෙදතො බහි අඤ්ඤං තත්තකං එව පරිච්ඡෙදං අතික්කමිත්වා ඨිතො'පි කම්මං න කොපෙති"** යනු: කියන ලද හෙයිනි[1].

නමුත්: අගාමකාරඤ්ඤයෙහි සිටි විනයකර්ම කිරීමේ බලාපොරොත්තුවක් නැති භික්ෂුවට ද: සත් අබතුරකින් පිරිසුන් අභ්‍යවකාශයෙහි (එළිමහනෙහි) තිචීවරාවිප්පවාසය භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලදි. ඒ පිරිසිඳීම ද සීමාවකි. මෙසේ: ඒ සීමාව අපේක්ෂාවෙන් තොරව උපන්නීය. එහෙයින් මෙහි 'මේ සීමාව තිචීවරාවිප්පවාසයද ලබන්නීය'යි: කියන ලදි. එහෙයින් විනයකර්ම කිරීමේ බලා පොරොත්තුවක් නැතිව ද, කියනලද ආකාරයෙන් සීමාවගේ ඉපදීම ගතයුතු ය යි: කියත්[2]. එය යුක්තියක් නොවෙයි[2].

(කවර හෙයින් ද?) ප්‍රදීපාලෝකයක් මෙන් සියලු පුද්ගල යන්ට වෙන් වෙන්ව සීමා ඇතිවීමෙන්: සඞ්ඝයා හෝ, ගණයා හෝ විනය කර්මයක් කරණ කල්හි: එහි සිටි භික්ෂූන්ගේ හාත්පස වෙන වෙනම හටගත්, නොයෙක් සීමාවන්ගේ එකිනෙක ගැටීමෙන් සංකර දෝෂය ඇතිවිය හැකි බැවිනි. තවද: පිරිස් වශයෙන් ඒ සීමාවන්ගේ අඩු-වැඩි වීම ද ඇති වෙයි. (ඒ සමගම) පසුව පැමිණෙන භික්ෂූන්ගෙන් අභිනව සීමන්තරෝත්පත්තිය ද, ගිය භික්ෂූන්ගේ හාත්පස සිටිසීමා විනාසය ද වන්නේය[2].

---

1. විවි: 412, 2. විවි: 413,

පාළියෙහි: **‘සමන්තා සත්තබ්භන්තරං අයං තස්ස සමානසංවාසා’** යනාදි වසයෙන් එක ම සත්තබ්භන්තර සීමාවක් ද, උදකුක්ඛෙපසීමාවක් ද (භාග්‍යවතුන් වහන්සේ විසින්) අනුදන්නා ලදි. ඒ සීමා ස්වභාවයෙන් හෝ, ක්‍රියාමාත්‍රයෙන් (සත් අබ්භතර මැනීමෙන් හා, උදකුක්ඛෙපමාත්‍රයෙන්) ප්‍රදීපාලෝකයක් මෙන් නො උපදිත්. යලි භාග්‍යවතුන් වහන්සේගේ අනුදැනීමෙන් ම උපදිත්[1].

භාග්‍යවතුන් වහන්සේ: මේ සීමාවන් අනුදන්නා සේක්: භික්ෂූන්ගේ වර්ගකර්ම පරිහාරය පිණිස හා, විනයකර්ම කර ගැණීමේ පහසුව පිණිස ද අනුදත් සේක. භික්ෂුවක් දියනෑම් ආදි යම් කිසකට නදියකට පිවිසිතැන, හාත්පස ඒ සීමාවන්ගේ ඇතිවීමෙන් ප්‍රයෝජනයක් නැත. (ඇතැම්විට) ප්‍රයෝජනයක් ඇතොත්: එකම සීමාවකින්ය. භික්ෂූන්ගේ ගණනට වෙන වෙනම සීමා ඇතිවීමේ ප්‍රයෝජනය කුමක් ද? නමුත් **‘එකසීමායං හත්ථපාසං අවිජහිත්වා ඨිතො’**ය යි: එක සීමාවක් ඇති බවම කියනලදි. තවද: (සත්තබ්භන්තර-උදකුක්ඛෙප) සීමා දෙකක් අතර: එතරම් පිරිසිඳීමකින්ම සීමන්තරිකය තැබියයුතු බව කීම ද, ඒ සීමන්තරිකයෙහි සිටියවුන්ගේ ඒ සිටීමෙන් පවා කර්මකොප්‍යය වන බවකීම ද, එයට හේතුය. මේ සීමාවන්ගේ පිරිසිඳීම දුරවබෝධ බැවින් සීමාසම්භෙද සැකයත්, කර්මකොප්‍යයවීමේ සැකයත් දුරින්ම දුරු කරණු පිණිස මෙසේ (කරුණු) කියන ලදි[1].

නැවතත්: භාග්‍යවතුන් වහන්සේ විසින්, තිචීවරාවිප්පවාසය පිණිස: සත් අබ්භතරකින් පිරිසුන් යම් අභ්‍යවකාශයක් දක්වන ලද ද: එය සීමාවක් නොවෙයි. කොතය-විල ය යි: තරම පිරිසිඳ ගන්නාක් මෙන්, මෙය ද එක්තරා පිරිසිඳ ගැණීමකි. (පමණ වෙන්කර ගැණීමකි). එහි (ඒ සත් අබ්භතුරෙහි) බොහෝ භික්ෂූන් එකට සිටි කල්හි, ඒ භික්ෂූන් වෙන වෙන ම තම තමන් සිටි තැන: පටන් සත් අබ්භතුරකින් පිරිසුන් පමණ තැනක සිවුරු තැබිය යුතු. පිරිස් කෙළවර පටන් (සත් අබ්භතුරක් පිරිසුන් තැන) සිවුරු නොතැබියයුතු.

---

1. විවි: 413,

පිරිස් කෙළවර පටන් සත්අබ්භන්තර ගන්නා කල්හි: අබ්භන්තර කෙළවරෙහි තැබූ සිවුරු, පිරිස මැද සිටි භික්ෂුවට අබ්භන්තර ගණනින් බැහැර වෙයි. එය අරුණ නැගී කල්හි නිසඟි වන්නේය. එහෙයින් සීමාව: පිරිස් කෙළවර පටන් නොගත යුතුය. තිචීවරාවිප්පවාස පරිහාරය: අබ්භ්‍යවකාශ පරිච්ඡේද යාගේ විද්‍යමාන භාවයෙන් කියන ලදි. සීමා පරිච්ඡේදය ලබා ගැණීම පිණිස නොකියන ලදි. මහා සීමාවෙහි: අවිප්පවාස සීමාව්‍යවහාරය මෙනි. මහාසීමාවෙහි ද ගාම-ගාමූපචාරයන් හිදී සිවුරු නිසඟි වෙයි. මෙහිදු: මැද සිටි භික්ෂුවගේ සිවුරු සීමා පරියන්තයෙහිදී නිසඟි වෙයි. එහෙයින්: 'කියන ලද පරිදි සීමාපෙක්ෂා වශයෙන් ම ඒ සත්තබ්භන්තර-උදකුක්ඛෙප සීමාවන්ගේ උත්පත්තිය වෙයි. සීමාපෙක්ෂාව නැති කල: ඒ සීමාවන්ගේ නැතිවීම ද වන බව ගත යුතුය' යනු: අපගේ (විමති විනෝදනී ඇදුරුගේ) මතයයි[1]. විමසා ගතයුතු. මීට වඩා ඉතා යුක්ති සහිත අන්‍ය ක්‍රමයක් හෝ සෙවිය යුතු[1].

මෙහි වනාහි: **'අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරං** යනුවෙන්: පාලියෙහි ද, **'විඤ්ඣාටවී සදිසෙ අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරං'** යනුවෙන්: අට්ඨකථාවෙහි ද: රුක් ආදියෙන් ගැවසී ගත් අරණ්‍යයෙහි: සත්තබ්භන්තර සීමාව නියම කරණලද බැවින් තමාට නිශ්‍රයවූ අරඤ්ඤසීමාව හා, මේ සත්තබ්භන්තරසීමාවගේ රුක් ආදීන් හා සම්බන්ධ වීමෙහි දෝෂයක් නැති බව මූලින්ම වැටහෙයි. (එහෙයින්) ගම නො වූ, රුක්වලින් ගැවසීගත් පෙදෙසෙහි තිචීවරා විප්පවාසයට: රුක්ඛපරිහාරයෙන් තොරවූ ම අබ්භොකාස පරිහාරය අනුමත බව සිඬයයි: දතයුතු[2].

---

## උදකුක්ඛෙපසීමා

**"උදකං උක්ඛිපිත්වා ඛිපීයති: එත්ථා'ති - උදකුක්ඛෙපො. උදකස්සපතනොකාසො**[2]= මෙහි: ජලය ඔසවා දමානුයි: උදකුක්ඛෙප නම්. දිය වැටුනු අවකාසයයි."

---

1. විවි: 413, 2 විවි: 414,

**“යථා අක්ඛධුත්තා දුරුගුළ කිලඤ්ජං ධුත්ත ජනො: දුරුගුළං හත්ථෙන ගහෙත්වා අත්තනොබලං දස්සෙන්තො විය: සබ්බථාමෙන අත්තානං ඔනමිත්වා ඛිපන්ති. එව මෙ'ව: ථාම මජ්ඣිමෙන පුරිසෙන: උදකං වා වාලිකං වා හත්ථෙනගහෙත්වා, අත්තනො බලං දස්සෙන්තො විය: ඔනමිත්වා සබ්බථාමෙං ඛිපිතබ්බං**[1] = දුකෙළින්නෝ දුරු ගුළය (පසැටය) අතින් ගෙණ: තම බලය දක්වන්නාක් මෙන්: සියලු ශක්තියෙන් නැමී ගුළය දමත් ද: එමෙන් මැදුම් බලැති පුරුෂයා විසින් දිය හෝ වැලි අතින් ගෙණ තම බලය දක්වන්නාක් මෙන් නැමී දැමිය යුතු.

**“පරිසපරියන්තතොපට්ඨාය: සමන්තා යාව මජ්ඣිමස්ස පුරිසස්ස උදකුක්ඛෙපො උදකපතනට්ඨානං: තාව යන්තං පරිච්ඡින්නට්ඨානං, අයං තස්ස නදී ආදිසු අපරා සමාන සංවාසා උදකුක්ඛෙපසීමා**[2] = (අත්පස නොහැර සීමාධිෂ්ඨානයෙන් එකතුව සිටි සඞ්ඝසඞ්ඛ්‍යාවෙන් යුත් උපසපන් භික්ෂූන්ගේ) පිරිස් කෙළවර පටන්: හාත්පස මධ්‍යම පුරුෂයකුගේ උදකුක්ඛෙපය හෙවත්: උදකුක්ඛෙපයකින් දිය වැටෙන තරම් ප්‍රමාණයකින් පිරිසුන් ස්ථානයවේ ද: මෙය ඒ නදී ආදියෙහි අතික් සමාන සංවාස උදකුක්ඛෙප සීමාවය” (තිචීවරාවිප්පවාසය මෙහි නොලැබෙයි.)

උදකුක්ඛෙපසීමාවෙහි: සඟකම් කරණ භික්ෂූහු: නදී ආදියෙහි ජලය අධික වේ නම්: ජලසාටිකා හැඳ පාදයෙන්ම හෝ, ඔරු – පාරු ආදියකින් හෝ උදකුක්ඛෙප දෙකක් ගත හැකි තරම් අවකාස ඇති වන සේ, නදිය තුළට වී උදකුක්ඛෙපය කළයුතු. නදී ආදිය මැද මැස්සක් හෝ මණ්ඩපයක් තනාගෙණ වුව ද සඟකම් කළ හැක[3].

මාතිකට්ඨකථාවෙහි: **“පරිච්ඡෙදබ්භන්තරෙ හත්ථපාසං විජහිත්වා ඨිතොපි, පරිච්ඡෙදතො බහි අඤ්ඤං තත්තකං එවපරිච්ඡෙදං අනතික්කමිත්වා ඨිතොපි කම්මං**

1. විවි: 415, කවි: 7, සිවි: ගා, 2. කවි: 7, විවි: 415, සීවි: ගී,
3. විවි: 414,

**කොපෙති''**[1]=උදකුක්ඛෙපයෙන් පිරිසිඳගත් (වෙන්කරගත්) තැන ඇතුළත අත්පස හැර සිටි භික්ෂුව ද, උදකුක්ඛෙපයෙන් බැහැර අනික් එපමණවූ ම උදකුක්ඛෙප ප්‍රමාණයක් නොඉක්මවා සිටි භික්ෂුව ද කර්මකෝප්‍යය කෙරෙයි'' යන මෙය: සියලු අටුවාවන්හි තීරණයට බැසගත් මත ය යි: කියන ලදී. **සාරත්ථදීපනී** ටීකාවෙහි: 'පළමුවන උදකුක්ඛෙප සීමාවෙන් බැහැර සිටීම වරදක් නැතැ' යි: කියන නමුත්: අටුවා වචන යන්ට සහ මාතිකට්ඨකථාවචනයට එය නොගැලපේ ය යි: **විමතිවිනෝදනී** ටීකාවෙහි ඒ මතය පිළිකෙව් කරයි[1].

යටත් පිරිසෙයින් උදකුක්ඛෙප දෙකක් අතර සීමන්තරිකය පිණිස: වියතක් හෝ සතරඟුලක්වත් තැබිය යුතුය. වැඩි වසයෙන් අනික් උදකුක්ඛෙපයක්ම තබන්නේ නම් මැනවි. කෙසේ නමුත් අඩුවෙන් තැබීම සුදුසු නැත. එසේ අඩුවෙන් තැබීමෙන් සීමා සංකරය හා කර්මකෝප්‍යය ද වේ ය යි: කියයි. ඒ කියන ලද ප්‍රමාණය තුළට එක භික්ෂුවක් හෝ ඇතුල්වුවහොත්: ඒ භික්ෂුව සීමාව තුළ සිටියෙකු වන බැවින් කර්මකෝප්‍යය කියනලදි: එහෙයින් අට්ඨකථාවෙහි: **"ඌනකං පන න වට්ටති**=අඩුවෙන් අනන්තරිකය තැබීම නොවටීය'' යි: කියයි. මෙසේ කියන ලද්දේ: උදකුක්ඛෙපය හරිහැටි දැන ගැණීමට අපහසු බැවින්: යම් අයුරකින් සීමාසංකරය: වුව හොත් එයින් කර්මකෝප්‍යයවීම ඇතිවිය හැකි බැවිනි[2].

(පාළියෙහි: උදකුක්ඛෙපය කළයුත්තේ: මධ්‍යමපුරුෂයා ය යි ද, ඒ **'මජ්ඣිමපුරිස'** යන්න: අට්ඨකථාවෙහි **'ථාම මජ්ඣිමපුරිස'** ය යි: ශක්තියෙන් මැදුම් බලය ඇති පුරුෂයා ගතයුතු ය යි කියත්[3]. නමුත්: උදකුක්ඛෙපසීමාවක් ඇතිකර ගැණීමෙහි දී: මැදුම් පමණ සිරුර ඇති මිනිසෙක - මැදුම් බලය ඇති මිනිසෙක යන විශේෂයක් ගැණ නොතකා, ඒ අවස්ථාවට ඉදිරිපත්වූවෙකු ලවා උදකුක්ඛෙපය කරවයි. එය හරිහැටි නොගැණීමෙන් කර්මකෝප්‍යයවන බව අට්ඨකථාවෙහි දක්වයි. එබැවින් නිතර අඩුවෙන් නොගෙණ වැඩියෙන්ම ගැණීම ගැණ අට්ඨකථාව එකඟභාවය දක්වයි).

1. විචි: 414, 2. විචි: 415, 3. විචි: 412,

**“ගණ්ඨිපදෙ පන: යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපාති: එකිස්සා නදියා චතුවග්ගාදීනං සඞ්ඝානං විසුං චතුවග්ගාදි කම්මකරණ කාලෙ සීමාපරිච්ඡෙද දස්සනත්ථං වුත්තං. තිචීවරෙන විප්පවාස පරිච්ඡෙද දස්සනත්ථං වුත්තමපි: සත්තබ්භන්තර සීමාය පරිච්ඡෙද දස්සනං විය’ති: ආචරියා. තස්මා උදකුක්ඛෙප පරිච්ඡෙද භාවෙ‘පි, අඤ්ඤා නදියං කාතුං වට්ටතී’ති සබ’නති ලිඛිතං.”**[1] = විනය ගැටපදයෙහි: මධ්‍යම පුරුෂයාගේ හාත්පස උදකුක්ඛෙපය නම්: එකනදියක වෙන් වෙන්ව චතුවග්ගාදි සඞ්ඝයා සඟකම් කරණ කල ඒ භික්ෂූන්ගේ සීමා පිරිසිඳීම දැක්වීම පිණිස: කියනලද්දකි. එය සත්තබ්භන්තර සීමාවෙහි තිචීවරාවිප්පවාසය දැක්වීම පිණිස: ‘සත් අබතුර කීම වැනිය’ යි ද: එබැවින් උදකුක්ඛෙපයෙන් පිරිසිඳීමක් නොකර වුව ද නදියතුළ සඟකම් කිරීම වටී ය යි: කියයි”. නමුත්:

**“තත්ථ ‘උදකුක්ඛෙප පරිච්ඡෙද’භාවෙපී’ති: ඉදං පදං සමන්තතො උදකුක්ඛෙපෙන පරිච්ඡින්නන්ති: මහා අට්ඨකථා වචනෙන වා, ‘සමන්තා උදකුක්ඛෙප පරිච්ඡෙදො කාතබ්බො’ති: මාතිකා අට්ඨකථාය: කඞ්ඛාවිතරණී යඤ්ච වුත්ත වචනෙන වා, එත’දත්ථ මෙවහි: “වාලිකාදීහි සීමාපරිච්ඡින්දනන්ති’ති: විමති විනොදනී වචනෙන වා න සමෙති.**[2] = එහි උදකුක්ඛෙපයෙන් පිරිසිඳීමක් නැතිව උවත් යන මේ පදය: හාත්පසින් උදකුක්ඛෙපයෙන් පිරිසිඳින ලද යන: මහාට්ඨකථා වචනය සමග හෝ, ‘හාත්පසින් උදකුක්ඛෙපය කළයුතුය’ යන: කඞ්ඛාවිතරණී වචනය සමග හෝ, මේ නිසාම: වැලි ආදියෙන් සීමාව පිරිසිඳිත්ය: යන: විමතිවිනෝදනී වචන සමග හෝ නොසමය”.

එසේම: උදකුක්ඛෙපයෙන් පිරිසිඳීමක් උවමනාය යන මේ කාරණය: සඞ්ගීතිත්‍රයයෙහිම පිළිගත් අටුවාවල ද: **කඞ්ඛාවිතරණී, විමති විනොදනීවලද,** පිළිගෙණ ඇති

---

1. සීවි: ගා, 2. සීවි: ගී, 3. සීවි: ගී,

බැවින් ද ඒ කීම: නොමැකියහැකිය යයි ද: බොහෝ කාරුණු දක්වමින් 'උදකුක්ඛෙප පරිච්ඡේදයක් උවමනා නැත' යන මතය: සම්පූර්ණයෙන් පිළිකෙව් කරයි[1].

---

## සීමාසංකර

(මහාසීමාදි) බඩසීමාවක සම්මතකළ ඛණ්ඩසීමාව: අන්‍ය ඛණ්ඩසීමාවක් සමග ද, ඛණ්ඩසීමාව: එම බඩසීමාව සමග ද ඔවුනොවුන් ගස්–මුල්–වැල් ආදි බාහිර දෙයක් නිසා සම්බන්ධය ඇතිවුව හොත්: ඔවුනොවුන්ට විපත්තිසීමාවෙත්. නදී ආදියෙහි සම්මත කරණලද උදකුක්ඛෙපසීමාව ද: බඩසීමා–ගාමසීමාදීන් සමග ගස් ආදියෙන් හෝ ඔවුනොවුන් සම්බන්ධ වුවහොත්: විපත්ති සීමාවවෙයි. මේ ක්‍රමයෙන් සත්තබ්භන්තර සීමාව: ගාම – නදී ආදි සීමාවන් සමග ද, උදකුක්ඛෙප සීමාව: අරඤ්ඤාදිසීමාවන් සමග ද, ගස් ආදීන්ගෙන් හෝ සම්බන්ධවීම නොවටනා බව දතයුතු. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද: **බඩසීමා – සත්තබ්භන්තර සීමා – උදකුක්ඛෙප සීමා:** ඔවුනොවුන් සම්බන්ධවූ කල්හි සම්භෙද, (සංකර) ද්‍රෝසය ඇතිවේයයි: සූත්‍රානුලෝමනයින් දතයුතුය[2].

තම – තමන්ට නිශ්‍රයවූ ගාමාදීන් සමග බඩසීමාදි ත්‍රිවිධ සීමාවන්ගේ උත්පත්තිකාලයේදී ම භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද: සීමසම්භෙද – සීමජ්ඣොත්ථරණ – සංකාරාදිද්‍රෝසයන්ට හේතුවන බැවින්: උදකුක්ඛෙප – බඩසීමාදීන්ගේ අතර සීමන්තරිකායක් තැබීමට කවර හෙයින් නො අනුදන්නා ලද ද?. නිශ්‍රයභේද සවභාව භේදයන්ගෙන් තම තමන්ම වෙන්ව පවත්නා බැවිනි[2].

නිශ්‍රයභේදයෙන් හා සවභාවභේදයෙන් වෙනස්වන හෙයින්: නදිය නිමිත්තක් කොට බඳින ලද: බඩසීමාවෙහි සඞ්ඝයා විසින් සඟකම් කාරණ කල: ගම්කෙතෙහි වැදී සිටි

---

1. සිවි: ගී,
2. විවි: 416,

නදියෙහි කළ උදකුක්ඛෙප සීමාවෙහි: වෙනම සඞ්ඝයාට සඟකම් කළ හැක[1] (ජලය හා පොළොව ස්වභාවයෙන් වෙන්ව ඇති බැවිනි).

ලෝක ව්‍යවහාර වසයෙන් සිද්ධ: ගාම-අරඤ්ඤ-නදී-සමුද්ද-ජාතස්සර යන පස්වැදෑරුම් සීමා ඔවුනොවුන් හා සම්බන්ධය ඇති කල්හි සම්භේද දෝෂයට නොපැමිණෙත්[1]. (ගාමසීමාව: ගම සමග ද, අරඤ්ඤසීමාව: අරඤ්ඤය සමග ද යනාදි වසයෙනි). කවර හෙයින්ද? ගම: ගමක් සමග ද, නදිය: නදිය සමග ද සම්භේදයක් ගැණෙ ලෝක ව්‍යවහාරයක් නැත. ලෝක ව්‍යවහාර සිද්ධීන්ගේ පැවැත්ම: ලෝක ව්‍යවහාරයෙන් ම ගතයුතුය. එහෙයින් අට්ඨකථාවෙහි ඒ සීමාවන්ගේ සම්භේද ක්‍රම සමහර තැනෙක නොදක්වයි. සාසන ව්‍යවහාර සිද්ධිය ම දක්වයි[2].

මහාසීමා – ඛණ්ඩසීමා දෙකම බද්ධසීමාවෝය. නමුත්: ගාමසීමාව: ගස්-වැල් ආදියෙන් බද්ධසීමාව හා සම්බන්ධවීම ගැන සඳහන් නොකර: බද්ධසීමාවන්ගේ ඔවුනොවුන් හා සම්බන්ධය දක්වීමෙන්: (සුද්ධ) ගාමසීමා-බද්ධසීමාවන්ගේ රුක් ආදීන් හා සම්බන්ධයක් ඇතිකල්හි සම්භේද සඞ්කර දෝෂයක් නැතිබව හැඟෙයි[3]. එයට හේතුව: ඔවුනොවුන් නිශ්‍රය – නිශ්‍රිතභාවයෙන් පැවතීමයයි ගත යුතුය[3].

ඉදින්: ඒ සුද්ධ ගාමසීමාවන්ගේ ඇති: ගස්-වැල් ආදියෙන් බද්ධ සීමාව සම්බන්ධවීමේ දෝෂයක් ඇතිවන්නේයයි: සලකන්නේ නම්: ගාම සීමා වෙහි බද්ධ සීමාවක් කෙසේ සම්මත කළ හැකිද? යම් සීමාවක් හා සම්බන්ධවන්නේ නම්: ඒ සීමාව එහි බදින්ට ද නොවටියි[4].

බද්ධසීමාවක්: උදකුක්ඛෙපසීමාවක් සමග ද, උදකුක්ඛෙප සීමාවක්: ගාමසීමාවක් සමග ද: දෙපසෙහි ඇති ගස්- අතු-අරළු ආදිය හා සම්බන්ධවී (සංකර) දෝෂ ඇතිවෙයි. එහෙයින් **“සචෙ පන රුක්ඛස්ස සාඛා වා, තතො නික්ඛන්ත පාරොහො වා බහි නදීතීරෙ විහාරසීමාය වා ගාමසීමාය වා**

1. විවි: 416, 2. විවි: 417, 3. විවි: 402, 4 විවි: 403,

**පතිට්ඨිතො**[1] = ඉදින් වනාහි: ගසක අත්තක් හෝ, එයින් නික්මුනු අරළුවක් හෝ, ගංඉවුරෙන් බැහැරව පිහිටි විහාර සීමාවක හෝ, ගාමසීමාවක හෝ පිහිටියේ වේ ද” යනාදී යෙන් උදකුක්ඛෙපසීමාවගේ තමහට අතිශ්‍රයවූ ගාමසීමාදීන් සමග (සංකර වීමෙන්) සම්බන්ධ දෝසය දක්වන ලද්දේය. නදී සීමාවක්-නදීසීමාවක් සමග සම්බන්ධ දෝසය නොදක්වන ලද්දේය[2].

**“සීමා මාලකෙ වටරුක්ඛො හොති. තස්ස සාඛා වා තතො නිග්ගත පාරොහො වා මහාසීමාය පඨවිතලං වා තත්‍ථ ජාත රුක්ඛාදීනි වා ආහච්ච තිට්ඨති. මහාසීමං වා සොධෙත්‍වා කම්මං කාතබ්බං**[3]= සීමා මාලකයෙහි (බිමෙහි) නුගරුකක් වෙයි නම්: ඒ නුගරුකේ අත්තක් හෝ, ඒ නුගරුකෙන් නික්මුනු අරළුවක් හෝ මහා සීමාවෙහි පොළෝ තලය හෝ ඒ සීමාබිමෙහි හටගත් රුක් ආදීන් හෝ ස්පර්ශ කොට (වැදී) සිටීනම්: (ඒවා ඉවත් කිරීමෙන්) මහාසීමාව සෝධනය කොට විනය කර්‍ම කළ යුතු”.

**“න භික්ඛවෙ සීමාය සීමා සම්භින්දිතබ්බා**[4]” = මහණෙනි! සීමාවෙන් සීමාවක් නොබිඳිය (නොගැටිය) යුතුය” යනාදීන් බද්ධසීමාවන්ගේ සම්භෙද* අජ්ඣොත්‍ථරණ* දෝසයන් ප්‍රතික්‍ෂෙප කොට[4].

**“අනුජානාමි භික්ඛවෙ සීමං සම්මන්නන්තෙන සීමන්තරිකං ඨපෙත්‍වා සීමං සම්මනිතු’න්ති**[4]= මහණෙනි! සීමාවක් සම්මතකරන්නහු විසින් සීමන්තරිකයක් තබා සීමාව සම්මත කරන්ට අනු දනිමි”යි: උභය බද්ධසීමාවන්ගේ අතර සීමන්තරිකයක් තබාම සීමාබන්ධනය කරන්ට අනු දන්නා ලද: බුදුරජාණන් වහන්සේ විසින් සීමාසම්භෙද* අජ්ඣොත්‍ථරණයන්* මෙන්: ඒ සීමාවන් (සංකරව) ඔවුනොවුන් ස්පර්ශ කොට (එකට වැදී) සිටිනසේ බන්ධනය ද නොවටීය’යි: දෙසන ලද බවක් හැඟෙන හෙයින්: බඳනාලද සීමාවන්ගේ ද පසුව ඔවුනොවුන් එක ගසකින්වත් වැදී-ගැටී

1. සපා: 786 – විවි: 403, 2 විවි: 403, 3. සපා: 780,
4. විවි: 403, 4. මඋ: 268, * උබ,

සිටීම නොවටීය[1], යනුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ අදහස දන්නා ලද **සඞ්ගීති කාරක මහරහතුන්** වහන් සේලා විසින් සීමාබන්ධන කාලයෙහි පිළිකෙව් කරණ ලදැ: සම්බන්ධදෝසයට අනුලොම් වීමෙන් අකප්පියානුලෝමය වන බැවින් ඒ කාරණය ගෙණහැර දක්වන ලදි[1].

සීමාවන්ගේ මේ සම්බන්ධ දෝසය: මුලින් මනාව බඳින ලද සීමාවන්ට පසුව ඇතිවන බැවින්: සීමාබන්ධනය කරණ කොණෙහි මෙන් අසීමා බවක් කරන්ට නොහැකි වෙයි. එබැවින් රුක් ආදීන් හා පැවති සම්බන්ධය ඉවත් කල කොණෙහිම ඒ සීමා පියවි සීමාවෝ වෙත්. යම් සේ සීමා බන්ධනයෙන් පසු: ඒ සීමාව අන්‍ය සීමාවක රුක් හා සම්බන්ධවීම නොවටී ද, එසේම: සීමාවක් බඳිනු ලබන කොණෙහි ද. ඔවුන්ගේ රුක් ආදීන් හා සම්බන්ධයක් ඇති කල්හි සීමාබන්ධනය කරන්ට නොවටීයයි: දතයුතු[1].

**ඇතැම් ඇඳුරු කෙනෙක්: "මහාසීමං වා සොධෙන්තා'ති**[2] = මහාසීමාව හෝ සුඬකොට" යන මෙහි: මහා සීමාවට ඇතුලත් භික්ෂූහු (බැහැර සීමාවකින් පැමිණි) අත්තක් හෝ, අරළුවක් හෝ යම්සේ කාය පිළිබඳ දෙයකින් ස්පර්ශ නොකරත් ද: 'එසේ සෝධනය ම මෙහි දක්වන ලද්දේය' යි: ද, 'සකල සීමා සෝධනය ම නොදක්වන ලද්දේ ය' යි ද කියත්. එය යුතු නැත. අටුවාවට විරුඬ වන බැවිනි[1].

**"මහාසීමාය පඨවිතලං වා තත්‍ථ ජාත රුක්ඛාදීනි වා ආහච්ච තිට්ඨතී'**[2]ති = මහාසීමා භූමිය හෝ, එහි හටගත් රුක් ආදිය හෝ ස්පර්ශ කොට (වැදී) සිටියි" යන අටුවාපාඨයෙන් රුක් අතු-මූලයන්ගේ මහාසීමාව ස්පර්ශකොට සිටීම ම: සම්බන්ධදෝසයෙහි කාරණභාවයෙන් කියයි. මහාසීමාවෙහි සිටි භික්ෂූන් විසින් රුක් අතු ආදිය ස්පර්ශ කිරීම ම: දෝසයක් වසයෙන් නො කියයි[1].

ඉඳින් භික්ෂූන්ගේ අතු ආදිය ස්පර්ශ කොට සිටීම ම: දෝසයට කරුණ වන්නේ නම්: 'ඒ ගසේ අත්තක් හෝ

1. විචි: 403, 2. සපා: 780, විචි: 403,

එයින් නික්මුනු අරළුවක් හෝ මහාසීමාවට ඇතුල්වූයේ: එහි සිටි යම් භික්ෂුවක් ස්පර්ශකොට සිටී' යයි: 'භික්ෂුවගේ ස්පර්ශ කිරීම' ම: කියයුතු වන්නේය. මහාසීමා සෝධනයෙහි යමක් කාරණය වන්නේ නම්: එයම (භික්ෂුවගේ ස්පර්ශ කිරීමම) ඒ වාක්‍යයෙහි ප්‍රධාන වශයෙන් දක්විය යුතු[1].

සීමා බිමෙහි වැදී සිටි අතු ආදියක් ස්පර්ශ කොට සිටි භික්ෂුව පමණක් සෝධනය නො කළයුතු. ඉහළ අහසින් පැමිණි අතු ආදියක් ස්පර්ශ කොට සිටි භික්ෂුව ද සෝධනය කළයුතු බැවිනි. එවිට සීමාවේ වැදී සිටී ය' යි: කීමෙන් පමණක් ඇති ප්‍රයෝජනය කිම[2]? එවිට උඩ අතුවල උන් භික්ෂුවගේ (පාවලින් හෝ සිවුරුවලින්) සීමා බිම ස්පර්ශ කිරීම කාරණ භාවයෙන් (සීමා සඞ්කරයට හේතු වසයෙන්) කියන ලදි[2].

සීමා සෝධනය ද: (ඒ අත්ත මත උන්) භික්ෂුව අත්පසට පමුණුවාගැණීම් වසයෙන් කියන ලදි. මෙහි (අට්ඨකථාවෙහි) **"මහාසීමං සොධෙන්තා** = මහාසීමාව සෝධනය කොට" යන්නෙන් සකල සීමාවගේ ම සාධාරණ වසයෙන් සෝධනය කියන ලදි. එහෙත්: අතු ආදිය ස්පර්ශ කොට සිටි භික්ෂුව පමණක් සෝධනය කිරීම: අභිමතය නම්: **"මහාසීමාය පථවිතලං** = මහාසීමා භූමිය" ය යි: විශේසයෙන් සීමා බිම ඇතුළත් කරගැණීම නිරර්ථකවන්නේය. යම්කිසි තැනෙක: අහසෙහි (ඉහළ ඇති) අතු ආදියක් ස්පර්ශ කොට සිටි භික්ෂුවද සෝධනය කළයුතු බැවිනි[2].

**"ඡින්දිත්වා බහිට්ඨකා කාතබ්බා**[3] = (මහාසීමාවෙන් ඛණ්ඩසීමාවට හෝ, ඛණ්ඩසීමාවෙන් මහාසීමාවට හෝ පැමිණ වැදී සිටි අතු-අරළු ආදිය) සිඳ ඉවත් කළ යුතු"ය යන මෙහි: (අටුවා වචනයෙහි) ඒ කීම: සීමා බිමෙහි පිහිටි අතු ආදිය (වැදී සිටි) ඉවත් කරණ කීමක් බැවින්: විසභාග සීමාවන්ගේ ස්පර්ශ කිරීමෙන් සකල සීමාවම සෝධනය කිරීමට හේතුව දක්වූ අටුවා මතයක් ය යි: ගතයුතු.[2]

1. විං: 403, 2. විම: 404, 3. සපාඃ 786,

එහෙයින්ම: උදකුක්ඛෙප සීමා කථාවෙහි ද: **"විහාර සීමාය වා ගාමසීමාය වා පතිට්ඨිතො'ති**[1] = විහාර සීමා වෙහි හෝ ගාමසීමාවෙහි පිහිටියේ ය යි: ද, **නදී තීරෙ ඛාණුකං කොට්ටෙත්වා තත්‍ථ බද්ධ නාවාය න වට්ටති.**[1] = නදී තීරයෙහි (ගංඉවුරෙහි) කණුවක් සිටුවා, ඒ කණුවෙහි බඳිනලද නැවක (ඔරු – පාරු ආදියක) විනය කර්ම කරන්ට නොවටී ය යි" ද, **"සචෙ පන සෙතු වා සෙතුපාද වා බහි නදීතීරෙ පතිට්ඨිතා කම්මං කාතුං න වට්ටති**[1] = ඉදින් ඒදණ්ඩ හෝ, ඒදඬුපාද (ඒදණ්ඩ රඳවාගැණීමට සරසට දමන ලී පිහිටි කණු) ආදිය හෝ නදී තීරයෙන් පිට පිහිටියාහු නම් විනයකර්ම කරන්ට නොවටී" ය යි: ද, එසේම: විසභාගවූ ගාම සීමාවත්හි අතු ආදිය වැදී සිටීම ද: සඞ්කර දෝෂයට කරුණු වේ ය යි ද: කියන ලදි. භික්ෂුවක් ඒ අතු ආදිය ස්පර්ශ කිරීම නොදක්වන ලදි[3].

එලෙසින්ම: **"නදියං ජාතරුක්ඛෙ බන්ධිත්වා කම්මං කාතබ්බ'න්ති**[2] = නදියෙහිම හටගත් ගසකබැඳ විනයකර්ම කරන්ට වටී" ය යි: නදීජලය තුළම (සඟකම්කරණ ඔරු පාරු) බැඳ තැබීම අනුදන්නා ලදි[1]. (කවර හෙයින්ද?) උදකොත්ක්ෂෙපයට නිශ්‍රය බැවින් නදීසීමාවට සභාග බැවිනි[3].

ඉදින් භික්ෂූන්ගේ ස්පර්ශකිරීම ඇතිහෙයින් සියලු තන්හි සම්බන්ධ දෝසය කියන්නේ නම්: නදියෙහි (සඟකම්කරණ කල නදියතුළ පිහිටි ගසක ඔරු ආදිය) බන්ධනය ද පිළිකෙව් කළ යුතුය. එහිදු: (ඒ උදකුක්ඛෙපසීමාවෙහි ද) (පිටතින් පැමිණි අතු ආදියක්) භික්ෂූන් ස්පර්ශ කිරීම: කර්මය කෝප්‍යය වීමට කාරණයක් වෙයි. එබැවින් සභාගසීමාවලට ඇතුල් වී, භූමි ආදිය ස්පර්ශ කොට, හෝ නො කොට, අතු ආදියක් ඇතිකල්හි: ඒ අතු ආදිය ස්පර්ශ කරණ භික්ෂුව ම සෝධනය කළ යුතුය. විසභාග සීමාවල අතු ආදිය ස්පර්ශ කොට සිටි කල්හි: ඒ අතු ආදිය ඉවත් කොට, ඒ අතු ආදිය ස්පර්ශ

1. සපා: 786, 2. සපා: 785, 3. විවි: 404,

නොකරන්නාවූ ද, සියලු භික්ෂූන් (ඡන්දාහරණාදියෙන්) සෝධනය කළයුතු. (අතු ආදිය) බිම ස්පර්ශකොට සිටි කල්හි: ඒ අතු ආදිය පමණක් ස්පර්ශ කරන්නාවූ ද සියලු භික්ෂූන් සෝධනය කළ යුතු ය යි: මෙහි තීරණයකට එළඹිය යුතු[1].

මෙහි: යම්කිසි ඈඳුරු කෙනෙක්: ('අතු-අරළු ආදියෙන් එකට සම්බන්ධවූ) බද්ධසීමා දෙකක් මෙන්, බද්ධසීමා – ගාම සීමාවන්ගේ ද, අනික් (උදකුක්ඛේප – සත්තබ්භන්තරාදි) සමානසංවාසක සීමාවන් ගේ ද ඔවුනොවුන් රුක් ආදීන් හා සම්බන්ධය ඇතිකල්හි: ඒ සීමා දෙකම හෝ කීපයම එක සීමාවක් මෙන් (ඡන්දාහරණාදියෙන්) සෝධනය කොට, එක තැනම විනය කර්ම කළ යුතුය. වෙන් වෙන්ව කරණ ලද කර්මය විනාසයට පැමිණේයි: කියත් ද, එහි සභාග –විසභාග භේදයක් නැතැ'යි: කියත් ද: එය ඔවුන්ගේ මතිමාත්‍රයකි[1].

සභාග සීමාවන්ගේ ම (ගම: ගාමසීමාව සමගද, නදිය: උදකුක්ඛේපසීමාව සමගද යනාදිවශයෙන්) ඔවුනොවුන් හා සම්භේද ධ්වංසයක් නැති බවට ද[1], විසභාග සීමාවන්ගේම: ඒ සම්භේද ධ්වංසය ඇති බවට ද සුත්ත – සුත්තානුලෝම* විනය ක්‍රමයන්ගෙන් හේතු සිද්ධය[1]. (කරුණු පැහැදිලිය)

තවද: **"අනුජානාමි භික්ඛවෙ සීමං සම්මන්නිතු'න්ති=** මහණෙනි! සීමාව සම්මත කරන්ට අනුදනිමි"යි: ගාමසීමාවෙහිම බද්ධසීමාව සම්මත කරන්ට අනුදන්නා ලදී. (මෙහි ගාමසීමාව සඟකම් කිරීමට වෙන්වූවක් නොව ගම ම – ගාම සීමාවය) ඒ ගාමසීමා – බද්ධසීමාවන්ගේ නිශ්‍රය – නිශ්‍රිත භාවයෙන්: සඞ්කර බවක් හෝ, සම්භේද*– අජ්ඣොත්ථරණ* ආදි ධ්වංසයක් හෝ නො වීම: සූත්‍රයෙන්ම සිද්ධය[2]. (දැක්වෙයි) සීමාබන්ධන කාලයෙහි අනුදන්නා ලද (කප්පියාකප්පිය) සම්බන්ධයට අනුලොම් වන බැවින් ඒ සීමාවන්ගේ පසුව

1. විචි: 404, 2. විචි: 405, * උබ:

හටගත් රුක් ආදීන් හා සම්බන්ධය ද වරදක් නැත[1]. (තුන් යොදුන් ආදි විසාල සීමාවන් සම්මත කරණ කල රුක් - වැල් ආදිය සහ සීමාපරිච්ඡේදයන් ගමන් සම්බන්ධවීම නොවැලැක්විය හැක.)

**"යං භික්ඛවෙ! -පෙ- කප්පියං අනුලොමෙති අකප්පියං පටිබාහති: තං වො කප්පතී'ති** = මහණෙනි! යමක් -පෙ- කැපදෙයට අනුලොම් වෙයි ද, අකපපිය දෙය වලක්වයි ද එය ඔබට කැපය"යි: දෙසන ලද බැවිනි[1].

මෙසේ බද්ධසීමා - ගාමසීමාවන්ගේ ඔවුනොවුන් සඞ්කරවීම, සම්භෙදාදි දෙ‍ාස් ඇතිවීම යන මොවුන්ගේ අභාවය: සුත්ත - සුත්තානුලෝම* වසයෙන් සිද්ධය. එමෙන්ම අරඤ්ඤ-සත්තබ්භන්තර සීමාවන්ගේද, නදී - උදකුක්ඛෙප - සීමා වන්ගේ ද: සුත්ත-සුත්තානුලෝම වසයෙන් ඔවුනොවුන් සඞ්කර - සම්භෙදාදි දෙ‍ාස් ඇතිනොවී ම ද (සුත්ත - සුත්තානුලෝම වසයෙන්) සිද්ධයයි: දතයුතු[1].

බද්ධ සීමාවක් අනික් බද්ධසීමාවක් තුළ ද, නදී ආදි සීමාවන් තුළද බැඳීම: පිළිකෙව් කොට ඇති බැවින් ද, උදකුක්ඛෙප - සත්තබ්භන්තර සීමා: නදී අරඤ්ඤයන්හි ම කරන්ට නියමකරණ සූත්‍ර දක්වෙන බැවින් හා, බද්ධසීමා - ගාමසීමා වන්හි: ඒ උදකුක්ඛෙප - සත්තබ්භන්තර සීමාවන්ගේ කිරීම පිළිකෙව්කොට ඇති බැවින් ද, ඒ සීමාවන්ගේ ඔවුනොවුන් විසභාග බව: සීමාව හටගත් කෙණෙහි ද, පසුව ද රුක් ආදීන් හා ගැටී මෙන් සම්භෙදාදි දෙ‍ාස් ඇතිවීම ද, කියන ලද ක්‍රමයෙන් සුත්ත-සුත්තානු ලෝම වසයෙන්ම සිද්ධය[1] (පැහැදිලිය)

එහෙයින් අටුවාවෙහි: විසභාග සීමාවන්ගේ ම 'වට රුක්ඛා' දි (නුගරුක් ආදි) වචනයන්ගෙන් සම්බන්ධ දෝසය දක්වා, සභාග: බද්ධසීමා - ගාමසීමාදීන්ගේ සම්බන්ධ දෝසය නො දක්වන ලද්දේය. එපමණක් නො ව: ඒ සභාගසීමා

1. විවි: 405, * උබ:

වත්ගේ (ගම හා - බඬසීමාව ද, නදිය හා - උදකුක්ඛෙප සීමාව ද) සම්බන්ධය ඇති කල්හි ද්‍රෝසයක් නැතිබව පෙළ අටුවා වන්හි සඳහන්ව ඇත[1].

තවද පෙළෙහි: **"පබ්බත නිමිත්තං - පාසාණ නිමිත්තං - වන නිමිත්තං - රුක්ඛ නිමිත්තං"** යනාදි වසයෙන් වැඩෙන නිමිති අනුදන්නා ලදහ. ඒ රුක් ආදි නිමිති වැඩෙන කල්හි ද: බඬසීමා - ගාම සීමාවන්ගේ සඞ්කර ද්‍රෝසයක් නැති බව දන්නා ලද්දේමය. බඬසීමා දෙකක මෙවැනි සම්බන්ධයක් සුදුසු නැත. එහෙයින්: **"එකරුක්ඛොපි ද්වින්නං සීමානං නිමිත්තං හොති. සො පන වඩ්ඪන්තො: සීමසඞ්කරං කරොති. තස්මා න කාතබ්බො"**ති[2] = එක රුකක් සීමා දෙකකට නිමිති වෙයි ද: එය වැඩී (විසාලවී) සීමාසඞ්කරය කරයි. එහෙයින් (එකගසක් බඬසීමා දෙකකට නිමිති දෙකක් මෙන්) නොගත යුතුය."යි කියන ලදි.

**"අනුජානාමි භික්ඛවෙ තියොජන පරමං සීමං සම්මන්නිතුං**[3] = මහණෙනි! (අවසාන වසයෙන් දිගපළලින්) තුන්යොදුන් පමණවූම සීමාව සම්මත කරන්ට අනුදනිමි" යනු වෙන් අනුදන්නා ලද තුන්යොදුන් මහාසීමාව හාත්පස - වටා, රුක් - වැල් -- ලියගොමු ආදියෙන් බඬසීමා - ගාම සීමාවන්ගේ නියමවසයෙන්ම ඔවුනොවුන් හා සම්බන්ධවීම ඇතිවන නමුත්: 'මෙවැනි සම්බන්ධයන් නැති කොට ම සීමාව සම්මත කළ යුතුය'යි: අටුවාවෙහි ද නොකියන ලදි[1].

ඉදින්: එසේ රුක් ආදීන් හා සම්බන්ධවීමෙන් විනය කම්මවිපත්තිය වන්නේ නම්: අවශ්‍යයෙන්ම (රුක් ආදීන් හා සම්බන්ධය ඉවත් කොට කළ යුතු ය යි:) කියයුතුවන්නේය. විනයකම් විපත්ති නැති කිරීම පිණිස ඇදුරුවරු: සැක නොකළ යුතු තැන්වලත් **"භිත්තිං අකිත්තෙත්වා**[4] = බිත්තිය කීර්තනය නො කොට" යනාදීන් සිඬවූ අර්ථය නැවත නැවතත් කීහ[1].

---

1. විවි: 405, 2. සපා: 788, 3. මළ: 258, 4. සපා: 779,

**"වෙනමජේඣ විහාරං කරොන්තී: වනං න කිත්තෙතබ්බං**[1] = වනමැද (සීමා) විහාරයක් කරන්නේ නම්: වනය කීර්තනය නො කළයුතු" යනාදිවසයෙන් රුක්-ලිය ආදි යෙන් ගහණ වනමැද ද සීමාබන්ධනය කීහ එසේම: කණුමත කළ ප්‍රාසාදාදියෙහි: යටකණු හා ඒකාබද්ධව පැවති උඩ තට්ටුවලද සීමාබන්ධනය බොහෝසෙයින් කියන ලදී. එබැවින් බඬසීමා – ගාමසීමාවන්ගේ රුක් ආදීන් හා සම්බන්ධය ප්‍රධාන වශයෙන්ම ඇතිවන බව දක්වන ලද්දේය[2].

තවද: ගාමසීමාවන් ද වෙනම බඬසීමා සමාන බැවින් එක ගාමසීමාවක විනයකම් කරණ කල්හි: තණපතකින්වත් සම්බන්ධවූ ගාමන්තර පරම්පරාවෙන් අරඤ්ඤ – නදී – සමුද්‍ර-යන් ද සෝධනය කළ යුතුවී: මුළුදිවයින ම සෝධනය කොට විනය කම්කළයුතු වන්නේය[3].

මෙසේ සෝධනය නො කොට: ප්‍රථම සඞ්ගීතිකාලයේ පටන් කරණලද උපසම්පදාදි විනයකම්ද, සීමාසම්මති ද විනාසවී යාමෙන්: සියලු භික්ෂූන්ට ප්‍රසඞ්ගයෙන් ඇතිවන අනුපසම්පන්නද? යන සැකය: නො වැලැක්විය හැක්කේය. එහෙයින් එසේ සම්බන්ධය ගැණීම යුතුනැත. කියන ලද ක්‍රමයෙන් විසභාග සීමාවන්ගේ ම, රුක් ආදීන් හා සම්බන්ධ ද්වෙසය වෙයි. 'බඬසීමා – ගාමසීමා ආදී සභාගසීමාවන්ගේ නො වේ' ය යි: ගතයුතු[3].

බඬසීමාවෙන් ගාමසීමාවට හෝ, ගාමසීමාවෙන් බඬ සීමාවට හෝ, පැමිණිබව නො කිය හැකි: බඬසීමා – ගාම සීමාවන්හි හෝ, උදකුක්ඛෙප – නදී ආදි සීමාවන්හි හෝ (ඒ සීමා ආසන්නයෙහි ම හටගත් සීමා දෙක ම සම්බන්ධවී) සරසවැටී ඇති (ගස්-වැල්) රුහැන් – දඬු ආදිය ගැණ කුමක් කළ යුතුද? (ඒවා සීමාසම්මතයට ප්‍රථමයෙන් පැවැත්තාහු නම්:) බඬසීමාවට ඇතුල් වී පැවති කොටස 'බඬසීමා' ව

---

1. සපා: 774, 2. විවි: 405, 3. විවි: 406,

යසි: ද, අබද්ධගාම සීමාවෙහි පිහිටි කොටස 'ගාම සීමාව' ය සි: ද ගතයුතු. ඒ බද්ධා' බද්ධ සීමාවන්ට අයත්ව සිටි පර්‍ව්තාදිය මෙනි[1].

බද්ධසීමාවෙන් මතුවී නැගී තුගරුකෙක අරළු: ගාමසීමාවෙහිද, ගාමසීමාවෙන් මතුවී නැඟී තුගරුකෙක අරළු: බද්ධ සීමා වෙහිද පිහිටිකල්හිත් මේ ක්‍රම ය සි. මූල් ඇතිවූකාලයෙන් පසු: බද්ධසීමාවෙන් ගාමසීමාවට හෝ, ගාමසීමාවෙන් බද්ධ සීමාවට හෝ ඒ රුක පැමිණියේ යයි. නොකිය හැකි බැවිනි[1].

යම් යම් කොටස් ඒ ඒ සීමාවල පිහිටියේ නම්: ඒ ඒ පිහිටි කොටස් එ ඒ සීමාසඞ්ඛ්‍යාවට්ම යෙත්. ඒ තුගරුක් හා අරළු අතර බිමනොවැදී උඩ තුබූ අතුවල ද: සීමා භූමියේ පිරිසිඳීම් පමණින් ඒ සීමා දෙකට අයිති වේ ය සි: **ඇතැම් ඇදුරු කෙනෙක්** කියත්[2].

යම් හෙයකින් (ගාමසීමාවට හෝ, බද්ධසීමාවට) උඩින් ඇතුල් වූ අත්තක අරළුවක්: ඇතුල් වූ සීමාවෙහි බිම මූල් ඇද පිහිටා සිටීමට අත්ත නොමැතිව නො හැකි වේ ද: ඒ තාක් මූලින් අත්ත පිහිටි සීමාවෙහි අයිතිය නොහරියි. **යම් කලෙක:** ඒ අත්ත නො මැතිව ඇදුනු මූල් පැවතී සිටීමට හැකි වෙත් ද: එවිට ඒ අත්තෙන් ඇදුනු අරළු පමණක් ඇතුල් වූ සීමාවට අයත් වෙති. එබැවින් උඩ අහසෙහි සිටි සියලු අතුකොටස් මූල්සීමාවේ අයිතිය නොහරියි. ඒ සීමාවෙන් පැමිණි කොටස අත් නොහළ බැවිනි[1].

උදකුක්ඛෙප – නදී සීමාවන්හි ද: ඒ ක්‍රමය මැයි. එහිදු: විසභාග සීමාවන් තුළට එසේ අතු ආදිය ඇතුල් වූ කල්හි: සකල සීමා සෝධනය ද: සභාග සීමාවකට පැමිණි කල්හි: එය ස්පර්‍ශකොට සිටි භික්‍ෂුව පමණක් සෝධනය ද යන සියල්ල පෙරකීසේයි[1].

---

1. විවි: 407 2. විවි: 406,

එක රුකක් සීමාදෙකකට නිමිතිකර ගැණීමෙන් ඒ රුකවැඩී සීමාදෙකම සංකර කළ හැක. එමෙන් සීමන්තරිකායෙහි හෝ, වැඩෙනරුක් රෝපනය කිරීම සුදුසු නොවේ. එසේම: බැහැරින් මතුවී සිටි ගස්මුල් ආදිය සීමාභූමියට ඇතුල්වීම සුදුසු නොවේ. මතුනොවී පොළොව යටින් ඇදෙනමුල් භූමිගතිකවෙයි. එසේම මතුවී ඇති පර්වත-පාසාණ ද භූමිගතිකවෙත්[1].

**(යටකී මතයට විපක්ෂව)** යම් බද්ධසීමාවක්: යම් වෘක්ෂ ශාඛාදියකින් අන්‍යසීමාවත් සමග ද, බද්ධසීමාවත් සමග ද අසංකර නම් ඒ සීමාව: සඞ්ඝකර්මයට සුදුසු වෙයි[2]. බද්ධ-අබද්ධ සීමාවන්ගේ වෘක්ෂ – ශාඛාදින් නිසා: සම්බන්ධයක් ඇතිකල්හි ඒ මිශ්‍රදෝෂය: සුද්ධනොකොට කරණලද සඞ්ඝ කර්මය කෝප්‍යය වෙයි[3]. ගාමසීමාවගේ බද්ධසීමාව හා සාඛාදීන් සම්බන්ධයක් ඇතිකල: සංකර නොවේය යන මතය සොළී ඇදුරන්ගේය. (විචි: චෝළියකස්සප) ගාමසීමා – බද්ධසීමා-වන්ගේ නිශ්‍රය – නිශ්‍රිත (ආධාර – ආධෙය) භාවයසංකර නොවීමට කාරණයයි: ඒ ඇදුරහු කල්පනා කළහ.[3].

ගාමසීමාව: බද්ධසීමාවට ආධාරය, බද්ධසීමාවක්: ගාම සීමාව ආශ්‍රය කරණලද්දීය. යනමේ කල්පනාව විනයානුරූප නොවේ. ගාම – බද්ධසීමාවන්ගේ එකතැන සිටීමෙක් නැත. එසේ ඇත්නම්: එක පෙදෙසක පිහිටි ගාම – බද්ධසීමා දෙකෙහි සිටිභික්ෂුහු: සීමා නා නා සංවාසකයෝ[4] වන්නාහ. නා නා සංවාසක භික්ෂුන්ගේ ගණපූරණයෙන් කළ කර්මය අකර්මයක් වෙයි[4].

ගාමසීමාව: බද්ධසීමාවතුළත් ලැබේනම්: දෙ සීමාවක සිටි භික්ෂුහු එකසීමාවක සිටිබවට යෙත්නම්: එකල්හි ගාමසීමාවෙන් වෙන් කරණු පිණිස බද්ධසීමාවක් බැඳීම නිෂ්ඵලවන්නේය[5]. සොළී භික්ෂුහු (විචි-කස්සප) බද්ධ – සීමාවන්ගේ සංකරනොවීමට කරුණුකියත්. ඒ කරුණු

---

1. සීද: 89, 2. සීල: 13, 3. සීල: 15, 4. සීල: 18,
4. සපා: 1021, 5. සීල: 19,

එයට සාධකනොවෙත්. (එනම්) අටුවාවෙහි: **"සචෙ පොරාණස්ස විහාරස්ස – පෙ – සීමාය සීමා සම්භින්නා හොති**[1] =පුරාණසීමාවට නිමිතිවූ ගාමසීමාවෙහි සිටි අඹරුක: සීමාවතුල පිහිටි දඹරුකසමග ඔවුනොවුන් හැනී – වෙළී සිටි වෙලෙප් ඇතිව සිටියදී ද. සීමාබන්ධන කාලයෙහි සංකර දොෂයක් නැතැ"යි: දක්වනලද්දේය. (මෙහිද දක්වනලද 'සංසත්තවිටප' භාවය සීමාබන්ධනයට ප්‍රථමයෙන් පැවැති සේයයි දක්වයි.)

නමුත්: එහි (අටුවාවෙහි) ම: **"එකරුක්ඛො' පි ච චිත්තං සීමානං නිමිත්තං හොති සො පන වඩ්ඪන්තො සීමාසඞ්කරං කරොති**[2]= එකගසක් සීමාදෙකකට නිමිතිකළ හොත්: එය වැඩී සීමාසංකරය කෙරෙයි" යනුකියනලද හෙයින් **'සංසත්ත විටප'** භාවයෙන් සංකර නොවේ' ය යි: ගැන් ම යුක්ති සහිත නොවෙයි[3]. 'සංසත්තවිටපභාවයෙන් සංකරනොවේ' ය යි: ගතහොත් අටුවාකථාව පූර්වාපර විරුද්ධවෙයි[4].

යටත් පිරිසයින් සුළගිලි පමණවූ ද රුක නිමිත්තු පග ය යි: දක්වන කල එය නිමිත්තක් ලෙස ගැණීමෙන් පසු: එය වැඩෙමින් බඩසීමාවට ඇතුල්වූවත් නිදෙස්යයි: කීම ද සොළී මතිමාත්‍රයෙකි. යට කියනලද ලෙසින්ම ග්‍රාම සීමාවෙහි වැඩෙමින් පැවතිරුක බඩසීමාවට ඇතුල්වූව හොත් සංකරවෙයි[5].

**'සංසත්තවිටප'** යනමෙහි: **'සංසත්ත'** ශබ්දය: ආසන්න වෙලෙප් ඇතිබව පමණක් දක්වයි. 'සං'පූර්ව 'සජ' ධාතුව: එක්වීම – වෙන්වීම යන දෙ අරුත්හිම වැටෙයි. **'සංසත්ත විටපා'ති ඉමිනා අාසන්නත්තං දී පෙති**[6]. **'සංසට්ඨවිට පා'ති** ඉමිනා ආසන්නභාවො කථිතො'[7]. යනාදිවසයෙන් පූර්වාචාර්යයන් විසින් වියෝගාර්ථවාචී – 'සජ'ධාතු හුගේ වස යෙන් ඔවුනොවුන් ගේ අසම්බන්ධ භාවය හැඟවූහ[8]. ('සං සත්තවිටප'යන්නක් නැතිව කියන්නටද අවකාස තිබින)

1. සපා 788, 2. සපා: 788, 3 සීල: 20 - 21, 4 සීල: 38, 5. සීල: 23, 6. සාදී, 7. වබු, 8. සීල: 24 – 25,

නදී – සමුද්ද – ජාතස්සරයන්ගේ උදකුක්ඛෙප සීමාව ම ලැබෙයි. උදකුක්ඛෙපයෙන් බැහැර වූවාහු බද්ධසීමා බවට හා අබද්ධ සීමාබවට ද නොයෙත්. නදී ආදීහු උදකුක්ඛෙප සීමාවට ආධාර වන බව හැර: ඒ නදී ආදීන්ගේ සීමාබවක් පෙළෙහි නොදක්වෙයි[1]. අටුවාවෙහි: නදී ආදින්ගේ සීමා බව උදකුක්ඛෙප සීමාව ම අපෙක්ෂාකොට කියනලදී. අරණ්‍යයෙහි; සත් අබතුරු පමණ පෙදෙසක් ම අරඤ්ඤ සීමාබවට යෙයි. ඉන්බැහැර අසීමාව වෙයි[2].

ගම්කෙතක: එක පෙදෙසක් ගෙණ සම්මතකළ සීමාව 'බද්ධසීමා' නම්. ගාම සීමා නොවේ[3]. ඒ ගාමසීමා – බද්ධ සීමා දෙදෙන වෙන්-වෙන් සීමා හෙයින් නිශ්‍රය-නිශ්‍රිත ද නොවෙත්. ඒ දෙ සීමාවන්ගේ සාඛාදි සම්බන්ධයක් ඇතිකල්හි සංකරවේ. ඒ සීමා අබතුර හටගත් රුක්-ලිය ආදි කිසිවක් අන්‍යසීමා පෙදෙසකට ගොස් එහි ඇතිදෙයක් හා සම්බන්ධ වුවහොත් සංකරවේ[4].

නදී ආදින්ගේ සීමාබව: උදකුක්ඛෙපයෙන් පිරිසුන් තැනින් පිටත ද, අරඤ්ඤ සීමාව: සත් අබතුරින් පිරිසුන් තැනින් පිටත ද නො ලැබෙයි. ගාම සීමාවගේ හා බද්ධසීමාවගේ සීමාබව පෙළෙහි දක්වයි. ඒ ගාම – බද්ධ සීමා: සීමා වනබැවින් සාඛා දීන් හා ගැටීමෙන් ඔවුනොවුන්ගේ සංකරය වෙයි[5].

බද්ධ – උදකුක්ඛෙප; බද්ධ – සත්තබ්භන්තර, ගාම – උදකුක්ඛෙප, ගාම–සත්තබ්භන්තර, උදකුක්ඛෙප – සත්තබ්භන්තර සීමාවන් අතර සීමන්තරිකායක් නැතත් විජාතීය සීමාබැවින් ඔවුනොවුන්ම පිරිසිඳෙන බැවින් සංකරනොවෙත්. සාඛාදීන් සම්බන්ධකල්හි සංකරවෙත්[6]. ගාමසීමා දෙකක් අතර සීමන්තරිකායක් නොලැබෙයි. එවැනි ලෝකව්‍යවහාරයක් නැති හෙයිනි. එහෙයින් රුක් ආදීන් හා සම්බන්ධයක් ඇතිකල්හි ඔවුන්ගේ සංකරයක් නැතැයි: චෝළිය මතය

1 සීල: 28, 2. සීල: 29, 3. සීල: 30,
4. සීල. 31, 5. සීල: 32, 6. සීවී,

වුවත් ගාමසීමාව බද්ධසීමාව සමානයයි ද: අවිප්පවාසය නැති-බව පමණක් වෙනස ය යි ද: දක්වා ඇතිබැවින් ගාමසීමා - බද්ධසීමා දෙදෙනාගේ ද සංකරය වනබව සීහළ මතයයි[1].

උදකුක්ඛෙප සීමාව: අසීමාව වූ නදිය සමග ද, සත්තබ්භන්තර සීමාව: අසීමාව වූ අරඤ්ඤය සමග ද සංකර නොවේ[2]. සීමාවක් සීමාවක් සමග මුත් අසීමාවක් සමග සංකර නොවේ. ගාම - බද්ධ සීමාදෙදෙන ඔවුනොවුන් ආසන්නව සිටියාහු නමුදු දිය හා පොකුරුපතමෙත් මිශ්‍ර නොවෙත්. වෘක්ෂාදීන් ගේ සම්බන්ධයක් ඇතිකල්හි කිරි හා දියමෙත් මිශ්‍රවෙත්[3].

ගඟමැද හෙයක්කසිටි භික්ෂූන් විසින් උදකුක්ඛෙපයෙන් පිරිසුත් සීමාවෙහි සිට කම්කරන්ට වටියි. සේතුව දෙගං තෙර වෘක්ෂාදියෙන් හෝ, ගාමසීමාවෙන් සම්බන්ධකල: කම්කරන්ට නොවටියි. ලක්දිව මහෙහළ සළුවිරාදීහු සීමා මණ්ඩලය හාත්පස ඇවිදුනාහු නිමිති කීර්තනය කරමින් සංකර දෝෂාදියෙන් මුදා සිමා බැන්දාහුය[4].

---

## සීමා සෝධන

බද්ධසීමාවෙහි හෝ, ගාමසීමාවෙහි සඟකම් කරණ කල අත්පසින් බැහැරව සිටින භික්ෂූන් අත්පසට පමුණුවාගෙණ හෝ සීමාවෙන් බැහැර කොට සීමාව සෝධනය කළ යුතු. උදකුක්ඛෙප සීමාවෙහි සඟකම් කරණ භික්ෂූන් විසින් ද උදකුක්ඛෙප සීමාව තුළ ඇති: ගස් - අතු - මුල් - අරළු ආදියකින් ගාමසීමාව හා සම්බන්ධය පවතීනම් හෝ, ගාම සීමාවෙහි ඇති එ වැනි ම දෙයකින් උදකුක්ඛෙප සීමාව සම්බන්ධව පවතී නම් හෝ, ඒවා ඉවත්කොට සීමාව සෝධනය කළයුතු. බද්ධසීමාවෙහි හා ගාමසීමාවෙහි සඟකම් කරණ භික්ෂූන් විසින් ද: උදකුක්ඛෙප සීමාවෙහි පිහිටි ගස් - අතු - වැල් - මුල් - අරළු ආදියක් සමග සම්බන්ධය පවතී නම්: ඒවා ඉවත් කිරීමෙන් සීමාව සෝධනය කොට

---

1. සීල: 35, 2. සීල: 36, 3. සීල: 40, 4. සිල: 42,

ගෙණ සඟකම් කළයුතු. එමෙන් ම සතතබහතතර-අරඤ්ඤ සීමාවන් හා, උදකුක්ඛෙප සීමාවෙහි රුක් ආදීන්ගේ සම්බන්ධයක් ඇතිකල්හි ද සෝධනය කරගැණීම නය වසයෙන්ම දක්වන ලදී[1].

ඉදින් ඛණ්ඩසීමා මාලකයෙහි විනයකම් කරණ කල: මහා සීමාවෙන් ඛණ්ඩසීමා මාලකයට ඇතුල්වී ඉහළ අහසෙහි තුබූ අත්තක හිඳගෙණසිටි භික්ෂුවකගේ දෙපා හෝ, හඳනා – පොරෝනා සිවුරු හෝ බිමවැදී තිබේ නම්: දෙපා හෝ සිවුරු ඔසවා තබා කර්මය කළයුතු[2]. ඒ භික්ෂුවත් අත් පසට ගෙණ කර්මය කරන්නේ නම්: වඩා යෙහෙක[2]. ඉදින් සීමා බිමතුළින් මතුවී සිටි පර්වතයක් මත යම් භික්ෂුවක් සිටිය හොත්: ඒ භික්ෂුව ද අත්පසට කැඳවාගත යුතු. ඉදිමත් බැවින් පර්වතය තුළට පිවිසි භික්ෂුව ද, එසේම අත් පසට කැඳවා ගැණීම වටියි. බඩසීමා බිමක හටගත් යම් ගස් – වැල් ආදියක් සීමාව හා සම්බන්ධවී සිටී නම්: ඒ සියල්ල සීමා සඞ්ඛ්‍යාවට ම යෙයි[1]. (එහෙයින් බඩසීමාවක හැදී වැඩුනු නුග වැනි රුකක: සීමා භූමියෙන් බැහැරට ගිය අහසෙහි ඇති අත්තක නමුත් හිඳ විනයකම් කළහැක.)

**"මහා සීමං වා සොධෙත්වා කම්මං කාතබ්බං** = මහා සීමාව හෝ සෝධනය කොට විනයකම් කළයුතු[2]" **"මහා සීමං වා සොධෙත්වා'ති – මහාසීමගතානං සබ්බසංභික්ඛූනං හත්ථපාසානයන ඡන්දාහරණාදි වසෙන සකලං මහාසීමං සොධෙත්වා**[3] = මහා සීමාව හෝ සෝධනය කොට යනු: මහා සීමාවතුළ සිටි සියලු භික්ෂූන් අත්පසට කැඳවා ගැණීම හා ඡන්දපාරිසුද්ධිය ගෙන්වා ගැණීම් වසයෙන් ද සියලු මහා සීමාව සෝධනය කොට යන අර්ථයි"

**'සොධෙත්වා'** යන පදයෙන්: සීමාබන්ධනයෙහිදී සියලු සීමා විපත්තීන්ගෙන්මුදා මනාවබඳින ලද බඩසීමා දෙකක: පසුව රුක් ආදීන් හා සම්බන්ධ වී මෙන් උපදින පෙලෙහි නොදක් වූ දෝස ඇතිවනබව දක්වයි[1].

1 විවි: 406, 2. සපා: 780, 3. විවි: 403, සාදී, 4. විවි: 403,

පසු කාලයෙහි මහාසීමා සෝධනය අපහසු බැවින් ඛණ්ඩසීමාවල ම බොහෝ සෙයින් සඟකම් කළහ[1]. ඛණ්ඩසීමාවෝ ද: විනයකර්ම කරණ අවස්ථාවන්හි යටකී නයින් සෝධනය කළයුතු. කායපිළිබඳ දෙයකින් හෝ උපසපන් භික්ෂුවක් සීමාවස්පර්ශී කළ හොත් සීමාවෙහි සිටියේ වෙයි[1].

ඡන්ද – පාරි සුද්ධිය* ගෙණ ඊමෙන් මහාසීමාව කෙසේ සෝධනය කරන්නේ ද? (සෝධනය වෙයි ද?) සීමාවක්තුළ ඡන්ද – පාරිසුද්ධිය ගැණීම) විනයධරයෝ රුචිනොකරත්. එහෙයින් (පිරිසෙන් වෙන්වසිටි) භික්ෂුව අත්පසට ගැණීම හෝ, සීමාවෙන් ඉවත් කිරීම හෝ මෙහි 'සෝධනය'යි: සලකත්[1]. (මහාසීමාවක් තුළ ඡන්ද – පාරිසුද්ධිය නොගෙණ සියලු භික්ෂූන් රැස්කරවීම උගහටය එබැවින් ඛණ්ඩසීමාවක් තුළ හෝ, අනික් උදකුක්ඛෙපාදි සීමාතුළ හෝ ඡන්දපාරිසුද්ධිය ගැණීම විනයධරයන්ගේ රුචිනොකිරීමද?[2])

---

## කර්ම කෝප්‍යය වීම

ගාමසීමාවක් තුළ: උමං හෝ ද්‍රෝනා මිනිසුන්ට ඇතුල්වී සිටීමට හැකිවන පරිදි සාරා ඇත් නම්: ඒ වාතුළ ද, රන් – මැණික් ආදිය ගරා ගැණීමට කණින ලද මහාවල් තුළ ද: පිරිසුදු ගාමසීමාවක විනය කර්මයක් කරණකල ගාමසීමාව පැතිර පවතියි. එහෙයින් එවැනි භූමි ගුහා ඇති ගාමසීමාවක විනයකර්මයක් කරණකල: යම් උපසපන් භික්ෂුවක් ඍද්ධිබලයෙන් හෝ ඒ ගුහාවකට ඇතුල්ව සිටිය හොත් කර්මය කෝප්‍යය වෙයි[3].

ඉඳින් සත්තබ්භන්තර සීමාවක විනය කර්ම කෙරේ නම්: එකල ඒ භික්ෂූන්ගේ සත්තබ්භන්තර සීමාපරිච්ඡේදය: ඒ භික්ෂුව උන්තැනට බැහැරින් එක් සත් අබතුරක් ඉක්මවා සිටියේ නම්: (මේ සත් අබතුර භික්ෂුවට දෙපසින්ය. එවිට තුදුස් අබතුරක් වෙයි) කර්මය කෝප්‍යය නො වේ[3].

---

1. විවි: 406, 2. අැ: 3 විවි: 417 * උබ:

ඒ භික්ෂුව: ගාමසීමා දෙකක් මැද පොළොවයට සිටියේ නම්: (ගම් දෙකෙහි ම එකවිට සඟකම් කෙරේනම්:) ඒ කම් දෙකම කෝප්‍යය කෙරෙයි. ඉදින් ඒ පෙදෙස් ගමනොවූ අරණ්‍යම වේත් නම්: ඒ දෙකෙහි ම සත්තබ්භන්තර සීමා හැර කුඩා අරණ්‍යසීමාවල සඟකම් කරණ භික්ෂූන්ගේ ද කර්මය කෝප්‍යය කරයි[1].

'ප්‍රධානවශයෙන්: බද්ධසීමා පරිච්ඡේදය පොළොව මතුපිට පටන් යට ජලපොළොවතෙක් බුද්ධාඝෙව පැතිර පවතී' ය යි:[2] අට්ඨකථාවෙහි දක්වන නමුත් තාවකාලිකව අධිෂ්ඨානයෙන් ඇතිකරගත් ගාමසීමාව යටපොළොව හා සම්බන්ධවන බව නො දක්වයි[1]. එහෙත්: **ඇතැම් ඇදුරු කෙනෙක්**: 'ඒ ගාමසීමාදීහුද බද්ධසීමාවමෙන් යටපොළොවෙහිද පැතිරසිටී' ය යි: කියත්. එහෙයින් 'නදී – සමුද්‍ද – ජාතස්සර සීමාවෝ ද, ඒවා ඇසුරු කළ උදකුක්ඛෙප සීමාවෝ ද නදී ආදියෙහි මතුපිට හා යට පෙදෙසෙහි ද ඒ පිරිසුන් ප්‍රමාණයට කෙළින්: ගංගා – මුහුදු ආදියෙහි පතුළතෙක් පවතිත්' ය යි: ද, ඉදින් දිය පහරින් යොදුනක් පමණ සෑරීගොස් පවතින ජලයද නදී සීමාව ම වෙයි. එහෙයින් ගං ඉවුරෙන් බැහැර උමගකින් ගඟපතුළ යට පිහිටි පොළොවෙහි සිටි උපසපන් භික්ෂූහු: නදියෙහි සඟකම් කරණ භික්ෂූන්ගේ කර්මය කෝප්‍යය නොකරත්. ඒ ගඟයට උමගෙහි සිටි භික්ෂුව: ආසන්නව පැවති ගාමසීමාවෙහි සඟකම් කරණ භික්ෂූන්ගේ කර්මය කෝප්‍යය කරත්[1]. ය යි: කියත්.

තවද: යට පොළොවෙහි මිනිසෙකුට ඇතුල්වීමට හැකි තරම්: (දෝනාවැනි) ගුහාවක් වෙයි ද, එපමණවූම පොළොව මතුපිට පෙදෙසෙහි අරඤ්ඤසීමාව පවතීනම්: ගුහාවෙත් යට පොළොවෙහි අරඤ්ඤසීමාව නොවෙයි. පොළොව මතුපිට සහ යට කොටස ද එක ම අරඤ්ඤසීමාවය: යන ව්‍යවහාරයක් නැති බැවිනි[1]. පොළොව් යටට පිවිසියෙකු අරණ්‍යයට පිවිසියේ ය යි: ව්‍යවහාරයක්ද නැත. එබැවින්

1. විවි: 417, 2. සපා: 777,

පොළොව යට සිටි උපසපන් භික්ෂුවක්: මතු පිට ඇති අරණ්‍යයෙහි කරණ විනයකර්ම කොප්‍යය නොකරයි. උමං නදියෙහි සිටි භික්ෂුවක් නදිය මතුපිට විනය කර්ම කරන්න වුන්ගේ කර්ම කොප්‍යය නොකරන්නාක් මෙනි. (යට දක්වූ අදහස මීට නොසමය)

**ඇතැම් ඇදුරු කෙනෙක්**[1]: බද්ධසීමා දෙකක හෝ ගාමසීමා දෙකක අතරක් නොමැතිව භික්ෂූන් පිරී සිට උපසම්පදා කර්මයක් කරණ කල එකසීමාවක භික්ෂුගණයාද, උපසම්පදාපෙක්ෂකයාද, අනුශ්‍රාවකයාද එකට සිට කර්මය කොරේ නම්: කර්මය මනාව කළා වෙයි. ඉදින් කර්මයට සුදුසු සඞ්ඝයා හෝ, අනුශ්‍රාවකයා හෝ සීමන්තරයෙහි සිටී නම් කර්මය කොප්‍යය වෙයි[2]. යනු කියත්.

යම් සීමාවන්හි රුක් ආදීන් හා සම්බන්ධ වීමෙන් දෝස ඇත්තේ නම්: එබඳු විසභාග සීමාවන්හි: රුක් ආදීන් හා සම්බන්ධයක් ඇති කල්හි (ගහක අත්තක හෝ) එක තැනක සිටි භික්ෂුව අන් තැනෙක සිටි භික්ෂූන් ගේ කර්මය කොප්‍යය කරයි[2].

ඛණ්ඩසීමා–මහාසීමා දෙකෙහි පිහිටි තුගරුක්දෙකකින් සීමන්තරිකයෙහි නොවැදී උඩින් අවුත් එකට සම්බන්ධවී සිටි අතු දෙකකින් එකක තුන් නමක් ද, අනිකෙහි දෙනමක් ද, හිඳ අත්පස නොහැර සිටි භික්ෂූන් පස් නමක් උපසම්පදාදි විනය කර්මයක් කිරීම නිවරද ය යි: ඇතැම් ඇදුරු කෙනෙක් කියතත් එය යුතු නොවෙයි[2].

**"නානා සීමාය ඨිත චතුක්කො කම්මං කරෙය්‍ය අකම්මං නච කරණීය'න්ති**[2]= නා නා සීමාවන්හි සිටි භික්ෂූන් සිවු දෙනෙකු විසින් විනය කර්මයක් කරණු ලබන්නේ නම්: එය අකර්මය වෙයි. එහෙයින් නොකළ යුතුය" මෙහිදු: මහාසීමාව සෝධනය කොට මාලක සීමා වෙහිම විනයකර්ම කිරීම නියම කරණලදි. මේ ක්‍රමය හැර අන්‍යක්‍රමයකින් සළකාත් හොත්: ඛණ්ඩසීමා – මහාසීමා

1. විවි: 417, 2. විවි: 406,

දෙක භින්නසීමා බැවින් ඒ ඒ සීමාවන්ට අයිති අතුවල සිටි භික්ෂුහු ගණපූරක නොවෙත්. එහෙයින් කර්මය කොප්‍යය වෙයි[1].

---

## විශේෂ සීමා

**උපචාරසීමා:**[2] වැට – පවුරු ආදියකින් වටකළ විහාර යෙහි: ඒ වටකිරීමෙන් ද, එසේ වටනොකළ විහාරයෙහි: වටකිරීමට සුදුසු ප්‍රමාණයෙන් ද පිරිසිඳින ලද්දී වෙයි. එහෙත්: භික්ෂූන් නිතරරැස් වන තැන සිට හෝ, විහාර කෙළවර ඇති බොජුන්හලේ සිට හෝ, නිතර වාසයකරණ ආවාසයෙහි සිට හෝ ස්ථාම මධ්‍යම පුරුෂයෙක්* ගැසූ ලෙඩ්ඩු පාත* දෙකක් ඇතුළත: 'උපචාරසීමා වය'යි: දතයුතු. ඒ උපචාරසීමාව: ආවාස වැඩිවනවිට වැඩෙයි. අඩුවනවිට අඩුවෙයි. **මහාපච්චරිය** අටුවාවෙහි: භික්ෂූන් අඩු – වැඩිවනවිට ද, අඩු – වැඩි වේයයි කියයි. ඉදින් විහාර යෙහි රැස්වසිටි භික්ෂූන් සමග ඒකාබද්ධවී යොදුන් සියයක් හෝ පුරා හිඳී නම්: එතෙක් යොදුන් සියයක් ම උපචාර සීමාව වෙයි.

**ලාභසීමා:**[1] බුදුරජාණන් වහන්සේ විසින් ද: අනු නොදන්නා ලද්දීය. සංගීතිකාරක තෙරවරුන් විසින් ද: නියම නො කරණ ලද්දීය. එහෙත්: රජ – රජමහ ඇමති ආදීහු විහාරාදිය කරවා ගවුවක් හෝ, අඩයොදුනක් හෝ, යොදුනක් හෝ හාත්පසින් පිරිසිඳ මේ පෙදෙස අපගේ විහාරයේ ලාභසීමාව ය යි: නම් කොටුවූ ගල් කණු ආදි කණු සිටවා 'මේ අතර උපදින සියලු ආදායම අපගේ විහාරයට දෙමු' ය යි: සීමාවක් තබා නම්: මේ ලාභසීමා නමි.

**ජනපදසීමා**[1]: කාසි – කෝසලාදි රටවල් ඇතුළත බොහෝ ජනපදයෝ වෙත්. එක රජකෙනෙකුගේ මැති-ඇමතියන්ට නිවාසභූත ප්‍රදේශයෝ: ජනපද සීමානම්.

---

1. විභ: 406, 2. සපා 842 – කාවි: – 59, * උබ:

**රට්ඨසීමා**[1]: කාසි – කෝසලාදි රටවල පිරිසිඳීම: අඞ්ග – මගධ – කාසි – කෝසල – විදේහ – වජ්ජි – චේතිය – කුරු – පඤ්චාල – මජ්ඣිම[2] – සුරසේන – අස්සක – අවන්ති – ගන්ධාර – මල්ල – කම්බෝජ[3] යන සොළොස් මහාජනපදසීමා රට්ඨසීමා වෝ යි. මේ හැර සුනාපරන්තාදි නොයෙක් රටවල් ද, රාමඤ්ඤආදි තව බොහෝ රටවල් ද ඇත. ඒ සියල්ල ද රට්ඨසීමා නම් වෙයි. යම් පෙදෙසක ක්ෂත්‍රිය – බ්‍රාහ්මණ – වෛශ්‍ය – ශුද්‍ර යන චාතුර්වර්ණයෝ වසත් නම් ඒ පෙදෙස මහාරට යයි කියයි[4].

**රජ්ජසීමා**[1]: චෝළරජය – කේරළරජය කියන්නාක් මෙන් එක – එක රජකෙනෙකුගේ අණපවත්නා පෙදෙස.

**දීපසීමා**: මහමුහුදෙන් වටවූ විසාලවූ හෝ කුඩාදිවයින්. ගංගාවෙන් වටවූ දූපත් ද දීපසීමා නම් වෙත්[5].

**චක්කවාලසීමා**[1]: සක්වළගලින් පිරිසුත් වූ දිග-පළලින් දොළොස් ලක්ෂ තුන්දස් හාරසිය පනස් යොදුන් පමණ වෙයි[5].

මෙසේ පසළොස් ප්‍රභේද ඇත්තා වූ සීමා අතර විශාල වූ බද්ධ සීමාවක සඟකම් කරණු කැමැති සෘද්ධිමත් භික්ෂූන්ට, භික්ෂූන්: අත්පසට ගෙන්වා ගැණිම හෝ, සීමාවෙන් බැහැරකිරීම හෝ, ඡන්දය ගෙන්වාගණු කැමැති භික්ෂූන්ගෙන් ඡන්දය ගෙන්වා ගැණිම හෝ කළහැක. එවැනි සෘද්ධිබලයක් නැති භික්ෂූන් සඳහා, ඉතාවිසාල අරණ්‍යයෙහි සත්තබ්භන්තර සීමා ද, නදී – සමුද්‍ර – ජාතස්සරයන්හි: උදකුක්ඛෙපසීමා ද: ගාම–නිගම–ජනපද–රට්ඨ–රජ්ජසීමාවන්හි වග්ගකම්ම පරිහාරය පිණිස: බද්ධසීමා ද අනුදන්නා ලදහ.

මේ හැර ගාම–සත්තබ්භන්තර–උදකුක්ඛෙපසීමා අනුදන්නා ලද සූත්‍රයන්ට අනුලෝමවන පරිදි: කුඩාගම් – අරණ්‍ය – නදී – ජාතස්සර යන්හි ද පහසුලෙස සඟකම්කර ගැණිමට සුදුසු බව දක්වනලදි.

1. සපා: 842, කම්: 59, 2. සිවි: 3. මත්ස්‍ය-මිළිඳ, 4. සාණී-මිළිඳ, සිවි, 5. සිවි:

මෙසේ සකලසීමාවෝම: පිරිසිඳීමේ ලක්ෂණයෙන් එකාකාර වෙත්. ලොකු – කුඩා වසයෙන් දෙයාකාරවෙත්. සටකීපරිදි: පසළොස් භේදයක් හා, ඛණ්ඩ – උපචාර – ලාභ – සමානසංවාස – අවිප්පවාස – ගාම – නිගම – ජනපද – නගර – අබ්භන්තර – අරඤ්ඤ – උදකුක්ඛෙප – නදී – ජාතස්සර – සමුද්ද – රට්ඨ – රජ්ජ – දීප – චක්කවාළ සීමා ය යි: එකුන්විසි ප්‍රභේද යක් ද ඇත්තාහු වෙත්[1]

**චිරං තිට්ඨතු ලොකස්මිං**
**සම්මාසම්බුද්ධ සාසනං**

---

1. සීවි- ගෙ,

# උපග්‍රන්ථය

# උපග්‍රන්ථය

**අජ්ඣොත්ථරණ**: ප්‍රථමයෙන් සම්මතකළ සීමාව සම්පූර්ණයෙන් හෝ, එහි කොටසක් හෝ ඇතුල් කොට නැවත සීමාවක් සම්මත කිරීම (සපා: 788); මුලින් සම්මත කළ සීමාව යටපත් කිරීම (කපි – 4); භික්ෂූන් සතරනමකට හිඳීමට හැකි ප්‍රමාණයේ පටන් වැඩි කොටසක් අන් සීමාවකට ඇතුල් කිරීම (විවි – 419);

**අඩ්ඪයොග**: 'සුපණ්ණස්ස ගරුළස්ස පක්ඛෙන සදිස ඡදනං: ගෙහං, සුපණ්ණවඞ්ක ඡදනං;එකපස්සෙනෙව ඡදනතො අඩ්ඪයොගො (අටී – 60); ගුරුළු පියාපත් වැනි සෙවෙනි ඇතිගෙය. **එක් පසක්** සෙවෙනි කරණ හෙයින් හෝ අඩ්ඪයෝගනම්; අඩ්ඪෙනයොගො: අඩ්ඪයොගො, ගරුළස්ස පක්ඛෙනසදිස ඡදනගෙහං (අචී – 10)

**අත්පස**: භොජනං ගහෙත්වා දායකො අඩ්ඪතෙය්‍ය හත්ථප්පමාණෙ ඔකාසෙ හොති (සපා – 604 – 607); භොජන පවාරණයට ගන්නා දෙරියන් හමාර; දෙරියන් හමාර (ශ්‍රීසු); තෙ ච ඛො හත්ථපාසං අවිජහිත්වා, – හත්ථ පාසං'ති: දියඩ්ඪහත්ථප්පමාණං (පාග – 4), විනයකාමීයට පැමිණි භික්ෂූහු එක්රියන් හමාරක් පමණ අත්පසෙහි සිටිය

යුතු; ද්වාදස හත්ථබ්භන්තරෙඨිතං: 'ඉම'න්ති, තතොපරං: 'එත'න්ති අධිට්ඨාතබ්බං. කෙචි: ගණ්ඨිපදෙ අඩ්ඪතෙය්‍ය හත්ථො'ති වුච්චති. (පාටී – 22); චීවරාධිට්ඨානයට දෙළොස්රියනක් තුළ 'ඉමං' යි ද, එයට ඇත්වූයේ 'එතං' යි ද කියයුතු. ගැටපදයෙහි රියන් එකාහමාරයයිද: කියයි;

**අත්පසටගැණීම**: පරිස සම්පත්තියට: 'තෙචඛො හත්ථපාසං අවිජහිත්වා එකසීමායං ඨිතා' (කවි – 4); සඟකම්කරණ විට සීමාවතුළ භික්ෂූහු අත්පසනොහැර සිටියයුතු; යාවතිකා තස්මිං ගාමක්ඛෙත්තෙ –පෙ– හත්ථපාසෙ කත්වා (කවි – 6); ගාමසීමාවෙහි දු සඟකම් කරණ විට: ගමේ භික්ෂූහු අත්පසට ගෙන්වාගතයුතු, ඡන්දය හෝ ගතයුතු;

**අන්තොමු පිරිවැජී**: 'අඤ්ඤතිත්ථියා' (සපා – 772); බුදුසම යෙන් බැහැර අන්‍යලබ්ධික පැවිද්දෝ;

**අබ්භන්තර**: 'යත්ථ යත්ථ හි යො යො ඨිතො නිසින්නොවා තත්ථ තත්ථ සමන්තා අට්ඨවීසති හත්ථප්පමාණං ඨානං' (අටී – 167), රියන් 28 (අදී – 197); (අචී: 22);

**අබ්භන්තරසතක්**: රියන් 196 කි (විකො – 156);

**අබද්ධසීමවිහාර:** 'යෙ අබද්ධසීම විහාරා තෙසු භික්ඛූ එකජ්ඣං සන්නිපාතෙතබ්බා (සපා – 777); බද්ධසීමාවක් ලෙස සම්මත නො කළ විහාරය.

**අරඤ්ඤ**: ගාම – ගාමූපචාර හැර සෙස්ස (පාරා – 104); නිගම – නගර ද 'ගාම' සදින් ගැණේ (සපා – 451); ගම – ගාමූපචාර (බ:)

**අංකාසපබ්භාර**: 'භිත්තියා අපරික්ඛිත්තපබ්භාරං' (විවි–440); බිත්තියෙන් වට නොකළ නයිපෙණයක් මෙන් ඉදිරියට නෙරාගිය ගල්තලාව;

**ඉතා ඛුද්දා සීමාව:** කර්මාර්හයාසමග භික්ෂූන් එක්විසිනම කට පරිමණ්ඩලාකාරයෙන් හිඳගත නොහැකි සීමාව (කපි – 4); (විම – 10); (කවි – 4);

**උදකුක්ඛෙප:** උදකුක්ඛෙපය නම්: මධ්‍යම පුරුෂයාගේ රියනින් සතරරියන් ප්‍රමාණයයි: කියත් (සීල – 9);

**උදකුක්ඛෙපසීමා:** ‘සීමාපෙක්ඛවසෙනෙව සත්තබ්භන්තර – උදකුක්ඛෙපසීමානං උප්පත්ති: තබ්බිගමනෙන විනා සො ච ගහෙතබ්බො’ (සීවි – ගු); සීමාපෙක්ෂාවෙන් සත්තබ්භන්තර උදකුක්ඛෙපසීමාවන්ගේ උප්පත්තියද, එය නැති වීමෙන් විනාසයද වෙයි; ලක්ෂණ ප්‍රාප්ත ජාතස්සරාදියෙහි සඞ්ඝයාගේ ගැවසීම හේතුකොට උදකුක්ඛෙපයට නොපොහොනේ නමුදු සඞ්ඝයා සිටිතැන් පටන් වියත් රියන් පමණ ජාතස්සරාදීන්ගේ අබතුර උදකුක්ඛෙප සීමායි. (සීල –11);

**උපචාර:** ‘අබද්ධසීමවිහාරානං සීමාය උපචාරං ඨපෙත්වා’ (සපා – 777); අබද්ධසීම විහාරයන්ගේ සීමාවට උපචාරය තබා; ‘උපචාරත්ථායා’ති: සීමන්තරිකත්ථාය’ (විවි – 414); බද්ධසීමවිහාරයන්ට සීමන්තරිකය පිණිස (අනන්තරය තබයි);

**උපෝසථාගාර:** මහාසීමාවක හෝ, සීමවිහාරයක පොහොය කිරීම පිණිස සම්මත කරගන්නා ගෙය (මළු – 260);

**උපෝසථපමුඛ:** උපෝසථාගාරයේ සඞ්ඝයාට රැස්වීමට ඉඩ – පහසු නොමැති නම්: එය ඉදිරියෙන් කැමති ප්‍රමාණයට නිමිති පිහිටුවා සම්මතකරගන්නා කොටස. ආලින්දය (මළු – 262);

**එසමයෙහි:** භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට සිකපද පනවන කාලයෙහි (සපා – 63);

**ඒකසීම මහාවිහාර:** ‘ඒකසීම මහාවිහාරෙ තස්මිං තස්මිං පරිවෙණෙ (සපා – 782); එකමසීමාවකට අයත් මහා විහාරය; විහාරසීමා (බ:)

**ඒකුපොසථ:** ඒකුද්දෙසයම ඒකුපෝසථ ය යි. (සපා – 438);

**කිර්තන:** බඩසීමාවක නිමිති කීර්තනය කරණවිට ඒ ඒ දිසාවල නිමිති වෙත සිටි අනුපසම්පන්නකෙනෙකු ගෙන් 'පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං'යි. පෙරදිග නිමිත්ත කුමක්ද?යි: විචාල ප්‍රශ්නයට 'පාසාණෝ භන්තෙ' වහන්ස! පාසාණ යයි: පිළිතුරු දුන්විට, නිමිති කීර්තනය කරණ භික්ෂුව 'ඒසෝ පාසාණෝ නිමිත්තං' යි: මේ පාසාණය නිමිත්ත යයි. ශබ්දනගා සඞ්ඝයාට ඇසෙනසේ කීම;

**කුටිපමුඛ:** කුඩා ගෙයෙහි ඉදිරිපස.

**කුඩාසීමං:** භික්ෂූන් විසිඑකනමකට වටාහිඳගැණීමට තරම් දිග – පලල ඇතිසීමාව (සීල – 10); (කවි – 4);

**කොප්‍යයවීම:** ප්‍රතික්ෂෙපවීම (සපා – 172): කර්මයට සුදුසු නොවීම; විනයකර්මය සුදුසුලෙස සිදු නොවීම (ශ්‍රීසු);

**ඛණ්ඩසීමං:** තුන්යොදුන් මහා සීමාවට වඩා කුඩා සීමාව.

**ගම:** මිනිසුන්ගේ පදිංචිය ඇති කුටි (පැල්) දෙක – තුණක් හෝ ඇති පෙදෙස. මිනිසුන් පදිංචිව සිට පෙරළා පැමිණීමට ගියාවූ හෝ, ගැල්කරුවන් සිවුමසකට වැඩි කලක් නැවතී සිටින පෙදෙස. (පාරා–104);ලෝවැස්සන් විසින් ගම යයි: ව්‍යවහාරකරණ පෙදෙස (සීද – 78);

**ගාමූපචාර:** වැටකින්හෝ, පවුරකින් වටකළ ගමෙහි ගම්දොර එළිපත හෝ, අගුළුකණුව වෙත සිට මැදුම් පමණ බලය ඇති පුරුෂයෙක් ගලක්ගසනදුර; වට නොකළගමෙහි ගෘහෝපචාරයෙහි සිට එවැනි පුරුෂ යෙකුගේ ගල්පහරක දුර; ගැසූගල වැටුනුතැන සිට පෙරළි ගියදුර නොගණී (පාරා – 104);

**ගුහා:** ගඩොල් – ගල් – පස් ආදියෙන් භික්ෂූන්ගේ විසීමට සුදුසුලෙස තැනූ ගුහා (සපා – 898);

**ගෘහ:** වහල්පලය ඇතිගෙයක පලයෙන් වැසිදියවැටෙන ප්‍රමාණයත් ගෙට අයිතිය (සපා – 275);

103

**ගෘහෝපචාර:** ගෙයක පිටදොරකඩසිටි මාගමෙක් බඳුන් දෙවුදිය හෝ, කුල්ලක් – ඉදලක් හෝ විසිකළවිට වැටෙනතරම් ප්‍රමාණය හෝ, ගෙයවටා වැට – පවුරු පිහිටි ප්‍රමාණය (සපා – 215);

**ඡන්දයදීම**: සඞ්ඝයාගේ පොහෝ කිරීම් – සීමාබන්ධන ආදී සඟකම් වලට නො පැමිණිය හැකි භික්ෂූන් විසින් 'ඡන්දං මෙ දම්මි – ඡන්දං මෙ හර – ඡන්දං මෙ ආරොචෙහි' යන එකවැකියකින් හෝ, ඡන්දය දියහැක. (කවි – 10); ඡන්දා දම්මි' යන්නෙන්: තමන් සමග බව කීනියාය; 'ඡන්දං මෙ හර' යන්නෙන්: අනිකෙකුට දීම් ආදීන් නොගැණගියහොත් නැවත දියයුතු බව කීනියාය; 'ඡන්දං මෙ ආරෝචෙහි' යන්නෙන්: නොකීමෙන් අවදනා ඇවතින් ද මිදෙනු; කී නියාය. (කපි – 8);

**ජලපොලොවතෙක් සීමාව**: 'කමම වාචා පරියොසානෙ නිමිත්තානි බහි කත්වා හෙට්ඨා පඨවිසන්ධාරක උදක පරියන්තං කත්වා සීමාගතා හොති' (සපා – 777), (විවි – 416); කම්වදන් උදෙසා අවසන්හි නිමිති බැහැර කොට ජලපොලොවතෙක් බුදුඅණින් සීමාව පිහිටයි.

**ජාතස්සර:** 'යෙන කෙනචි ඛණිත්වා අකතො සයඤ්ජාත සොබ්භො' (සපා – 785); කිසිවෙකුවිසින් නොකැණූ ඉබේහටගත් හෙබ (ජලයපිහිටි ස්ථානය)

**තිචීවරාවිප්පවාසසීමා**: මේ සීමාව තුළදී තේචීවරික භික්ෂුවගේ සිවුරු: දවස පිළිබඳ අරුණ නැගීමේදී අත්පසින් ඉවත්ව තිබීමෙන් නිසගි නො වෙයි. මහ කසුප්තෙරුන්ගේ තෙමුනු සිවුරු වියලාගැණීමේදී: අත්පසින් ඉවත්ව අරුණගතවීමෙන් ඇතිවන ඇවතින් මිදීම පිණිස අවිප්පවාසසීමාව අනුදන්නා ලදී. බද්ධ සීමාවල හැර ගාමසීමා – උදකුක්ඛෙප සීමාවල තිචීවරාවිප්පවාසබලය නැත. සත්තබ්භන්තර – අරඤ්ඤ සීමාවල ඇත.

**තුන්යොදුන් මහාසීමා**: 'රාජගහං හි පරික්ඛිපිත්වා අට්ඨාරස මහා විහාරා සබ්බෙ එකසීමා ධම්මසෙනාපතිනා නෙසං සීමා බද්ධා' (සපා – 783); රජගහනුවර පිහිටි අටළොස් විහාර තුන්යොදුන් පමණ පෙදෙසක පිහිටි බැවින් ඒ අනුව මහාසීමා ප්‍රමාණය ගෙණ ඇත.

**නගර**: ධන ධාන්‍යාදි උපභෝග පරිභෝග වස්තූන්ගෙන් යුත් ජනයන්ගෙන් පිරි ගෙවල් ඇති පෙදෙස (අදී–191);

**නදී**: නදී නිමිත්ත – නදීසීමා (බ) සුක්ඛනදී: වියලුනුනදිය. 'දෙවෙ අවස්සන්තෙ හෙමන්ත ගිම්හෙසු වා සුක්ඛනදියා'පි වට්ටති (සපා – 787); නදියෙහි දියසිඳී වියලීගියකල ද සඟකම් කළහැක. නමුත්: උදකං න හොති සුක්ඛති: අයං න ජාතස්සරො' (සපා – 787); ජාතස්සරය වියලුනු කල සඟකම්කිරීම නොවටියි එහෙත්: නදියෙහි ඉතා අඩුජලයගැණ සඳහන්කළේ: භික්ෂුණියගේ අන්තර වාසකය තෙමීමේ ප්‍රමාණයෙනි. එහෙයින් එපමණවත් ජලයඇති නදිය ගැණීම සුදුසුය.

**නවක භික්ෂු**: 'ඌනපඤ්චවස්සතාය: නවො' (සපා – 169;) උපසපන්වී පස්වසට අඩු වූ බැවින් නවකය.

**නානාසංවාසක**: එක සීමාවෙක්හි සිටියෝම සමාන සංවාසක වෙත්. වෙන් වූ සීමාවල සිටි බැවින් එක ප්‍රදේශයෙක්හි උභයසීමාවෙහි සිටි භික්ෂූහු සමාන සංවාසක නොවෙත්. (සීල – 18); 'යො සඞ්ඝෙන උක්ඛෙපනීය කම්මකතානං අධම්මවාදීනං පක්ඛෙ නිසින්නො තෙසඤ්ච ඉතරෙ සඤ්ච ලද්ධිං සුත්වා ඉමෙ අධම්මවාදිනො, ඉතරෙ ධම්මවාදිනොති: චිත්තං උප්පාදෙති. අයං තෙසං මජ්ඣෙනිසින්නො'ව එතෙසං නානාසංවාසකො හොති. (සපා – 853); යම් භික්ෂුවක් උක්ඛෙපනීය කර්මයකළ අධර්මවාදීන්ගේ පක්ෂයෙහි සිටියේ දෙපසෙහි ලබ්ධිය අසා 'මේ අධර්මවාදීහුය. අන්‍යයෝ ධර්මවාදීහුය' යි: සිතඋපදවාද: මෙතෙම ඒ ධර්මවාදීන් මැද හුන්නේම ඔවුන්ට නානාසංවාසක වෙයි;

**නිමිත්තූපග පාසාණ**: 'වත්තිංසපලගුළපිණ්ඩප්පමාණන්ති: ථූලතො ගහෙතබ්බං න තුලගණනාය (සාදි-ථාම්) බඩ සීමාවේ නිමිති කීර්තනයට ගන්නා පාසාණ (ගල්) පලම් 32 ක් පමණ උසමහත ඇති හකුරු ගුළියක් තරම් මතු කොට තැබිය යුතු. එය බරින් නොව උස මහතින්ය. එවිට සීමා බිමින් අඟල් 12 ක් වත් මතුවී සිටීම වටී. මේ ඉතා අඩු ප්‍රමාණයයි. මෙයට අඩු ගණන සුදුසු නොවේ.

**පලම්**: 'එකපලං නාම දසකලඤ්ජන්ති වදන්ති' (විම - 18); එකපලමක් කලන් දසයකැයි: කියත්; කළන් 12 පලමකි (ශ්‍රීසු); මාරාඇට 16 කර්ෂ 1 යි, කර්ෂ 4 පලම් 1 යි, (ශතො)

**පාතිමොක්ඛ**: සික්පදරකින භික්ෂුව: අපාදුකින් සහ අත්තානුවාදාදි බියෙන් මුදවානුයි: පාතිමොක්ඛනම්. භික්ඛු - භික්ඛුණී පාතිමොක්ඛ ගන්ථ. (කවි - 1);

**පාමොක් උදෙසීම**: ප්‍රාතිමොක්ෂය - අතිශ්‍රෙෂ්ඨ උත්තමශීලය (කවි - 1), ප්‍රාතිමොක්ෂ ග්‍රන්ථය උපසපන් භික්ෂුහු පොහෝදිනවල සීමාවට රැස්ව කීම.

**පාසාද**: 'පාසාදෙති: දීඝ පාසාදෙ' (සපා 472); දිග පහය.

**පාසාද පමුඛ**: පහයෙහි ආලින්දයක් මෙන් ඉදිරියටගත් කොටස (විවි - 400);

**පාසාණනිමිත්ත**: 'පාසාණනිමිත්තානි ඨපෙත්වා සීමාසම්මන්නිතබ්බා' (සපා - 778); (විවි - 399); බොහෝතැන්වල පාසාණ නිමිත්තම දක්වයි. කැණුවල්වල දියපුරවා ගන්නා උදකනිමිත්ත එසේ ගෙණඇති බවක් නො පෙනෙයි.

**පැමිණිකල්**: (ප්‍රාප්තකාල) පොහොයකිරීමට සුදුසුකාලය. උපෝසථදිනය වීම - විනය කර්මයට සුදුසු භික්ෂූන්ගේ පැමිණීම - සභාගාපත්තිවලට පැමිණි භික්ෂූන්ගේ අභාවය - බැහැරකළයුතු පුද්ගලයන් නැතිබව (කවි - 4);

**පිරිවෙණ:** 'පරිච්ඡෙදවසෙන වෙදියති දිස්සතී'ති: පරිවෙණං (සාදී-48); (වැට – පවුරුආදියෙන්) පිරිසිදීම් වසයෙන්, වෙන්කළ භික්ෂූන්වසන ආවාසය; 'පරිවෙණනති: තස්ස තස්සවිහාරස්ස අබ්භන්තරෙ විසුං විසුං පාකාරාදි පරිච්ඡින්නට්ඨානං' (විවි – 154); පිරිවෙණනම්: ඒ ඒ විහාරතුළ වැට – පවුරු ආදියෙන් වෙන්කළ තැන්; 'පරිවෙණනති: මහාවිහාරස්ස අබ්භන්තරෙ විසුං විසුං පාකාර පරිච්ඡින්නට්ඨානං'. (සාදී-ඵාම්);

**පෙරකිස:** හැමදීම – පහන්දැල්වීම – පැන්එළවා තැබීම – අසුන්පැනවීම යන පුබ්බකරණ ද, ඡන්ද – පාරිසුද්ධි – උතුක්ඛාන – භික්ඛුගණනය – භික්ඛුනොවාද යන පසද: නවවිධ පුබ්බකිච්ච (කවි – 10);

**බද්ධසීමා:** කම්වදන් කියවා බඳසීමායි. නිමිත්තෙන් නිමිත්තගලපා බඳනාලද සීමායි (කපි – 4);

**බද්ධසීම විහාර:** 'බද්ධසීමා යෙසුවිහාරෙසු: තෙ බද්ධසීම විහාරා' (විවි – 398); මූළුවිහාරයම ඇතුළත්කොට බඳිනලද සීමාව ඇති විහාරය, තුන්බෝධි-ආවාස – බොජුන්හල් හා ඛණ්ඩසීමා – උපෝසථාගාර ද මෙහි ඇත. බඳනා ලද සීමාවඇති විහාර (සස);

**භන්තෙ:** 'භන්තෙ' ති: සගාරව සප්පතිස්ස වචනං' (කවි-2) 'භන්තෙ' යනු: ගරු – බුහුමන් පෙරදූරිව කියන වචනයකි. 'ස්වාමීනි –' (බ);

**මජ්ඣිමදේස:** දඹදිව මධ්‍යදේශයට අයත් රටක්;

**මණ්ඩපකප්‍රමාණ:** 'මණ්ඩපා'ති: පකති විදත්ථියා නව විදත්ථිප්පමාණො' (සීවි – ග); පියවි වියතෙන් නව වියතක් මණ්ඩපක ප්‍රමාණයයි; සාමාන්‍යයෙන් දිග – පළලින් රියන් 4½ — 2½ ගණී;

**මද්දකුච්ඡි:** අජාසත් කුමරු කුස පිළිසිඳගත් කල: මේ 'කුමරු ඉපදී විය පැමිණ රජු මරන්නේය'යි: නිමිතිදත්

බමුණන්ගේ වචනය ඇසූ බිම්සර රජමෙහෙසිය කුමරු බිහිවන්ට මත්තෙන් බඬම්රිකා කුමරු නසන්ට තැත්කළ උයන (විගැ – 219);

**මධ්‍යමභික්ෂු:** උපසපන්වී පස්වසට වැඩි, උණු දසවස් ඇති භික්ෂුව (සපා – 169);

**මධ්‍යමපුරුෂ:** 'මජ්ඣිම පුරිසා'ති: ථාම මජ්ඣිමස්ස, නෙව අථාමස්ස, න මහාථාමස්ස, මජ්ඣිමථාමස්සාති වුත්තං හොති' (සපා – 215); මැදුම් බලැති පුරුෂයා;

**මහළුඟරන්මෙන්:** 'සෙය්‍යථාපි මූගසූකරා' (මළු – 250); 'මූගසූකරා'ති: ථූලසරීර සූකරා' (සපා – 772); මෙහි 'මහළුඟරන්' යන්නෙන් නිගරු බවක් ද හැඟෙයි. වස් එළැඹි භික්ෂූන්ගේ කථා නොකිරීම ගැණ පවාරණක් ඛන්ධකයෙහි: (මප – 398) 'පසුසංවාස – සපත්තසංවාස යනුයෙන් දෙසා ඇතිබැවින් 'මූගසූකරා' යන්නෙන් 'ගොළුබීරන්' යයි: අරුතක් ගතහැකි නම්: ප්‍රසතාවොචිත වියහැක (වි–යු);

**මහා සීමා:** තුන් යොදුන් මහා සීමාව. මුලින්ම බුඩ කාලයෙහි රජගහනුවර සම්මතකළ සමාන සංවාස අවිප්පවාස මහා බඩසීමාව (මළු – 258)

**මුළුපොළොව:** 'කිත්තාවතා නු ඛො සාමග්ගීහොති: යාවතා ඒකාවාසො උදඟු සබ්බා පුථුවීති' (මළු – 256); සමගිය කොතෙක් ද? එක් ආවාසයක් තෙක්ද? නොහොත් මුළු පොළොවද? (මෙහි අදහස නොපැහැදිලිය);

'කිත්තාවතානුඛො සාමග්ගී' ති: එත්ථාය මධිප්පායො: සාමග්ගි නා මෙසා සභාගානං සන්නිපාතො. සභාගාච නාම: යත්තකා සහධම්මිකා තෙ සබ්බ' පි හොන්ති. උදඟු අවාස සභාගතාය සභාගානාම හොන්තී'ති: තත්‍ථ යදි සහධම්මිකානං සාමග්ගි සාමග්ගිනාම: 'සබ්බසං පුථුවිගතානං සාමග්ගි' ඉච්ඡිතබ්බා. අථාවසථ වසෙන

ඒකාවාස සභාගානන්ති, වුත්තං හොති. අඤ්ඤථා ඒකාවාසො සාමග්ගී' ති ආපජ්ජති. (වබු – 2කා); මෙහි 'සබ්බෙසං පුථු විහත්තානං' යන්න හා 'සබ්බාපුථුවී' යන පෙළේ වචනවල ගැටීමක් ඇද්ද? (වි-යු)

**යොදුන**: ගවුසතරකි. ගවුවක්: ඉස්බ 80 වකි; ඉස්බක් 28 රියනකි. (අදී – 196 ගා); ඉංග්‍රිසි සැතපුම් 8 ක් පමණ දුර (ශ්‍රීසු); සැතපුම් සතරකට සුළු ප්‍රමාණයක ඒහා මෙහාවක් ඇත (බවි – 95);

**ලෙඩ්ඩුපාත**: 'යථා ච උදකුක්ඛෙපෙ උදකං ඛිපන්ති: එවං අක්ඛිපිත්වා යථා තරුණ මනුස්සා අත්තනො බලං දස්සෙන්තා බාහං පසාරෙත්වා ලෙඩ්ඩුං ඛිපන්ති. (සපා – 215); උදකුක්ඛෙපයෙහිදී මෙන් ගල නොදමා, තරුණයෙකු තමාගේ ශක්තිය දැක්වීමට අතදිගහැර ගසන ගලක් වැටෙන තරම් ප්‍රමාණය. බිම්වැටී ගල පෙරළීගිය පමණ නොගණීසි;

**ව්‍යක්ත – ප්‍රතිබල**: පාළ්‍යර්ථ දැනීම: ව්‍යක්තය, සිථිල-ධනිතාදිය කීමෙහි හැකිබව: ප්‍රතිබලය. (කපි – 3);

**ව්‍යඤ්ජන සම්පත්ති**: 'සිථිල – ධනිත – දීඝ-රස්ස - ගරුක – ලහුක – නිග්ගහීත – සම්බන්ධ – වවත්ථිත – විමුත්ත' යයි: දසවිධය. (විම – 49);

**වනය**: අරඤ්ඤසීමා (බ); වන නිමිත්ත (බ);

**විතාන සණ්ඨාන**: 'අභිවජ්ජන්තකසණ්ඨාන' (විවි – 401); නය්හතු සටහන; 'විතානසණ්ඨානා උපරි ඔකාසො අත්ථි හෙට්ඨානත්ථි' (සපා – 779); මතුභාගය පළල යටභාගය සිහින් ආකාරය;

**විහාර**: 'විහාරොනාම අඩ්ඪයොගාදිමුත්තකො අවසෙසාවාසො.' (සපා – 898); විහාර නම් අඩ්ඪගොගාදිය හැර සෙසු ආවාස; 'විහරන්ති එත්ථාති: විහාරො – ආවාසො – භික්ඛූ නමාවාසො' (අදී); භික්ෂූන් වාසයකරණගෙය;

බොහෝතැන්වල 'විහාර' සද: 'සීමා' වෙනුවට යොදා ඇතිබව පෙනෙයි. 'කෙචිපනද්දිසෙසු විහාරෙසු........, විහාර කොටිතොපට්ඨාය ....., විහාර පරික්ඛෙපස්ස .... සීමඤ්චසමූහනනවසෙන සමුග්ඝාතෙ කතෙ. (විවි - 409); සචෙ වනමජ්ඣෙ විහාරං කරොන්ති: වනං න කිත්තෙතබ්බං, විහාරං පරික්ඛිපිත්වා ඨිතංවනං එකත්ථ කිත්තෙත්වා අඤ්ඤත්ථ න කිත්තෙතබ්බං.' (සපා - 774); විහාර සීමා - සීමවිහාර (බ)

**විහාරසීමා**: 'විහාර සීමන්ති: බද්ධසීමං සන්ධාය වදති' (සාදී - **ෂාමි**); සංඝාවාස - ප්‍රතිමාගෘහ - බොජුන් හල් ආදි විහාරාඞ්ගයන් ගෙන් සපිරුණු විහාරය: නිමිති කීර්තනය කොට සම්පූර්ණ බද්ධසීමාවක් ලෙස සම්මත කරගණී. සමහර විට විසාල භූමිභාගයක් සීමාවක් ලෙස නිමිති කීර්තනය කොට සම්මතකරගත් පසු විහාරාඞ්ගයන් ගෙන් සම්පූර්ණ කරගණියි.

**සථවිරභික්ෂු**: පිරිපුන් දසවස් ඇති භික්ෂුව. (සපා - 169);

**සඞ්ඝ**: 'ආයශී - අනායශී තොරතුරක් නැති පුද්ගලසමූහය, (කපි - 3);

**සත්තබ්භන්තර**: රියන් 196 කි. (විකො - 156);

**සම්භින්දන**: සීමාවක් සම්මත කරණවිට: එකට එක අතුපැටලී ආසන්නව වැඩී තුබූ අඹගහක් හා ජම්බුගසක් යන ගස් දෙකින්: ප්‍රථමයෙන්සම්මතකරණ සීමාවට අඹගස ඇතුලත් කොට ජම්බුගස නිමිත්තවසයෙන් ගණී. පසුව සම්මතකරණ සීමාවකට ජම්බුගස ඇතුල්කොට අඹගස නිමිත්තවසයෙන් ගණී. මෙලෙසින් නිමිති ගැණීමෙන් සීමාවෙන් සීමාව බිඳුනේ වෙයි. (සපා - 788); තමා සම්මතකරණ සීමාවෙන් අනුන්ගේ සීමාව බිඳීම: හෙවත් මිශ්‍රකිරීම (කපි - 4); භික්ෂූන් සතර නමක් හිඳීමට නොහැකි තරම් සුළුප්‍රමාණයේ පටන් කෙස්ගහක් පමණ ප්‍රමාණයක්වත් අන්සීමාවකට ඇතුල් කිරීම (විවි - 419);

**සමානසංවාසක**: 'එකං කම්මං එකුද්දෙසො සමසික්ඛතා'ති: අයං තාව සංවාසො. සමානො සංවාසො එතෙසන්ති: සමාන සංවාසා' (සපා – 673); යම් ඒකකර්ම – ඒකුද්දෙස – සමසික්ඛතාවක් ඇත්තේ ද. මේ සංවාසයයි. සමානවූ සංවාසය මොවුන්ට ඇත්තේනුයි: සමාන සංවාස නම්. 'යෙනසද්ධිං උපොසථාදිකො සංවාසො අත්ථි: අයං සමාන සංවාසකො. ඉතරො: නානා සංවාසකො' (සපා – 974); යමෙකුසමග උපොසථාදි සංවාසය ඇත්තේ ද: මෙතෙම සමාන සංවාසකය. අන්‍යතෙම නානා සංවාසකය. (නානා සංවාසක (බ)

**සමූහනන**: 'සමූහනිත්වා' ති: විනාසෙත්වා–උද්ධරිත්වා'ති අත්ථො. (විවි – 408); කලින්තුබූ සම්මතය නැතිකර දූමීම – උගුළුවාදූමීම යන අර්ථයි;

**සවගමහණභු**: 'ඡබ්බග්ගියා භික්ඛූ: අස්සජි – පුනබ්බසුක – පණ්ඩුක – ලෝහිතක – මෙත්තිය – භුම්මජක. (පාරා– 466); (සපා – 442 – 443); රජගහනුවර කීටාගිරියෙහි විසූ සැරියුත් මහතෙරුන්ගේ අතවැසි නොදූමුනු භික්ෂූ හු සදෙන;

**සීමන්තරික**: සීමා දෙකක් අතර සුඩ භූමිය. සීමාසමූහනය කළ බිමක බද්ධසීමාවක් සම්මත කිරීමේදී ද, මහා සීමාවේ ද වැඩිවසයෙන් ලැබෙයි.

**සීමන්තරිකපාසාණ**: 'සීමන්තරිකපාසාණා'ති: සීමන්තරිකාය ඨපිතපාසාණා. (විවි – 399); සම්භින්දන – අජ්ඣොත්ථරණ දෝසයන් වලක්වනු පිණිස නිමිතිවලට රියනක් හෝ රියන් කීපයක් අතර ඇති කොට තබනු ලබන පාසාණ;

**සීමා මාලක**: 'මාලකන්ති: අඞ්ගනං' (සපා – 780); 'සීමාමාලකෙ වට රුක්ඛො හොති' (සපා – 780); 'මාලකෙ' ති: ඛණ්ඩසීමඞ්ගනෙ' (විවි – 402); සීමාමාලක නම්: සීමා භූමියයි;

**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො**: 'සචෙ සඞ්ඝත්ථෙරො හොති: ආවුසො'ති වත්තබ්බං, සචෙ නවකතරො හොති: පාළියං ආගතනයෙ නෙ'ව භන්තෙ'ති වත්තබ්බං. (කවි – 2); ඉදින් පාමොක් උදෙසන්නේ රැස්වූ සඞ්ඝයා අතර වැඩිමහල් සඟතෙර නම්: 'ආවුසෝ' යි: කියයුතු. ඉතා බාලමවූයේ නම්: පෙළෙහි ආ පරිදි 'භන්තෙ' යි: කියයුතු. මෙහි: එක භික්ෂුවකට හෝ දෙතුන් නමකට බාල වූ භික්ෂුවක්: තමාට වඩා බාලවූ වැඩි පිරිසක් අතර පාමොක් උදෙසීමේදී කියයුතු පිළිවෙළ නොදක්වයි.

'සඞ්ඝං උපාදාය සඞ්ඝත්ථෙරෙනා'පි: සුණාතුමෙ භන්තෙ සඞ්ඝො'ති: වත්තබ්බං. භික්ඛුං උපාදාය 'ආවුසො'ති. (චබු); සඞ්ඝයා පිළිබඳව සඟතෙරුන් විසින් ද 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො'යි: කියයුතු. භික්ෂුවක් පිළිබඳව 'ආවුසො'යි: කියයුතු. භාග්‍යවතුන් වහන්සේ විසින් ද සුණාතු මෙ භන්තෙ සඞ්ඝො' යි: දෙසා ඇති බැවින් හා, පෙළෙහි ද එසේම ආබැවින් ද, මහකසුප් තෙර ආදි සඟතෙරුන්පවා එසේම උදෙසා ඇති බැවින්ද සඞ්ඝයාට ගරු කිරීම් වසයෙන් 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො'යි: බාල – මහළු හැමභික්ෂුවක් විසින් ම කියයුතු. (චබු-2 කා – 125);

**සුත්තන**: 'සුත්තං නාම – උභතො විභඞ්ගා' (සපා – 1008) සුත්තනම්: උභතො විභඞ්ගයයි.

**සුත්තානුලොම**: 'අනුලෝමිකං නාම චත්තාරො මහාපදෙසා (සපා – 1008) සුත්තානුලෝම නම්: සතර මහා ප්‍රදේශයෝයි.

**සංකර**: සීමාදෙකක් එකවෘක්ෂයක් හෝ, සාඛා ආදියක් සපශීකොට මිශ්‍රවීම. සමෙභද – සම්භින්න යනුද එම අර්ථයි. (සීල – 16);

**හම්මිය**: 'හම්මියන්ති: මුණ්ඩච්ඡදන පාසාදෙ' (සපා – 472); මුදුන් නො කළ මුඩුසෙවෙනි ඇතිගෙය; 'හම්මියන්ති: උපරි ආකාසතලෙ පතිට්ඨිත කූටාගාරො පාසාදෙ' (සපා – 898); ඉහළ අහසෙහි පිහිටි කුළුගේ ඇති පහය; 'රාජතො අඤ්ඤෙසං ධනීනං වොහාරකාදීනඤ්ච භවනෙ' (අටී – 208); රජුන් හැර ධනවත් වෙළඳ ආදීන්ගේ ගෙවල්;

# සීමාභූමි සටහන්

නිමිති සම්මත කිරීමේදී ගන්නා බිම් සටහණ[1] අනුව නිමිති තුණකින් සම්මත කරණවිට මංසන්ධියක සටහණ ගෙණ ත්‍රිකෝණාකාරවද[2] නිමිති සතරකින් සම්මත කරණ කාල සිවුරැස් ආකාරවද භූමිය සිටීයි. මෙසේ: ත්‍රිකෝණ – සිවුරැස් – අඩසඳ – පණාබෙර – මිහිගුබෙර – විතාන – නැගුදුනු – සකටාකාරාදි බිම් සටහන් අනුව සීමා සම්මතය කරයි.

යට දක්වනලද බිම් සටහන්වලට වෙනස්වූ ද නොයෙක් සටහන් ගෙණ[2] නිමිති කීර්තනයට සුදුසු වනසේ බිම් සකස් කරගෙණ සීමාබන්ධනය කළහැක. බිම් සටහණ කොබඳු වුවත් ඉඩකඩ ඇති අයුරු ඒ සීමා භූමියෙහි කැමති පරිදි සීමා මන්දිරය තනාගත හැක.

---

1 සපා: 776, විනි: 565, විවි: 398.

2. සපා: 777, සාදී: ෂො,







සීමාංකුම් සටහන් – 1




සීමාභූමි සටහන් - 2


පණුව


මුදිඞග


සීකට


විතාන


දිග සිවු රැස්


මුදිඟ

# සීමා මණ්ඩල

පැරණි බද්ධසීමාවක් සමූහනනය කිරීමේදී හෙවත් උගුළුවාලීමේදී මෙහි ඇති මණ්ඩලසටහන් 1 - 2 අනුව මණ්ඩල බෙදාගණියි.

1- මණ්ඩල සටහණෙහි: මණ්ඩපක ප්‍රමාණයට විසමව සිටිනසේ පස්නමක් හෝ සනමක් සිටීමට ප්‍රමාණය ඇතිව මණ්ඩල බෙදාගැණීමේ ආකාරයද,

2- මණ්ඩල සටහණෙහි: සීමා භූමියේ මුළුතැනකට විනයකර්මයට පැමිණ සිටි සඞ්ඝයා රැස්කරවා ඒ ප්‍රමාණයෙන් මණ්ඩල බෙදාගැණීමේ ආකාරය ද දක්වයි.



සීමං මණ්ඩල – 1

120




සීමං මණ්ඩල – 2

# අනුක්‍රමණිකා


අකප්පිය 82
අකර්ම 86
අකොප්‍ය කර්මම 17
අගාමකාරඤ්ඤ 55, 60, 69
අගාමකාරඤ්ඤ සීමා 58
අගාමකේ 58
අජ්ඣාත්ථරණ 41, 50, 77
අට්ඨකථා 52
අටවක 2
අටවැදෑරුම් නිමිති 22
අටුවා ඇදුරෝ 50
අත්පස 70, 91
අතිඛුද්දකා 18
අතිමහතී 18
අධාර්මික කර්ම 17
අනන්තරිකා 39
අන්ධකවින්ද 40
අන්ධකට්ඨකථා 28
අනිමිත්තා 18
අනුපරිවේණියං 43
අනුපසම්පන්න 84
අනුරාධපුර 40
අනුරාධපුර මහාසීමා 41
අබද්ධසීමා 20
අබතුර 68
අමිශ්‍ර නිමිත්ත 30
අරඤ්ඤ 60, 61
අරඤ්ඤසීමා 42, 54, 60, 61, 66, 90
අවිප්පවාස සීමා 20, 43

122


අවිපපවාස සීමාසමමත 32

අසීමා 16, 39

ආකාස පබ්භාර 37

ආපත්‍යාරෝචන 59

ආවාස 44

ඇදුරුමත 52, 56, 57, 59, 78, 85, 90, 92, 93

උදක නිමිත්ත 28

උදකුකෙඛප 67, 72

උදකුකෙඛප සීමා 16, 21, 63, 68, 71

උදකුකෙඛප සීමන්තරික 49, 63

උපචාර 39

උපෝසථ 3

උපෝසථ නිදාන 1

උපෝසථය කිරීම 44

උපෝසථයවීම 44

උපෝසථ පමුඛ 44

උපෝසථාගාර 43, 44

උපෝසථාගාර පමුඛ සමමති 10

උපෝසථාගාර සමමති 8

උමංනදී 93

ඌනන්තරික 73

එකුන්විසි සීමා 96

එකොළොස් විපත්තිසීමා 18

ඒකනිස්සය සීමා 48

ඒකසභාග බද්ධසීමා 48

ඒකසීම විහාර 46

ඒකසීම මහාවිහාර 43

ඒදඬු පාද 46, 80

කඞ්ඛාවිතරණී 74

කමමවාචා සමපත්ති 22

කර්ම කොප්‍යය 39, 47, 70, 73, 91

කර්ම විපත්ති 59

කරවීකතිස්ස තෙර 46

කල්‍යාණිපපකරණ 56

කීර්තන 36

කුටිපමුඛ 36

කුඩා උපෝසථාගාර 9

කුඩා නදී 67

කුඩා සීමා 37, 38

කුරුන්දිය 34, 48

කොසොල් රජ 56

ඛණ්ඩසීමා 20, 33, 34, 35, 38, 41, 43

ඛණ්ඩ නිමිත්තා 18
ගණ්ඨිපද (විනය) 74
ගම්කෙත 35, 88
ගම 53, 55
ගාම 42, 43
ගාමභෝජක 53
ගාමසීමා 20, 52, 53, 54, 80
ගාමූපචාර 40, 41, 42, 68
ග්‍රාමභෝජක 54, 57
ඝරූපචාර 68
චක්කවාළ සීමා 95
චොළිය මත 88
ඡන්දපාරිසුද්ධි 91
ඡායා නිමිත්තා 18
ජනපද සීමා 96
ජල සාටිකා 63, 72
ජාතස්සරසීමා 66, 90
ජාතස්සරෙ සම්මතා 18
ඤෙය්‍යධම්ම සඞ්ඝරාජ 58
තිචීවරාවිප්පවාස 58, 60, 70, 74
තිචීවරාවිප්පවාස සීමා සම්මති 12
තිචීවරාවිප්පවාස සීමා සමූහනන 13
තිචීවරාවිප්පවාස සීමා 34, 40, 41, 42
තියෝජන පරම සීමා 39, 40
තුදුස් අබතුර 90, 91
තෙවැදෑරුම් පබ්බත 22
ත්‍රිවිධ සම්පත්ති 22
දීප සීමා 95
දුකූලා ඇවත 17
දෙතිස් පළම 23
දෙවනපෑතිස් 40
ධාර්මිකකම් 17
නගර 40
නගරූපචාර 40
නදිය 62, 65
නදිය (විසලි) 65
නදියා සම්මතා 18
නදී අසීමා 61
නදී නිමිත්ත 27
නදී පාරසීමා 45, 46, 47
නදී ලක්ෂණ 27, 63
නදී සීමා 54, 62, 67, 92
නානාසීමා 93

නිමිත්ත කීර්තන 28
නිමිත්ත සම්පත්ති 21
නිමිති ගල් 35
නිමිත්තුපග පාසාණ 35
නිශ්‍රය 81
නිශ්‍රය භේද 75
නිශ්‍රිත 81
පබ්බත නිමිත්ත 22
පරිස සම්පත්ති 22
පස්වැදෑරුම් නිමිති 76
පසළොස් සීමා 19
පාසාණ නිමිත්ත 23
පාසාද පමුඛ 36
පිරිවෙණ 7, 43, 44
පෙරකිස 3
පොක්ඛරසාති බමුණු 56
ප්‍රාප්තකාල 3
බඩසීම විහාර 24
බඩසීමා 35, 75, 88
බඩසීමා පරිච්ඡේද 92
බහිසීමෙඨිත සම්මතා 18
බිම්සර රජ 2
බුඩාඥව 31, 33, 35, 92
භණ්ඩුක කුමාර 53
භික්ෂුණී සඞ්ඝ 42
භෝග ගාම 63
මගගනිමිත්ත 25
මජ්ඣිම පුරිස 73
මණ්ඩල බෙදීම 53
මණ්ඩලේ නුවර 57
මද්දකුච්ඡි 5
මහතෙර 44
මහාකප්පින තෙර 5
මහාට්ඨකථා 74
මහා පච්චරිය 34, 48, 94
මහාපදුම තෙර 32, 45, 62
මහාමෙඝ වන 40
මහාසීමා 34, 35, 40, 41, 51
මහාසීමා සම්මති 6
මහාසීමා සමූහනන 52
මහාසුම්ම තෙර 32, 45, 62
මහෙසඳු සර්විර 89
මාතිකට්ඨකථා 72
මාළක සීමා 93
මිශ්‍ර නිමිත්ත 30
මිහිඳු මහරහත් 40
රජ්ජ සීමා 98

රට්ඨ සීමා 95
ලාභ සීමා 94
ලුණුලේවා 54, 66
වන නිමිත්ත 24
වම්මික නිමිත්ත 25
වග්ග කම්ම 60, 70
විඤ්ඣාටවි 71
විපක්ෂ මත 86
විපත්ති සීමා 61, 75
විමති විනෝදනී ටීකා 73
විසභාග සීමා 50, 81, 84
විසුංගාම 57
විසුංගාම සීමා 21, 54, 55, 57, 58
විසේස සීමා 94
විහාර වස්තු 38
විහාර සීමා 44, 47, 48, 65, 80
වේළුවන 40
සඞ්ගීති කාර 78
සත්තබ්භන්තර 50, 70
සත්තබ්භන්තර සීමා 16, 21, 42, 58, 59, 61, 68
සත්තබ්භන්තර සීමන්තරිකා 49
සප්පිනියා නදී 40
සභාග සීමා 81
සම්භේද 41, 50
සමානසීමා 11
සමානසංවාස 39, 42
සමානසංවාස ඒකූපෝසථ සීමා 15, 16, 53
සමානසංවාස සීමා 20, 34, 41
සමානසංවාස සීමා සම්මති 5
සමානසංවාස සීමා සමූහනන 14
සමුද්ද සීමා 54, 62
සමූහනන 51
සාමග්ගී 4
සාරත්ථදීපනී ටීකා 73
සැරියුත් තෙර 40
සික්ඛාකරණී 63
සීමජ්ඣෝත්ථරණ 75
සීමන්තරිකා 17, 35, 39, 41, 48, 49, 50, 77
සීමන්තරික පාසාණ 34
සීම විහාර 27, 44
සීම සම්භේද 75

සීමා අජ්ඣොත්ථරණ 17
සීමානානාසංවාසක 93
සීමාපරිච්ඡෙද 38
සීමාපෙක්ඛා 59, 67
සීමා භේද 19
සීමා මාළක 77, 90
සීමා විග්‍රහ 19
සීමා විපත්ති 59, 67
සීමා සම්භින්දන 16, 17
සීමා සෝධන 78, 79, 84, 85, 89
සීමා සංකර 69, 73, 75
සීහළමත 89
සුත්තානුලෝම 82
සේතු 80
සේතුපාද 80
සොළී භික්ඛු 86
සොබ්භා 90
සංකර 69
සංසත්තවිටප 87
හත්ථපාස 70

---

# ශුද්ධිපත්‍ර

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 3 | 3 | සනතිපතිතවා | සන්නිපතිතවා |
| ,, | 8 | උදෙසිම් | උදෙසීම් |
| 5 | 27 | හනෙතා | හනෙතා |
| ,, | 31 | 1. මඋ: | 1. මඋ: 258 |
| 7 | 7 | සීමාව | සීමාවක් |
| ,, | 12 | හරස්කොට | යටපත්කොට |
| ,, | 28 | දුකලා | දුකූලා |
| 9 | 23 | භුමියා | භූමියා |
| 10 | 7 | කිර්තනය | කීර්තනය |
| 12 | 31 | * මඋ: | * උබ: |
| 17 | 8 | සමහින්දන | සමභින්දන |
| 19 | 7 | සීමාති | සීමාති |
| 21 | 3 | සමහින්දන | සමභින්දන |
| 22 | 9 | නයින් සබෙසා | නයින් |
| 31 | 2 | සිමන්තරිකා | සීමන්තරිකා |
| 34 | 23 | ගාත්පස | හාත්පස |
| ,, | ,, | හමත් | ගමත් |
| 39 | 8 | කොප්‍ය | කොප්‍යය |
| ,, | 22 | කිරිම | කිරීම |

| පිටුව | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 39 | 31 | සිමාව | සීමාව |
| ,, | ,, | අසීමා | අසීමාව |
| 49 | 10 | කලහි | කල්හි |
| 50 | 32 | සපා: 714 | සපා: 784 |
| 52 | 29 | සපා: 408 | සපා: 784 |
| 57 | 18 | විසුංගාම | විසුංග්‍රාම |
| ,, | 21 | දෙනලදගම්ය. | දෙනලදගම් පිළිබඳවය. |
| ,, | 22 | ගම්නොවේත් | ගම්පිළිබඳ නොවේත්. |
| 59 | 16 | අනුන්දන්නාලද | අනුදන්නාලද |
| 61 | 22 |ආගාමකාරක්‍ෂ | අගාමකාරක්‍ෂ |
| ,, | 23 | සීමාවදනොපවත්නා | සීමාවද පවත්නා |
| 63 | 19 | නොවටයි | නොවටියි |
| 64 | 7 | ගගට | ගඟට |
| 66 | 30 | ඇතුලත් | ඇතුළත් |
| 69 | 11 | විජහිත්වා | අ විජහිත්වා |
| 72 | 13 | පරිච්ඡින්නටඨානං | පරිච්ඡින්නාටඨානං |
| 81 | 21 | විනයක්‍රම | විනයනයක්‍රම |
| 90 | 32 | නො දක්වූ | නොදූක්වූ |
| 92 | 9 | බුඩාඥව | බුඩාඥවෙත් |
| 95 | 4 | සුරසේන | සූරසේන |

සටහන්

## සටහන්

සටහන්

## සටහන්